

SriLankan Airlines oneworld

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් | වාර්ෂික වාර්තාව 2024/25

# සාර්ථකත්වයේ හිනිපෙත සොයා

# පටුන

**දළ විශ්ලේෂණය**
අපගේ දැක්ම හා අපගේ මෙහෙවර 03
වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම 05
මූල්‍ය විශේෂ තොරතුරු 06

**නායකත්වය**
සභාපතිතුමාගේ සමාලෝචනය 08
ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විවරණය 10
අධ්‍යක්ෂ මණ්ඩලය 13
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 16

**කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය**
මෙහෙයුම් පරිසරය සමාලෝචනය 21
මානව ප්‍රාග්ධනය 25
නිෂ්පාදිත ප්‍රාග්ධනය 29
බුද්ධිමය ප්‍රාග්ධනය 32
සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය 38
ස්වභාවික ප්‍රාග්ධනය 43
මූල්‍ය ප්‍රාග්ධනය 46

**ආයතනික භාරකාරත්වය**
ආයතනික පාලන වාර්තාව 50
ආයතනික අවදානම් කළමනාකරණය 52

**මූල්‍ය ප්‍රකාශ**
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 55
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 59
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 61
ස්වාධීන විගණකගේ වාර්තාව 62
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 66
ලාභ හෝ අලාභ ප්‍රකාශය 67
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 68
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 69
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 70
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 71

**අතිරේක තොරතුරු**
පාරිභාෂික පද මාලාව 115
දස අවුරුදු සමාලෝචනය 116
ගුවන් මාර්ග සිතියම 118
විශේෂ කඩඉම් 120
සාංගමික තොරතුරු 122
මහා සභා රැස්වීම් නිවේදනය 123
සටහන් 124
පෙරකලාසි පත්‍රය 127

# සාර්ථකත්වයේ හිනිපෙත සොයා

ගුවන් සේවයේ අපි නිමක් නොවන අහස තරණය කරන්නෙමු. එවන් වූ නිමක් නොමැති අභියෝග සමඟද පොර බදින්නෙමු. වත්මන් සාර්ථකත්වය විඳගනු පිණිස පදනම වූයේ එයයි. දුෂ්කරතා හමුවේ වුවද ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය අරමුණු වෙනුවෙන් සිදු කළ කැපවීම් ඉමහත් ය. අපි කලාපය තුළත්, ඒ සීමාවෙන් ඔබ්බටත් විධිමත්ව මෙහෙයුම් පවත්වා ගනිමින්, අපගේ භූමිකාව වෙත නව අරුතක් එක් කළෙමු.

සමාලෝචනයට භාජනය වන වසර තුළ අපි අපගේ සැලසුම්වල සාර්ථකත්වය අත්කර ගත්තෙමු. එදිනෙදා මෙහෙයුම් සියුම්ව හැසිරවීමේ පටන් අපගේ හවුල්කරුවන් සහ පාරිභෝගිකයින් සමඟ ස්ථිර සබඳතා පවත්වා ගැනීම දක්වා වූ සැම කටයුත්තක් තුළම අනාගත යහපැවැත්ම අරමුණු කරනු ලැබුවෙමු. රජයේ සහයෝගයත්, මනා සැලසුම්වල මඟ පෙන්වීමත් සමඟින් අපි ආර්ථික අභියෝග සාර්ථකව ජය ගැනීමට සමත් වීමු. එය තිරසාර අනාගතයක පදනමයි.

වටිනාකම් උපැයීමේ නව අරමුණු පෙරදැරි කරගනිමින් ඉදිරියේදී ඇති විය හැකි අභියෝග වෙනුවෙන් අප දැන් පෙරටත් වඩා සූදානම් ය.

SriLankan Airlines

oneworld


member of
oneworld
SriLankan Airlines
www.srilankan.com
A320-200

## අපගේ දැක්ම

උණුසුම් ආගන්තුක සත්කාර සපිරි සැබෑ ශ්‍රී ලාංකේය අත්දැකීමක් විඳගැනීමට බලාපොරොත්තු වන සංචාරකයින්ගේ පළමු තේරීම බවට පත්වීමට අපි අපේක්ෂා කරමු.

## අපගේ මෙහෙවර

සංචාරක ව්‍යාපාරයට මෙන්ම විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට සහ ජාතික ආර්ථිකයට ද සහය වෙමින්, ඉන්දියන් සාගර කලාපය තුළ පිහිටීමේ වාසිය උපායමාර්ගික ලෙස යොදාගනිමින්, ශ්‍රී ලංකාව ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම මඟින් අප රට ලෝකය වෙත ගෙන යන තිරසාර, ලාභ උපයන ගුවන් සේවයක් බවට පත්වීම.

ගුවන් සේවය සඳහා මෙන්ම ගුවන් සේවා ක්ෂේත්‍රය සඳහා වෘත්තිකයන් බිහිකිරීමේ ප්‍රමුඛත්වය ගන්නා මධ්‍යස්ථානයක් බවට පත්වීම. තවද රටට සහ අප සේවය කරන ප්‍රජාවන්ට දිගුකාලීන තිරසාර ප්‍රතිලාභ අත්කර දෙමින් සදාචාර සම්පන්නව සේවය කිරීමට අපි කැපවී සිටිමු.





# වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

**මෙය 2024 අප්‍රේල් 1වනිදා සිට 2025 මාර්තු 31වනිදා දක්වා මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි වාර්ෂික වාර්තාවයි. 1979 වසරේ ආරම්භය පටන් ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය ලෙස ක්‍රියාත්මක වන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම විසින් ශක්තිමත් මගී සහ භාණ්ඩ ප්‍රවාහන ජාලයක් පවත්වා ගෙන යනු ලබයි. මූලික ගුවන් මෙහෙයුම් හැරුණු කොට සමූහය විසින් ගොඩබිම් හැසිරවීම්, ගුවන් යානස්ථ ආහාරපාන සැපයීම, ගුවන්යානා නඩත්තුව සහ විවිධ අතිරේක සේවා ඇතුළු පුළුල් පාරිභෝගික සේවා සපයනු ලබයි.**

**උසස් තත්ත්වයේ සේවාව, සුව පහසුව, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය වෙනුවෙන් ප්‍රබල කීර්තියක් දරනු ලබන ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පිහිටි එහි ප්‍රධාන මධ්‍යස්ථානයේ සිට මෙහෙයුම් සිදු කරනු ලබයි. වාර්තාකරණ කාලය තුළ එමඟින් රටවල් 59ක ගමනාන්ත 117ක් පුරා විහිදෙන ගෝලීය ජාලයක් ඔස්සේ මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධතා පවත්වාගෙන යනු ලබයි.**

## විෂය පථය සහ සීමාව

සමාලෝචිත කාල සීමාව තුළ සමූහයේ මූල්‍ය සහ මූල්‍ය නොවන සංවර්ධනයන්ට අදාළ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවෙහි අන්තර්ගත වන අතර විවිධ ප්‍රාග්ධන උපායමාර්ගික යෙදවීම හරහා වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රමවේද පිළිබඳද විස්තර කරනු ලබයි. මෙමඟින් මෙහෙයුම් ප්‍රතිඵලයන්, මූල්‍ය කාර්යසාධනය, අවදානම් කළමනාකරණය, තිරසාරභාවය පිළිබඳ මූලපිරීම් සහ ආයතනික පාලනය පිළිබඳ දැක්වෙන අතර, සමූහයේ සමස්ත කාර්යසාධනය සහ සැලසුම් පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් අපගේ පාර්ශ්වකරුවන් වෙත ලබා දේ.

## වාර්තාව පිළියෙල කිරීමේ ප්‍රමිති සහ මූලිකාංග

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත. ආයතනික පාලනය පිළිබඳ හෙළිදරව් කිරීම් රාජ්‍ය ව්‍යවසාය චක්‍ර ලේඛන අංක 01/2021 යටතේ දක්වා ඇති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොත අනුව සකස් කර ඇත.

## ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය

සමූහයේ ඉදිරි කාර්යසාධනය සහ අපේක්ෂාව පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ "ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය" හි දැක්වේ. මෙම ප්‍රකාශ ආවේනික අවදානම් සහ අනපේක්ෂිතතාවලට යටත් වන අතර, ඒ අනුව සැබෑ ප්‍රතිඵල, එහි අපේක්ෂා කළ ප්‍රතිඵලවලට වඩා වෙනස් විය හැකිය. එවැනි ප්‍රක්ෂේපණ මත අනවශ්‍ය විශ්වාසයක් තබා නොගන්නා ලෙස පාඨකයන් වෙත දැනුම් දෙනු ලැබේ.




සටහන:
මෙම සිංහල වාර්තාව ඉංග්‍රීසි වාර්තාවේ පරිවර්තනයක් වන අතර, පරිවර්තන ගැටළු පවතින සෑමවිටම ඉංග්‍රීසි වාර්තාව පරිශීලනය කරන්න.

# මූල්‍ය විශේෂ තොරතුරු

| 2025 මාර්තු 31 දිනට | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| **මූල්‍යමය** | | | | | |
| ආදායම | රු. මිලියන | 303,093.89 | 339,591.65 | 296,506.00 | 333,614.09 |
| මෙහෙයුම් වියදම | රු. මිලියන | 276,332.31 | 312,929.37 | 275,694.95 | 312,739.14 |
| විනිමය ලාභය/(අලාභය) ට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය) | රු. මිලියන | 28,422.90 | 28,147.92 | 22,472.37 | 22,360.59 |
| වසර සඳහා ලාභය/(අලාභය) | රු. මිලියන | (2,735.28) | 7,925.01 | (7,594.56) | 3,870.86 |
| මුළු වත්කම් | රු. මිලියන | 189,256.80 | 201,648.71 | 181,971.09 | 194,258.01 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල | රු. මිලියන | (379,519.61) | (381,723.67) | (403,172.55) | (400,534.71) |
| **ගමනාගමනය** | | | | | |
| මගී ධාරිතාව | ASK මිලි. | | | 14,714.85 | 15,425.45 |
| ප්‍රවාහනය කරන ලද මගීන් | RPK මිලි. | | | 11,571.61 | 12,198.65 |
| මගී පැටවුම් සාධකය | % | | | 78.64 | 79.08 |
| සමස්ත ධාරිතාව | ATK මිලි. | | | 1,908.92 | 2,072.57 |
| ප්‍රවාහනය කළ සමස්ත පැටවුම | RTK මිලි. | | | 1,338.08 | 1,394.50 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 70.10 | 67.28 |
| වියදම් ආවරණය කිරීම සඳහා සමස්ත පැටවුම් සාධකය | % | | | 76.17 | 72.95 |
| **කාර්ය මණ්ඩල ඵලදායීතාවය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,786 | 6,648 | 6,071 | 5,935 |
| එක් සේවකයෙකුගේ ආදායම | රු. මිලියන | 44.66 | 51.08 | 48.84 | 56.21 |
| **ගුවන් යානා** | | | | | |
| පටු බඳ සහිත | සංඛ්‍යාව | | | 13 | 12 |
| පුළුල් බඳ සහිත | සංඛ්‍යාව | | | 9 | 9 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | | | 22 | 21 |









# වර්ධනයේ
# හිනිපෙත කරා

# සභාපතිතුමාගේ සමාලෝචනය

> "සමාගම සිය මෙහෙයුම් ශක්තිමත් කරමින් දිගුකාලීන තිරසාරභාවය වෙනුවෙන් කටයුතු කරයි. අරමුණු පෙරදැරි කරගත් යෝජනා නැවත සකස් කිරීමේ ක්‍රියාවලිය නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද පළමු පියවර අතරින් එකකි. ඒ තුළින් පරිසරය කළමනාකරණය, කොටස්කරුවන්ගේ සහභාගීත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සමඟ වාණිජ අරමුණු සමබර කිරීමට උත්සාහ දරනු ලබයි."

ගෝලීය වශයෙන් ගුවන් සේවා කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම සහ දේශීය ආර්ථිකය ස්ථාවර වීම යන කාරණා හමුවේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 2024/25 මූල්‍ය වර්ෂයේදී සිය ඔරොත්තු දීමේ හැකියාව, අනුවර්තනය වීමේ හැකියාව සහ උපායමාර්ගික දුරදක්නාභාවය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළේය. මා ඇතුළු නව අධ්‍යක්ෂ මණ්ඩලය 2024 ඔක්තෝබර් මාසයේදී පත්වීම් ලද අතර, කෙටි කාලයක් තුළ අපි කඩිනම් ස්ථාවරත්වය, ද්‍රවශීලතාවය සහ කොටස්කරුවන් වෙත ප්‍රතිලාභ අත්කර දෙනු ලබන මධ්‍යම කාලීන සිට දිගු කාලීන තිරසාරභාවය සහ වගකීම් සහගත ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කළෙමු. ශ්‍රී ලංකාව හුදෙක් ලෝකයා වෙත සම්බන්ධ කිරීමට සීමා නොවෙමින්, අපගේ ව්‍යාපාරයේ සහ අපගේ සේවකයින් ඇතුළු සියලුම කොටස්කරුවන්ගේ යහපැවැත්ම වෙනුවෙන් කල් පවතින වටිනාකම් නිර්මාණය කරන ජාතික ගුවන් සේවයක් ලෙස සේවය කිරීමේ මෙහෙවර වෙනුවෙන් අපි කැපවූවෙමු.

## විවිධත්වයෙන් පිරි මෙහෙයුම් පසුබිම

සමාලෝචනයට භාජනය වන මූල්‍ය වර්ෂය තුළදී ගෝලීය සහ දේශීය මෙහෙයුම් කටයුතු බාධා මධ්‍යයේ පවත්වාගෙන ගිය අතර, එය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත අභියෝග මෙන්ම නව අවස්ථා ගෙන ආවේය. ගුවන් සේවා කර්මාන්තය සඳහා ඉල්ලුමේ කැපී පෙනෙන ප්‍රතිසාධනයක් දැකගත හැකි වූවද, අඛණ්ඩව පැවති අස්ථාවරත්වය, භූ දේශපාලනික ගැටුම් සහ ආර්ථික පීඩා එලෙසම පැවතිණ.

ගෝලීය වශයෙන් ගුවන් සේවය, භූ දේශපාලනික අස්ථාවරත්වය සහ සැපයුම් දාමයේ දුෂ්කරතා ඇතුළු සැලකිය යුතු මෙහෙයුම් අභියෝගවලට මුහුණ දුන්නේය. උක්ත කාරණා මඟින් ගුවන් ගමන් කාලය දීර්ඝ වීම, ඉන්ධන භාවිතය වැඩිවීම සහ සැපයුම්දාමයේ දුෂ්කරතා ආදි අහිතකර ප්‍රතිඵල ඇති කළ අතර, මෙහෙයුම් සැලසුම් කඩිනම් කිරීමේ අවශ්‍යතාව මතු විය. දේශීය වශයෙන්, ජාත්‍යන්තර ගුවන් යානා සමඟ තරඟකාරිත්වය ඉහළ යාම, ගුවන් යානා සීමා වීම හේතුවෙන් ආන්තිකය සහ මුදල් ප්‍රවාහය මත තවත් බලපෑම් ඇති වූවේය. ගෝලීය වශයෙන් ගුවන් යානා උපාංග හිඟවීම සහ එයාර්බස් A320/321 Neo ගුවන් යානා ඇණියට බලපානු ලබන එන්ජින් නඩත්තු කිරීමේ අභියෝග මූලික වෙමින් නඩත්තු කිරීම සඳහා දිගු කාලයක් වැයවීම හේතුවෙන් ගුවන් යානා සේවයේ යෙදවීමට තිබූ හැකියාව සීමාවිය. කල්බදු ලෙස භාවිත කළ ගුවන් යානා හිඟය ඉදිරි වසර තුළද පැවතිය හැකි අතර එය සමාගමේ සැලසුම්ගත වර්ධනයට බාධාවක් වනු ඇත.

මෙම බාධා මධ්‍යයේ වූවද, ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ සැලකිය යුතු පුනර්ජීවනයත් සමඟ ජාත්‍යන්තර පැමිණීම්වල වර්ධනය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත ප්‍රතිලාභ අත් කර දුන්නේය. එමෙන්ම, ගුවන් සේවය සිය මෙහෙයුම් කාර්යසාධනය පවත්වා ගනු පිණිස ගමන් වාර ගණන වැඩි කිරීම, කාලසටහන්වල ඵලදායීතාව වැඩි කිරීම සහ වෙළඳපළ තුළ පවතින අවස්ථා උපයෝගී කර ගනු ලැබුවේය.

## උපායමාර්ග වැඩිදියුණු කිරීම සහ තිරසාර දැක්ම

සමාගම සිය මෙහෙයුම් ශක්තිමත් කරමින් දිගුකාලීන තිරසාරභාවය වෙනුවෙන් කටයුතු කරයි. අරමුණු පෙරදැරි කරගත් යෝජනා නැවත සකස් කිරීමේ ක්‍රියාවලිය නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද පළමු පියවර අතරින් එකකි. ඒ තුළින් පරිසරය කළමනාකරණය, කොටස්කරුවන්ගේ සහභාගීත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සමඟ වාණිජ අරමුණු සමබර කිරීමට උත්සාහ දරනු ලබයි. අප විසින් නව පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකස් කොට රජයට ඉදිරිපත් කරන ලද්දෙමු. එමඟින් අපගේ ගුවන් යානා ඇණිය පුළුල් කිරීම සහ නවීකරණය කිරීම, ආදායම් උත්පාදනය වැඩි කිරීම, පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, වෙළඳපළ කොටස වර්ධනය කිරීම, ඩිජිටල්කරණය වෙත යොමු වීම, තිරසාර ව්‍යාපාරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සහ අපගේ ජනතාවගේ සංවර්ධනය සහ යහපැවැත්ම වෙනුවෙන් ආයෝජනය කිරීම යන ප්‍රධාන ප්‍රමුඛතා වටා ගොඩනගා ඇති පැහැදිලි සැලසුමක් ගෙනහැර දක්වයි. මෙකී ප්‍රමුඛතා කෙටි කාලීන කාර්ය සාධනය සහතික කරන්නා සේම, ගුවන් කර්මාන්තයේ ගෝලීය ප්‍රවණතා සහ සාර්ව ආර්ථික අස්ථාවරත්වය හමුවේ ගුවන් සේවය අනාගතයේ සුරක්ෂිතභාවය තහවුරු කරනු ලබයි.

මේ අනුව, ජාතික සහ කලාපීය වශයෙන් පවතින අවස්ථාවලින් ප්‍රතිලාභ අත් කර ගත හැකි ශක්‍යතාවයක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සතු වේ. අපි ජාතික ගුවන් සේවය ලෙස, ශ්‍රී ලංකාවේ පොහොසත් සංස්කෘතික උරුමය සහ ස්වාභාවික සුන්දරත්වය වෙත සීමා නොමැති ප්‍රවේශයක් පිරිනමමින් දේශීය සංචාරක ව්‍යාපාරයට පහසුකම් සැලසීම වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරලන්නෙමු. අපගේ මෙහෙයුම්, විදෙස් රටවල රැකියාවේ නියැලෙන ශ්‍රී ලාංකිකයින්ට සිය මවු රට සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට හේතුවක් ලෙස කටයුතු කරයි. භූගෝලීය වශයෙන්, කොළඹ පිහිටි අපගේ මධ්‍යස්ථානය කලාපයේ ප්‍රධාන සංක්‍රමණ ස්ථානයක් ලෙස කටයුතු කරමින් විශාල වාසියක් ලබා දෙයි. ඒ හා සමානව ආසියා-පැසිෆික් කලාපයේ ශීඝ්‍ර ආර්ථික වර්ධනයෙන් ප්‍රතිලාභ අත් කර ගැනීමට හැකිවන පරිදි ගුවන් සේවය ස්ථානගත වී ඇත. මෙම ඉහළ විභවයකින් යුතු වෙළඳපොළ වෙත අපගේ භූ ගෝලීය සමීපත්වය, කලාපීය වෙළඳ හා සංචාරක පද්ධතිය සමඟ මනා සම්බන්ධයක් පවත්වා ගැනීමට පිටිවහලක් වේ. එමෙන්ම, අපි අපගේ පරිපාලිතයේ සහ උපායමාර්ගික ව්‍යාපාරික ඒකක තුළ වර්ධන අවස්ථා මනාව හඳුනාගෙන පෝෂණය කරමින්, අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ සැලසුම් සහ ආදායම් පදනම තවදුරටත් විවිධාංගීකරණය කරන්නෙමු.

එමෙන්ම, සමූහයේ ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීම සිදුවෙමින් පවතී. ශ්‍රී ලංකා රජයේ සහය ඇතිව, පෙර මූල්‍ය බැඳීම් විසඳීමට අවශ්‍ය පියවර ගෙන ඇත. වසර පහක් ඇතුළත සම්පූර්ණ ආපසු ගෙවීම සඳහා රජය සතු බැංකු ණය ප්‍රතිව්‍යුහගත කරනු ලබයි. බැඳුම්කර හිමියන් සමඟ සාකච්ඡා ආරම්භ කරමින්, ඇමරිකානු ඩොලර් මිලියන 175ක ස්වෛරී-සහතික කළ ජාත්‍යන්තර බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා උපදෙස් ලබා ගැනීමට Lazard Freres SAS පත් කර ඇත. මෙකී පියවර සහ අනෙකුත් උපායමාර්ග මඟින් පවතින මුදල් ප්‍රවාහ පීඩනයන් සමනය කිරීම අරමුණු කරයි.

## සමූහයේ කාර්ය සාධනය සහ මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම

වසර තුළ, සමූහය විසින් රුපියල් බිලියන 30.7ක (විනිමය ලාභ සහ කාලසටහන් ගත නොකළ එන්ජින් අලුත්වැඩියා වියදම් ගිණුම්ගත කිරීමට පෙර) මෙහෙයුම් ලාභයක් උපයන ලදී (2023/24: රුපියල් බිලියන 39.7). කෙසේ වෙතත්, සමූහය විසින් රුපියල් බිලියන 2.7ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් රුපියල් බිලියන 31.6ක ශුද්ධ මූල්‍ය පිරිවැය බලපාන ලදී. වසර තුළ මගී මෙහෙයුම් වලින් ලබාගත් ආදායම රුපියල් බිලියන 234.5ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 15%ක අඩුවීමක් සටහන් කරයි (2023/24: රුපියල් බිලියන 276.2). මෙකී අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් ආදායම අඩු වීම සහ ගුවන් යානා ඇණියේ පැවති සීමා බලපාන ලදී. පෙර මූල්‍ය වර්ෂයට (2023/24 - රුපියල් බිලියන 31.4) සාපේක්ෂව භාණ්ඩ ආදායම 2%කින් වර්ධනය වූවේය.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට (BIA) විදේශීය ගුවන් සමාගම්වලට අයත් ගුවන්යානා ද විශාල ප්‍රමාණයක් ආපසු පැමිණීමත් සමඟ, ගුවන් පර්යන්තය සහ ඒ ආශ්‍රිත සේවාවන්ගෙන් සමූහයට රුපියල් බිලියන 24.9ක මුළු ආදායමක් ලබා ගැනීමට හැකි වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 17%ක වර්ධනයකි (2023/24: රුපියල් බිලියන 21.2). යානස්ථ ආහාර සැපයුම් ආදායම රුපියල් බිලියන 7.3ක් ලෙස වාර්තා වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 13% ක වර්ධනයකි. ජෙට් ඉන්ධන මිල අඩුවීමත් සමඟ, ගුවන් සමාගමේ විවිධ පිරිවැය ඉතිරිකිරීමේ සහ කාර්යක්ෂමතා මුලපිරීම් සපුරාලමින් සමූහයේ විනිමය ලාභයට පෙර සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැයට පෙර, මෙහෙයුම් ලාභය 9%කින් අඩු විය.

## සන්ධිස්ථාන සහ කර්මාන්තයේ පිළිගැනීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සේවා විශිෂ්ටත්වය, සන්නාම ශක්තිය සහ මෙහෙයුම් සහ වාණිජ කළමනාකාරිත්වය සඳහා කැපවීම වෙනුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සම්මාන කිහිපයකින් පිදුම් ලැබීය. මධ්‍යම/දකුණු ආසියාවේ හොඳම විනෝදාස්වාද සම්මානය සඳහා 2024 APEX සම්මානය ඒ අතර වේ; එමෙන්ම APEX නිල ගුවන් සේවා ශ්‍රේණිගත කිරීම්වල 'තරු හතරක ප්‍රධාන ගුවන් සේවය' ලෙස සිය තත්ත්වය රඳවා ගත්තේය. 2024 PATA සම්මාන උළෙලේදී අපගේ අලෙවිකරණ විශිෂ්ටත්වය වෙනුවෙන් රන් සම්මානයකින් පිදුම් ලැබීය. භාණ්ඩ ප්‍රවාහන අංශයේ, ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් 2024 වර්ෂයේ ජාතික සැපයුම් සම්මාන උළෙලේදී රිදී සම්මානයක් පිරිනමන ලද අතර, ඩුබායි හි පැවති අරාබියේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පිළිබඳ සම්මාන උළෙලේදී 'නැගී එන භාණ්ඩ ප්‍රවාහන ගුවන් සේවය' ලෙස හඳුනා ගැනීමට ලක් වූ අතර, මැද පෙරදිග කලාපයේ අපගේ වර්ධනය පිළිබඳ ඉස්මතු කරයි. එමෙන්ම ගුවන් සමාගම විසින් වසර 7 කට පසුව, 2025 ජුනි මස පුළුල් බඳ සහිත ගුවන්යානයක් තම ඇණියට එක් කරන ලදි. මෙකී සන්ධිස්ථාන සියල්ල පිළිබඳ සලකා බලන කළ සුවිශේෂී වටිනාකමක් සිය සේවයට එක් කිරීමටත්, එහි කලාපීය සහ ගෝලීය වශයෙන් සිය පැවැත්ම වැඩි දියුණු කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සේවයේ අඛණ්ඩ කැපවීම පෙන්නුම් කරයි.

## පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ පාලනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් රජයේ බලධාරීන්, ගෝලීය ගුවන් සේවා ආයතන, සැපයුම්කරුවන් සහ බදු දෙන්නන් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වා ගනු ලබයි. ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA), IATA මෙහෙයුම් ආරක්ෂණ විගණන (IOSA) සහ භූමි මෙහෙයුම් සඳහා IATA ආරක්ෂණ විගණන (ISAGO) අඛණ්ඩව පිළිපැදීම සහ අනුකූලතාවය පවත්වා ගැනීම අපගේ මෙහෙයුම්වල මූලික පදනමක් ලෙස පවතී. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිතීන්, නිර්දේශිත පිළිවෙත් සහ නියාමන අඛණ්ඩතාව සහතික කරන විනිවිදභාවයෙන් යුතු වාර්තාකරණයක් පවත්වා ගෙන යනු ලබයි. ඉංජිනේරු මෙහෙයුම් අංශය විසින් EASA අනුමැතිය ඇතුළු දැඩි ජාත්‍යන්තර නඩත්තු ක්‍රියාපටිපාටි අනුගමනය කරන අතර, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය ගෝලීය පුහුණු ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරයි. ශ්‍රීලංකන් කේටරින් විසින් ක්‍රමවත් විගණනයක් පවත්වා ගනිමින් ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතාව සහ සනීපාරක්ෂක රෙගුලාසි අනුව කටයුතු කරනු ලබයි. මෙකී සාමූහික ප්‍රයත්නයන් මෙහෙයුම් විශිෂ්ටත්වය සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සඳහා අප කැපවීම උදෙසා මහත් උපකාරයක් වේ. විශේෂයෙන්, අපගේ පාර්ශවකරුවන්, විශේෂයෙන් ගුවන් යානා බදු දෙන්නන් සහ එන්ජින් නිෂ්පාදකයින් සමඟ පැවති සාකච්ඡා ද්‍රවශීලතාව පිළිබඳ අභියෝග විසඳීමට මෙන්ම අපගේ බලඇණියේ මෙහෙයුම්වල සූදානම සහතික කිරීමට උපකාරී විය. මෙකී සහයෝගය හේතුවෙන් කල් දැමූ ගෙවීම් සැලසුම්කරණය සහ භාවිත කළ නොහැකි එන්ජින් අලුත්වැඩියාව සඳහා මුදල් යෙදවීමට අවස්ථාව උදා වූ අතර, බාධා හමුවේ යහපත් සම්බන්ධතාවල වැදගත්කම මින් පසක් කරලනු ලැබීය.

## පරිසරය කළමනාකරණය සහ තිරසාර නවෝත්පාදනය

තිරසාරභාවය පිළිබඳ අපගේ අරමුණු වෙනුවෙන්ද වැදගත් තැනක් ලබා දී ඇති අතර එය අපගේ ආයතනික උපායමාර්ග සඳහා ඇතුළත් කොට ඇත. අපි ගුවන් සේවයේ ගෝලීය ඉලක්ක සමඟ මුහුවෙමින්, මෙහෙයුම්වල කාබන් විමෝචනය නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා ICAO හි CORSIA මාර්ගෝපදේශ අනුව කටයුතු කරන්නෙමු. දේශීය හා ජාත්‍යන්තර පාරිසරික ප්‍රමිතීන් වෙනුවෙන් අපගේ කැපවීම එයාර්බස් හරිත මෙහෙයුම් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම, IATA හි $CO_2$Connect මුලපිරීම සඳහා සහය දැක්වීම සහ බලශක්ති-කාර්යක්ෂම මුලපිරීම් සඳහා අඛණ්ඩ ආයෝජනය කිරීම යනාදි කාර්යභාරයන් මඟින් මනාව පිළිබිඹු වේ.

## අනාගතය වෙනුවෙන් නැඟී සිටීම: ඔරොත්තු දීමේ හැකියාව, අවදානම සහ ප්‍රතිසංස්කරණය

භූ දේශපාලනික අස්ථාවරත්වය පටන් කුසලතා හිඟය සහ තරඟකාරී බලපෑම් දක්වා වූ සියලු කාරණා සම්බන්ධයෙන් ගුවන් සේවය සුපරීක්ෂාකාරීව සහ ප්‍රතිචාරාත්මකව කටයුතු කළ යුතුය. මෙකී අවිනිශ්චිතතා ආමන්ත්‍රණය කළ හැකි වන පරිදි අපගේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුව සවිමත්ය, එමෙන්ම එමඟින් ව්‍යාපාර අඛණ්ඩතාව, වත්කම් ආරක්ෂාව සහ අවස්ථා පාදක සැලසුම්කරණය ආදිය පිළිබඳ සහතික වනු ලබයි.

ගුවන් කර්මාන්තය හරිත ගුවන් සේවා සහ ඩිජිටල්කරණය වෙත නැඹුරුතාවයක් දක්වන්නා හෙයින්, අපි අපගේ වර්ධනය, කාර්යක්ෂමතාව සහ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්නෙමු. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ජාතික ගුවන් සේවයක් ලෙස පමණක් නොව, වගකිවයුතු, තරඟකාරී සහ තිරසාර ගෝලීය ගුවන් සේවා සන්නාමයක් ලෙස ස්ථානගත කිරීමේ දිගුකාලීන දැක්ම වෙනුවෙන් රුකුලක් වනු පිණිස ගුවන් යානා ඇණිය පුළුල් කිරීමේ සැලසුම්, ඩිජිටල්කරණය වෙත ආයෝජන කිරීම සහ කුසලතා සංවර්ධනය යන කාරණා පිළිබඳ අපි සැලකිලිමත් වන්නෙමු.

## ස්තුතිය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කෙරෙහි අඛණ්ඩව විශ්වාසය තබමින්, අප මෙතෙක් දුර ආ ගමනේ සැබෑ හිමිකරුවන් වන, දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පැතිර පවත්නා අපගේ වටිනා ගනුදෙනුකරුවන් වෙත මම මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අප විශිෂ්ටත්වය කරා යන ගමනට ඔබගේ නොසැලෙන පක්ෂපාතිත්වය මහත් ශක්තියක් වූ අතර, සංචාරක අත්දැකීම් නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට අපව පොළඹවනු ලැබීය. නොවෙනස්වන මඟ පෙන්වීම සහ උපායමාර්ගික අධීක්ෂණය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම, බාධා සහ වෙනස්කම්වලින් පිරි කාල පරිච්ඡේදයක් තුළ දක්ෂ නායකත්වයක් ලබා දෙමින් සිය සේවා කාලය අවසන් කළ ප්‍රධාන විධායක නිලධාරියාතුමා වෙත ද මම ස්තුතිය පළ කරමි.

සැලකිය යුතු බාධක මධ්‍යයේ වුවද, මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරනු පිණිස සිය කැපවීම සහ දරා ගැනීම ඉස්මතු කළ අපගේ කළමනාකරණ කණ්ඩායමට සහ සේවකයින්ට මම ගෞරවනීය ස්තුතිය පුද කරමි. ඔවුන්ගේ මෙම කැපවීම අපගේ සාමූහික ප්‍රගතිය පිටුපස වූ සෙවනැල්ලයි.

එමෙන්ම ශ්‍රී ලංකා රජය, අතිගරු ජනාධිපතිතුමා සහ ගරු මුදල් අමාත්‍යතුමා, ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා සහ අදාළ ආයතනවල සියලුම නිලධාරීන් වෙත ඔවුන් දැක්වූ නොනිම් සහයෝගය සහ එකමුතුභාවය වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අවිනිශ්චිතතා මඟහරවා ගැනීම සහ සංචාරක ව්‍යාපාරය දියුණු කරලීම සහ ජාතියේ ආර්ථික වර්ධනයට දායක වීම යන අපගේ පුළුල් මෙහෙවර සාක්ෂාත් කර ගනු පිණිස ගුවන් සමාගම වෙත යෝධ ශක්තියක් වූ අපගේ කොටස් හිමියන්ගේ සහයෝගය ද බෙහෙවින් අගය කරන්නෙමි.

**සරත් ගනේගොඩ**
*සභාපති*

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විවරණය

"ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය මෙහෙයුම් කාර්ය සාධනය වර්ධනය කරලීමට දැඩි අවධානයක් යොමු කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් ගමන්වල පිටත්වීමේ සහ පැමිණීමේ කටයුතු නියමිත වේලාවට පවත්වා ගැනීමට හැකි විය."

මෙතෙක් ආ ගමන්මග තුළ අපි ඉතා සතුටුදායක ප්‍රගතියක් උපයා ගෙන ඇත්තෙමු. ගුවන් සේවා කර්මාන්තය වසංගත තත්වයෙන් පසු ප්‍රකෘතිමත් වීමට වෙර දැරූ මෙන්ම, ශ්‍රී ලංකා ආර්ථිකය සුබදායක මට්ටමකට ළඟා වෙමින් පැවති කාල පරිච්ඡේදයක් වූ, 2024/25 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙලෙස ඔබ වෙත ඉදිරිපත් කෙරේ. මෙම වාර්තාව මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කිරීමට පමණක් සීමා නොවී අපගේ උපායමාර්ගය, මෙහෙයුම්, පරිසර කළමනාකාරිත්වය, මානව සංවර්ධනය සහ සියලුම පාර්ශවකරුවන් වෙත අපි වටිනාකම පිරිනමන ආකාරය ගෙනහැර දක්වයි.

## මෙහෙයුම් ස්වාභාවය සහ කර්මාන්තයේ වපසරිය

සමාලෝචනයට භාජනය වන වසර තුළ විවිධාකාර අභියෝගවලට මුහුණදීමට ගෝලීය සහ කලාපීය ගුවන් සේවා කර්මාන්තයට සිදු වූවද ඒ සමඟම නව ව්‍යාපාරික අවස්ථා බිහි විය. වෙනස්වීමට ලක් වන වෙළඳපොළ අභියෝග හමුවේ, ශ්‍රී ලංකාවේ සංචාරක අංශයට සිය නම්‍යශීලිතාව සහ ප්‍රකෘතිමත් වීමේ හැකියාව පවත්වා ගැනීමට හැකි වූ අතර, ජාතික ගුවන් සේවයේ වර්ධනය වෙනුවෙන් එය අනුප්‍රාණයක් විය. 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත සංචාරකයින්ගේ පැමිණීම මිලියන 2.1 ඉක්මවා ගියේය. එය 38%ක වාර්ෂික වර්ධනයක් මෙන්ම 2019 සිට වාර්තා වූ ඉහළම අගය නිරූපණය කරයි. සංචාරයකයින්ගේ පැමිණීම 416,000ක් ලෙස ඉහළම අගය වාර්තා කරමින් ඉන්දියාව ප්‍රමුඛතම මූලාශ්‍ර වෙළඳපොළ ලෙස සිය ස්ථානය පවත්වා ගෙන ගිය අතර, ඊට අමතරව රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ චීනය යන රටවල් විසින් ඉහළ අගයන් වාර්තා කරනු ලැබීය. කෙසේ වෙතත්, සැපයුම් දාමයේ බාධා හේතුවෙන් ගුවන් යානා සීමා කිරීම් වැනි නිරන්තර පැවති අභියෝග හමුවේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට මෙම වර්ධනය වන ඉල්ලුමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ කාර්යක්ෂමව සපුරාලීමට නොහැකි විය.

සමාලෝචිත වසර පුරාම, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය මෙහෙයුම් කටයුතු අස්ථාවර ගෝලීය සහ දේශීය පසුබිමක පවත්වා ගෙන ගියේය. එය එහි මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කළේය. ගුවන් සේවා කර්මාන්තයට අවදානම් සහිත ගෝලීය අභියෝග සමඟ නිරන්තරයෙන් මුහුවීමට සිදු විය. ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයට (IATA) අනුව, ගුවන් කර්මාන්තයේ වාර්ෂික ආදායම 4.7%කින් හායනය වූ අතර, ආසියා-පැසිෆික් කලාපය තුළ එහි බලපෑම තවත් වැඩි විය. භූ දේශපාලනික පීඩාකාරී තත්ත්වයන් හේතුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට එහි යුරෝපීය ගුවන් ගමන් මාර්ග වෙනස් කිරීමට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගමන් කාලය දීර්ඝ වීම, ඉන්ධන පරිභෝජනය ඉහළ යාම සහ බර පැටවීමේ ධාරිතාව අවම කිරීම වැනි ප්‍රතිඵල ඇති විය. ලන්ඩන් හීත්‍රෝ වැනි කාර්යබහුල ගුවන් තොටුපළවල අත්‍යවශ්‍ය ගොඩබෑමේ ස්ථාන පවත්වා ගැනීම සඳහා, ගුවන් සමාගමට පිටත්වීමේ කාලසටහන් වෙනස් කිරීමට සිදු විය. එය මෙහෙයුම් කටයුතුවල අත්‍යවශ්‍ය කාරණයක් වූවද අහිතකර අන්දමින් සම්බන්ධතා මඟ හැරීම සහ අක්‍රමවත් ලෙස ගුවන් ගමන් වලින් ඉවත් වීම වැනි කාරණා හේතුවෙන් මගීන් වෙත අපහසුතා ඇති කළේය. භාණ්ඩ ප්‍රවාහන අංශය සඳහා බංගලාදේශය වැනි රටවල පැවති දේශපාලන අස්ථාවරත්වය සැපයුම් කටයුතු සඳහා තවත් පීඩනයක් ඇති කළේය. ඒ අනුව ගුවන් සමාගමේ භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම්වලට බාධා ඇති වූ අතර කලාපීය සැපයුම් ජාලවල කාර්යසාධනය ද දුර්වල කළේය.

දේශීය වශයෙන්, ඉහළ යන මෙහෙයුම් පිරිවැය සහ ගුවන් යානා සීමා වීම ඇතුළු සැලකිය යුතු අභියෝග මධ්‍යයේ ජාත්‍යන්තර ගුවන් සමාගම් කිහිපයක් විසින් ශ්‍රී ලංකාවට නැවත පැමිණීම සහ සේවා පුළුල් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ගුවන් සේවයේ සමස්ත තත්ත්වය තවත් තරඟකාරී විය. එයාර්බස් A320/321 Neo ගුවන් යානාවල එන්ජින්වල ගැටලු හේතුවෙන් ලොව පුරා පියාසැරි අකර්මණ්‍ය විය. උපාංග හිඟය හේතුවෙන් අනිවාර්ය නඩත්තු කටයුතු ගෝලීය වශයෙන් ප්‍රමාද වීමෙන් මෙකී තත්ත්වය තවදුරටත් උග්‍ර විය. එමඟින් ගුවන් සමාගමේ ලබා ගත හැකි ගුවන් යානා ප්‍රමාණයද අවම විය. මෙම සීමා හේතුවෙන් ගුවන් ගමන්වල බාධා, එන්ජින් ආශ්‍රිත පිරිවැය ඉහළ යාම සහ ගුවන් සමාගමේ මුදල් තත්ත්වය අයහපත් වීම වැනි අහිතකර තත්ත්වයන් ඇති විය. මෙකී බාහිර බලපෑම් හමුවේ වූවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය මෙහෙයුම්වල අනුවර්තනය වීමේ හැකියාව, පාරිභෝගික සේවා විශිෂ්ටත්වය සහ මූල්‍ය විචක්ෂණභාවය පවත්වා ගැනීමට කටයුතු කළ හෙයින් එය තිරසාර ප්‍රකෘතියක් මෙන්ම දිගුකාලීන වර්ධනයක් වෙනුවෙන් පදනමක් සපයනු ලැබීය.

## තෘප්තිමත් කාර්ය සාධනය

අභියෝග මධ්‍යයේ වුවද 2024/25 මූල්‍ය වර්ෂයේදී, රුපියල් බිලියන 296.5ක ආදායමක් උපයා ගැනීමට ගුවන් සේවය සමත් වූ අතර, මෙහෙයුම් ලාභය (විනිමය ලාභ සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැය ගණනය කිරීමට පෙර) රුපියල් බිලියන 24.7ක් ලෙස සනිටුහන් විය. සැලසුම් නොකළ එන්ජින් අලුත්වැඩියා වියදම් රුපියල් බිලියන 2.2ක් සහ ශුද්ධ මූල්‍ය ගාස්තු රුපියල් බිලියන 31.6ක් ලෙස ගණනය කිරීමෙන් පසු රුපියල් බිලියන 7.6ක ශුද්ධ අලාභයක් ගුවන් සේවය වාර්තා කළේය.

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාමක් පෙන්නුම් කළ බැවින් විනිමය අනුපාතයේ බලපෑම, ධාරිතා සීමා වීම, ගෝලීය වශයෙන් ආදායම අඩුවීම හේතුවෙන් 2023/24 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2024/25 මූල්‍ය වර්ෂය තුළ මගී ආදායම 15% කින් පහත වැටුණි. ඊට ප්‍රතිවිරුද්ධ වෙමින්, භාණ්ඩ අංශය විසින් 2023/24 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ආදායමේ 2%ක වර්ධනයක් වාර්තා කළේය. ඉල්ලුමේ උච්චාවචනයන්, සෘතුමය වෙනස්කම්, ධාරිතාව සීමා කිරීම සහ ඉලක්කගත පාරිභෝගිකයින් යන කරුණු සැලකිල්ලට ගනිමින් විවිධත්වයෙන් යුතු මිලකරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමෙන් මෙකී වර්ධනය සාක්ෂාත් කර ගත හැකි විය. මෙම ප්‍රවේශයත් සමඟ ගුවන් සමාගමට ප්‍රවාහනය කරන ලද භාණ්ඩ කිලෝග්‍රෑමයකට ආදායම ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමට හැකි වූ අතර, සැපයුම් දාමයේ දුෂ්කරතා මධ්‍යයේ උපායමාර්ගික භාණ්ඩ ප්‍රවාහන අවස්ථා ශක්තිමත් කරනු ලැබීය. අනෙකුත් ආදායම් රුපියල් බිලියන 34.1ක් ලෙස 15%ක වර්ධනයක් සටහන් කරනු ලැබීය. ශ්‍රී ලංකාවට ක්‍රියාත්මක වන අනෙකුත් ගුවන් සමාගම් වෙත සපයන ලද භූමි හැසිරවීම සහ සහයක සේවා මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද අතර වෙළඳපොළේ යම් ශක්තිමත් ප්‍රකෘතිමත්භාවයක් පිළිබිඹු කරයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය මෙහෙයුම් කාර්ය සාධනය වර්ධනය කරලීමට දැඩි අවධානයක් යොමු කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් ගමන්වල පිටත්වීමේ සහ පැමිණීමේ කටයුතු නියමිත වේලාවට පවත්වා ගැනීමට හැකි විය. අත්‍යවශ්‍ය ධාරිතාවය යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රමුඛතා මාර්ගවල ගුවන්

සමාගමේ වෙළඳපළ පැවැත්ම ශක්තිමත් කිරීම සඳහා පදනම් වූ NEO ගුවන් යානා දෙකක් සාර්ථකව නැවත සේවයට පැමිණීම මෙකී දියුණුවේ පුරෝගාමීත්වය දරයි.

එමෙන්ම ගුවන් සමාගම විසින් ගුවන් සේවා මෙහෙයුම් සහ ගුවන් යානා භාවිතයේ සිට ගමන්මලු හැසිරවීම සහ භූමි සේවා දක්වා සියලුම මෙහෙයුම් කාර්යයන් හරහා දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් අනුගමනය කරන ලද්දේය. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය ක්‍රියා පටිපාටි ප්‍රමිතියකට අනුව පවත්වා ගැනීමට සහ තථ්‍ය කාලීන මෙහෙයුම් අධීක්ෂණය වැඩි දියුණු කිරීමට කටයුතු කරන හෙයින් පියාසැරි කාර්යක්ෂමව පවත්වා ගැනීමට සහ සේවාවේ පවතින බාධා අවම කිරීමට සමත් විය. එමෙන්ම එය මෙහෙයුම් විශ්වසනීයත්වය සහ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය පවත්වා ගනිමින් ශක්තිමත් කීර්ති නාමය පවත්වා ගැනීමට උපකාරී විය.

නිරන්තරයෙන් වෙනස් වන ගුවන් සේවා කර්මාන්තය තුළ කටයුතු කරමින් ඉදිරි සැලසුම්වලදී අපි තිරසාර වර්ධනය, මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ අපගේ මගීන්ට සහ කොටස්කරුවන්ට වටිනාකමක් අඛණ්ඩව ලබා දීම කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දෙන්නෙමු.

### පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම

සේවා විශිෂ්ටත්වය, ඩිජිටල් නවෝත්පාදනය සහ දත්ත මත පදනම් වූ අවබෝධය තුළින් මගී අත්දැකීම් ඉහළ නැංවීම සඳහා ස්ථිර කැපවීම අපගේ සංවර්ධන කටයුතුවල පදනමයි. වසර පුරාවටම ගුවන් සේවය විසින් පාරිභෝගිකයාගේ ගමන් කාලය පුරාවට පහසුව, සම්බන්ධතාවය සහ අන්තර් සම්බන්ධතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් වැදගත් මුලපිරීම් ක්‍රියාත්මක කරනු ලැබීය.

FlySmiLes විශ්වසනීයත්වය පිළිබඳ වැඩසටහන සඳහා විශේෂ වෙනස්කම් සිදු කළ අතර, වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් කාර්යක්ෂමතාව සහ පුළුල් පරිශීලක අත්දැකීම් ලබා දීමට අදහස් කරනු ලැබීය. පාරිභෝගිකයින්ට ඔවුන් උපයා ගත් ලකුණු වැය කිරීමට හැකිවන පරිදි වෙළඳ කටයුතු වෙනුවෙන් විශේෂ වෙබ් පිටුවක් හඳුන්වා දුන් අතර එමඟින් වැඩසටහනට තවත් වටිනාකමක් එක් කරනු ලැබීය. ඊට අනුග ාමීව, ගුවන් සමාගම විසින් පළමු වරට සිය වෙබ් අඩවිය සඳහා කෘත්‍රිම බුද්ධියෙන් ක්‍රියාත්මක වන චැට්බොට් ක්‍රමවේදයක් වන 'යානා' (YAANA) හඳුන්වා දෙනු ලැබීය. එමඟින් පාරිභෝගිකයින්ට ඕනෑම වේලාවක කිසිදු බාධාවකින් තොරව අන්තර්ජාලය හරහා සන්නිවේදනය කිරීමේ හැකියාව ලබා දී ඇත.

සංචාරක ක්ෂේත්‍රයේ වෙනස්වන රුචිකත්වයන් හඳුනා ගනිමින් ජංගම දුරකථන හරහා ලියාපදිංචි වීමට සහ භෞතිකව සම්බන්ධ වීම අවශ්‍ය නොවන පිවිසුම් ක්‍රියාවලියක් හඳුන්වා දෙනු ලැබිණ. එමඟින් රැඳී සිටීමේ කාලය සැලකිය යුතු ලෙස අවම කළ අතර මගීන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කරන ලදී. ගුවන් සේවය එහි ගුවන් ගමන්වලදී තෘප්තිමත් සේවයක් ලබා දෙනු පිණිස රැහැන් රහිත විනෝදාස්වාද පහසුකම් හඳුන්වා දුන් අතර සෙරන්ඩිබ් ලොන්ජ්හි උසස් සූපශාස්ත්‍ර අත්දැකීම් පවත්වා ගැනීමටද කටයුතු කරනු ලැබීය.

අපි මෙම වැඩිදියුණු කිරීම්වලදී පාරිභෝගික ප්‍රතිපෝෂණය වැදගත් කොට සලකන්නා සේම, ලියාපදිංචි වීම, භුවමාරු වීම්, ගමන්මලු හැසිරවීම සහ විවේකාගාර යනාදි ප්‍රධාන සේවා ක්ෂේත්‍රවල ශුද්ධ ප්‍රවර්ධක ලකුණු (NPS) ක්‍රියාකාරීව නිරීක්ෂණය කරන්නෙමු. මෙම අවබෝධයන් තථ්‍ය කාලීන වැඩිදියුණු කිරීම හඳුනා ගැනීමට උපකාරී වන අතර අපගේ පාරිභෝගිකයින් වෙනුවෙන් විශේෂ ස්ථානයක් ලබා දීමට උපකාරී වේ.

මෙම සංවර්ධන බොහොමයක් ගුවන් සමාගමේ මෙහෙයුම් පුරා ඩිජිටල් තාක්ෂණය පුළුල් ලෙස යොදා ගනිමින් සිදු විය. කෘත්‍රිම බුද්ධියෙන් ක්‍රියාත්මක වන තථ්‍ය කාලීන ආදායම් කළමනාකරණ පද්ධතියක් යොදා ගැනීම, iCargo වේදිකාව යොදා ගනිමින් භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීම සහ ස්වයං සේවා තාක්ෂණය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ඇතුළු විස්තර පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් අදාළ ප්‍රාග්ධන අංශවල දක්වා ඇත.

### උපායමාර්ගික ව්‍යාපාර ඒකකයේ (SBU) මෙහෙයුම් හි පූර්ණ සංවර්ධනයක් ඇති කිරීම

අපගේ සාමූහික කාර්ය සාධනය ඉහළ නැංවීමේදී ඉංජිනේරු, ගොඩබිම් හැසිරවීම පටන් ගුවන් සේවා විද්‍යාලය දක්වා උපායමාර්ගික ව්‍යාපාර ඒකකයේ (SBU) සෑම අංශයක් විසින්ම වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, පිරිවැය අවම කිරීම සහ මෙහෙයුම් අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා මෙකී කණ්ඩායම් එකමුතු වෙමින් සහයෝගීතාවය ලබා දුන්නේය.

ඉංජිනේරු අංශය ගුවන් යානා නඩත්තු යටිතල පහසුකම් සහ මෙහෙයුම්වල විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම අරමුණු කරගත් ආයෝජන අතරින් Swiss-AS සමාගමේ AMOS සහ Airbus Skywise වැනි කර්මාන්තයේ ප්‍රමුඛ නඩත්තු විසඳුම් ප්‍රධාන විය. මෙමඟින් සැලසුම් කිරීම, අධීක්ෂණය සහ දත්ත මත පදනම් වූ තීරණ උසස් මට්ටමින් පවත්වා ගැනීම ඔස්සේ ගුවන් සමාගමේ නඩත්තු මෙහෙයුම් පරිවර්තනය කිරීමට අපේක්ෂා කරයි. මෙම පද්ධති ගුවන් යානා ඇණිය පුරා අනුකූලතාව සහ නඩත්තු කාර්යක්ෂමතාව යහපත් මට්ටමකින් පවත්වා ගැනීමට සහය වේ.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා සමාගම සමඟ එක් වෙමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (BIA) යටිතල පහසුකම් සැලකිය යුතු මට්ටමින් වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. මේ සඳහා ගමන් මලු ධාවන තීරු දීර්ඝ කිරීම සහ මගී පිවිසුම් ද්වාර සංවර්ධනය කිරීම ඇතුළත් විය. මෙය ගුවන් යානා ගොඩබිම තුළ රැඳීම කාර්යක්ෂමව පවත්වා ගැනීමට මෙන්ම බාධා රහිත මගී ප්‍රවාහයක් සඳහා දායක විය. භුවමාරු සහ ප්‍රමුඛ මගීන් සඳහා සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් විවේකාගාර සහ භුවමාරු වීමට රැඳී සිටින ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ සිදු කරන ලද අතර, එමඟින් සමස්ත ගුවන්තොටුපළ අත්දැකීම් සහ පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කරන ලදී.

ශ්‍රී ලංකා ගුවන් සේවා පුහුණු විද්‍යාලය EASA Part 66 පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණුව සාර්ථකව ලබාදීමට අරමුණු කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ හවුල් වෙමින් කටයුතු කරනු ලබයි. එමෙන්ම උසස් ජාත්‍යන්තර පුහුණුවක් ලබා දීම අරමුණු කරමින් ගුවන් යානා නඩත්තු කටයුතු ඉංජිනේරු ඩිප්ලෝමාව හඳුන්වා දීම සඳහා ඕස්ට්‍රේලියානු ගුවන් සේවය සමඟ ද සහයෝගයෙන් කටයුතු කරනු ලැබිණ.

### සුවිශේෂිතා

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සේවා විශිෂ්ටත්වය, සන්නාම ශක්තිය සහ මෙහෙයුම් නායකත්වය වෙනුවෙන් සිය අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරමින් විශේෂ ඇගයීම් සහ කර්මාන්ත පිළිගැනීම් කිහිපයක් ලබා ගත්තේය. වසරේ කැපී පෙනෙන අවස්ථා කිහිපයක් ලෙස:

- APEX සම්මාන 2024 - මධ්‍යම/දකුණු ආසියාවේ හොඳම විනෝදාස්වාද සම්මානය
- දකුණු ආසියානු සංචාරක සම්මාන (SATA) 2024 - දකුණු ආසියාවේ ප්‍රමුඛතම ජාත්‍යන්තර ගුවන් සේවය
- PATA රන් සම්මාන 2024 - "අලෙවිකරණය - වාහකයා" ලෙස රන් සම්මානය
- ජාතික සැපයුම් සම්මාන 2024 - ගුවන් සේවා කාණ්ඩයේ රිදී සම්මානය ලබා ගන්නා ලදී.

### පාරිසරික කළමනාකරණය සහ අනුකූලතාව

පාරිසරික කාර්ය සාධනය යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් නිරන්තරයෙන් ප්‍රමුඛතාවයක්

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විවරණය තවදුරටත්.

ලබා දෙන අංශයකි. අපි ICAO හි CORSIA වැඩසටහන, එංගලන්තය සහ යුරෝපයේ විමෝචන වෙළඳ යෝජනා ක්‍රම සහ ජාතික පාරිසරික රෙගුලාසි වලට අනුකූලව, විමෝචන, අපද්‍රව්‍ය සහ සම්පත් භාවිතය කෙරෙහි දැඩි අධීක්ෂණ සහ සත්‍යාපන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත්තෙමු.

ජෛව විවිධත්ව සංරක්ෂණය යනු අපගේ පාරිසරික උපාය මාර්ගවල මූලික අවධානය යොමු වන්නකි. කාලයත් සමඟ අපගේ සහයෝගය පුළුල් කිරීමේ අරමුණින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ අපගේ සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට අපි කැපවී සිටිමු. නවෝත්පාදනය යොදා ගනිමින් අපි අපගේ තිරසාර අරමුණු ක්‍රියාත්මක කරන්නෙමු. 2025 වර්ෂයේ ශ්‍රී ලංකා නිර්මාණ උළෙලේදී ප්‍රදර්ශනය කරන ලද සම්මානලාභී 'මතක' ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය මඟින් පරිසරය සහ වෙළඳ නාමය අතර වටිනාකම් වී ආකාරයෙන්ම පවත්වා ගනිමින් පාරිසරික වගකීම සහ නිර්මාණාත්මක සැලසුම් අතර සංකලනය ඉස්මතු කරයි.

අපගේ ව්‍යාපාරික කැබින්වල සුවපහසුව පවත්වා ගැනීමේදී තිරසාරභාවය කෙරෙහිද අපි අවධානය යොමු කරන්නෙමු. එහිදී ප්‍රතිචක්‍රීකරණය කරන ලද PET ප්ලාස්ටික් (R-PET) භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද නව පරිසර හිතකාමී කොට්ට සහ හිස් ආවරණ (antimacassars) හඳුන්වා දී ඇත. මීට අමතරව, පුනර්ජනනීය නයිලෝන් වලින් සාදන ලද සැහැල්ලු කාපට් අදියර වශයෙන් ස්ථාපනය කිරීමට කටයුතු කරයි. මෙම කාපට් සමස්ත ගුවන් යානා බර අඩු කිරීමට උපකාරී වන අතර ඉන්ධන පරිභෝජනය අඩු කිරීමට දායක වේ. එසේම නව ද්‍රව්‍ය මත යැපීම අඩු කිරීමෙන් සහ පරිසරයෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් චක්‍රීය රටාවක් පවත්වා ගැනීමට සහය දක්වයි.

### ඉදිරි සැලසුම්: 2025/26 වර්ෂය සඳහා ප්‍රමුඛතා

අපි ඉදිරි වසර සඳහා සැලසුම් සකස් කිරීමේදී, ප්‍රධාන ප්‍රමුඛතා ලෙස මෙහෙයුම් ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම, ගුවන් යානා බලඇණියේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, ඉහළ ඉල්ලුමක් ඇති මාර්ගවල ධාරිතාව පුළුල් කිරීම සහ සමස්ත පාරිභෝගික අත්දැකීම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන්නෙමු. මූල්‍ය කාර්ය සාධනය අපගේ දිගුකාලීන පාරිසරික සහ සමාජ තිරසාර ඉලක්කවලට අනුගත වන බව සහතික කරමින්, ප්‍රාග්ධන රාමු හය කෙරෙහිද අවධානය යොමු කරමින් එය අපගේ මෙහෙයුම්වලට ඇතුළත් කිරීමට අපි කැපවී සිටිමු.

ඉහළ කාර්යක්ෂමතාවයක් අරමුණු කරමින්, අපි යටිතල පහසුකම් සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් සඳහා නිරන්තරයෙන් ආයෝජනය කරන්නෙමු. ප්‍රාග්ධන පිටතට ගලායාම කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, මෙහෙයුම් ආකාරයේ කොන්ත්‍රාත්තු හරහා අපි නව්‍ය මූල්‍යකරණ සැලසුම් ව්‍යුහගත කර ඇත. එමඟින් භාවිතය සමඟ ප්‍රතිලාභ උපයා ගනිමින් එක් එක් ව්‍යාපෘතියේ කාල සීමාව පුරා පිරිවැය යෙදෙන ආකාරයට සකස් කර ඇත.

ගුවන් යානා බදු දෙන්නන් සහ එන්ජින් නිෂ්පාදකයින් සමඟ අපගේ ශක්තිමත් හවුල්කාරිත්වයන් මෙම උත්සාහයන්ට මහත් සේ උපකාරී වී ඇත. විනිවිදභාවයෙන් යුතු මූල්‍ය සංවාදය සහ සහයෝගී සැලසුම් කිරීම හරහා, භාවිත කළ නොහැකි එන්ජින් අලුත්වැඩියා කිරීම සඳහා අපි බදු දෙන්නන්ගේ මූල්‍යකරණය සාර්ථකව ලබා ගත්තෙමු. මෙම ප්‍රධාන කොටස්කරුවෝ කල් දැමූ බේරුම්කරණ ගිවිසුම් සඳහා පහසුකම් සැලසීමෙන් ද්‍රවශීලතා සීමාවන් ලිහිල් කිරීම සම්බන්ධයෙන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. එමඟින් අපගේ මුදල් ප්‍රවාහ තත්ත්වය ශක්තිමත් කරමින්, ඉහළ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගනිමින් අපගේ මෙහෙයුම් අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ලබා දේ.

### ස්තුතිය

පසුගිය වසර ආවර්ජනය කරමින්, තවත් අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් තුළ අඛණ්ඩව විශ්වාසය හා සහයෝගය ලබා දුන් සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා රජය සහ අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට මම ගෞරවනීය ස්තුතිය පළ කර සිටිමි. 2022 ජනවාරි සිට 2025 මාර්තු දක්වා කාලය තුළ එහි ප්‍රධාන විධායක නිලධාරීතුමා ලෙස ගුවන් සේවයට නායකත්වය දුන් රිචඩ් නට්ටල් මහතා වෙත මම මගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

අපගේ පක්ෂපාතී ගනුදෙනුකරුවන් සිය අපේක්ෂා සපුරාලීමට නිරන්තරයෙන්ම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තෝරා ගැනීම මෙන්ම අපගේ හැකියාව කෙරෙහි විශ්වාසය තැබීම වෙනුවෙන් මම ස්තුතිය පළ කර සිටිමි. ඔබගේ නොසැලෙන අනුග්‍රහය ඉදිරි ගමනේ පදනම ලෙස පවතී.

මෙහෙයුම් පවත්වා ගැනීමට සහ ඉල්ලුම සපුරාලමින් අපගේ මගීන්ට වටිනාකමක් ලබා දීම සඳහා මා හැඟි වූ කැපවීමක් ලබා දුන් අපගේ කළමනාකරණ කණ්ඩායමේ සහ ශ්‍රීලංකන් පවුලේ සියලුම සේවකයින්ගේ කැපවීම සහ නම්‍යශීලී ගුණය මම ප්‍රශංසා කරමි.

ඉදිරිය දෙස බලන විට, ශ්‍රී ලංකාව ලෝකය සමඟ සම්බන්ධව සිටීම, එහි ප්‍රවේශය පුළුල් කිරීම; එමඟින් ජාතික ආර්ථිකයේ ප්‍රතිසාධනයට සහය වීම සහ වර්ධනය හා සංවර්ධනය සඳහා වැඩි අවස්ථාවක් ලබා දීම සහතික කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නිරන්තරයෙන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

**යසන්ත දිසානායක**
*වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී සහ සමූහයේ මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 1. සරත් ගනේගොඩ මහතා

සරත් ගනේගොඩ මහතා 2024 ඔක්තෝබර් 9 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර, පසුව ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ඔහු හේලීස් පීඑල්සී හි සමූහ විධායක අධ්‍යක්ෂවරයා වන අතර, 2007 ජූලි මාසයේ දී සමූහ කළමනාකරණ කමිටුවට පත් කරන ලද අතර එමගින් 2009 සැප්තැම්බර් මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධන ඒකකය සහ සමූහයේ තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා වගකීම ඔහු දරයි. ඔහු 2020 ඔක්තෝබර් මාසයේ දී ඇලුමෙක්ස් පීඑල්සී හි නියෝජ්‍ය සභාපති ලෙස පත්විය. ඔහු යුනිසිස්ට් ඉංජිනියරින් පීඑල්සී, ඩිප් ප්‍රොඩක්ට්ස් පීඑල්සී, හේකාර්බ් පීඑල්සී, හේලීස් ෆැබ්රික් පීඑල්සී, හේලීස් ෆයිබර් පීඑල්සී, කැලණිවැලි ප්ලාන්ටේෂන් පීඑල්සී, සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී, කිංග්ස්බරි පීඑල්සී, හොරණ ප්ලාන්ටේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරයි. පසුව, ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි විශාල පෞද්ගලික අංශයේ ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයක් දැරීය.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හි සාමාජිකයෙකු මෙන්ම ඕස්ට්‍රේලියාවේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ද සාමාජිකයෙකු ද වන්නේය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධියක් දරයි.

## 2. ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා

ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා 2023 මාර්තු 16 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු අධ්‍යක්ෂවරයෙකු සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයෙකු ලෙසත්, සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුවේ සහ සමූහයේ අවදානම් කමිටුවේ සභාපති ලෙසත් සමාගම හා පරිපාලිතයේ මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේද, විගණන කමිටුවේ සහ මණ්ඩල ආචාරධර්ම කමිටුවේ සාමාජිකයෙකු ලෙසද සේවය කරයි.

අරන්දර මහතා වෘත්තියෙන් නීතීඥවරයෙකු වන අතර මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි.

ඔහු සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් (සේවා) සමාගමේ සභාපති වේ.

## 3. රොහාන් ගුණතිලක මහතා

රොහාන් ගුණතිලක මහතා 2024 ඔක්තෝබර් 9 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සභාපතිවරයා වන අතර, සමාගමේ සහ පරිපාලිතයේ විගණන කමිටුවේ සාමාජිකයෙකි.

රොහාන් ගුණතිලක මහතා හේලීස් සමූහයේ රෙදිපිළි අංශයේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීවරයා වේ. 2013 මාර්තු මාසයේ දී සම්බන්ධ වූ හේලීස් ෆැබ්රික් පීඑල්සී සමාගමේ සහ 2021 දී හේලීස් ෆැබ්‍රික් පීඑල්සී විසින් අත්පත් කරගන්නා ලද සවුත් ඒෂියා ටෙක්ස්ටයිල්ස් සමාගමේ ප්‍රධානියා ලෙසද ඔහු කටයුතු කරයි. හේලීස් ෆැබ්‍රික් පීඑල්සී සමඟ සම්බන්ධ වීමට ප්‍රථම, ගුණතිලක මහතා බ්‍රැන්ඩික්ස් එක්ස්ප්‍රෙෂන්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයා ලෙස සේවය කළ අතර, 2011 ජනවාරි මාසයේ දී බ්‍රැන්ඩික්ස් ලංකා සමාගමේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන සී එල් ටී ඇපරල් (ඉන්දියා) (පුද්.) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු ටෙක්ස්වර්ඩ් ජර්සි ලංකා (පුද්.) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, මාස් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට අනුබද්ධිත ලීනියා ක්ලෝතින් (පුද්ගලික) සමාගමේ සහ ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද සේවය කළේය. ඔහු හේලීස් ෆැබ්රික් සොලියුෂන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කරයි.

ඔහු එක්සත් රාජධානියේ උසස් අධ්‍යාපනය ලැබූ අතර, උපාධිධාරී ඉංජිනේරුවෙකු ලෙස සුදුසුකම් ලබා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇත.

## 4. Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා

Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා 2024 ඔක්තෝබර් 9 වන දින සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර, පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු සමාගමේ සහ පරිපාලිතයේ විගණන කමිටුවේ මෙන්ම මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයෙකු වේ.

ඔහු ආගන්තුක සත්කාර සහ කාර්මික ආහාර සැපයුම් අංශවල වසර 45 කට වැඩි අත්දැකීම් සහිත පළපුරුදු වෘත්තිකයෙකු වන අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කීර්තිමත් හමුදා වෘත්තියකින් ද යුතු වේ. විශ්‍රාමික ගුවන් ලුතිනන්වරයෙකු වන ඔහු, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් හමුදා, ආයතනික සහ තරු පන්තියේ හෝටල් පරිසරයන් හරහා ආහාර සැපයුම් මෙහෙයුම් සංවිධානය කිරීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

ඔහු වර්තමානයේ ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් හි සභාපතිවරයා ලෙස සේවය කරන අතර සංචාරක හා ගුවන් සේවා අංශ සඳහා ඔහුගේ නායකත්වය සහ විශේෂඥතාව ලබාදෙයි.

ඔහු ලංකා හෝටල් පාසලෙන් (වර්තමානයේ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය) හෝටල් සහ ආහාර සැපයුම් කළමනාකරණය පිළිබඳ සිව් අවුරුදු කළමනාකරණ ඩිප්ලෝමාවක් ලබා ඇති අතර එක්සත් රාජධානිය, හවායි, ඕස්ට්‍රේලියාව, ජපානය සහ තවත් රටවල් කිහිපයක ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණුවක් ලබා ඇත. ඔහුගේ පුළුල් අත්දැකීම් අතරට අරලිය ග්‍රීන් හිල්ස් හෝටලයේ සහ රන්දෝලි සුඛෝපභෝගී නිකේතනයේ ප්‍රධාන කළමනාකරු, සාමා රිට්‍රීට් හි නේවාසික කළමනාකරු සහ ඩීමෝ 800 හි පරිශ්‍ර කළමනාකරු වැනි ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් ඇතුළත් වේ. ඔහු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි හෝටල්

# අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත්.

පූර්ව විවෘත කිරීමේ ව්‍යාපෘති රැසකට ද සම්බන්ධ වී ඇත.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කළ කාලය තුළ දී ඔහු මාණ්ඩලික නිලධාරී - ආහාර සැපයුම්, භෝජනාගාර කළමනාකරු, අතිවිශේෂ ප්‍රභූ/ ප්‍රභූ ගුවන් සේවා කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ඉවුම් පිහුම් සහ ආපනශාලා සේවය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ඇතුළු විවිධ තනතුරුවල සේවය කළේය. ඔහු ගුවන් හමුදා ආහාර සැපයුම් පද්ධති නවීකරණය කිරීමට සහ ගුවන් හමුදා සූපශාස්ත්‍ර කණ්ඩායම පිහිටුවීමට දායක විය.

ඔහුගේ දායකත්වයන් “Trip Advisor Excellence Award”, “ග්‍රීන් හොටෙල්” සම්මානය (අඛණ්ඩව) සහ රන්දෝලි සුඛෝපභෝගී නිකේතනය සඳහා “ආහාර සනීපාරක්ෂාව සඳහා කිරුළ” ඇතුළු බහුවිධ සම්මාන මගින් ඇගයීමට ලක්ව ඇත.

ඔහු ලංකා හෝටල් පාසල් උපාධිධාරී සංගමයේ සහ එක්සත් රාජධානියේ ආගන්තුක සත්කාර ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ගෝලීය ආහාර පිසීමේ සහ ආගන්තුක සත්කාර සම්මන්ත්‍රණ ගණනාවකට ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා මුක්ත භට සංගමයේ සභාපති, ආගන්තුක සත්කාර ආයතනයේ (ශ්‍රී ලංකා ජාත්‍යන්තර ශාඛාවේ) ලේකම්, වෘත්තීය සංගම් සංවිධානයේ සහකාර ලේකම් සහ කැලණිය රොටරි සමාජයේ සහ ඩීමෝ ටෝස්ට්මාස්ටර්ස් සමාජයේ හිටපු සභාපති ඇතුළු ප්‍රජා නායකත්ව තනතුරු කිහිපයක් ද දරා ඇත.

## 5. විපුල ගුණතිලක මහතා

විපුල ගුණතිලක මහතා 2024 ඔක්තෝබර් මස 14 වන දින සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු විගණන කමිටුවේ සභාපතිවරයා ද, සමාගමේ සහ පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලීය සමූහ අවදානම් කමිටුවේ සහ සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුවේ සාමාජිකයෙකු ද වේ.

ගුණතිලක මහතා ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයෙකු ලෙස ගුවන් සේවා කළමනාකරණය පිළිබඳ පෘථුල දැනුමක් සහ දුෂ්කර කාලයන්හි ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරයන් හැසිරවීම මඟින් අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියයි.

ඔහු වර්තමානයේ දී උපායමාර්ග, ගුවන් සේවා ආරම්භක කටයුතු, ගුවන් යානා අත්පත් කර ගැනීම, මූල්‍ය කළමනාකරණය, ආදායම් සහ පිරිවැය ප්‍රශස්තිකරණ උපාය මාර්ග පිළිබඳව උපදෙස් දෙයි.

ඔහු 2022 මාර්තු සිට 2023 අගෝස්තු දක්වා ඉන්දියාවේ 2 වන විශාලතම ගුවන් සේවය නැවත දියත් කිරීමේදී ජෙට් එයාර්වේස් (ඉන්දියාව) හි ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස කටයුතු කළේය. ගුවන් යානා අත්පත් කර ගැනීම් සාකච්ඡා කිරීම, ගුවන් යානා මූල්‍ය ව්‍යුහගත කිරීම, තොරතුරු තාක්ෂණ පද්ධති ඇගයීම/ක්‍රියාත්මක කිරීම සහ නව ගුවන් ක්‍රියාකරු සහතිකයට අදාළ කාර්යයන් සඳහා ඔහු වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

ඔහු 2018 අගෝස්තු සිට 2022 ජනවාරි දක්වා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ප්‍රධාන විධායක නිලධාරී තනතුර දැරූ අතර ගෝලීය වසංගතය අතරතුර ජාතික ගුවන් සේවය සාර්ථකව මෙහෙයවමින් පිරිවැය තාර්කිකකරණය, ප්‍රධාන කාර්ය සාධන දර්ශක මෙහෙයුම් වැඩිදියුණු කිරීම, වාණිජ හා පාරිභෝගික සේවා කාර්යයන් ස්වයංක්‍රීයකරණය වැඩි දියුණු කිරීම පිළිබඳ මුලපිරීම් සාර්ථකව ක්‍රියාත්මක කළේය. ඔහුගේ ධුර කාලය තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම 2019 වර්ෂයේදී දෙවරක් World’s Most Punctual Airline, World’s Leading Airline to the Indian Ocean iy Four-Star Major Airline (2018 – 2021) වැනි කීර්තිමත් සම්මාන සහ ඇගයීම් දිනා ගත්තේය. ලොව ප්‍රමුඛතම ගුවන් සේවා සමාගම් අතර 2020 CondeNast Traveler, Readers’ Choice සම්මාන උළෙලේ දී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 6වෙන ස්ථානයට පත් විය.

2021 අවසාන කාර්තුව තුළ ගෝලීය වසංගත තත්ත්වයෙන් වේගයෙන් යථා තත්ත්වයට පත් වී ලාභදායක තත්ත්වයට නැවත අත්කර ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට හැකියාව ලබා දුන් ප්‍රධාන දිගැදුම් වෙළඳපොළවල් කිහිපයක් නැවත දියත් කිරීමට සහ ජාලය පුළුල් කිරීමට ඔහු දායක විය.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි බැඳීමට පෙර, ඔහු 2015 නොවැම්බර් සිට 2018 ජූලි දක්වා එමිරේට්ස් ගුවන් සේවයේ කළමනාකාරිත්වය යටතේ TAAG ඇන්ගෙ ්ලා ගුවන් සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ විධායක අධ්‍යක්ෂවරයා විය. බටහිර අප්‍රිකාවේ ගුවන් සේවා මධ්‍යස්ථානයක් ලෙස ඇන්ගෝලාව ස්ථානගත කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙන්, නව ආදායම් මාර්ග නිර්මාණය කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ පිරිවැය අවම කිරීම සඳහා පියවර ගැනීම මගින් අලාභ ලබන ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැදගත් කාර්යභාරයක් ඔහු ඉටු කළේය.

ඔහු 2005 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා එමිරේට්ස් ගුවන් සමාගමේ කළමනාකාරිත්වය යටතේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර දැරූ අතර එමිරේට්ස් වෙතින් ශ්‍රී ලංකා රජයට කළමනාකාරිත්වය මාරුවීමේ දී බාධාවකින් තොරව මාරු වීම සහතික කිරීම සඳහා වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

## 6. දුමිත් ප්‍රනාන්දු මහතා

දුමිත් ප්‍රනාන්දු මහතා 2024 ඔක්තෝබර් මස 24 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු සමාග මේ සහ ඊට අනුබද්ධිත ආයතනයේ විගණන කමිටුවේ, අධ්‍යක්ෂ මණ්ඩලීය සමූහ අවදානම් කමිටුවේ සහ සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුවේ ද මණ්ඩල ආචාරධර්ම කමිටුවේද සාමාජිකයෙකු වේ.

දුමිත් ප්‍රනාන්දු මහතාට ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළෙහි වසර 30 ක පළපුරුද්දක් ඇත. පසුගිය වසර 10 තුළ ඔහු ජාත්‍යන්තර සහ දේශීය සේවාදායකයින්ට ආයතනික මූල්‍ය උපදේශන, පර්යේෂණ, කොටස් තැරැව්කාර සහ ධන කළමනාකරණ සේවා සපයන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ස්වාධීන ආයෝජන බැංකුවක් වන Asia Securities හි සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත. ඔහු 2020-2022 දක්වා කොළඹ කොටස් වෙළඳපොලේ සභාපතිවරයා වූවේය.

2013 තෙක් ඔහු හොංකොං හි පිහිටි Credit Suisse Asia Pacific හි සමූහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය. ඊට සම්බන්ධ වීමට පෙර ඔහු නිව්යෝර්ක් සහ හොංකොං හි එක්සත් ජනපද බැංකු සමාගමක් වන JPMorgan Chase හි විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ අතර, එහිදී ඔහු ආයතනික උපායමාර්ග, ආයෝජන බැංකුකරණය, කොටස් සහ පුද්ගලික කොටස් යන අංශවල භූමිකාවන් ඉටු කළේය.

ඔහු යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී හි ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි.

ඔහු ශ්‍රී ලංකාවෙන් ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කළ අතර ඇමරිකා එක්සත් ජනපදයේ මිඩ්ල්බරි කොලේජ් මගින් භෞතික විද්‍යාව සහ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියක් සහ හාවඩ් ව්‍යාපාරික පාසලෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තේය.

## 7. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා

ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල්, 2024 ඔක්තෝබර් මස 24 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු මණ්ඩල ආචාරධර්ම කමිටුවේ සභාපතිවරයා වන අතර සමාගමේ සහ පරිපාලිතයේ මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයෙකු වේ.

ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල්, සමාගම් නීතිය, බුද්ධිමය දේපළ නීතිය, වාණිජ නීතිය, බේරුම්කරණය, සුරැකුම්පත් නීතිය සහ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ වසර 38 කට වැඩි නෛතික කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකාවේ ජනාධිපති නීතිඥවරයෙකි. ඔහු වාණිජ මහාධිකරණවල සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිට ඇති අතර 1995 අංක 11 දරන බේරුම්කරණ පනත, 2007 අංක 7 දරන සමාගම් පනත සහ බුද්ධිමය දේපළ පනත ඇතුළු ප්‍රධාන නීති කෙටුම්පත් කිරීමේදී මූලික විය.

ඔහු පැරිසියේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයෙහි ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ සාමාජිකයෙකු ලෙස වසර හයක් සේවය කළ අතර දැනට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සහ ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව ඇතුළු උපදේශන සහ පාලන භූමිකාවන් කිහිපයක් දරයි.

ඔහු ටෝකියෝ සිමෙන්ති සමූහයේ සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිවරයා ලෙසත්, හේලීස් පීඑල්සී, ඩිමෝ පීඑල්සී, ඇලුමෙක්ස් පීඑල්සී, සෙලින්කෝ ලයිෆ් සහ චෙව්රොන් ලුබ්‍රිකන්ට්ස් ලංකා පීඑල්සී ඇතුළු ප්‍රමුඛ සමාගම් කිහිපයක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙසත් සේවය කරයි. ඔහු විගණනය, පාලනය, පාරිශ්‍රමික සහ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කමිටු ඇතුළු විවිධ අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටුවල සේවය කරන අතර ඒවායේ සභාපතිත්වය දරයි.

ආචාර්ය කබ්රාල් මහතා විශ්ව විද්‍යාල කිහිපයක ජ්‍යෙෂ්ඨ බාහිර කථිකාචාර්යවරයෙකු වන අතර ආයතනික සහ බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ ප්‍රකාශන කිහිපයක් රචනා කර ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ කැන්බරා විශ්ව විද්‍යාලයෙන් ආයතනික නීතිය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇති අතර, වරලත් පාලන ආයතනයේ (එක්සත් රාජධානිය සහ ඊශ්‍රායලය) සාමාජිකයෙකි.

## 8. සෙනරත් ඩී. ලියනගේ මහතා

සෙනරත් ඩී. ලියනගේ මහතා, 2024 දෙසැම්බර් 12 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු සමාගමේ විගණන කමිටුවේ සහ සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුවේ සාමාජිකයෙකි.

ඔහු ගුවන් සේවයේ නීති කටයුතු, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන ප්‍රතිපත්ති සහ නියාමන කටයුතු පිළිබඳ දශක තුනකට අධික පළපුරුද්දක් සහිත දක්ෂ නීති වෘත්තිකයෙකි. ඔහු කැනඩාවේ මැක්ගිල් විශ්ව විද්‍යාලයෙන් ගුවන් සහ අභ්‍යවකාශ නීතිය පිළිබඳ LLM උපාධියක් ලබා ඇති අතර, එංගලන්තයේ සහ වේල්ස් හි සොලිසිටර්වරයෙකු ලෙස සහ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස සුදුසුකම් ලබා ඇත.

ඔහු දැනට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ගුවන් නීති උපදේශකයෙකු ලෙස සේවයේ නියැලෙයි. එහිදී ජාත්‍යන්තර ගුවන් සේවා නීතිය, ගුවන් සේවා මෙහෙයුම් සහ එක්සත් ජනපදයේ ITAR සහ අපනයන පාලන රෙගුලාසි ඇතුළු හමුදා ගුවන් සේවා අනුකූලතා කරුණු පිළිබඳව උපදෙස් ලබා දෙයි. ලියනගේ මහතා 1980 වර්ෂයේදී එයාර් ලංකා හි ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ගුවන් සේවායේ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

මීට පෙර, ලියනගේ මහතා එතිහාඩ් එයාර්වේස් හි නීති කටයුතු සහ සාමාන්‍ය උපදේශන කටයුතු පිළිබඳ උප සභාපති ලෙස සේවය කළේය. එහි ආරම්භයේ පටන් වසර 15 කට වැඩි කාලයක් සේවයේ නියැලෙමින් ගුවන් සමාගමේ නීති රාමුව ස්ථාපිත කිරීමට සහ එහි ආරම්භක වසරවලදී සියලුම නෛතික, නියාමන සහ පාලන කටයුතු අධීක්ෂණය කිරීමට දායක විය. ඊට පෙර ඔහු එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ෆෙඩරල් සන්නිවේදන අමාත්‍යාංශයේ ගුවන් ප්‍රවාහන කටයුතු උපදේශක ලෙස සේවය කළේය. එහිදී ඔහු එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජාතික වෘත්තිය වෙනුවෙන් ද්විපාර්ශ්වික සාකච්ඡාවලට සම්බන්ධ වූ අතර ICAO සහ IATA වැනි ජාත්‍යන්තර සංසදවලදී එක්සත් අරාබි එමීර් රාජ්‍යය නියෝජනය කළේය.

ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අත්දැකීම් බහුලත්වය පෙරදැරි කරගනිමින්, ඔහු ප්‍රධාන ගෝලීය ගුවන් සේවා සම්මන්ත්‍රණවලදී ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය නියෝජනය කළේය. ඔහු විසින් 1999 වසරේ මොන්ට්‍රියල් සම්මුතිය සහ 2001 වසරේ කේප්ටවුන් සම්මුතිය සඳහා අත්සන් තබා ඇත.

ශ්‍රී ලංකාවේදී, ලියනගේ මහතා අපරාධ සහ සිවිල් නඩු කටයුතු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥවරයෙකු ලෙස සේවය කළේය. එමෙන්ම ඔහුව ප්‍රධාන ගුවන් සේවා නීති කෙටුම්පත් කිරීම ඇතුළු නියාමන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවට සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට උපදෙස් දීම සඳහා අනුයුක්ත කොට ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

**1. යසන්ත දිසානායක මහතා**
*වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරී සහ සමූහයේ මූල්‍ය කළමනාකාරණ ප්‍රධානී*

යසන්ත දිසානායක මහතා 2004 වර්ෂයේදී ගුවන් සමාගමට සම්බන්ධ වූ අතර, වර්තමානයේදී සමූහයේ මූල්‍ය කළමනාකරණ ප්‍රධානී තනතුර (GCFO) හොබවමින් සංවිධානයට අවැසි දූරදර්ශී නායකත්වය සහ මූල්‍ය කළමනාකරණ දැනුම ලබා දෙයි. සමූහයේ මූල්‍ය කළමනාකරණ ප්‍රධානී තනතුරේ වගකීම්වලට අමතරව ඔහු විසින් සමාගමේ මූල්‍ය හා වාණිජමය ප්‍රසම්පාදන, ලොජිස්ටික්ස් සහ දේපළ අංශ අධීක්ෂණය කිරීමේ වගකීම් දරයි. දිසානායක මහතා 2025 මාර්තු මාසයේදී වැඩ බලන විධායක නිලධාරී ලෙස පත්වන ලදී.

ඔහු ආසියානු කලාපීය සම්මාන දෙකකින් පිළිගැනීමට ලක් වූ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ඉස්ලාමීය මූල්‍යකරණ පහසුකම් ඇතුළු සමාගමේ පුරෝගාමී මූල්‍ය ගනුදෙනු රාශියකට නායකත්වය ලබා දී ඇත.

එමෙන්ම ඔහු නව A330-300 ගුවන් යානා ඇණියවල මිලදී ගැනීමට පූර්ව කෙරෙන ගනුදෙනුවල මූල්‍යකරණ කටයුතු (PDP) සම්බන්ධයෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කරන ලද අතර, එම ගනුදෙනුව 2014දී " එයාර්ෆයිනෑන්ස්" සඟරාව මගින් "වසරේ පූර්ව ලබාදීම් මූල්‍යකරණ ගනුදෙනුව" වශයෙන් ඇගයුමට පාත්‍ර විය.

සමාගමට සම්බන්ධ වීමට පෙරාතුව, දිසානායක මහතා ආයෝජන බැංකුකරණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍රහි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් දැරුවේය. හෙතෙම, වෘත්තියෙන් ගණකාධිකාරිවරයකු (එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයෙහි අධි සාමාජිකයකු) වන අතර, කාර්ඩිෆ්හි වේල්ස් සරසවියේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියෙකු වේ.

**2. ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
*සමූහයේ ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

ඩැල්රින් තිරුකුමාර් මහත්මිය 2013 වසරේදී එයාර්ලයින්ස් සමාගමට සම්බන්ධ වූවාය. ඇය සමූහයේ සමාගම් ලේකම්වරිය සහ ආයතනික ලේකම් සේවා ප්‍රධානී වශයෙන් කටයුතු කරයි. එම අංශය මඟින් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් පෞද්ගලික සමාගම වෙත ආයතනික ලේකම් සේවා සපයනු ලබයි. ඇය සමාගමේ සහ එහි පරිපාලිතයේ විගණන කමිටුව, මානව සම්පත් සහ වේතන කමිටුව සහ ආයතනික අවදානම් කළමනාකරණ කමිටුව සහ අදාළ පාර්ශව සමාලෝචන කමිටුව යන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු සඳහා ලේකම්වරිය ලෙස කටයුතු කරයි. ඇය "ශ්‍රීලංකන් කෙයාර්ස් ට්‍රස්ට්" භාරයේ භාරකාරිනියකි.

ඇය සමාගමේ ලේකම් ධූරයේ වසර 27කට වැඩි කාලයක පශ්චාත් සුදුසුකම් දරා ඇති අතර, ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත විවිධාංගීකරණය වූ සමාගම්හි ඉතා ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවා ඇත. ඇය එක්සත් රාජධානියේ සහ අයර්ලන්තයේ වරලත් ලේකම්වරුන් සහ පරිපාලකයින්ගේ ආයතනයේ සාමාජිකාවක වන අතර ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිධාරිනියක වේ. ඇය ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජිකාවක වන අතර, එම ආයතනය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරුන්ගේ සංසදයේ ක්‍රියාකාරී කමිටුවේ සක්‍රීය සාමාජිකාවක ලෙසද කටයුතු කරයි.

**3. කැප්ටන් පැට්රික් ප්‍රනාන්දු මහතා**
*ප්‍රධාන තාක්ෂණික නිලධාරී සහ ගුවන් මෙහෙයුම් ප්‍රධානී*

ශ්‍රීලංකන් සමාගම, එයාර් ලංකා නමින් හැඳින්වූ කාලයේ, 1992 වසරේදී කැප්ටන් පැට්රික් මහතා L-1011 කණ්ඩායමේ කැඩෙට් නියමුවරයෙකු ලෙස එහි සේවයට බැඳුණේය. ඔහු දශක දෙකකට වැඩි කාලයක් උපදේශක කටයුතුවල අත්දැකීම් ලබමින්, වසර ගණනාවක් පුරා L-1011, A320, A330, සහ A340 යන ගුවන් යානාහි ගුවන් නියමුවෙකු ලෙස කටයුතු කළේය. පියාසැරි රාජකාරීවලට අමතරව, වසර 15 කට වැඩි කාලයක් උපදේශකවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) සඳහා නියම කළ පිරික්සුම් නියමුවරයෙකුද වේ.

නියෝජ්‍ය නියමුවෙකු ලෙස කටයුතු කළ ඔහු ප්‍රධාන නියමු - පුහුණු සහ ප්‍රමිති ලෙස තනතුරු දරමින් 2011 වසරේදී නායකත්ව භූමිකාවේ පත්වීම් දැරුවේය. වර්තමානයේ ඔහු A320/A330 බලඇණියේ අණදෙන නිලධාරියෙකු ලෙස කටයුතු කරන්නේය.

එමෙන්ම, ඔහු ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි වැඩබලන වගකිවයුතු කළමනාකරු ලෙසත්, ප්‍රධාන තාක්ෂණික නිලධාරී සහ ගුවන් මෙහෙයුම් ප්‍රධානී ලෙසත් වර්තමානයේ කටයුතු කරනු ලබන්නේය.

**4. චාමර පෙරේරා මහතා**
*සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රධානී*

චාමර පෙරේරා මහතා දශක දෙකක කාලයක් පුරා ගුවන් යානා තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් විශේෂඥතායක් දක්වනු ලබන ගුවන් සේවා ක්ෂේත්‍රයේ පළපුරුදු ලත් වෘත්තිකයෙකි. 1999 වර්ෂයේදී ගුවන් සේවා ක්ෂේත්‍රයට එක්වූ පෙරේරා මහතා තොරතුරු තාකෂණ ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රායෝගික දැනුමෙන් පිරි අයෙකු වේ. වසර ගණනාවක් පුරා ඔහු විසින් කළමනාකරණ තනතුරු කිහිපයක් දරා ඇති අතර 2012 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ ප්‍රධානියා ලෙසත්, ඉන් පසුව තොරතුරු තාක්ෂණය පිළිබඳ සමූහයේ ප්‍රධානියා ලෙසත් කටයුතු කරමින් සමූහයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සැලසුම් සහ මෙහෙයුම් අධීක්ෂණය කරනු ලැබුවේය.

පෙරේරා මහතා සිය සේවා කාලය පුරාම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමූහය ඩිජිටල්කරණය කිරීමටත්, තාක්ෂණික නවෝත්පාදන සිදු කිරීමටත් මූලික වී කටයුතු කරනු ලැබුවේය. ඔහුගේ නායකත්වය යටතේ ගුවන් සේවා කටයුතුවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහ ඩිජිටල් පරිසර පද්ධතියේ සුවිශේෂි පෙරළියක් ඇති විය; මෙහෙයුම් අඛණ්ඩතාවය සඳහා අවශ්‍ය වන මෙහෙවර තීරණාත්මක පද්ධතියේ ක්‍රියාකාරීත්වය වෙනුවෙන් සහය දක්වමින් බිම් මට්ටමේ මෙහෙයුම් සිට ගුවන් යානා දක්වා සියල්ල ආවරණය වන පරිදි සම්බන්ධතාවය ශක්තිමත් කරනු ලැබිණ.

ඔහු ගෝලීය ගුවන් සේවා ප්‍රවණතාවලට අනුකූලව කඩිනම් සංචාරක තාකෂණ විසඳුම් හඳුන්වා දෙමින් IATA ව්‍යාපාරය සරල කිරීමේ වැඩසටහනට (StB) අනුගතවීම ඇතුළුව, මගී කේන්ද්‍රීය සේවා ඉහළ නැංවීම අරමුණු කරගත් විවිධ මුලපිරීම් වෙනුවෙන් මූලිකත්වය ගෙන කටයුතු කළේය. ඔහු උසස් තොරතුරු තාක්ෂණයක් මූලික වූ පාලනයක් ගෙන ඒමට කැපවූ හෙයින් එයාර්ලයින්ස් සමාග මට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවීමට එනම් ISO/IEC 27001:2013 - තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, ISO 9001:2015 - මෘදුකාංග තත්ත්ව කළමනාකරණය, ISO/IEC 20000:2018 - තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය සහ ISO/IEC 27701:2019 – රහස්‍යතා තොරතුරු කළමනාකරණය පිළිබඳ සහතික ලබා ගැනීමට හැකි විය.

පෙරේරා මහතා විසින් පෙර පැවති මිල අධික ක්‍රමවේදය සිට කඩිනම්, අඩු වියදම් යෙදවුම් දක්වා සාර්ථකව පරිවර්තනය වීමට වෙනස්කම් සිදු කළ අතර, ඒ ඔස්සේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය තාර්කිකකරණය සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඔහු විසින් අභ්‍යන්තරව සංවර්ධනය කළ විසඳුම් සඳහා ජාතික හා ජාත්‍යන්තර සම්මාන හිමි වී ඇත. අනාගත අවශ්‍යතා සපුරාලීමට සහ එයාර්ලයින්ස්හි වර්ධන අභිලාෂයන්ට සහය වීමට හැකියාව ඇති කල්පවත්නා, ශක්තිමත් තාක්ෂණික පද්ධතියක් සංවර්ධනය කිරීමට ඔහු පෙරමුණ ගත්තේය. දත්ත පදනම් කරගත් සැලසුම්, පාරිභෝගික සම්බන්ධතාවය වර්ධනය, මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වර්ධනය සහ ආදායම් උත්පාදනය වර්ධනය කිරීම ආදිය අරමුණු කරගනිමින් ඔහු විද්‍යුත් ව්‍යාපාර සහ ඩිජිටල් සේවා සහ කෘත්‍රිම බුද්ධිය (AI) සහ ස්වයං පරිගණක අධ්‍යනය (ML) වැනි උසස් තාක්ෂණය පෙරදැරි කරගත් අති නවීන ඩිජිටල් වේදිකාවක් ගොඩනැංවීමෙහිලා මූලිකත්වය ගෙන කටයුතු කළේය.

පෙරේරා මහතා ලයිස්ටර් විශ්ව විද්‍යාලයේ (එක්සත් රාජධානියේ) තොරතුරු තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා ඇති ඔහු වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකි. එමෙන්ම ඔහු තොරතුරු තාක්ෂණ විශේෂීකරණයන්ට අදාළ වෘත්තීය සුදුසුකම්, සහතිකපත් සහ ජාත්‍යන්තර ආයතනවල පිළිගැනීම ලබා ඇත.

**5. දිමුතු තෙන්නකෝන් මහතා**
*වාණිජ කටයුතු ප්‍රධානී*

දිමුතු තෙන්නකෝන් මහතා ගුවන් සේවා අලෙවිය, මූල්‍ය කළමනාකරණය, ආදායම් කළමනාකරණය සහ වාණිජ සැලසුම් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති ගුවන් සේවා ක්ෂේත්‍රයේ දශක තුනක අත්දැකීම්වලින් පිරි අයෙකි. ඔහු 2017 වසරේ පටන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි ලෝක ව්‍යාප්ත විකුණුම් සහ බෙදාහැරීමේ ප්‍රධානියා ලෙස කටයුතු කළ අතර 2025 වර්ෂයේදී වාණිජ කටයුතු ප්‍රධානී ලෙස තනතුරේ උසස්වීමක් ලැබුවේය. වර්තමානයේ ඔහු ගුවන් සමාගමේ ලෝක ව්‍යාප්ත මගී විකුණුම් සහ බෙදාහැරීමේ, ආදායම් කළමනාකරණය සහ සැලසුම්කරණය සහ විකුණුම් මෙහෙයුම් සඳහා නායකත්වය ලබා දෙයි.

1992 වසරේදී එයාර්ලයින්ස් සමාග මට සම්බන්ධ වූ ඔහු මූල්‍යය, ආදායම් සැලසුම්කරණය, ජාල සැලසුම්කරණය, මාර්ග සැලසුම්කරණය සහ මිලකරණය ආදී විවිධ ක්ෂේත්‍රහි සේවය කර ඇත. එසේම ඔහු ඩුබායි සහ කැනඩාවේ විකුණුම් කළමනාකරු ලෙසද, මහාරාෂ්ට්‍ර සහ ගුජරාටිහි කළමනාකරු ලෙසද ආසියා පැසිෆික් සහ ඕස්ට්‍රේලියාවේ කලාපීය කළමනාකරු ලෙසද කටයුතු කර ඇත. විදේශ සේවයෙන් පසුව, තෙන්නකෝන් මහතා, වාණිජ මෙහෙයුම් සාමාන්‍යාධිකාරී වශයෙන් කටයුතු කළේය. එහිදී ඔහු ප්‍රාදේශීය විකුණුම්, විකුණුම් සංවර්ධන, නිෂ්පාදන සංවර්ධන, පාරිභෝගික කටයුතු, ශ්‍රීලංකන් හොලිඩේස්, කර්මාන්ත කටයුතු, පාරිභෝගික සබඳතා (ශ්‍රීලංකන් ලෝයල්ටි වැඩසටහන ඇතුළත්ව), විද්‍යුත්-වාණිජ්‍යය, ගෝලීය ඇමතුම් මධ්‍යස්ථානය, නාලිකා කළමනාකරණය වැනි විවිධ දෙපාර්තමේන්තු සඳහා නායකත්වය දුන් අතර එමඟින් එයාර්ලයින්ස් සමාගමේ වාණිජ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඔහුගේ විශේෂඥතාව පිළිබිඹු කරයි. ඔහු ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සේවය කරන අතරතුර, ඕමාන් එයාර් සමාගමේ උතුරු ඉන්දීය කළමනාකරු ලෙස බොම්බේ, දිල්ලි, ලක්නව් සහ ජයිපූර්හි මෙහෙයුම්ද අධීක්ෂණය කළේය.

දැඩි තරඟකාරීත්වය ඇතුළු සමකාලීන අභියෝග මධ්‍යයේ විකුණුම් වර්ධනයේ විප්ලවීය වෙනසක් ඇති කිරීම හේතුවෙන් තෙන්නකෝන් මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ කීර්තියක් උසුලනු ලබයි. නව්‍ය සහ ඵලදායි වාණිජ භාවිතයන් පිළිබඳ උනන්දුවක් දක්වන ඔහු, උපායමාර්ගික සැලසුම් පිළිබඳ මනා දැක්මක් සහිත එයාර්ලයින්ස් සමාගමේ වාණිජ අරමුණු සාක්ෂාත් කරලීමට සමත් වූ අයෙකු වේ. ඔහු ආයතනික වර්ධනය අපේක්ෂා කරනු ලබන, තම කණ්ඩායමේ ශක්‍යතා ධෛර්යමත් කරනු ලබන කැපවූ නායකයෙක් වන්නේය.

තෙන්නකෝන් මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධිධාරියෙකු මෙන්ම, බකිංහැම්ෂයර් නව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජාත්‍යන්තර ශාස්ත්‍රපති උපාධියකට හිමිකම් කියනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් සේවා නියෝජිත මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද කටයුතු කරනු ලබයි.

**6. සමින්ද පෙරේරා මහතා**
*අලෙවිකරණ ප්‍රධානී*

සමින්ද පෙරේරා මහතා 2015 ජුනි මස සිට ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන උපායමාර්ගය මෙහෙයවනු ලබයි. ඔහු දශක දෙකකට වැඩි කාලයක් උපායමාර්ගික අලෙවිකරණය සහ ගෝලීය විකුණුම් පිළිබඳ විශේෂඥයෙකු ලෙස ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවය කරන්නේය. එමෙන්ම එයාර්ලයින්ස්හි ආයතනික සමාජ වගකීම් (CSR) අංශය - ශ්‍රීලංකන් කෙයාර්ස්, ශ්‍රීලංකන් හොලිඩේස් සහ තිරසාර ක්‍රියාමාර්ග යන්ද අධීක්ෂණය කරනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම එමිරේට්ස් යටතේ පැවති කාලයේ එහි කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් සම්බන්ධ වූ පෙරේරා මහතා, ආයතනික සන්නිවේදන වැඩබලන ප්‍රධානී, ප්‍රංශයේ වාණිජ කළමනාකරු, ශ්‍රී ලංකාව සහ මාලදිවයින කලාපීය කළමනාකරු සහ ලෝක ව්‍යාප්ත විකුණුම් පිළිබඳ සාමාන්‍යාධිකාරී වැනි ගුවන් සේවයේ ප්‍රමුඛ තනතුරු රැසක් දරන්නට විය.

ඔහු අලුතින් ස්ථාපිත වෙළඳපොළ ගමනාන්තයන්හි වෙළඳ සන්නාමය ප්‍රතිෂ්ඨාපනය, අලෙවිකරණ නවෝත්පාදන සහ පාරිභෝගික කේන්ද්‍රීය, සාකල්‍ය සන්නිවේදනය යන ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් දරන්නේය. ඔහු ජාත්‍යන්තර සංසදවලදී පැසසුමට පවා ලක්වූ ගෝලීය ගෞරවයට පත් වූ අලෙවිකරණ සන්නිවේදන ප්‍රයත්න බොහෝමයක් වෙනුවෙන් එයාර්ලයින්ස් අලෙවිකරණ කණ්ඩායම වෙත මඟ පෙන්වීම් ලබා දුන්නේය.

ඔහු මුම්බායි සරසවියෙන් මූල්‍ය ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ වාණිජවේදී උපාධියක් සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙන් (IATA) ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් (ගුවන්සේවා අලෙවිකරණය, ගුවන්සේවා මූල්‍ය, ගිණුම්කරණය, නැවතුම් කළමනාකරණය) ලබා ගෙන ඇත.

**7. චමින්ද පෙරේරා මහතා**
*ගුවන් භාණ්ඩ ප්‍රවාහන ප්‍රධානී*

චමින්ද පෙරේරා මහතා 2022 ජනවාරි මස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමඟ සම්බන්ධ වෙමින් වාණිජ ගුවන් භාණ්ඩ සහ ගොඩබිම් සේවා මෙහෙයුම් හැසිරවීම සම්බන්ධයෙන් කටයුතු කරන අතර, ගුවන්සේවා කර්මාන්තයේ වසර 30කට අධික පළපුරුද්දක් ඔහු සතු වන්නේය.

පෙරේරා මහතා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සිය වෘත්තීය කටයුතු ගොඩබිම් සේවා මෙහෙයුම් හැසිරවීම් අංශයෙන් ආරම්භ කරනු ලැබුවේය. ගුවන් භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල වාණිජ අංශය පිළිබඳ දැක්වූ උනන්දුව හේතුවෙන්ම ලුෆ්තන්සාහි සේවයට එක් වෙමින් ඔහුගේ වෘත්තීයභාවය තවදුරටත් පෝෂණය කරගනු ලැබුවේය. ඉන්පසු ඔහු චයිනා එයාර්ලයින්ස්හි ගුවන් භාණ්ඩ අලෙවි සහ පාරිභෝගික සේවා කළමනාකරු ලෙස වාණිජ සහ ගොඩබිම් සේවා මෙහෙයුම් කටයුතු අධීක්ෂණ සේවා කණ්ඩායමේ

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම තවදුරටත්.

කළමනාකරණ සහ අධීක්ෂණ කටයුතු සිදු කරනු ලැබුවේය. ඉන්පසු ඔහු එමිරේට්ස්හි ගුවන් භාණ්ඩ කළමනාකාර වශයෙන් වසර 16ක කාලයක් පුරා සේවය කරන ලද්දේය. පසුව ඔහු ශ්‍රීලංකන්හි ගුවන් භාණ්ඩ කළමනාකාර ලෙස පත් වූ අතර, ශ්‍රීලංකන් කාගෝහි නව අභියෝග වෙනුවෙන් උර දරයි.

පෙරේරා මහතා ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් (එක්සත් රාජධානිය) ගුවන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක්, ආසියානු විද්‍යුත් විශ්ව විද්‍යාලයෙන් (මැලේසියාව) අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ එක්සත් රාජධානියේ චරලත් ප්‍රවාහන ආයතනයෙන් ප්‍රවාහනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත. එමෙන්ම ඔහු චරලත් සැපයුම් සහ ප්‍රවාහන ආයතනයේ චරලත් සාමාජිකයෙකි.

**8. විපුල් මිස්‍රා මහතා**
*ඉංජිනේරු අංශ ප්‍රධානී*

විපුල් මිස්‍රා මහතා 2024 වසරේදී ඉංජිනේරු අංශ ප්‍රධානී ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින් සමඟ සම්බන්ධ වුවේය. දශක 02ක ගුවන් යානා ඉංජිනේරු ක්ෂේත්‍රයේ අත්දැකීම් සමඟින් ඔහු එයාර් ඉන්ඩියා, ස්පයිස් ජෙට්, විස්ටාරා, ඉන්ඩිගෝ, එයාර් ඩෙකෑන් සහ කින්ග්ෆිශර් ආදිය ඇතුළත් වාණිජ ගුවන් සමාගම් බොහෝමයක වගකීම් දරා ඇත.

ඔහුගේ වෘත්තීය පරාසය බලපත්‍රලාභී ගුවන් යානා ඉංජිනේරුවරයෙකු සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු දක්වා විවිධ වෘත්තීය මට්ටම් වල පැතිර පවතින අතර, විවිධ ගුවන් සමාගම් රැසක තාක්ෂණික කළමනාකරණ කටයුතු සිදු කොට ඇත. ඒ අතර අඩු මිල ගුවන් යානා, පූර්ණ පහසුකම් සහිත යානා, නව ගුවන් යානා මෙන්ම දීර්ඝ ඉතිහාසයක් සහිත ගුවන් සේවා වැනි විවිධ පරාසයන්ගේ කටයුතු සම්බන්ධව විශේෂඥභාවයක් සහ අත්දැකීම් ඔහු සතුය.

මිස්‍රා මහතා ගුවන් අවකාශ නීතිය සම්බන්ධව ශාස්ත්‍රපති උපාධියක් සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද දරයි. එමෙන්ම ඔහු ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රධාරියෙකුද වෙයි.

**9. ක්‍ෂානක සපරමාදු මහතා**
*ආදායම් කළමනාකරණය, ජාල සැලසුම් සහ පර්යේෂණ ප්‍රධානී*

2000 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ක්‍ෂානක සපරමාදු මහතා එයාර්ලයින්ස්හි සේවයට එක් වූ අතර සිය වෘත්තීය ජීවිතය පුරාවට වාණිජ අංශයේ විවිධ නායකත්ව තනතුරු දරා ඇත. වසර 15කට වැඩි කළමනාකරණ භූමිකාවන් ඇතුළුව වාණිජ ගුවන් සේවා කර්මාන්තයේ දශක 2කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු ආදායම් සැලසුම්කරණය, ජාල ප්‍රශස්තකරණය සහ ආදායම් කළමනාකරණ යන ක්ෂේත්‍රහි විශේෂඥතාව ලබා ඇත.

ඔහු 2001 දී ආදායම් සැලසුම් දෙපාර්තමේන්තුවට සම්බන්ධ වෙමින් ආදායම් සැලසුම් කළමනාකරු ලෙස කණ්ඩායම මෙහෙයවනු ලැබුවේය. ඉන් අනතුරුව 2010දී ඔහු ආදායම් සැලසුම් සහ ජාල සැලසුම් කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ උසස් වගකීම් සමඟින්, සැලසුම් කළමනාකරු ලෙස උසස්වීමක් ලැබුවේය. ඔහු පසුව යුරෝපීය කලාපය සඳහා ආදායම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණය කරමින් ආදායම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාණිජ කළමනාකරු ලෙස පත් වනු ලැබුවේය. ඉන්පසු ඔහු 2021 වර්ෂයේදී යුරෝපයේ සහ ඈත පෙරදිග ප්‍රදේශ සඳහා ඉන්වෙන්ටරි සහ මිලකරණයේ සමස්ත කාර්යයන් මෙහෙයවීමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආදායම් කළමනාකරණය භූමිකාව සඳහා උසස්වීමක් ලද්දේය. 2024 වර්ෂයේදී ඔහු ආදායම් කළමනාකරණ අංශය, ජාල සහ සබඳතා අංශය භාර ප්‍රධානියා ලෙස පත්වන ලද අතර, වර්තමානයේ ආදායම් කළමනාකරණය, ජාල සැලසුම්කරණය සහ පර්යේෂණ මෙන්ම එයාර්ලයින්ස්හි ජාත්‍යන්තර සම්බන්ධතා යන දෙපාර්තමේන්තු සඳහා නායකත්වය සපයයි.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සහ ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ IATA ඩිප්ලෝමාව (මොන්ට්‍රියල්) ලබා ඇත. ඔහු චරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එංගලන්තය) ඉගෙනුම් සම්පූර්ණ කළ අයෙකි.

**10. Lt. Col. බන්දුල වේරගම මහතා**
*සාමාන්‍යාධිකාරී - සමූහ ආරක්ෂණය*

Lt. Col. බන්දුල වේරගම මහතා ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 23ක සේවා කාලයකින් පසුව 2012 වර්ෂයේදී එයාර්ලයින්ස්හි සේවයට එක් වූවේය. ඔහු ත්‍රිවිධ හමුදා පරිසරය ආශ්‍රිත අණදීම හා පුහුණුවට අමතරව එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහිද සේවය කර ඇත. සමාගමේ මානව සම්පත්, ගුවන් යානාස්ථ හා ආරක්ෂක අංශවලට සේවය කළ ඔහු 2016 වසරේ පෙබරවාරි මාසයේදී ගුවන්තොටුපළ හා ගොඩබිම් සේවා අංශයේ ප්‍රධානියා ලෙස පත් වන ලදී. දැනට ඔහු 2020 අප්‍රේල් මාසයේදී භාරගත් පත්වීමක් වශයෙන් කණ්ඩායම් ආරක්ෂක අංශයේ කටයුතු මෙහෙයවයි. ඔහු කැළණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ පකිස්තානයේ ක්වෙට්ටා විශ්වවිද්‍යාලයේ විද්‍යාපති උපාධියක්ද ලබාගෙන ඇත.

**11. සුසාන් ජේකොබ් මහත්මිය**
*මානව සම්පත් සමූහ ප්‍රධානී*

2025 වර්ෂයේදී මානව සම්පත් සමූහ ප්‍රධානියා ලෙස සහ නායකත්ව කණ්ඩායමේ සාමාජිකාවක ලෙස පත්වීම් ලද සුසාන් ජේකොබ් මහත්මිය, මානව සම්පත් ක්ෂේත්‍රයේ අවුරුදු විස්සකට වැඩි කාලයක් පුරා සේවය කොට ඇත.

ඇය විසින් හොඹවන ලද තනතුරු ලෙස ප්‍රීමා සිලෝන් ලිමිටඩ්හි මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානියා, තර්ඩ් ස්පේස් ග්ලෝබල්හි මානව සම්පත් ප්‍රධානියා, ඩයලොග් ආසියාටා පීඑල්සීහි මානව සම්පත් කළමනාකරු සහ ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස්හි සහකාර මානව සම්පත් කළමනාකරු ආදිය දැක්විය හැකි අතර එහිදී ඇය සම්මානලාභී මානව සම්පත් මුලපිරීම් වෙනුවෙන් සිය හොමඳ දායකත්වය ලබා දුන්නාය. ගුවන් සේවයට ප්‍රමුඛ මානව සම්පත් භාවිතයන් හඳුන්වා දීම සඳහා ජේකොබ් මහත්මියගේ මෙකී අත්දැකීම් බහුලත්වය උපකාරී විය. ඇගේ විශේෂඥතා ක්ෂේත්‍ර ලෙස ආයතනික පරිවර්තනය, පාරිභෝගික අත්දැකීම් සැලසුම් කිරීම (තොග බඳවා ගැනීම), මානව සම්පත් පද්ධති, කාර්යසාධන කළමනාකරණය, කුසලතා අත්පත් කර ගැනීම සහ නායකත්ව සංවර්ධනය දැක්විය හැකිය.

ජේකොබ් මහත්මිය එක්සත් රාජධානියේ ඇන්ග්ලියා රස්කින් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්, එක්සත් රාජධානියේ විගන් සහ ලීග් විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධි ඩිප්ලෝමාවක් සහ ශ්‍රී ලංකාවේ මෙට්‍රොපොලිටන් විද්‍යාලයෙන් සාමාන්‍ය මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත.

**12. දීපාල් පල්ලේගංගොඩ මහතා**
*ගුවන් තොටුපළ සහ ගොඩබිම් හැසිරවීම් සේවා පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ*

දීපාල් පල්ලේගංගොඩ මහතා 1991දී එයාර්ලයින්ස්හි සේවයට සම්බන්ධ විය. 1994දී ඔහු එයාර්ලයින්ස් සේවයෙන් ඉවත් වී දෝහා ගුවන් සේවය සමඟ සම්බන්ධ වූ අතර, එහිදී කටාර් එයාර්වේස් හැන්ඩ්ලිං පිහිටුවීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක්

ඉටු කළේය. 1995දී ඔහු නැවත එයාර්ලයින්ස් සමඟ සම්බන්ධ වූවේය. ඔහු රාජකාරී කළමනාකරු, ගුවන් පියාසැරි සැලසුම් සහ මෙහෙයුම්, ගුවන්තොටුපළ සේවා උපදේශක (දේශීය/විදේශීය) සහ ස්ථාන කළමනාකරු ලෙස ගුවන්තොටුපළ මෙහෙයුම් ක්ෂේත්‍රයේ සියලුම අංශවල සේවය කර ඇත. ඔහු 2010දී වාණිජ කණ්ඩායමට සම්බන්ධ වූ අතර විකුණුම් විධායක, සහකාර විකුණුම් කළමනාකරු, දේශීය කළමනාකරු, රජයේ සංචාරක සහ මහජන කටයුතු කළමනාකරු ලෙස සේවය කළේය. පසුව ඔහු 2023 මැයි මාසයේදී ගුවන්තොටුපළ සහ ගොඩබිම් සේවා ජ්‍යෙෂ්ඨ කළමනාකරු ලෙස පත් වන ලදී.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සේවා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ කාඩිෆ් විශ්ව විද්‍යාලයෙන් (එක්සත් රාජධානිය) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. තවද ඔහු සිටි සහ ගිල්ඩ්ස් හි සහතිකලත් උපදේශකවරයෙකි.

**13. තුෂාරි පෙරේරා මහත්මිය**
*සමූහයේ නීති කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරු*

තුෂාරි පෙරේරා මහත්මිය ශ්‍රීලංකන් සමූහයේ නෛතික කටයුතු කළමනාකාරතුමිය ලෙස කටයුතු කරයි. ඇය සිය වෘත්තීය ජීවිතය සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි මානව සම්පත් අංශයෙන් ආරම්භ කළ අතර, මානව සම්පත් කළමනාකරණයේ විවිධ අංශවල සේවයේ නිරත වූවාය. ඇය කාර්මික සහ කම්කරු සබඳතා සහ සේවකයින් සම්බන්ධ කාරණාවන්හි නඩු පැවරීම් ආදිය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇත. 2013 වසරේදී සමූහයේ නෛතික කටයුතු දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ දින සිට, ආයතනික සහ නියාමන කටයුතු, මතභේද විසඳීම, විදේශයන්හි බහු අධිකරණ සහ දේශීය නඩු, බුද්ධිමය දේපළ, කාර්මික සහ කම්කරු සබඳතා සහ නොතාරිස් කටයුතු ඇතුළු සමූහයේ වාණිජ සහ ගුවන් සේවා කොන්ත්‍රාත්තු යන අංශ සියල්ලම ඇය විසින් කළමනාකරණය කරනු ලැබුවාය.

පෙරේරා මහත්මිය වෘත්තියෙන් නීතිඥවරියකි. ඉංග්‍රීසි සහ සිංහල භාෂා සඳහා නොතාරිස් බලපත්‍ර හිමි අයෙකි. ඇය ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් පවත්වනු ලබන ගුවන් යානා අත්පත් කර ගැනීම සහ මූල්‍යකරණය යන පාඨමාලාව සාර්ථකව නිම කර ඇත. ඇය සිය නීති අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ (IPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව, සහ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ සංවර්ධන වැඩසටහනද සාර්ථකව සම්පූර්ණ කර ඇත.

**14. රවී සමරසිංහ මහතා**
*කැබින් සේවා පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරු*

රවී සමරසිංහ මහතා 1988 වසරේ කැබින් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස එයාර්ලයින්ස් සේවයට සම්බන්ධ වූ අතර ගුවන් ගමන් සේවා උපදේශකවරයෙකු දක්වා උසස්වීම් ලැබුවේය. ඔහු පසුව කාර්ය මණ්ඩල කාර්ය සාධන කළමනාකරු සහ ගුවන් ගමන් සේවා කළමනාකරු ලෙස පත් වුවේය. 2024දී ඔහු ගුවන් ගමන් සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු - කැබින් සේවා ලෙස පත් කරන ලදී. ජාතික ගුවන් සේවයට සම්බන්ධ වීමට පෙර, බැංකු ක්ෂේත්‍රයේ ද ඔහු සේවය කොට ඇත.

දැනට ඔහු ගුවන් සමාගමේ ප්‍රසිද්ධියක් උසුලනු ලබන ගුවන් යානා සේවා භාරව එහි සියලුම කාර්ය කළමනාකරණය කරයි. ආචාරශීලී කැබින් කාර්ය මණ්ඩලය කළමනාකරණය මෙකී කාරණා අතරින් වඩාත් වැදගත් කාර්යයකි. ඊට අමතරව තීරුබදු රහිත විකුණුම් සහ ගුවන් යානා ආහාරපාන සේවා ඔහුට පැවරී ඇති අනෙකුත් වගකීම් වේ.

සමරසිංහ මහතා එංගලන්තයේ සෆොල්ක් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

**15. කමල් අතාවුද මහතා**
*සමූහ ආරක්ෂා කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරු*

කමල් අතාවුද මහතාට ගුවන් සේවා කර්මාන්තයේ වසර 30 ක පළපුරුද්දක් ඇත. ඔහු 1995දී භූමි හැසිරවීමේ දෙපාර්තමේන්තුවෙන් බර පාලකයෙකු ලෙස එයාර් ලංකා ලෙස කලින් හැඳින්වූ ගුවන් සේවය සමඟ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. 1999දී, ජාත්‍යන්තර සහ ව්‍යවස්ථාපිත රෙගුලාසි මගින් පාලනය වන වඩාත් අභියෝගාත්මක භූමිකාවකට උර දෙමින් ගුවන් ගමන් මෙහෙයුම් අංශයට මාරු වුවේය. 2000 වසර වන විට, ඔහු ICAO 201 පියාසැරි මෙහෙයුම් නිලධාරී පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන්, ICAO බලපත්‍රලාභී පියාසැරි සැලසුම්කරුවෙකු බවට පත්විය. ඔහු කාර්යක්ෂම හා ආරක්ෂිත ගුවන් ගමන් මෙහෙයුම් සහතික කරලනු පිණිස පියාසැරි සැලසුම්කරණය, ගුවන් යානා කාර්යසාධන ඉංජිනේරු විද්‍යාව, ඉන්ධන අධීක්ෂණය සහ කාර්යක්ෂමතාව, තාක්ෂණික ප්‍රකාශන සහ නියමිත වේලාවට කාර්ය සාධන අධීක්ෂණය වැනි ප්‍රධාන කළමනාකරණ තනතුරු කිහිපයක් හරහා උනන්දුව සහ කැපවීම පෙන්නුම් කරමින් ගුවන් ගමන් මෙහෙයුම් ක්ෂේත්‍රයේ සිය කාර්යභාරය සාර්ථකව ඉටු කරනු ලැබුවේය.

ගුවන් ගමන් මෙහෙයුම් පිළිබඳ වසර 25කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු 2024 නොවැම්බර් මාසයේදී ජ්‍යෙෂ්ඨ කළමනාකරු කණ්ඩායම් ආරක්ෂක කටයුතු පිළිබඳ භූමිකාව භාර ගත්තේය. මෙම භූමිකාව තුළ, දශක ගණනාවක් තිස්සේ ගොඩනගා ඇති ගුවන් සේවයේ ශක්තිමත් මෙහෙයුම් ආරක්ෂක වාර්තාව රැකගැනීමට ඔහු සමත් වූවේය. ICAO රෙගුලාසිවලට අනුකූලව ගුවන් ගමන් සහ ගොඩබිම් මෙහෙයුම්හි ආරක්ෂාව සහතික කරලීමට ආරක්ෂක කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගැනීම ඔස්සේ ඔහු වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. එමෙන්ම, ඔහු තම වගකීම්වල කොටසක් ලෙස ගුවන් සේවයේ සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ස්ථාවර පියවර ගෙන ඇත.

කමල් අතාවුද මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ගුවන් ගමන් මෙහෙයුම් සහ ආරක්ෂාව පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලබා ඇත.



# නවෝත්පාදනයේ හිනිපෙත කරා

## කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

# මෙහෙයුම් පරිසරය සමාලෝචනය



"2024/25 මූල්‍ය වර්ෂය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මෙහෙයුම් කටයුතු සංකීර්ණ වූත්, වෙනස්වීම් වලට භාජනය වන්නා වූත් පරිසරයක් තුළ ක්‍රියාත්මක විය. ආර්ථිකය ප්‍රකෘතිමත් වීම, භූ දේශපාලනික අභියෝග, මෙහෙයුම් පිරිවැයේ ඉහළයාම් සහ වෙළඳපළ අවස්ථා ආදී කරුණු මේ සඳහා බලපාන ලදී. ඉහත කී කරුණු අනුව ගුවන් සමාගමේ උපායමාර්ගික අවධානය, මෙහෙයුම් තීරණ සහ මූල්‍ය ප්‍රතිඵල තීරණය විය."

### ආදායම් සහ ලාභදායිතාවයට සාර්ව ආර්ථික හා වෙළඳපළ පරිසරය මඟින් ඇති කරන බලපෑම

සලකා බලන ලද මූල්‍ය වර්ෂය තුළ, ගෝලීය ගුවන් සේවා කර්මාන්තය ප්‍රකෘතියක් ලැබූ අතර, විශේෂයෙන් විවේක සහ ව්‍යාපාරික සංචාර යන දෙඅංශයෙන්ම ජාත්‍යන්තර මගී පරිමාව නැවත වර්ධනය විය. ඒ හා සමානව, ශ්‍රී ලංකාවේ සංචාරක අංශය 2024දී තෘප්තිමත් ප්‍රතිසාධනයක් ලැබුවේය. ජාත්‍යන්තර පැමිණීම් මිලියන 2.1 ඉක්මවනු ලැබිණ. එය 38%ක වාර්ෂික වර්ධනයක් මෙන්ම 2019 සිට වාර්තා වූ ඉහළම අගය සනිටුහන් කරයි. සංචාරයකයින්ගේ පැමිණීම 416,000ක් ලෙස ඉහළම අගය වාර්තා කරමින් ඉන්දියාව ප්‍රමුඛතම මූලාශ්‍ර වෙළඳපොළ වූ අතර, ඊට අමතරව රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ චීනය යන රටවල් විසින් ඉහළ අගයන් වාර්තා කරනු ලැබීය. මගී ඉල්ලුම වැඩිවීම, උපායමාර්ගික යටිතල පහසුකම් සංවර්ධනය සහ සහය දක්වන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මෙකී ප්‍රතිසාධනයට හේතු වනු ලැබීය. මෙම ක්‍රියාමාර්ග මඟින් අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරය සැලකිය යුතු ලෙස කාර්යක්ෂම වූ අතර, ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා ඉල්ලුම සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මගී වර්ධන උපාය මාර්ගය ශක්තිමත් කළේය. කෙසේ වෙතත්, ගෝලීය සහ දේශීය පාරිසරික අභියෝග හමුවේ සලකා බලන ලද වසර තුළ ගුවන් සේවයේ ක්‍රියාකාරිත්වයට බාධා ඇති විය.

ගෝලීය ගුවන් සේවා කර්මාන්තය තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි මෙහෙයුම් සහ ලාභදායිතාවයට බලපෑ අභියෝග කිහිපයකට මුහුණ දුන්නේය. ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයට (IATA) අනුව, ගෝලීය ගුවන් සේවා කර්මාන්තය විසින් වාර්ෂික ආදායමෙහි 5%ක අඩුවීමක් අත්විඳින ලද අතර, ආසියා-පැසිෆික් කලාපය තුළ එහි බලපෑම තවත් වැඩි විය. භූ දේශපාලනික බලපෑම්, විශේෂයෙන් ඊශ්‍රායලය සහ ඉරානය අතර ගැටුම් හමුවේ මැද පෙරදිග ගුවන් ගමන් මාර්ග කිහිපයක් නවත්වනු ලැබීය. ඊට විකල්ප වශයෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි යුරෝපීය ගුවන් ගමන් මාර්ග යොදා ගනු ලැබීය. මේ හේතුවෙන් ගුවන් ගමන් සඳහා දීර්ඝ කාලයක් වැය වීම, ඉන්ධන පරිභෝජනය වැඩි වීම සහ බර පැටවීමේ ධාරිතාව අවම වීම වැනි අහිතකර ප්‍රතිඵල ඇති විය. විශේෂයෙන් ලන්ඩන් හීත්‍රෝ වැනි කාර්යබහුල ගුවන් තොටුපළවල නියමිත වේලාවන් පවත්වා ගැනීම සඳහා, පිටත්වීමේ වේලාවන් පැයකින් වැඩි කරන ලද අතර, මෙහි අයහපත් ප්‍රතිඵලයක් ලෙස සම්බන්ධතා ඇණහිටීම සහ ගුවන් ගමන්වලින් අනපේක්ෂිත ලෙස ඉවත් වීම ඇතුළු මගීන් වෙත අපහසුතා ඇති කරනු ලැබීය. ඊට අමතරව, රතු මුහුදේ අර්බුදකාරී තත්ත්වය ගෝලීය නැව්ගත කිරීම්වලට සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කළ අතර එනිසා මුහුදෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ පිරිවැය සහ ප්‍රමාදය ඉහළ යනු ලැබීය. මේ හේතුවෙන් සැපයුම් දාමයේ විශ්වසනීයත්වය පවත්වා ගැනීමේ අරමුණින් ගුවනින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ විකල්පය වෙත යොමු වීම දැකගත හැකි විය.

පසුගිය වසර පුරා පැවති දැඩි ගෝලීය අනුකූලතා අවශ්‍යතාවලට අනුගත වෙමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට ජාත්‍යන්තර පාරිසරික ප්‍රමිතීන් පිළිපැදීමට සිදු විය. ගෝලීය සහ ජාතික තිරසාර පිළිවෙත් අනුව සිය මෙහෙයුම් පවත්වා ගනිමින්, පරිසර කළමනාකරණය වෙනුවෙන් ගුවන් සමාගම දැඩි ලෙස කැපවී සිටී. එය ගුවන් යානාවලින් විමෝචනය වන වායු පිළිබඳ නිසි ලෙස අධීක්ෂණ, වාර්තාකරණ සහ සත්‍යාපන (MRV) පද්ධතියක් යොදා ගනිමින්, ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා වන ICAO හි කාබන් තුලනය කිරීමේ සහ අවම කිරීමේ යෝජනා ක්‍රමය (CORSIA) සමඟ දැඩි අනුකූලතාවයක් පවත්වා ගෙන යනු ලබයි. මීට අමතරව, ගුවන් සමාගම එක්සත් රාජධානියේ සහ යුරෝපා සංගමයේ ව්‍යපාර පදනම් වූ වායු විමෝචනය පිළිබඳ යෝජනා ක්‍රමවලට අනුකූලව වන අතර ගුවන් සේවාවේ ඉන්ධන තිරසාර මට්ටමෙන් පවත්වා ගැනීමේ (SAF) විධාන සපුරාලයි. මෙමඟින් පාරිසරික පාලනය සඳහා එහි ක්‍රියාශීලී සහ වගකිවයුතු ප්‍රවේශය පිළිබිඹු කරයි.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## *මෙහෙයුම් පරිසරය සමාලෝචනය තවදුරටත්.*

ඉහළ මෙහෙයුම් පිරිවැය, ගුවන් යානා සහ අමතර කොටස් සීමා සහිත වීම සහ ඉහළ යන පාරිසරික බලපෑම් ඇතුළු අඛණ්ඩ අභියෝගවලට ගුවන් කර්මාන්තය මුහුණ දුන්නේය. භාණ්ඩ අංශයේ, සැපයුම් දාමය තවදුරටත් බිඳ දමමින් බංගලාදේශය වැනි රටවල කලාපීය දේශපාලන අස්ථාවරත්වය, මෙහෙයුම් සහ සැපයුම් සඳහා අභියෝග ඇති කළේය.

### මෙහෙයුම් පිළිබඳ දළ විශ්ලේෂණය

**මගී මෙහෙයුම්**

සමාලෝචනයට භාජනය වන වසර තුළ, ගෝලීය සංචාරක ක්ෂේත්‍රයේ පුළුල් ප්‍රතිසාධනයක් පෙන්නුම් කරමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මගී ඉල්ලුමේ සැලකිය යුතු වර්ධනයක් ඇති විය. කෙසේ වෙතත්, ධාරිතාව සහ ආදායම සඳහා බලපෑ මෙහෙයුම් කටයුතුවල සීමා සහ බාහිර වෙළඳපොළ තුළ පැවති බාධා හේතුවෙන් වර්ධනය වන ඉල්ලුම අනුව ආදායම් වර්ධනය වීමට අවස්ථාව සීමා සහිත විය.

ගුවන් සමාගමේ වාර්ෂික කිලෝමීටර් ප්‍රමාණයට අදාළ ආසන (ASK) ප්‍රමාණය 5%කින් පහත වැටීම කෙරෙහි සේවයට ලබාගත හැකි ගුවන් යානා ප්‍රමාණය සීමිත වීම ප්‍රධාන වශයෙන් බලපාන ලදී. දකුණු ඉන්දියානු ගමනාන්ත වෙනුවෙන් ගමනාගමනයෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් දායක වන ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සේවය කරන මැද පෙරදිග කලාපයේ ASK ප්‍රමාණය සැලකිය යුතු ලෙස 15%කින් අඩුවීම අහිතකර අන්දමින් බලපෑවේය. ඒ අනුව, මෙම මාර්ගවල උපායමාර්ගික වැදගත්කම හමුවේ සමස්ත ASK ප්‍රමාණයේ අඩු වීම මඟින් ආදායමේ සැබෑ සංකෝචනය තක්සේරු කිරීම අපහසුය. ගුවන් සේවය සමඟ ගමන් කළ මගීන් සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 4%කින් අඩු වී ඇත (23/24 මූල්‍ය වර්ෂය: මිලියන 3.6). පැටවුම් සාධකය 78.6%ක් ලෙස පැවතුණ අතර, එය පෙර වසරට සාපේක්ෂව 0.4%ක අඩුවීමකි (23/24 මූල්‍ය වර්ෂය: 79.1%). ගුවන් යානා නඩත්තු කටයුතු ප්‍රමාද වීම ගුවන් යානා ඇණියේ සීමාවන් සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද අතර, ඉංජිනේරු කටයුතු ආශ්‍රිත ගැටලු හේතුවෙන් ගුවන් ගමන් අවලංගු කිරීම් 487ක් සිදු විය. මෙහෙයුම් ප්‍රමාද වීමත් සමඟ එහි විශ්වසනීයත්වයද පලුදු විය. මෙම බාධා හමුවේ මගීන් තුළ පවතින විශ්වාසය සැලකිය යුතු ලෙස බිඳ වැටුණ හෙයින් ගමන් මාර්ග කිහිපයක වෙන්කරවා ගැනීමේ පරිමාවන් පහත වැටුණේය.

අභ්‍යන්තර හා බාහිර බාධා හමුවේ මගී ආදායම පෙර වසරට සාපේක්ෂව 7% කින් පහත වැටුණි. ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳපළවල තරඟකරුවන් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් සාමාන්‍ය ගාස්තු අඩු වූ අතර, නිරන්තරයෙන් ඇති වන ප්‍රමාදයන් සහ අවලංගු කිරීම්; මගීන්ගේ වෙන්කරවා ගැනීමේ රටාවන්ට සහ ගුවන් සමාගමේ විශ්වසනීයත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. එමෙන්ම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (BIA) ශ්‍රීලංකන් ගුවන් සේවයේ ආසන ධාරිතාවේ ප්‍රමාණය 2024/25 වර්ෂයේදී 40% දක්වා පහත වැටුණු අතර, ගාස්තු තරඟකාරිත්වය තීව්‍ර කරමින් සහ ආදායම් විභවය තවදුරටත් සීමා කළේය.

ධාරිතාව අඩුවීම, ආදායම අඩුවීම සහ මෙහෙයුම් කටයුතුවල බාධා කිරීම් ඇතුළු දුෂ්කර අභියෝගවලට මුහුණ දුන්නද, කාර්ය සාධනය ස්ථාවර කිරීම සහ පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් කාර්යක්ෂම සහ බහුවිධ ක්‍රමවේදයක් යොදා ගනු ලැබුවේය. ගුවන් සේවය විසින් සිය ගමන් මාර්ග සහ මිලකරණය වැඩිදියුණු කිරීම, භූ දේශපාලනික අභියෝගවලට විසඳුම් ලෙස ගුවන් ගමන් මාර්ගවල වෙනස්කම් සිදු කිරීම, සහ වෙළඳපොළ තුළ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීමට ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීම වැනි දෑ සිදු කරන ලදී. ගුවන් ගමන් කාලසටහන් ප්‍රශස්තිකරණය, සුපරීක්ෂාකාරීව ගුවන් යානා නැවත සේවයේ යෙදවීම සහ ඉහළ සේවාවක් අරමුණු කරගත් තාක්ෂණික වැඩිදියුණු කිරීම් හරහා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. බඳවා ගැනීම් නැවත සිදු කිරීම සහ විකල්ප කාර්ය මණ්ඩල යොදා ගැනීමට සැලසුම් කිරීම ඔස්සේ කාර්ය මණ්ඩල තුළ පවතින උග්‍ර හිඟයට විසඳුම් ලබා දුන් අතර, නඩත්තු සැලසුම්කරණය ශක්තිමත් කිරීම සහ ගුවන් යානා ගමන් කාලය කළමනාකරණය ඔස්සේ මෙම බාධා සමනය කරනු ලැබිණ. මෙකී ප්‍රයත්නයන් දැනටමත් ධනාත්මක ප්‍රතිඵල පෙන්නුම් කර ඇති අතර, ගුවන් ගමන් පිටත්වීම් සහ පැමිණීම් නියමිත වේලාවට සිදු කිරීම 70% ක පමණ වර්ධනයක් ලබා ඇත. සමස්තයක් ලෙස, මෙම මූලපිරීම් ගුවන් සේවයේ ආදායම් වර්ධනය පවත්වා ගැනීමට උපකාරී වූ අතර සහ වසර තුළ මෙහෙයුම් වඩාත් විශ්වාසදායක සහ කාර්යක්ෂම අන්දමින් පවත්වා ගැනීමට ශක්තිමත් පදනමක් සපයනු ලැබුවේය.

**භාණ්ඩවල මෙහෙයුම් කටයුතු**

ඉල්ලුමේ උච්චාවචනයන්, සෘතුමය වෙනස්කම්, ධාරිතාව සීමා කිරීම සහ පාරිභෝගික බණ්ඩනය සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වන විවිධත්වයෙන් යුතු මිලකරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම ඔස්සේ භාණ්ඩ අංශය විසින් වසර තුළදී මෙහෙයුම් කාර්යක්ෂමව පවත්වා ගනු ලැබීය. මෙම නම්‍යශීලී ප්‍රවේශය මඟින් ගුවන් සමාගමට සිය ප්‍රවාහනය කරන ලද භාණ්ඩ කිලෝග්‍රෑමයකට උපරිම ආදායම උත්පාදනය කිරීමට හැකි වූ අතර, දිගුකාලීන වාණිජ ගිවිසුම් අතර ප්‍රශස්ත සමතුලිතතාවයක් පවත්වා ගැනීමට හැකි විය. එමඟින් ස්ථාවරත්වයක් ඇති කළ අතර උපරිම ඉල්ලුමක් පවතින කාලවලදී ඉහළ ආදායමක් ලබා දුන් වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීමට උපකාරී විය.

භාණ්ඩ මෙහෙයුම් සඳහා සාමාන්‍ය භාණ්ඩ ප්‍රවාහනය, නෂ්ට වන ද්‍රව්‍ය සහ ඉක්මනින් බෙදා හැරීම් සිදු කළ යුතු ද්‍රව්‍ය ආදී විවිධත්වයෙන් යුතු දෑ ඇතුළත් වූ අතර, එය කල්පවතින සහ අඛණ්ඩ ප්‍රශස්ත ආදායම් ප්‍රවාහයක් සහතික කළේය. කෙටි කාලීන අරමුණු ලෙස, ධාරිතා භාවිතය වැඩි දියුණු කිරීම සහ භාණ්ඩවල සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීම මූලික කරගත් උපායමාර්ගික මූලපිරීම් කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. වත්මන් ඉල්ලුම, පවතින අවකාශය, සෘතුමය වෙනස්කම් සහ පාරිභෝගික පැතිකඩ මත පදනම්ව භාණ්ඩ මිලකරණය සඳහා පවතින වාතාවරණය අනුව වෙනස්කම් සිදු කරන ලද අතර, එය ඉහළ ආදායමක් ලබා ගැනීමට මෙන්ම, ඉල්ලුම ඌන කාලවලදී ධාරිතාව නිවැරදිව හැසිරවීමට උපකාරී විය. භාණ්ඩ ප්‍රවාහන සාධක වැඩි කිරීමට සහ ධාරිතාව නිසි ලෙස යොදා නොගැනීමෙන් ඇති වන අලාභය අවම කිරීම සඳහා එම අවස්ථාවේ වෙන්කරවා ගැනීම් සහ ගිවිසුම්ගත සේවාදායකයින් වැනි නිෂ්පාදන කාණ්ඩ සහ පාරිභෝගිකයින් වර්ගය අනුව සැලසුමකට අනුකූලව භාණ්ඩ ප්‍රවාහන අවකාශය වෙන් කරන ලදී. තවද, දිගුකාලීන ස්ථාවර කොන්ත්‍රාත්තු සහ වෙනස් කළ හැකි එම අවස්ථාවේ සිදුවන වෙන්කිරීම් සියල්ල සක්‍රියව කළමනාකරණය කිරීමෙන්, වෙළඳපොළ මන්දගාමී අවස්ථාවේදී පවා ස්ථාවර ආදායමක් පවත්වා ගැනීමට අංශයට හැකි වූ අතර ඉල්ලුම ඉහළ යන විට මිල ගණන්ද ඒ අනුව වෙනස් කරලීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 24/25 මූල්‍ය වර්ෂයේදී, භාණ්ඩ ප්‍රවාහන මාර්ගවල ආදායම ඇමරිකානු ඩොලර් 1.29/ kgs ලෙස වාර්තා වූ අතර එය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 10%ක වර්ධනයකි (23/24 මූල්‍ය වර්ෂයේදී ඇමරිකානු ඩොලර් 1.17/ kgs).

මිලකරණය, වෙන් කිරීම සහ ධාරිතාව කළමනාකරණය වෙනුවෙන් ගත් ප්‍රයත්නයන් භාණ්ඩ ප්‍රවාහන අංශයේ වාණිජ හා මෙහෙයුම් කාර්ය සාධනය හිතකර අන්දමින්

වර්ධනය කළ අතර, එයාර්ලයින්ස් හි සමස්ත ආදායම් උත්පාදනයට ප්‍රධාන දායකයෙකු ලෙස කටයුතු කරනු ලැබුවේය.

### උපාය මාර්ගික හවුල්කාරිත්ව සහ තරඟකාරී පසුබිම

කලාපයේ මිල අවම ගුවන් සමාගම් සහ ප්‍රධාන පූර්ණ සේවා ගුවන් සමාගම් සමඟ තරඟකාරී පරිසරයක, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය වෙළඳපොළ තත්ත්වය පවත්වා ගනු පිණිස ගාස්තු ව්‍යුහයන් වෙනස් කරමින් සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කළේය. ෆ්ලයි ඩුබායි සහ එයාර් සීෂෙල්ස් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඇති කර ගනිමින් මැදපෙරදිග, අප්‍රිකාව සහ ඉන්දියන් සාගර කලාපය පුරා ජාල සම්බන්ධතාවය පුළුල් කළ අතර ගුවන් ටිකට්පත් අලෙවිය සාමූහිකව සිදු කිරීමට ගිවිසුම්වලට යොමු වීමෙන් යුරෝපය සහ උතුරු ඇමරිකාව වෙත නව වෙළඳපොළවල් විවෘත විය. 2014 සිට වන්වර්ල්ඩ් සන්ධානයේ සාඩම්බර සාමාජිකයෙකු ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ගෝලීය මෙහෙයුම් සහයෝගීතාවය සහ වාණිජ කටයුතුවල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවමින් ප්‍රමුඛ ජාත්‍යන්තර ගුවන් සමාගම් සමඟ සහයෝගීව ගෝලීය යටිතල පහසුකම්, සම්බන්ධීකරණ මෙහෙයුම් සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභවලින් ප්‍රයෝජන ලැබුවේය.

### ඉදිරි දැක්ම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සාර්ව ආර්ථික වර්ධනයන්, නියාමන වෙනස්වීම්, තාක්ෂණික දියුණුව සහ වෙනස්වන පාර්භෝගික අපේක්ෂාවන් මතින් නිර්මාණය වන ඉහළ විවිධත්වයකින් යුතු සහ වෙනස්වීමට භාජනය වන පරිසරයක තුළ ක්‍රියාත්මක වීමට හැකි වන පරිදි ඉදිරි වසරක හෝ වසර තුනක කාලයක් වෙනුවෙන් සැලසුම් සකස් කරයි. එයාර්ලයින්ස් හි ඉදිරි දැක්ම පිළිබඳ සැලසුම්වලදී තිරසාර වර්ධනය, මෙහෙයුම් විශිෂ්ටත්වය, පාර්භෝගිකයින් මුල් කරගත් නවෝත්පාදනය සහ කොටස්කරුවන්ගේ වටිනාකම් නිර්මාණය යන මූලධර්ම පදනම් කර ගනු ලබයි.

ගුවන් යානා සංඛ්‍යාව පුළුල් කිරීමට සැලසුම් කිරීම සහ පුළුල් බඳ සහිත ගුවන් යානාවල ඒකාකාරිත්වය පිළිබඳ වැඩසටහන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉදිරි සැලසුම් අතරින් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අතර එමඟින් පිරිවැය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ජාල විශ්වසනීයත්වය වැඩි කිරීම සහ මෙහෙයුම් නම්‍යශීලීභාවය වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ. ගුවන් යානා ඇණිය ප්‍රමිතිගත කිරීම සහ ඉන්ධන කාර්යක්ෂමතාවයෙන් යුතු ගුවන් යානා තවත් යොදා ගැනීම මඟින්, ගුවන් සේවය නඩත්තු සහ පුහුණු පිරිවැය අවම කිරීමට මෙන්ම, එහි කාබන්හරණ ඉලක්ක සපුරාලීමටද හැකි වනු ඇත.

මේ හා සමගාමීව, එයාර්ලයින්ස් සමාගම විසින් පැහැදිලි තරඟකාරී වාසියක් හිමි කර ගැනීමට හෝ වර්ධනය කළ හැකි, පුරෝකථන මඟින් හඳුනාගත් වෙළඳපොළවල් තුළ ගුවන් ගමන් වර්ධනය කරලීමට සක්‍රීයව කටයුතු කරයි. විශේෂයෙන් විශාල ගෝලීය ගුවන් සමාගම් විසින් අවධානය යොමු නොකළ, අවම සේවා සපයන ලද හෝ සේවය නොකරන ලද ගමනාන්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට අදහස් කරයි. මෙම වෙළඳපොළවල ඉලක්කගත ගුවන් මාර්ග සංවර්ධනය සහ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම තුළින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ගුවන් ගමන් ශක්තිමත් කිරීමට නායකත්වයක් ලබා දීම, හඳුනා නොගත් ඉල්ලුම සපුරාලීම සහ ඉහළ මිලකරණයෙන් වාසියක් ලබා ගැනීම අරමුණු කරයි.

සංචාරක ව්‍යාපාරය සහ විදේශීය රටවල සිටින්නන් මව් රටට සංචාරය කිරීම යනු පෙර සිටම ඉහළ අදායමක් සහ ස්ථායීතාවයක් ලබා දුන් අංශ දෙකක් වන හෙයින් ඒ වෙනුවෙන් ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපොළවල් වෙත සෘජු ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීමට ද ගුවන් සමාගමේ වර්ධන සැලැසුම් වලදී ප්‍රමුඛත්වය දෙයි. ඊට සමගාමීව, ගෝලීය සහ කලාපීය ගුවන් සමාගම් සමඟ සෘජු සේවා සහ හවුල්කාරිත්වයන් පවත්වා ගනිමින් ද්විතීයික නගර සහ නැගී එන කලාපීය මධ්‍යස්ථාන සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කර ගනිමින්, ගුවන් සේවයේ වටිනාකම් සැලසුම් ශක්තිමත් කරමින් සහ පිරිවැය ඉහළ නොවන අන්දමින් එහි ජාත්‍යන්තර කටයුතුවල ව්‍යාප්තිය පුළුල් කරනු ඇත.

ගුවන් යානා පුළුල් කිරීමේ අරමුණින්, විශේෂයෙන් නව සහ පවතින පුළුල් බඳ ගුවන් යානාවල රැගෙන යා හැකි භාණ්ඩ ධාරිතාව ප්‍රශස්ත කිරීමට කටයුතු කරනු ඇත. භාණ්ඩ අංශය විසින් ආදායම සහ ලාභදායිතාවය සඳහා ප්‍රධාන දායකත්වයක් සපයනු ලබයි. එහි අනාගත සැලසුම් අතරට උසස් ඩිජිටල් තාක්ෂණය, විවිධත්වයෙන් යුතු මිලකරණ ආකෘති සහ පූර්ණ පාර්භෝගික සැපයුම් විසඳුම් පවත්වා ගනිමින් නැගී එන භාණ්ඩ වෙළඳපොළවල ස්ථිර පැවැත්මක් පවත්වා ගැනීම ඇතුළත් වේ. මෙම උත්සාහයන් විවිධාංගීකරණයෙන් යුතු ආදායම් මාර්ග ජනනය කරන අතර මගී ගමනාගමනයේ උච්චාවචනයන්ට එරෙහිව ගුවන් සමාගමේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි.

තරඟකාරීත්වය පවත්වා ගැනීම සහ පාර්භෝගිකයින්ට මූලිකත්වය ලබා දීම උදෙසා, එයාර්ලයින්ස් සිය ප්‍රධාන මෙහෙයුම් සහ වාණිජ කාර්යයන් සඳහා ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම වෙනුවෙන් ආයෝජනය කිරීම නිරන්තරයෙන් සිදු කරනු ඇත. කාලීන තීරණ ගැනීම, මෙහෙයුම් පුරෝකථනය සහ මිලකරණයේ වෙනස්කම් සිදු කිරීම සඳහා සහය දක්වන දත්ත විශ්ලේෂණ සහ කෘත්‍රිම බුද්ධිය (AI) යොදා ගැනීම, ආරම්භයේ සිට අවසානය දක්වා උසස් පාර්භෝගික අත්දැකීම් ලබා දීම සහ කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා අභ්‍යන්තර වැඩ කටයුතු ස්වයංක්‍රීයකරණය මෙහි ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට ඇතුළත් වේ. මෙය කාර්යක්ෂමතාව, සරල බව සහ පුද්ගලීකරණය හරහා වටිනාකමක් ලබා දෙන කාර්යක්ෂම, ප්‍රතිචාරාත්මක සහ ඒකාබද්ධ ගුවන් සේවා පරිසර පද්ධතියක් ගොඩනැගීමේ පුළුල් සැලසුම්වල ප්‍රයත්නයන් වේ.

සාරාංශයක් ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වඩාත් නම්‍යශීලි, කාර්යක්ෂම සහ අනාගතයට සූදානම් ව්‍යාපාරයක් සඳහා අවැසි අඩිතාලම දමමින් සිටී. සැලසුම්ගත ගුවන් යානා සහ ගුවන් ගමන් ව්‍යාප්තිය, මෙහෙයුම් නවෝත්පාදනය, තිරසාර නායකත්වය සහ ඩිජිටල් ප්‍රතිනිර්මාණය තුළින්, නව වර්ධනයක් අත්පත් කර ගැනීමට, කොටස්කරුවන්ගේ වටිනාකම් ඉහළ නැංවීමට සහ ගෝලීය ගුවන් සේවා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක හොබවනු පිණිස ගුවන් සමාගම විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට අදහස් කරයි.

කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.




මානව ප්‍රාග්ධනය



නිෂ්පාදිත ප්‍රාග්ධනය



බුද්ධිමය ප්‍රාග්ධනය



සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



ස්වාභාවික ප්‍රාග්ධනය




මූල්‍ය ප්‍රාග්ධනය

**ඒකාබද්ධ වාර්තාකරණ රාමුව යටතේ දැක්වෙන මානව ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය සහ මූල්‍ය ප්‍රාග්ධනය නම් වූ ප්‍රාග්ධන හය පුරා එයාර්ලයින්ස් හි කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් පහතින් දක්වා ඇත. මෙම පුළුල් ඇගයීම මඟින් වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන ජයග්‍රහණ සහ අභියෝග ඉදිරිපත් කරයි. එමෙන්ම අනාගත සංවර්ධන කටයුතු සඳහා වටිනා අවබෝධයක් සහ උපායමාර්ගික මඟ පෙන්වීමක් සපයයි. එතුළින් තිරසාර සංවර්ධනය සහ කොටස්කරුවන් වෙත වටිනාකම් නිර්මාණය වෙනුවෙන් අප ගන්නා ප්‍රයත්නයන් ශක්තිමත් කරයි.**




# මානව ප්‍රාග්ධනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සේවකයින් එහි වටිනාම වත්කමයි. ලොව පුරා අපගේ මෙහෙයුම් සඳහා බලය සපයන විවිධත්වයෙන් මෙන්ම ඉහළ කුසලතාවලින් පිරි ශ්‍රම බලකායක් යනු අපගේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂිත, විශ්වාසදායක සහ සුවිශේෂී සේවාවක් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. මෙම මානව ප්‍රාග්ධන සමාලෝචනය මගින් අපි දක්ෂතා ආකර්ෂණය, සංවර්ධනය සහ රඳවා ගැනීම, සේවක සහභාගීත්වය වර්ධනය කිරීම සහ පූර්ණ, ආරක්ෂිත සහ සහය දක්වන කාර්යය පරිසරයක් පෝෂණය කරන ආකාරය පිළිබඳ විස්තරාත්මකව ඉදිරිපත් කරයි.

ගුවන් සේවා කර්මාන්තය තුළ සිදුවන සීඝ්‍ර සංවර්ධනය සහ ආර්ථිකයේ පවතින අභියෝග හමුවේ, අපගේ උපායමාර්ගික අරමුණු සමඟ සංකලනය වූ ශක්තිමත් සහ නම්‍යශීලීභාවයෙන් යුතු ශ්‍රම බලකායක් ගොඩනැගීමට අපි කැපවී සිටිමු. ඉලක්කගත බඳවා ගැනීම්, අඛණ්ඩ ඉගෙනීම, ආකර්ෂණීය දීමනා සහ ආරෝග්‍ය සම්පන්න මෙන්ම යහපැවැත්ම පවත්වා ගැනීමේ මුලපිරීම් පෙරදැරි කරගනිමින් අපගේ මානව ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට අප දරන ප්‍රයත්න මෙම සමාලෝචනයෙන් ඉස්මතු කරයි.

අපගේ පිරිස වෙත ආයෝජනය කිරීමෙන්, වත්මන් මෙහෙයුම් ඉල්ලීම් සපුරාලීම පමණක් නොව, අනාගතයේදී නව්‍යකරණය කිරීමට සහ තිරසාර ලෙස වර්ධනය වීමට සුදුසු තත්ත්වයක ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පසුවන බැව් අපි සහතික කරන්නෙමු.

### ශ්‍රම බලකාය පිළිබඳ විස්තර සහ එහි ව්‍යුහය

2024/25 මූල්‍ය වර්ෂය සඳහා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි මුළු සේවකයින් ප්‍රමාණය 6071 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 67%ක් පුරුෂ පාර්ශ්වය වන අතර 33%ක් කාන්තාවන් වේ. ප්‍රධාන මෙහෙයුම් සහ කළමනාකරණ අංශවල පැතිර පවත්නා විවිධාකාර භූමිකාවල, විවිධත්වයෙන් යුතු සහ ඉහළ කුසලතා ඇති ශ්‍රම බලකායක් මඟින් මෙය නිර්මාණය වී ඇත. ඔවුන් විවිධ උපායමාර්ගික ව්‍යාපාරික ඒකකවල සේවය කරනු ලබයි.

| කාණ්ඩය | ස්ත්‍රී | | පුරුෂ | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සේවකයින් ප්‍රමාණය | % | සේවකයින් ප්‍රමාණය | % | සේවකයින් ප්‍රමාණය | % |
| කළමනාකරුවන් | 111 | 2 | 180 | 3 | 291 | 5 |
| ගුවන් නියමුවරු | 20 | 0.3 | 252 | 4 | 272 | 4 |
| කැබින් කාර්ය මණ්ඩලය | 645 | 11 | 295 | 5 | 940 | 15 |
| ගුවන්යානා ඉංජිනේරු සහ තාක්ෂණ ශිල්පීන් | 23 | 0.3 | 592 | 10 | 615 | 10 |
| පුහුණු, අභ්‍යාසලාභී සහ විධායක නිලධාරින් | 1,230 | 20 | 2,723 | 45 | 3,953 | 65 |
| එකතුව | 2,029 | 33 | 4,042 | 67 | 6,071 | 100 |

### කුසලතා කළමනාකරණය සහ සේවකයින් රඳවා ගැනීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, විශේෂයෙන් එහි ගුවන් සේවා මෙහෙයුම්වල ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන තාක්ෂණික සහ මෙහෙයුම් භූමිකාවන් සඳහා දක්ෂ වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම, සංවර්ධනය කිරීම සහ රඳවා ගැනීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. තාක්ෂණික ශක්‍යතාව පමණක් නොව, සංවිධානයේ දිගුකාලීන වටිනාකම් සහ මෙහෙවරට අනුකූලව කටයුතු කරන ශක්තිමත් ශ්‍රම බලකායක් ගොඩනැගීම පදනම් කරගනිමින් ගුවන් සේවයේ මානව සම්පත් උපායමාර්ගය සකස් කොට ඇත.

ඉහළ දක්ෂතා ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් සමාගම අභ්‍යන්තර තනතුරු උසස් කිරීම සහ කුසලතා වර්ධනයට ප්‍රමුඛත්වය දෙන සාධාරණ හා විනිවිදභාවයෙන් යුතු බඳවා ගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය කරයි. මෙම ප්‍රවේශය ඔස්සේ අභ්‍යන්තර වෘත්තීය ප්‍රගතිය සහ ආයතනික දැනුම ශක්තිමත් කරයි. විශේෂිත භූමිකාවන් සහ නව නිපුණතා අවශ්‍ය ආරම්භක මට්ටමේ තනතුරු පිරවීම සඳහා බාහිර බඳවා ගැනීම් පරික්ෂාකාරීව සිදු කරයි. මෙම ද්විත්ව උපායමාර්ගය මඟින් ආයතනික අඛණ්ඩතාව සහ නව කුසලතා පිළිගැනීම යන කාරණා සපුරාලනු ලබයි.

කෙසේ වෙතත්, පසුගිය වසර තුළ, ගුවන් සේවයේ නියැලෙන සේවකයින් බොහෝ ප්‍රමාණයක් සේවයෙන් ඉවත් වූ අතර ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ද එකී ගැටළුවට මුහුණ දුනි. සමාගමේ සාමාන්‍ය පිරිවැටුම් අනුපාතය ආසන්න වශයෙන් 7%ක් වූ අතර, නිපුණ වෘත්තිකයන් අතර අඩුවීමක් දැකගත

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## *මානව ප්‍රාග්ධනය තවදුරටත්.*

හැකි විය. මෙයට ප්‍රධාන වශයෙන් රට තුළ පැවති ආර්ථික තත්ත්වය, බදුකරණය සහ ආකර්ෂණීය වැටුප් ලබා දෙමින්, විදේශීය වෘත්තීය අවස්ථා පිරිනමමින් මැදපෙරදිග ගුවන් සමාගම් විසින් දක්ෂතා සහිත පිරිස් ආකර්ෂණය කර ගැනීම බලපාන ලදී. මෙය ඉංජිනේරු, ගුවන් මෙහෙයුම් සහ ගොඩබිම් සේවා ඇතුළු ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවල ඉදිරි අඛණ්ඩතාව පිළිබඳ අවදානම් ඇති කළේය.

ඊට පිළියම් වශයෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මූල්‍ය වර්ෂය පුරා සේවකයින් රඳවා ගැනීමේ සැලසුම් මාලාවක් ක්‍රියාත්මක කළේය. ඒ සඳහා පහත දෑ ඇතුළත් විය:

- තරඟකාරිත්වය සහ සමානාත්මතාවය වැඩි දියුණු කිරීම සඳහා හැකි අවස්ථාවන්හිදී වැටුප් ක්‍රියාපටිපාටිය සමාලෝචනය කිරීම සහ නැවත සකස් කිරීම.
- අභ්‍යන්තර තනතුරු හුවමාරුව සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වෘත්තීය සංවර්ධන මුලපිරීම් සහ පුහුණු වැඩසටහන් පුළුල් කිරීම.
- ඉහළ කාර්ය සාධනයක් පවතින සේවකයින් හඳුනාගෙන ප්‍රතිලාභ පිරිනැමීම සඳහා ප්‍රවර්ධන සහ කාර්ය සාධන කළමනාකරණ ක්‍රියාවලි විධිමත් කිරීම.
- කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීමෙන් මෙහෙයුම්වලට ඇති වන බාධා අවම කිරීම සඳහා ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ අනුප්‍රාප්තිකයින් කළමනාකරණය වැඩිදියුණු කිරීම.
- සම්බන්ධතාවය සහ අරමුණ පිළිබඳ ශක්තිමත් හැඟීමක් ඇති කරලනු පිණිස අභ්‍යන්තර සන්නිවේදනය සහ සම්බන්ධීකරණ ප්‍රයත්නයන් වැඩි දියුණු කිරීම.

ශ්‍රම බලකායේ පවතින පුරප්පාඩු පියවා ගැනීම සහ බාධාවකින් තොරව මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා, ආරක්ෂාව සහ නියාමන අනුකූලතාව සහතික කරමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු ආශ්‍රිත රැකියා සඳහා කාර්මික ශිල්පීන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් දියත් කර ඇත. ඊට සමගාමීව, සේවකයින් සේවය හැර යාම පාලනය කිරීමටත්, ගොඩබිම් හැසිරවීම සහ මඟී සේවා හි විශිෂ්ටත්වය සහතික කරනු පිණිස ගුවන්තොටුපළ සේවා නියෝජිතයින් සඳහා මහා පරිමාණ බඳවා ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙකී ප්‍රයත්නයන් සේවා ගුණාත්මකභාවය පවත්වා ගැනීම, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සහ ගුවන් සමාගමේ වර්ධන අභිලාෂයන්ට සහය වීම පදනම් කරගත් පුළුල් ශ්‍රම බලකායේ සැලසුම්වල අරමුණු වේ.

### ඉගෙනුම් සහ සංවර්ධනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මානව ප්‍රාග්ධන සැලසුම්වලදී නිරන්තර ඉගෙනුම වෙනුවෙන් සුවිශේෂී තැනක් ලබා දේ. එය මෙහෙයුම් විශිෂ්ටත්වය, නියාමන අනුකූලතාවය සහ ශක්තිමත් නායකත්වය වෙනුවෙන් සංවිධානයේ කැපවීම පිළිබිඹු කරයි. 2024/25 මූල්‍ය වර්ෂය තුළ, එයාර්ලයින්ස් සියලු මට්ටම් සහ කාර්යයන් හරහා සේවකයින්ගේ කුසලතා ඉහළ නැංවීම අරමුණු කරගත් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් රාශියක් සංවිධානය කළේය.

අභ්‍යන්තර විෂය කරුණු පිළිබඳ විශේෂඥයින්, ජාත්‍යන්තරව පිළිගත් පුහුණු මාදිලි සහ විධායක කටයුතු පිළිබඳ ඉගෙනුම සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාල සමඟ සහයෝගීතාවයන් බාහිර ආයතන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන්වල එකතුවක් තුළින් සැලසුම් කළ පුහුණුවීම් ලබා දෙන ලදී. මෙම උත්සාහයන් මඟින් ඉගෙනුම් වැඩපිළිවෙල තාක්ෂණික වශයෙන් මෙන්ම ගෝලීය හොඳම භාවිතයන් යොදා ගනිමින් සැකසී ඇති බවට සහතික කරන ලදී. ප්‍රධාන අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර අතරට නායකත්වය සංවර්ධනය, උපායමාර්ගික චින්තනය, සන්නිවේදනය සහ සාකච්ඡා කුසලතා, පාරිභෝගික සේවා විශිෂ්ටත්වය, ව්‍යාපාර ක්‍රියාවලි නැවත ගොඩනැගීම, කර්මාන්ත-විශේෂිත තාක්ෂණික පුහුණුව සහ වෙනස්වීම් කළමනාකරණය ඇතුළත් විය. එමෙන්ම, වෙනස් වන කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල වෙමින් නව ආරක්ෂක ක්‍රියාමාර්ග සහ අවදානම් කළමනාකරණ රාමු කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරන ලදී.

මුල් පෙළ කාර්ය මණ්ඩලය, ඉංජිනේරුවන්, උපදේශකයින්, නිලධාරීන්, විධායක නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය ඇතුළු විවිධ සේවක කණ්ඩායම්වල විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම පුහුණුව නිර්මාණය කර ඇත. එමඟින් තනි පුද්ගල භූමිකාවන් සහ වෘත්තීය අවධීන් තුළින් සංවර්ධනයක් ලබා ගන්නා බවට සහතික කරයි. එදිනෙදා මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා පමණක් නොව, නම්‍යශීලී සහ අනාගතයට සූදානම් ඉහළ කාර්ය සාධන සංස්කෘතියක් පෝෂණය කිරීම අරමුණු කරමින්, ගුවන් සේවය කුසලතා වැඩි දියුණු කිරීම කෙරෙහි නිරන්තරයෙන් අවධානය යොමු කළේය. විධිමත් පශ්චාත් පුහුණු තක්සේරු කිරීම්, රැකියා ස්ථානයේ කාර්ය සාධන ඇගයීම් සහ ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය අඛණ්ඩ පවත්වා ගැනීම ඇතුළු බහු ඇගයීම් මාර්ග හරහා පුහුණු සහ සංවර්ධන වැඩසටහන්වල ඵලදායීතාවය තක්සේරු කරනු ලබයි. ගුවන් සේවයට සේවක කාර්ය සාධනයේ වැඩිදියුණු කිරීම් නිරීක්ෂණය කිරීමට, දැනුම පැවරූ බවට සහතික කිරීමට සහ නියාමන සහ මෙහෙයුම් ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීමට මෙම යාන්ත්‍රණ උපකාරී වේ.

### කාර්ය සාධන කළමනාකරණය සහ වෘත්තීය සංවර්ධනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් කාර්ය සාධනය කළමනාකරණය සහ වෘත්තීය සංවර්ධනය සම්බන්ධයෙන් පරිපූර්ණ හා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම කැපවීමේ කොටසක් ලෙස, එයාර්ලයින්ස් විසින් කුසලතා හඳුනා ගැනීම, පෝෂණය කිරීම සහ උසස් කිරීම සඳහා නිර්මාණය කර ඇති පද්ධති සහ ක්‍රමවේද සංවිධානයේ සියලු මට්ටම් හරහා ක්‍රියාත්මක වේ.

එයාර්ලයින්ස් හි වෘත්තීය සංවර්ධන දර්ශනයේ හරය වනුයේ භූමිකාවන් සහ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය මෙහෙයුම්, තාක්ෂණික සහ හැසිරීම් කුසලතා පදනම් කරගත් පුළුල් නිපුණතා ක්‍රමවේදයකි. මෙම ක්‍රමවේදය සියලු ඉගෙනුම් මුලපිරීම් සැලසුම් කිරීම සහ ලබා දීම මෙහෙයවන අතර සේවක ශක්‍යතාව සහ ව්‍යාපාරික අවශ්‍යතා අතර ගැළපීම සහතික කරයි. එමෙන්ම, ඉදිරි නායකත්ව වගකීම් සඳහා සේවකයින් සූදානම් කිරීමේදී නිපුණතා ක්‍රමවේදය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නිපුණතා පාදක තක්සේරු කිරීම් හරහා ඉහළ විභවයක් ඇති පුද්ගලයින් හඳුනාගෙන, ඊළඟ පරම්පරාවේ නායකයින් ලෙස හැඩගැන්වීම අරමුණු කරගත් විශේෂිත සංවර්ධන වැඩසටහනකට යොමු කරනු ලබයි. මෙම සැලසුම්ගත ප්‍රවේශය දිගුකාලීන කුසලතා අවශ්‍යතා සපුරාලීමට සීමා නොවෙමින්, ප්‍රගතිය වෙනුවෙන් පැහැදිලි මඟ පෙන්වීමක් ලබා දීමෙන් සහභාගීත්වය සහ රඳවා ගැනීම වැඩි දියුණු කරයි.

වාර්ෂික කාර්ය සාධන සමාලෝචන ක්‍රියාවලිය මඟින් ඉලක්ක සැකසීම, හැසිරීම් තක්සේරු කිරීම් සහ නිපුණතා ඇගයීම් සිදු කරයි. එය කාර්ය සාධනය, සංවර්ධනය සහ වෘත්තීය ඉලක්ක පිළිබඳව සේවකයින් සහ කළමනාකරුවන් අතර අර්ථවත් සාකච්ඡා සඳහා පහසුකම් සපයයි. කාර්ය සාධන සමාලෝචනවලින් ලබාගන්නා අවබෝධය, පුද්ගල සංවර්ධන සැලසුම් (IDP) නිර්මාණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලබයි. එය වෘත්තියේ වත්මන් කාර්ය සාධනය සහ අනාගත ප්‍රගතිය පිළිබඳ ඉදිරිපත් කරමින් පුද්ගලාරෝපිත ඉගෙනුම් සැලසුමක් ලෙස කටයුතු කරයි. වෙනස්වන භූමිකාවන්, නැගී එන කුසලතා සහ ව්‍යාපාර ප්‍රමුඛතා පිළිබිඹු කිරීම සඳහා සේවකයින් සහ රේඛීය කළමනාකරුවන් සමඟ සහයෝගයෙන් මෙකී පුද්ගල සංවර්ධන සැලසුම් නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ.

ගුවන් සේවා කර්මාන්තය සහ ආයතනික වර්ධනය තුළ විකාසනය වන ඉල්ලුම සපුරාලීම සඳහා සේවකයින් හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම සහ සූදානම් කිරීම වෙනුවෙන් අපගේ මානව සම්පත් අංශය

ක්‍රියාකාරීව ආයෝජනය කරයි. කළමනාකරණ අභ්‍යාසලාභී වැඩසටහන, උපාධිධාරී ඉංජිනේරු වැඩසටහන, කැඩෙට් නියමු කුසලතා අත්පත් කර ගැනීම, ගුවන් සේවා පාසල හරහා කාර්මික කුසලතා සංවර්ධනය, අනුප්‍රාප්තික සැලසුම් කිරීම යනාදිය මෙහි ප්‍රධාන මුලපිරීම් අතර වේ.

මෙම ව්‍යුහගත වැඩසටහන් සහ අඛණ්ඩ නිපුණතා සංවර්ධනය ඔස්සේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තම ශ්‍රම බලකාය නිවැරදි කුසලතා වලින් සන්නද්ධ කරයි. අඛණ්ඩ ඉගෙනීමේ සහ අනාගත අභියෝග සහ අවස්ථාවන් භාර ගැනීමට සූදානම් සංස්කෘතියක් එමඟින් ඇති කරයි.

### සේවක සහභාගීත්වය සහ සංස්කෘතිය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වාර්ෂික සැමරුම්, විවිධ ආගමික උත්සව, ක්‍රීඩා තරඟාවලි (උදා: Cricket Bash 2024), සුභසාධන වැඩසටහන් සහ ප්‍රජා සේවා මුලපිරීම් ඇතුළු විවිධ ආයතනික සහ තේමා පදනම් වූ ක්‍රියාකාරකම් හරහා සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරයි. එමෙන්ම කර්මාන්ත හා බාහිර සංවිධාන සමඟ සහයෝගී හවුල්කාරිත්වය ඇති කර ගැනීමෙන් සම්බන්ධතා සහ සංස්කෘති අතර ඉගෙනුම් අවස්ථා ලබා දීමෙන් සේවක අත්දැකීම් තවදුරටත් පොහොසත් කරයි.

තවද, "වර්ණ" නමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සේවයේ නියුතු සේවකයින් පිළිගැනීමට ලක් කිරීමේ වැඩසටහන මඟින් සංවිධානයට වටිනාකමක් එක් කිරීම සඳහා තම නිතිපතා රාජකාරිවලට සීමා නොවෙමින් කටයුතු කළ සුවිශේෂී සේවකයින් ඇගයුමට සහ ගෞරවයට පාත්‍ර කරනු ලබයි. කණ්ඩායම් හැඟීම සහ සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කරන සමාගමේ ක්‍රීඩා කවුන්සිලයේ සහය ඇතිව පැවැත් වූ ක්‍රීඩා සහ අනෙකුත් විෂය බාහිර ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ජයග්‍රහණ මෙම වැඩසටහන මඟින් විශේෂයෙන් ඉස්මතු කරයි.




ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ට්‍රැවල් ට්‍රේඩ් ස්පෝර්ට් ක්ලබ් - 2024 පිහිනුම් ශූරතාවලියේදී රන් පදක්කම් 46ක්, රිදී පදක්කම් 32ක්, ලෝකඩ පදක්කම් 12ක් දිනා ගනිමින් සමස්ත ශූරතාව හිමි කර ගන්නා ලදී.

සේවක අදහස් පිළිබඳ කෙටි සමීක්ෂණ, සේවය හැර යන විට පවත්වන සම්මුඛ සාකච්ඡා, රඳවා ගැනීමේ අනුපාත සහ සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය යන ක්‍රමවේද හරහා සේවක සහභාගීත්වය අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබයි. මෙකී දත්ත ධනාත්මක, සුහදශීලී සහ සහයෝගී රැකියා ස්ථානයක් ගොඩනැගීම අරමුණු කරගත් මුලපිරීම් වෙනුවෙන් සහය දක්වයි.

### සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තම ශ්‍රම බලකාය; විශේෂයෙන් ඉල්ලුමක් ඇති සහ ඉහළ අවදානම් සහිත පරිසරයක ක්‍රියාත්මක වන කාර්ය මණ්ඩල සාමාජිකයින්, ඉංජිනේරුවන් සහ ගොඩබිම් හැසිරවීමේ කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙයි. එයාර්ලයින්ස් සිය කැබින් කාර්ය මණ්ඩලය සහ ගොඩබිම් හැසිරවීමේ කාර්ය මණ්ඩලය සඳහා නිතිපතා ප්‍රථමාධාර පුහුණුව ලබා දෙමින් පුළුල් ආරක්ෂක ප්‍රමිතීන් සහතික කරනු ලබයි. සේවා ස්ථාන අවදානම් අවම කිරීම සහ ආරක්ෂිත සුපරීක්ෂාකාරී සංස්කෘතියක් ඇති කිරීම සඳහා නිර්මාණය කර ඇති අඛණ්ඩ ආරක්ෂක දැනුවත්භාවය සහ වැළැක්වීමේ වැඩසටහන් ඊට සහය සපයයි.

සේවක යහපැවැත්ම යනු ශාරීරික ආරක්ෂාව පමණක් නොවන බැව් හඳුනා ගනිමින්, එයාර්ලයින්ස් තම කාර්ය මණ්ඩලයේ සමස්ත සෞඛ්‍යය සහ යහපැවැත්ම ආවරණය වන පරිදි පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කරයි. පිහිනුම් තටාක, අභ්‍යන්තර සුභසාධන වෙළඳසැල් සහ කාර්ය මණ්ඩල ආපනශාලාවල පහසු මිලට සෞඛ්‍ය සම්පන්න ආහාර ලබා දීම ආදී විකල්ප ඇතුළුව ශාරීරික, මානසික සහ සමාජීය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සහ සේවා ලබා දී ඇත. විශ්වසනීය උපදේශකයින් සහ සේවා ස්ථානයේ සම වයසේ මිතුරන්ගේ සහය ජාලයක් හරහා මානසික සෞඛ්‍යයට විශේෂ අවධානයක් යොමු කරන අතර එමඟින් සේවකයින්ට ආතතිය කළමනාකරණයට සහ මානසික ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය සම්පත් ලබා දේ.

ක්‍රියාශීලී ජීවන රටාවක් දිරිමත් කිරීම සහ කණ්ඩායම් හැඟීම ශක්තිමත් කිරීම අරමුණු කරමින්, වසර පුරා ක්‍රීඩා ඉසව් සහ තරඟ සංවිධානය කරනු ලබන ක්‍රීඩා කවුන්සිලය සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එක්ව ක්‍රීඩා කටයුතු සඳහා සහභාගීත්වය නිරන්තරයෙන් ප්‍රවර්ධනය කරයි. මෙම මුලපිරීම් ශාරීරික යෝග්‍යතාවය වැඩි දියුණු කිරීම මෙන්ම සේවකයින් අතර සුහදතාවය සහ සමාජ අන්තර්ක්‍රියා ද පෝෂණය කරයි.

ඊට අමතරව, සමාගම විසින් පිළිකා රෝගය වැනි තීරණාත්මක සෞඛ්‍ය ගැටලු ඉලක්ක කරමින් වාර්ෂික සහ ද්වි-වාර්ෂික සෞඛ්‍ය ව්‍යාපාර ක්‍රියාත්මක කරයි. එමඟින් රෝගී තත්ත්වයන් කල්තියා හඳුනා ගැනීම, වැළැක්වීම සඳහා පියවර ගැනීම පිළිබඳ දැනුවත් කිරීමක් සේවකයින්ට ලබා දෙයි. එසේම, සේවා සපයන්නන් සමඟ හවුල් වී නොමිලේ අක්ෂි පරීක්ෂණ සහ ශ්‍රවණ පරීක්ෂණ සැසි පවත්වන ලදී. තවද, සේවකයින්ට තම පුද්ගල යහපැවැත්මට සමගාමීව වෘත්තීයභාවය පවත්වා ගැනීමට උපකාර වන පරිදි වැඩ-ජීවිත සමතුලිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි නිතිපතා පවත්වනු ලබන අතර, එමඟින් ආතති අවදානම අඩු කරයි. සේවකයින්ට සිය යහපැවැත්ම පිළිබඳ ගැටලු නිදහසේ සාකච්ඡා කිරීමට සහ අවශ්‍ය විටෙක සහය ලබා ගැනීමට හැකි බව සහතික කිරීම සඳහා විවෘත හා විනිවිදභාවයෙන් යුතු සන්නිවේදන ක්‍රමවේදවලට එයාර්ලයින්ස් සිය ප්‍රමුඛත්වය දෙයි. සේවකයින් සඳහා විශේෂයෙන් සකස් කරන ලද අතිරේක සෞඛ්‍ය සේවා ප්‍රතිලාභ ලබා දීම සඳහා "දිගසිරි" සහ "සුවසම්පත" වැනි විශේෂ වෛද්‍ය යෝජනා ක්‍රම කාර්ය මණ්ඩල සුභසාධන සංගමය හරහා හඳුන්වා දී ඇත.

### සේවක සබඳතා සහ අනුකූලතාව

ගුවන් සේවය විවිධ කළමනාකරණ මට්ටම් සමඟ නිතිපතා සංවාද පවත්වමින් වෘත්තීය සමිති සහ සේවක සංගම් සමඟ ශක්තිමත්, ඵලදායී සබඳතා පවත්වා ගනී. විනිවිදභාවයෙන් යුතු සන්නිවේදන මාර්ග, සාධාරණ සාකච්ඡා ක්‍රියාවලීන් සහ සේවක

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## *මානව ප්‍රාග්ධනය තවදුරටත්.*

ගැටලු කාලෝචිත ලෙස විසඳීම මඟින් සේවක සමගිය ශක්තිමත් කරයි.

රාජ්‍ය ආයතන, නියාමන අධිකාරීන්, සේවා යෝජකයින්ගේ සම්මේලන සහ නීති විශේෂඥයින් සමඟ නිති සහයෝගීතාවයෙන් ජාතික කම්කරු නීති සහ ගුවන් සේවා රෙගුලාසි අනුගමනය කරමින් මානව සම්පත් ප්‍රතිපත්ති සකස් කර ඇත. මෙය අනුකූලතාවය සහතික කරන අතර සාධාරණ, ගෞරවනීය සහ සමානාත්මතාවයෙන් යුතු සේවා ස්ථානයක් පෝෂණය කරයි.

**විවිධත්වය, සමානාත්මතාවය සහ සම තැන ලබා දීම (DEI)**

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි ආයතනික වටිනාකම් සහ ව්‍යාපාරික සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස විවිධත්වය, සමානාත්මතාවය සහ සමාන පිළිගැනීම (DEI) පවත්වා ගෙන යනු ලබන වැඩ බිම් සංස්කෘතියක් පෝෂණය කිරීමට නිරන්තරයෙන් කටයුතු කරයි. විවිධාකාර සහ පුළුල් ශ්‍රම බලකායක් පවත්වා ගැනීමෙන් නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදනය වැඩි දියුණු කරන්නා සේම, සේවය කරන ගෝලීය ප්‍රජාව ද පිළිබිඹු කරන බවත්, ගනුදෙනුකරුවන්, හවුල්කරුවන් සහ කොටස්කරුවන් සමඟ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කරන බවත් සමාගම පිළිගනී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි වත්මන් ශ්‍රම බලකාය විවිධාකාර සහ තුලිත වයස් ව්‍යාප්තියකට අනුව පවත්වා ගෙන යයි. සේවකයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 21 සිට 50 දක්වා වයස් පරාසයට අයත් වන අතර එය මුළු කාර්ය මණ්ඩලයෙන් 81% කි. මේ සඳහා වයස අවුරුදු 21-30 (26%) සහ 31-40 (37%) යන වයස් කාණ්ඩ දෙකෙන්ම සැලකිය යුතු නියෝජනයක් ඇතුළත් වන අතර, අවුරුදු 41-50 (18%) වයස කාණ්ඩයද ඊට ඇතුළත් වේ. මෙතුළින් දක්ෂ තරුණයින් සහ පළපුරුදු වෘත්තිකයන්ගේ සංකලනයක් ගෙන එන අතර, පූර්ණ වෘත්තීය පරිසරයක් නිර්මාණය කරයි. තරුණ සේවකයින් අනුවර්තනය වීමේ හැකියාව, තාක්ෂණික ප්‍රවීණතාවය සහ නව ඉදිරිදර්ශන සමඟ සිය දායකත්වය සපයන අතර, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ආයතනික දැනුම, උපදේශකත්වය සහ උපායමාර්ගික දුරදක්නාභාවය සමඟ සිය දායකත්වය සපයයි. පරම්පරාවල සංකලනය තුළින් නවෝත්පාදනය, ඔරොත්තු දීමේ හැකියාව සහ කර්මාන්තයේ වෙනස් වන ඉල්ලීම් සහ පාරිභෝගික අපේක්ෂාවන් ඵලදායී ලෙස සපුරාලීමට සංවිධානයේ හැකියාව ශක්තිමත් කරයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි DEI කැපවීම්වලින් අරමුණ වනුයේ, ස්ත්‍රීපුරුෂ භාවය, වයස, ජනවාර්ගිකත්වය, විශේෂ අවශ්‍යතා ඇති පිරිස, ආගම, ලිංගික දිශානතිය හෝ සංස්කෘතික පසුබිම නොසලකා සෑම පුද්ගලයෙකුටම සමෘද්ධිමත් වීමට සමාන අවස්ථා ලැබිය යුතුය යන විශ්වාසය පවත්වා ගැනීමයි. එයාර්ලයින්ස් විසින් විවිධත්වයට ගරු කරයි; එමෙන්ම ආයතනික වර්ධනය සහ පැවැත්ම මෙහෙයවන දිගු කාලීන ප්‍රතිලාභයක් ලෙස එයට වැදගත්කමක් ලබා දෙයි.

මෙම මූලධර්ම ආරක්ෂා කිරීම සඳහා, විවිධ කුසලතා සහ පසුබිම් පිළිබිඹු කරන ශ්‍රම බලකායක් ආකර්ෂණය කර ගැනීමට, සංවර්ධනය කිරීමට සහ රඳවා ගැනීමට නිර්මාණය කර ඇති මධ්‍යස්ථ සහ සාධාරණ වෘත්තීය පරිසරයක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පවත්වාගෙන යයි. මෙහිදී ඕනෑම ආකාරයක වෙනස්කොට සැලකීම්, හිරිහැර කිරීම් සහ පක්ෂග්‍රාහී වීම් වැළැක්වීම සඳහා දැඩි ප්‍රතිපත්ති සහ භාවිතයන් පවත්වා ගෙන යනු ලබයි. සේවකයින්ට ඔවුන්ගේ අව්‍යාජ ස්වභාවයන් ප්‍රකාශ කිරීමට දිරිමත් කරනු ලබන අතර, සමාගම අන්‍යෝන්‍ය ගෞරවය, විවෘතභාවය සහ සහයෝගීතාව නිරතුරු ආරක්ෂා කරයි. සේවයට එක් වූ පසු, සේවකයින්ට සිය ශක්‍යතා පෝෂණය කරගැනීමට සහ වෘත්තීය ප්‍රගතිය සාධනය කරගැනීමට ඉවහල් වන ලෙස නිර්මාණය කර ඇති වෘත්තීය සංවර්ධන වැඩසටහන්, නායකත්ව පුහුණුව සහ උපදේශන අවස්ථා සඳහා සම ප්‍රවේශ පවතී. සියලු පුද්ගලයින්ට වර්ධනය වීමට සහ සංවිධානයේ සාර්ථකත්වයට අර්ථවත් ලෙස දායක වීමට සාධාරණ අවස්ථාවක් ඇති බව සහතික කරමින් උසස්වීම් සහ ප්‍රවර්ධනය කිරීමේ තීරණ කාර්ය සාධනය, කුසලතා සහ ප්‍රදර්ශනය කරන ලද හැකියාවන් මත දැඩි ලෙස පදනම් වී ඇත. මීට අමතරව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි DEI මුලපිරීම්වල ඵලදායීතාවය අඛණ්ඩව තක්සේරු කිරීම සඳහා ශ්‍රම බලකායේ දත්ත සහ ප්‍රතිපෝෂණ නිරතුරු නිරීක්ෂණය කරයි. සමාගම විසින් සේවක සමීක්ෂණ සහ විවෘත සන්නිවේදන මාර්ග හරහා, වැඩිදියුණු කිරීම සඳහා අවස්ථා හඳුනාගෙන, වඩාත් සාර්ථක සේවා ස්ථානයක් පෝෂණය කිරීම සඳහා එහි සැලසුම් සඳහා ඒවා යොදා ගනී.

2024/25 සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මානව ප්‍රාග්ධන සැලසුම්, මෙහෙයුම් විශිෂ්ටත්වය ලබා දීමට සහ දුෂ්කර වෙළඳපළ අභියෝගවලට මුහුණ දීමට හැකියාව ඇති දක්ෂ, කැප වූ සහ විවිධත්වයෙන් යුතු ශ්‍රම බලකායක් ගොඩනැගීම වෙනුවෙන් නිර්මාණය කර ඇත. ඉලක්කගත කුසලතා අත්පත් කර ගැනීම, පුළුල් සංවර්ධන වැඩසටහන්, සේවා ස්ථාන තුළ සහයෝගී පිළිවෙත් සහ කාර්යක්ෂම අවදානම් කළමනාකරණය හරහා, ගුවන් සමාගමට සේවක යහපැවැත්ම සහ ආයතනික පැවැත්ම වැඩි දියුණු කරන අතරම වර්ධනය සහ නවෝත්පාදනයන් පවත්වා ගැනීමට හැකියාව ලබා දේ.



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය මඟින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා විශිෂ්ටත්වයට පාදක වන අත්‍යවශ්‍ය භෞතික හා තාක්ෂණික වත්කම් නියෝජනය කරයි. මේ සඳහා අපගේ කල්බදු ගුවන් යානා සමූහය, නඩත්තු සහ ඉංජිනේරු පහසුකම්, ගොඩබිම් හැසිරවීමේ ආධාරක උපකරණ, ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, යානස්ථ ආහාර සැපයුම් පහසුකම්, විශේෂිත පුහුණු ආයතන සහ ගුවන් භාණ්ඩ හැසිරවීමේ විධි ඇතුළත් වේ. මෙම භෞතික වත්කම් මඟින් අපගේ මූලික ගුවන් සේවා මෙහෙයුම්වල අඛණ්ඩතාව සහතික කරනු ලබයි. එමෙන්ම, ගනුදෙනුකරුවන්ට සහ හවුල්කරුවන්ට උසස් තත්ත්වයේ සේවාවන් සැපයීමේ හැකියාව ලබා දෙයි. ප්‍රාග්ධනය අධික ලෙස භාවිත වන කර්මාන්තයක් ලෙස, ගුවන් සේවා දැඩි ලෙස ප්‍රශස්ත ක්‍රියාකාරිත්වය, අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ අවදානම් අවම කිරීම සඳහා අවධානය යොමු කරයි. එමඟින් මූල්‍ය කාර්ය සාධනය, වෙළඳ සන්නාමයේ වටිනාකම, ආරක්ෂක අනුකූලතාව සහ කොටස්කරුවන්ගේ විශ්වාසය සහතික කරයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි නිෂ්පාදිත ප්‍රාග්ධනය යනු තිරසාර වටිනාකමක් ඇති සක්‍රීය මෙන්ම, දිගුකාලීන සහයකයෙකු වේ. මෙම ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා අප ගන්නා ක්‍රියාමාර්ග මඟින් කාර්යක්ෂමතාව, පැවැත්ම සහ නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කරයි. මෙහෙයුම් යටිතල පහසුකම්වල ඉලක්කගත ආයෝජන මේ සඳහා ශක්තිය සපයයි. සාර්ව ආර්ථික අභියෝග, ගෝලීය සැපයුම් දාමයේ සීමාවන් සහ නිශ්චිත ගොඩබිම් හැසිරවීම් සහ ගුවන් යානා වත්කම්වල ආයු කාලය පුරා පවතින පීඩන හමුවේ පවා, වත්කම්වල අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව ආරක්ෂා වෙනුවෙන් අපි විචක්ෂණශීලීව, ඉදිරි දැක්මක් සහිතව කටයුතු කළෙමු.

### ගුවන් යානා ඇණිය කළමනාකරණය සහ ඉංජිනේරු කටයුතුවල යටිතල පහසුකම්

කෙටි, මධ්‍යම සහ දිගු දුර මාර්ග හරහා මඟී සහ භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් සඳහා අපගේ ගුවන් යානා ඇණිය අඛණ්ඩව සහය දක්වයි. වසර තුළ, A320/321 Neo ගුවන් යානා ඇණියේ CFM එන්ජින්වලට අදාළ එන්ජින් කාර්ය සාධන ගැටලු හේතුවෙන් මෙහෙයුම් ස්ථායිතාවයට අභියෝග ඇති විය; ගුවන් යානා සංරචක සහ අමතර කොටස් ගෝලීය වශයෙන් හිඟ වූ හෙයින් මෙය තවදුරටත් උග්‍ර විය. මේ සඳහා පිළියමක් වශයෙන්, ප්‍රායෝගික කාලසටහන්, කාර්යක්ෂමව ගුවන් ගමන් සැලසුම් කිරීම සහ සැලසුමකට අනුව නඩත්තු කටයුතු පවත්වා ගැනීමෙන් අපි ගුවන් යානා ඇණිය කළමනාකරණය සඳහා වඩාත් කඩිනම් ප්‍රවේශයක් අනුගමනය කළෙමු. ගුවන් වාර ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ගුවන් යානා ක්‍රියාත්මක වන බව සහතික කරමින්, විවිධ ගුවන් යානා එකවර නඩත්තු සඳහා භාවිතයෙන් ඉවත් කිරීම වළක්වන ආකාරයෙන් නඩත්තු කාර්යයන් පවත්වා ගෙන යන ලදී. තවද, ගුවන් යානාවල තත්ත්වය පිළිබඳ තත්‍ය කාලීන නිරීක්ෂණ සිදු කිරීමෙන් ගැටලු කල්තියා හඳුනා ගැනීමට සහ ඒවා කාර්යයේ යෙදවීමට බලපෑම් ඇති වීමට පෙර නඩත්තු කටයුතු සැලසුම් කිරීමට හැකියාව ලැබුණි. එසේම, දීර්ඝ ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම ප්‍රතිස්ථාපනයක් පවත්වා ගැනීම සඳහා තීරණාත්මක සංරචකවල ගබඩා පවත්වා ගැනීම හෝ අවශ්‍ය ස්ථානවලට බෙදා හැරීම සිදු කරන ලදී. නියමිත වේලාවට ගුවන් යානා පිටත් වීම ඉහළ නැංවීමට සහ අනපේක්ෂිත ලෙස සේවයෙන් බැහැර වීම අවම කිරීමට මෙම භාවිතයන් සහය විය. එමඟින් ගුවන් යානා සේවයේ යෙදවීමේ හැකියාව ප්‍රශස්ත කළේය.

ඉංජිනේරු අංශය ගුවන් යානා නඩත්තු පහසුකම් සහ අදාළ තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා අරමුණු සහ සැලසුම් පාදක කර ගත් උපායමාර්ගික ආයෝජන සිදු කළේය. එමඟින් මෙහෙයුම් විශ්වසනීයත්වය, නියාමන අනුකූලතාව සහ සමස්තයක් ලෙස සූදානම සහතික කරන ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගුවන් යානාවල සේවා හැකියාව ඉහළ දැමීම, උපාංගවල ගුණාත්මකභාවය සහතික කිරීමේ සහ පරීක්ෂණ කිරීමේ හැකියාවන් අභ්‍යන්තරව ශක්තිමත් කිරීම සහ උපාංගවලට වෙනස්කම් නොකොට පරීක්ෂා කිරීමේ සේවා පුළුල් කිරීම අරමුණු කරගත් සැලසුමක් සහිත නඩත්තු කටයුතුවලට ආයෝජන සිදු කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම් මෙහෙයුම් කාර්යක්ෂමතාවයට සහය දක්වමින්, බාහිර සේවා සපයන්නන් මත යැපීම අවම කළ අතර අභ්‍යන්තර නඩත්තු අවශ්‍යතා සහ තෙවන පාර්ශවීය සේවා සපුරාලීමට ගුවන් සමාගමේ හැකියාව ඉහළ නංවයි. සමස්තයක් ලෙස, ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ තාක්ෂණික ප්‍රවීණතාවයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉංජිනේරු අංශයේ කැපවීම සඳහා මෙම ආයෝජන මහත් පිටිවහලක් වන අතර, වර්තමාන සහ අනාගත මෙහෙයුම් අභියෝගවලට මුහුණ දීම සඳහා ගුවන් සමාගමේ ගුවන් යානා මනා සූදානමකින් යුතු බව සහතික කරයි.



### භූමි මෙහෙයුම් සහ ගුවන්තොටුපළ සේවා හි යටිතල පහසුකම්

පැරණි බිම් හැසිරවීමේ උපකරණ (GSE) යොදා ගනිමින් මෙහෙයුම් ක්‍රියාත්මක වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි බිම් හැසිරවීමේ

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## නිෂ්පාදිත ප්‍රාග්ධනය තවදුරටත්.

අංශය විසින් දැඩි හා ක්‍රියාශීලී නඩත්තු සේවාවලට අනුකූලව විශ්වාසදායක සේවාවක් නිරන්තරයෙන් ලබා දී ඇත. මෙම පිළිවෙත මඟින් නියමිත සහ වරලත් ගුවන් ගමන් සඳහා අඛණ්ඩ සහය ලබා දෙමින්, 85% ඉක්මවන සේවා ශක්‍යතාවක් සහතික කළේය. සේවා ප්‍රමිතීන් පවත්වා ගැනීම, බාධා අවම කිරීම සහ මගී විශ්වාසය පවත්වා ගැනීම සඳහා
උපායමාර්ගික සම්පත් කළමනාකරණය සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ඉතා වැදගත් වේ.

උපකරණවල ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම මෙන්ම, එයාර්ලයින්ස් එහි ප්‍රමුඛ මධ්‍යස්ථානය වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (BIA) භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ගුවන්තොටුපළ සහ ගුවන් සේවා සමාගම සමඟ සමීප හවුල්කාරිත්වයකින්, වසර තුළදී ප්‍රධාන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම්වලට ගමන් මලු ධාවන තීරු දීර්ඝ කිරීම ඇතුළත් වන අතර එමඟින් ගමන් මලු හැසිරවීමේ ධාරිතාව ඉහළ නංවමින්, පැමිණෙන මගීන්ගේ රැඳී සිටීමේ කාලය අවම කරනු ලැබීය. තවද, මගී පිවිසුම් ද්වාර කාර්යක්ෂමව පවත්වා ගැනීමට කටයුතු කළේය. එය බාධා රහිතව මගීන්ට ගමන් කිරීමේ පහසුව සහ ගුවන් යානාවල ගොඩබිම් කටයුතු කාර්යක්ෂම වීම සඳහා පහසුකම් සපයනු ලබයි. සමස්තයක් ලෙස මෙම මුලපිරීම් ගොඩබිම තුළ රැඳී සිටීමේ කාලය කෙටි කරමින්, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කළේය. එමෙන්ම මගීන් හට සමස්ත සේවා ගුණාත්මකභාවයෙන් යුතුව පිරි නැමීමට උපකාරී විය.

මගී සුවපහසුව සහ තෘප්තියේ වැදගත්කම හඳුනා ගනිමින්, ගුවන් තොටුපළ සේවා කණ්ඩායම විසින් විවේකාගාර සහ ගුවන් ගමන්වල හුවමාරු ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සිදු කරනු ලැබිණ. පහසුකම්වල වාතාවරණය සහ සුවපහසුව ඉහළ නංවමින් මෙම වැඩිදියුණු කිරීම්වලදී විශේෂයෙන් ප්‍රමුඛ මගීන් සහ ජාත්‍යන්තරව සම්බන්ධ වන මගීන් කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණ.

මෙම භෞතික වැඩිදියුණු කිරීම් සඳහා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගොඩබිම් මෙහෙයුම් සහ මගීන් අනුගමන කළ යුතු පිළිවෙත්වල කාර්යක්ෂමතාව තවදුරටත් උසස් කරලීමට තාක්ෂණික නවෝත්පාදනයන් යොදා ගෙන ඇත. නැවතුම් පාලන මධ්‍යස්ථානයට සජීවී උපකරණ පුවරු හඳුන්වාදීම මෙහි ප්‍රමුඛ සංවර්ධන කටයුත්තක් විය. මෙමඟින් පවතින ගුවන් ගමන් පිළිබඳ යාවත්කාලීන කිරීම් සහ මෙහෙයුම් දත්ත සපයනු ලබයි. මෙම මෙවලම මඟින් ගමනාගමන පාලකයන් සහ ගොඩබිම් කාර්ය මණ්ඩලය වෙත වෙනස් වන තත්ත්වයන්ට ඉක්මනින් ප්‍රතිචාර දැක්වීමට, ප්‍රමාදයන් අවම කිරීමට සහ ගුවන්යානා ධාවනපථවල සම්පත් යෙදවීම ප්‍රශස්ත කිරීමට හැකියාව ලබා දෙයි. මීට අමතරව, මගී ප්‍රවාහයන් විධිමත් කිරීමට සහ තදබදය අවම කිරීමට ස්වයං සේවා තාක්ෂණය භාවිතය කිරීමට ගුවන් සමාගම ක්‍රියාකාරීව කටයුතු කළේය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් පූර්ණ ස්වයං සේවා පහසුකම් සහිත ස්මාර්ට් සංචරණ ක්‍රියාවලියක් ලබා දෙන ලදී. මෙහිදී මගීන්ට KIOSK භාවිත කරමින් තම ගමන් මලු ලබා ගැනීම සහ ටැග් කිරීම (SBD) සිදු කළ හැකි අතර කාර්ය මණ්ඩලයේ උපකාර නොමැතිව ගමන් මලු ස්වයංක්‍රීයව තැම්පත් කිරීමේ හැකියාව ලබා දේ. මගීන් පදනම් කරගත් ගුවන් සේවයක් ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් නව තාක්ෂණයෙන් යුතු Kiosks සහ SBD උසස් හැකියාවන් යොදා ගනිමින් BIA හි ස්වයං සේවා හැකියාවන් දියුණු කිරීම් තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරයි.




### ගුවන් යානයේ ගමන් ගන්නා පාරිභෝගිකයින්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් තෝරාගත් පටු බඳ සහිත එයාර්බස් A320 ගුවන් යානා සඳහා යානස්ථ රැහැන් රහිත උපාංග යොදා ගනිමින් විනෝදාස්වාද පහසුකම් (IFE) හඳුන්වාදීමෙන් ගමන් ගන්නා පාරිභෝගිකයින් වෙත උසස් සේවාවක් ලබා දීමට කටයුතු කර ඇත. මෙම අති නවීන පද්ධතිය, මගීන්ට ගුවන් යානය තුළදී SkyPlus නම් වූ Wi-Fi ජාලය භාවිතයෙන් ස්මාර්ට් දුරකථන, ටැබ්ලට් සහ ලැප්ටොප් ඇතුළු ඔවුන්ගේ පෞද්ගලික උපාංග හරහා, පුළුල් පරාසයක විනෝදාස්වාද අන්තර්ගතයන් වෙත සෘජුවම පහසුවෙන් සම්බන්ධවීමේ හැකියාව ලබා දෙයි. මෙම රැහැන් රහිත විසඳුම, මගීන් සඳහා දැඩි නම්‍යශීලීභාවයක්, සුවපහසුවක් සහ අභිරුචිකරණයක් ලබා දෙමින් ආසන පිටුපස ඩිජිටල් තිර යොදා ගැනීමේ සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඉවත් වෙයි. SkyPlus ජාලය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගුවන් යානාවල විනෝදාස්වාද කටයුතු සඳහා සීමා නොමැති, පහසු සම්බන්ධතාවයක් ලබා දෙයි. එහි සුපරීක්ෂාකාරීව තෝරා ගත් සහ නිතිපතා යාවත්කාලීන කරන, ඕනෑම අවස්ථාවක රස විඳිය හැකි චිත්‍රපට, රූපවාහිනී කතා මාලා, සංගීත ධාවන ලැයිස්තු, සාකච්ඡා, ක්‍රීඩා සහ තවත් දෑ අන්තර්ගත වේ. පුළුල් පරාසයක මගී විවිධත්වයට සහ මනාපයන්ට ගැළපෙන පරිදි සුපරීක්ෂාකාරී ලෙස අන්තර්ගතය තෝරාගෙන ඇති අතර, සියලුම ගුවන් යානාවල ආකර්ශනීය අත්දැකීමක් ලබා දීම සහතික කරයි. මගීන්ගේම උපාංග යොදා ගනිමින්, රැහැන් රහිත IFE පද්ධතිය පරිශීලක පහසුව වැඩි දියුණු කරන අතර, සාම්ප්‍රදායික ලෙස ආසන පිටුපස උපාංග සම්බන්ධ කිරීමෙන් ඇතිවන බර සහ නඩත්තු වියදම් අවම කරයි. මෙය සමස්ත ඉන්ධන කාර්යක්ෂමතාවයට දායක වන අතර ගුවන් සමාගමේ තිරසාර ඉලක්ක සපුරාලයි.

### ආහාර සැපයුම්වල යටිතල පහසුකම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව

ශ්‍රීලංකන් කේටරින් සමාගම තම නිෂ්පාදන පහසුකම් ප්‍රශස්ත කරමින් සහ සැපයුම් සහ තොග නිසි ආකාරයෙන් හැසිරවීම මඟින් මෙහෙයුම් ශක්තිය සහ වෙළඳපළ නායකත්වය අඛණ්ඩව පවත්වා ගනු ලැබීය. ඉල්ලුම ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ, මෙම අංශය මඟින් නිෂ්පාදන සැලසුම් කිරීම, බලශක්ති ඉතිරිකිරීමේ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සහ නාස්තිය අවම කිරීම සඳහා මුළුතැන්ගෙයි කටයුතු අධීක්ෂණය සිදු කරන ලදී. ISO සහ HACCP අනුකූලතාව සමඟ නිසි ඒකාබද්ධව පවත්වා ගනිමින්, තත්ත්ව සහතිකරණයේ වැඩිදියුණු කිරීම් මඟින් ආහාර සුරක්ෂිතතාව සහ සනීපාරක්ෂාව පිළිබඳ ඉහළම ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික

කළේය. වාණිජමය දෘෂ්ටිකෝණයකින්, අංශය විසින් පාරිසරික තිරසාරභාවය පදනම් වූ ඇසුරුම්කරණය සහ වෙළඳ නාමකරණය, උසස් ආහාර කාණ්ඩ සහ සූපවේදීන් ඉදිරිපත් කරන විශේෂ මෙනු හඳුන්වා දෙමින් නිෂ්පාදනවල වෙනසක් ඇති කළේය. මේ හරහා අපගේ සන්නාමය පාරිභෝගිකයින් වෙත තවත් සමීප වූ අතර, හවුල්කාර ගුවන් සමාගම් සහ ආයතනික සේවාදායකයින් සමඟ ඉහළ විකුණුම් අවස්ථා නිර්මාණය කළේය. උෂ්ණත්වය පාලනය කළ ගබඩාකරණය සහ දිගු කාලයක් පවත්වා ගැනීමට හැකිවන පරිදි කළමනාකරණය සඳහා ආයෝජනය කිරීම හේතුවෙන් අපතේ යාම අවම වූ අතර පිරිවැය කාර්යක්ෂමතාවය පවත්වා ගැනීමට හැකි විය.

### භාණ්ඩ හැසිරවීම සඳහා යටිතල පහසුකම් පිහිටුවීම සහ පුළුල් කිරීම

ගුවන් සමාගමේ භාණ්ඩ අංශය විසින් යටිතල පහසුකම් නැවත සකස් කිරීම සහ අනාගත ආරක්ෂණය සම්බන්ධයෙන් බොහෝමක් වැඩ කටයුතු සිදු කොට ඇත. උෂ්ණත්ව සංවේදී දෑ ගබඩා කිරීමේ පහසුකම් ඉහළ නංවමින්, ඖෂධ, දිරාපත් වන ද්‍රව්‍ය සහ ඉහළ වටිනාකමක් ඇති භාණ්ඩ සඳහා වෙන් කළ කලාපයක් සහිතව භාණ්ඩ ගබඩාගාරයන් නැවත සැලසුම් කරන ලදී. එන්නත් සහ සායනික අත්හදා බැලීමේ ද්‍රව්‍ය විශේෂ ආරක්ෂාවක් යටතේ නැව්ගත කිරීම වැනි සැපයුම් දාමයේ වැදගත් කටයුතු සඳහා තත්‍ය කාලීන උෂ්ණත්ව අධීක්ෂණ පද්ධතියක් හඳුන්වාදීම මඟින් භාණ්ඩවල ආරක්ෂිතභාවය සහ නියාමන අනුකූලතාව වැඩි දියුණු කළේය.

ඉහළ ධාරිතාවයකින් යුත් ෆෝක්ලිෆ්ට් යොදා ගැනීමෙන් භාණ්ඩ හැසිරවීමේ ධාරිතාව පුළුල් කළ අතර, සිදු කළ වැඩිදියුණු කිරීම් මඟින් ගබඩාවේ සිට ගුවන් යානය දක්වා පවතින කාර්යයන් පහසු කිරීමට දායක විය. ඉදිරිය ගැන සාකච්ඡා කිරීමේදී, උසස් කළමනාකරණ හැකියාවන් පවතින නව භාණ්ඩ පර්යන්තයේ සංවර්ධන කටයුතු මේ වන විට අවසන් අදියරේ පසු වෙයි. වත්මන් පර්යන්තය, නශ්‍ය වන භාණ්ඩ සහ කුරියර් හැසිරවීමේ මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමට නියමිත අතර, භාණ්ඩ හසුරුවන ප්‍රමාණය සහ සේවා විවිධත්වය ඉහළ නැංවීමට මෙය මහෝපකාරී වේ. මෙම සංවර්ධන කටයුතු කලාපීය භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස කොළඹ නගරය ස්ථානගත කිරීමේදී වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරයි.

### වටිනාකම් නිර්මාණයට දායකත්වය

නිෂ්පාදිත ප්‍රාග්ධනය මඟින් කෙටි කාලීන මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ව්‍යාපාරය පුරා දිගු කාලීන වටිනාකම් නිර්මාණය සඳහා සෘජුව දායකත්වයක් ලබා දේ. යානා තුළ ස්ථාපිත පද්ධති, ගමන් මලු හැසිරවීම සහ ආහාර සැපයුම් පහසුකම් පාරිභෝගික තෘප්තිය සහ පක්ෂපාතිත්වයට සෘජුවම බලපානු ලබයි. එමෙන්ම, නඩත්තු විශ්වසනීයත්වය, ඩිජිටල්කරණය පාදක වූ ගොඩබිම් මෙහෙයුම් සහ ගුවන් යානා ඇණිය පුළුල් කිරීමේ අධීක්ෂණ පද්ධති මඟින් පිරිවැය ඉතිරිකිරීම්, කාර්ය සාධන ස්ථාවරත්වය සහ වර්ධනයවීමේ හැකියාව ඇති කරනු ලබයි.

වත්කම් අක්‍රීය කාලය අවම කරමින් මූල්‍ය ලාභය පවත්වා ගැනීම, ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි කිරීම, අලුත්වැඩියා වියදම් අවම කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා නිෂ්පාදිත ප්‍රාග්ධනයේ ආයෝජන බලපාන ලදී. බලශක්ති කාර්යක්ෂමතා පද්ධති, පරිසර හිතකාමී ආහාර සැපයීමේ පිළිවෙත් සහ කාබන් විමෝචනය අවම කරන ගමන් මාර්ග හඳුන්වාදෙන තාක්ෂණය යොදා ගැනීම හේතුවෙන් පරිසර කළමනාකාරිත්ව පවත්වා ගැනීම පහසු විය. මෙම අන්තර් සම්බන්ධිත බලපෑම් හේතුවෙන් නිෂ්පාදිත ප්‍රාග්ධනය ගුවන් සමාගමේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියා පටිපාටිවල වටිනා දායකයෙකු බවට පත් විය.

### අනෙකුත් ප්‍රාග්ධනයන් සමඟ අන්තර් සබඳතාව

නිෂ්පාදිත ප්‍රාග්ධනයේ කාර්ය සාධනය සහ සංවර්ධනය අනෙකුත් ප්‍රාග්ධනවලට සම්බන්ධ වී ඇත. තාක්ෂණික පුහුණුව, කුසලතා සංවර්ධනය සහ වෘත්තීය සුරක්ෂිතභාවය සහතික කරනු ලබන යටිතල පහසුකම් මඟින් මානව ප්‍රාග්ධනය ශක්තිමත් වේ. මූල්‍ය ප්‍රාග්ධනයේ ආරක්ෂාව සහ වර්ධනය උදෙසා; මෙහෙයුම් අකාර්යක්ෂමතා අවම කිරීම සහ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය දීර්ඝ කිරීම සිදු කරයි. නඩත්තු කටයුතු පිළිබඳ වාර්තා ඩිජිටල්කරණය, තත්‍ය කාලීන අධීක්ෂණ මෙවලම් සහ තොරතුරු තාක්ෂණ පද්ධති හරහා දැනුම ග්‍රහණය කිරීමෙන් බුද්ධිමය ප්‍රාග්ධනය ශක්තිමත් වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය, අපගේ සමාජීය සහ ස්වාභාවික ප්‍රාග්ධන සැලසුම් සඳහා සහය දක්වයි. අවම පරිසර දූෂණයක් පවත්නා වාහන, අපද්‍රව්‍ය වෙන් කිරීමේ උසස් පද්ධති සහ අවම විමෝචනයක් සහිත ආහාර සැපයුම් උපකරණ අපගේ පාරිසරික පියසටහන අඩු කිරීමට උපකාරී වේ. එමෙන්ම, මගීන් සමඟ සෘජු සම්බන්ධයක් ඇති ස්ථානවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම; ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීමට සහ කීර්ති නාමය පවත්වා ගැනීමට ධනාත්මක ලෙස බලපායි.

### ඉදිරි දැක්ම සහ උපායමාර්ගික ව්‍යාපෘති

ඉල්ලුමේ අපේක්ෂිත වර්ධනය සපුරාලීමට සහ සම්බන්ධතා අරමුණු පවත්වා ගැනීම පිළිබඳ සැලසුම් සාක්ෂාත් කරගැනීම සඳහා ඉදිරි වසර පහ තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය ගුවන් යානා ඇණිය පුළුල් කිරීමට කටයුතු කරයි. පුහුණු පහසුකම්, ඉංජිනේරු කටයුතු ඩිජිටල්කරණය, ගබඩා ස්වයංක්‍රීයකරණය සහ පර්යන්තවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සමාන ආයෝජන සිදු කෙරේ. නවීන භාණ්ඩ ප්‍රවාහන පර්යන්තයක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සහ නශ්‍ය වන භාණ්ඩ සහ විද්‍යුත් වාණිජ්‍ය හැසිරවීම සඳහා පවතින ඉඩ නැවත භාවිත කිරීමට යොමු වීම තුළින් දකුණු ආසියාවේ සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ගුවන් සේවය ස්ථානගත කිරීමේ අපගේ අභිලාෂය මනාව සංකේතවත් කරයි.

නිෂ්පාදිත ප්‍රාග්ධනයෙන් ලබාගත් වටිනාකම වැඩි දියුණු කිරීමේදී, නඩත්තු කටයුතු ඩිජිටල්කරණය, පුරෝකථන විශ්ලේෂණ හඳුන්වාදීම සහ ඉන්ධන-කාර්යක්ෂම ගුවන් යානා විකල්ප වෙත මාරුවීම වැනි කාර්යයන් මඟින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සංවර්ධනයේ ඊළඟ පරිච්ඡේදය සඳහා අපි සූදානම් වන අවස්ථාවේ, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ දිගුකාලීන තිරසාරභාවය වෙනුවෙන් සහය දක්වන කල්පවතින, කාර්යක්ෂම සහ අනාගතයට සූදානම් භෞතික වත්කම් පදනමක් ගොඩනැගීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු.



# බුද්ධිමය ප්‍රාග්ධනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි බුද්ධිමය ප්‍රාග්ධනය ලෙස අර්ථ දක්වනුයේ ගුවන් සේවයට කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට, අඛණ්ඩව නවෝත්පාදනය කිරීමට සහ කර්මාන්තය තුළ සුවිශේෂිත්වය පවත්වා ගැනීමට පාදක වන සාමූහික දැනුම, පද්ධති, ක්‍රියාවලීන් සහ සබඳතාවන් ය. මෙම ප්‍රාග්ධනයට දැනුම කළමනාකරණය සහ මෙහෙයුම් දැනුම, ඩිජිටල් වේදිකා සහ උසස් තොරතුරු තාක්ෂණ පද්ධති, ශක්තිමත් වෙළඳ නාම සාධාරණත්වය, ප්‍රතීතනය සහ අනුකූලතා ක්‍රමවේද සහ නවෝත්පාදන ඇතුළත් වේ.

## දැනුම කළමනාකරණය සහ මෙහෙයුම් ලේඛන

ඉහළ ආරක්ෂාව, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා දැනුම මනා ලෙස කළමනාකරණය අත්‍යවශ්‍ය බැව් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් පිළිගනී. මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ ආරක්ෂණ ප්‍රොටෝකෝලවල සිට තාක්ෂණික මාර්ගෝපදේශ සහ පාරිභෝගික සේවා ප්‍රමිතීන් දක්වා වටිනා දැනුම නිරවද්‍ය ලෙස ලේඛනගත කර, අඛණ්ඩව යාවත්කාලීන කර, අදාළ සියලුම දෙපාර්තමේන්තු හරහා ඵලදායී ලෙස සංසරණය වන බව සහතික කරලීමට ගුවන් සේවය තුළ පුළුල් පද්ධති සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කර ඇත.

### *ගුවන් සේවා-විශේෂිත මෙහෙයුම් අත්පොත් සහ ඩිජිටල් ගබඩා*

මෙම ක්‍රියාමාර්ගවල අරමුණ ලෙස වසර ගණනාවක මෙහෙයුම් අත්දැකීම් සහ නියාමන අනුකූලතාවයන් එක් කොට සකස් කළ හා සංස්කරණය කළ ගුවන් සේවා-විශේෂිත අත්පොත් දැක්විය හැකිය. මෙම අත්පොත් මඟින් ගුවන් ගමන් මෙහෙයුම්, පිටත් කිරීම්, ඉංජිනේරු විද්‍යාව, යානස්ථ සේවා, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර බුද්ධිය ඇතුළු පුළුල් පරාසයක ක්ෂේත්‍ර ආවරණය කරයි. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP), හදිසි අවස්ථා සැලසුම්, ආරක්ෂක ක්‍රියාමාර්ග සහ පාරිභෝගික හැසිරවීමේ ක්‍රියාවලීන් පිළිබඳ සවිස්තරාත්මක උපදෙස් එහි අඩංගු වේ. ප්‍රවේශ්‍යතාවයේ වැදගත්කම හඳුනා ගනිමින්, මෙම අත්පොත් සහ අදාළ ලේඛන, විශේෂ අභ්‍යන්තර ගබඩා සහ දැනුම කළමනාකරණ පද්ධති හරහා පහසු ප්‍රවේශයකින් ඩිජිටල් ආකෘතිවලින් පවත්වා ගෙන යනු ලබයි. එමඟින් සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය නවතම තොරතුරු වෙත ක්ෂණික ප්‍රවේශය ඇති බව සහතික කරයි.

පෙර පැවති ගුවන් මාර්ග කාර්ය සාධන මිනුම්, සවිස්තරාත්මක ඉන්ධන දහන විශ්ලේෂණ සහ ප්‍රමාදවීම්වල රටා පිළිබඳ වාර්තා වැනි ප්‍රධාන මෙහෙයුම් දත්ත සහ අවබෝධය මෙම පද්ධති තුළ ක්‍රමානුකූලව එකතු කර, ගබඩා කර, විශ්ලේෂණය කරනු ලැබේ. මෙම වටිනා දත්ත ගබඩාව දැනුවත් තීරණ ගැනීම සඳහා උපකාරී වන අතර, කළමනාකරණ සහ මෙහෙයුම් කණ්ඩායම්වලට ගුවන් ගමන් සැලසුම් ප්‍රශස්ත කිරීමට, ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට, නියමිත වෙලාවට වැඩ කිරීමට සහ ප්‍රමාදයන් අවම කිරීමට ඉඩ සලසයි. එවැනි දත්ත එදිනෙදා මෙහෙයුම්වලට ඒකාබද්ධ කිරීමෙන් දත්ත මත පදනම් වූ කළමනාකරණ පිළිවෙත් පවත්වා ගැනීමට ගුවන් සමාගමේ කැපවීම පෙන්නුම් කරයි.

### *නිෂ්පාදක මාර්ගෝපදේශ සහ නියෝග*

අභ්‍යන්තර ලේඛන පවත්වා ගැනීමට අමතරව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් එයාර්බස්වල තාක්ෂණික සටහන්, යමක් අලුතින් හඳුනා ගැනීමේ ලේඛන සහ අනෙකුත් නියාමන කරුණු දක්වන නිෂ්පාදක මාර්ගෝපදේශ එහි දැනුම පරිසර පද්ධතියට එකතු කරනු ලබයි. නවතම ආරක්ෂක ප්‍රමිතීන්, තාක්ෂණික යාවත්කාලීන කිරීම් සහ අනුකූලතා අවශ්‍යතා පිළිපැදීම සහතික කරලීමට මෙම ලේඛන නිතිපතා සමාලෝචනය කර මෙහෙයුම් අත්පොත් සහ පුහුණු මාදිලිවලට ඇතුළත් කරනු ලැබේ. එසේ කිරීමෙන්, ගෝලීය ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් සේවය පවත්වා ගෙන යන අතර, ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය යාවත්කාලීන තොරතුරු අනුව ක්‍රියාත්මක වන බව සහතික කරයි.

මානව ප්‍රාග්ධනය යනු මෙහෙයුම් විශිෂ්ටත්වයේ පදනම බව වටහා ගනිමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ව්‍යුහාත්මක දැනුම හුවමාරු වැඩසටහන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. තාක්ෂණික සහ මෙහෙයුම් දෙපාර්තමේන්තු තුළ මෙය විශේෂයෙන් වැදගත් වේ. ගුවන් සේවය මඟින් පළපුරුදු වෘත්තිකයන් අලුතින් බඳවා ගත් සේවකයින් සමඟ මුහු කරමින් විධිමත් සැසි, කෙටි විස්තර සහ උපදේශන මුලපිරීම් හරහා දැනුම බෙදා ගැනීමේ පහසුකම් සපයයි. මෙම වැඩසටහන් තාක්ෂණික කුසලතා සහ මෙහෙයුම් ක්‍රියා පටිපාටි ලබා දීමට පමණක් නොව, වෙනස්වන සහ ඉහළ අවදානම් පරිසරයන්හි අත්‍යවශ්‍ය වන අත්දැකීම් සහිත දැනුම, මෙහෙයුම් විනිශ්චය සහ ගැටලු විසඳීමේ ශිල්පීය ක්‍රම සන්නිවේදනය කිරීම සඳහා නිර්මාණය කොට ඇත.

එවැනි දැනුම හුවමාරු යාන්ත්‍රණ මඟින් විශේෂඥතාවයේ අඛණ්ඩ පැවැත්ම සහතික කරන අතර, සේවක පිරිවැටුම හෝ භූමිකාව වෙනස් කිරීම් සම්බන්ධයෙන් අවදානම් අඩු කරයි. මෙම ප්‍රවේශය; නව සේවකයින්ට ප්‍රගතිය සඳහා අවශ්‍ය නිපුණතා සහ මෙහෙයුම් අවබෝධය ලබා ගැනීමට පැහැදිලි මඟ පෙන්වීමක් ලබා දෙමින් වෘත්තීය සංවර්ධනයට සහය වේ.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි තොරතුරු තාක්ෂණ අංශය විසින් සහයෝගීතාව වැඩි දියුණු කිරීම, මෘදුකාංග සංවර්ධනය විධිමත් කිරීම සහ වටිනා ආයතනික දැනුම ආරක්ෂා කිරීම සඳහා නවීන ඩිජිටල් භාවිතයන් භාවිත කරනු ලබයි. මෙම ප්‍රවේශයන් පැහැදිලි ලේඛන පවත්වා ගැනීම, නව කණ්ඩායම් සාමාජිකයින් පහසුවෙන් කටයුතු ආරම්භ කිරීම සහ ගුවන් සමාගමේ ඩිජිටල් මෙහෙයුම්වල ස්ථාවර පැවැත්ම සඳහා උපකාරී වේ. මෙය නවෝත්පාදනය සහ

අඛණ්ඩ වැඩිදියුණු කිරීම වෙනුවෙන් අපගේ අරමුණු පිළිබිඹු කරයි.

හදිසි අවස්ථා ක්‍රියා පටිපාටි, ආරක්ෂක නියෝග සහ මෙහෙයුම් යාවත්කාලීන කිරීම් නිතිපතා සමාලෝචනය කර, සංශෝධනය කර, තත්‍ය කාලීනව පවත්වා ගෙන යන අතර, සියලු මට්ටම් සහ කාර්යයන්හි සේවකයින් නවතම ක්‍රියාමාර්ග අනුව ක්‍රියාත්මක වන බව සහතික කරයි. නිතිපතා පුහුණු සහ සන්නිවේදන මුලපිරීම් මඟින් යාවත්කාලීන ලේඛන පවත්වා ගැනීමේ අරමුණු සපුරාලනු ලබයි. එය අවබෝධය සහ අනුගත වීම වෙනුවෙන් ඉතා වැදගත් වේ.

### එලදායි පුහුණු කිරීමේ රාමුව

තාක්ෂණික දියුණුවට සමගාමීව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පුළුල් පුහුණු වැඩසටහන් මාලාවක් හරහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. මෙම මුලපිරීම් සේවකයින්ව අවශ්‍ය තාක්ෂණික නිපුණතාවලින් සන්නද්ධ කිරීම මෙන්ම, ආරක්ෂාව, තිරසාරභාවය සහ නියාමනවලට අනුගත වීම ප්‍රවර්ධනය කරයි.

ගුවන් සේවයේ විවිධ සේවක කණ්ඩායම් සඳහා ආරම්භක සහ පුනරාවර්තන පුහුණු වැඩසටහන් සකස් කර ඇත. මෙය කර්මාන්තයේ සංවර්ධන සහ නියාමන වෙනස්කම්වලට අනුකූලව නිරන්තරයෙන් කුසලතා වැඩි දියුණු කිරීම සහ දැනුම යාවත්කාලීන වීම සහතික කරයි. අභ්‍යන්තර විශේෂඥතාව තවදුරටත් ගොඩනැගීම සහ ගෝලීය ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුකූල වීම වෙනුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ඉලක්කගත තාක්ෂණික පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වමින් සිය සහභාගීත්වය ලබා දේ. මේ සඳහා තෙහෙට්ටුව පිළිබඳ දැනුවත්භාවය සහ අවම කිරීම, ගුවන් යානා ක්‍රියාකාරිත්වය, ඉන්ධන අධීක්ෂණය සහ විමෝචන අනුකූලතාව, ජාත්‍යන්තර සහ දේශීය බලපත්‍ර ප්‍රමිතීන්, හදිසි සහ අක්‍රමවත් මෙහෙයුම් පුහුණුව සහ මානව සාධක පුහුණුව ඇතුළත් වේ.

ව්‍යුහගත නියාමන මැදිහත්වීම මඟින්, නඩත්තු සහ ගුවන් යෝග්‍යතා කළමනාකරණ කාර්යයන් පරිණාමය වන ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුකූලව පවතින බව සහතික කරයි. නිතිපතා විගණනය, තාක්ෂණික සම්බන්ධීකරණය සහ මෙහෙයුම් අත්පොත් සහ ක්‍රියා පටිපාටි සඳහා ක්‍රමානුකූල යාවත්කාලීන කිරීම් මඟින් ආරක්ෂක නියෝග සහ නියාමන වෙනස්කම් කාලෝචිත ලෙස යොදා ගැනීම සහතික කරයි. එමෙන්ම එමඟින් අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ මෙහෙයුම් සූදානම වෙනුවෙන් හිතකර වතාවරණයක් පවත්වා ගනිමින් අනුකූලතාව පවත්වා ගනී. ඉලක්කගත කුසලතා සංවර්ධන මුලපිරීම් සඳහා කාර්ය සාධන ඇගයීම් සහ ව්‍යුහගත තක්සේරු කිරීම් උපකාරී වන අතර, එය අඛණ්ඩ සංවර්ධනයක් සහතික කරමින්, ආයතනික වර්ධනයට වක්‍රව දායක වේ. ආරක්ෂක නියෝග සහ මෙහෙයුම් ක්‍රියාමාර්ග සඳහා සංශෝධන ඇතුළු නියාමන ප්‍රකාශන ක්‍රියාකාරීව අධීක්ෂණය කරන අතර, එහි යාවත්කාලීන කිරීම් ව්‍යුහගත සන්නිවේදනය, යාවත්කාලීන කරන ලද විස්තරාත්මක උපදේශන ලේඛන සහ ඉලක්කගත පුහුණුව හරහා සිදු කරයි. මෙය වෙනස්වන ප්‍රමිතීන් අනුව සංවිධානයේ අනුකූලතාව පවතින බැව් සහතික කරයි.

මෙම වැඩසටහන් සාමූහිකව ගත් කළ ආයතනික ඉලක්ක කිහිපයකට සහය වේ: එනම්, ගුවන් යානා කාර්ය සාධනය සහ ඉන්ධන සැලසුම් ප්‍රමිතීන් දැඩි ලෙස පිළිපැදීම, තිරසාර ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉන්ධන සම්පත් කාර්යක්ෂමව භාවිතය සහ දැඩි විගණන සහ නියාමන පරීක්ෂණවලට භාජනය වීමට සූදානම, එමඟින් ගුවන් සමාගමේ අනුකූලතා ස්ථාවරය පවත්වා ගැනීම මේ අතර වේ.

### තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඩිජිටල් වත්කම්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තොරතුරු තාක්ෂණ අංශය 'ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති' ලෙස හඳුන්වයි. එය ගුවන් සේවයේ ව්‍යාපාර සැලසුම් සහ අරමුණුවලට අනුකූලව ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් උපාය මාර්ග පාලනය කරයි. එහිදී ඩිජිටල්කරණ ව්‍යාපාර පද්ධතියක් සහ වැඩිදියුණු කළ මගී අත්දැකීම් සහිත පහසු මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා ගුවන් සේවා කර්මාන්තයේ අති නවීන තාක්ෂණයන් යොදා ගැනීමට අදහස් කරයි.

මෙම වසරේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස දත්ත මත පදනම් වූ තීරණ ගැනීම, පාරිභෝගික සහභාගීත්වය වැඩි දියුණු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය (AI) සහ යාන්ත්‍රික ඉගෙනීම (ML) වැනි නැගී එන තාක්ෂණය වැඩි වශයෙන් යොදා ගැනීම ආදිය දැක්විය හැකිය. මෙම වර්ධනයන් ගුවන් සමාගමේ පුළුල් වන ඩිජිටල් විකුණුම් ජාල සහ විද්‍යුත් ව්‍යාපාර අංශවලට යොදා ගෙන ඇති අතර, ආදායම් වර්ධනය සහ පුද්ගලාරෝපිත මගී සේවා සඳහා නව අවස්ථා විවෘත කරයි.

### AI/ML මඟින් ක්‍රියාත්මක වන නව ආදායම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම

මින් පෙර, ජාල පදනම් වූ වාහකයෙකු ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සාම්ප්‍රදායික පාදක පද්ධති භාවිතයෙන් ආරම්භය සහ ගමනාන්තය (O&D) පදනම් කරගත් ආසන ලබා ගැනීමේ හැකියාව කළමනාකරණය කිරීමේදී සීමාවන්ට මුහුණ දුන්නේය. 2024 ඔක්තෝම්බර් මාසයේදී, ගුවන් සේවය PROS හි AL/ML පදනම් කරගත් ආදායම් කළමනාකරණ ප්‍රතිලාභ (RMA) සහ Amadeus ආදායම් ලබා ගැනීමේ හැකියාව සහ ක්‍රියාකාරී තක්සේරුව (RAAV) මඟින් බල ගැන්වෙන නවීන, තත්‍ය කාලීන O&D වේදිකාව යොදා ගනු ලැබුවේය. කෘත්‍රිම බුද්ධි ඇල්ගොරිතම මඟින් වෙළඳපළ තත්ත්වයන්, තරඟකරුවන්ගේ මිලකරණය සහ ඉතිරි ආසන ධාරිතාව අඛණ්ඩව ඇගයීමට ලක් කරයි. ඒ හරහා ආරම්භය සහ ගමනාන්තය පුරා ටිකට් මිල ගණන් සහ ආසන ලබා ගැනීමේ හැකියාව ප්‍රශස්ත කරනු ලබයි. මගීන් තෝරා ගැනීමට ඉඩ ඇති සංචාර පිළිබඳ විස්තර හෝ මිල පුරෝකථනය කරමින්, ගාස්තු සකස් කරන ආකාරය වැඩිදියුණු කරමින් පාරිභෝගික හැසිරීම් ආකෘතිකරණය කිරීමට ML උපකාරී වේ. මෙම උසස් විසඳුම් මඟින් සම්පූර්ණ මගී ගමනාගමනය පුරාවට ආසන ලබා ගැනීමේ හැකියාව ක්ෂණිකව ගණනය කරයි. එමෙන්ම වඩාත් පහසු, දත්ත මත පදනම් වූ තීරණ සහ වඩාත් නිවැරදි ගාස්තු දීමනා මෙහිදී ලබා දේ. සියලුම විකුණුම් නාලිකා හරහා තත්‍ය කාලීන ඒකාබද්ධ කිරීම මඟින් ප්‍රශස්ත ආසන බෙදා හැරීම සහ උසස් සම්බන්ධතාවය, ලාභදායීතාවය සහ මගී අත්දැකීම් වැඩිදියුණු කිරීම සහතික කරයි.

### මෙහෙයුම් ක්ෂේත්‍රවල වෙනසක් ඇති කරලීමට ස්වයංක්‍රීය රොබෝ තාක්ෂණය යොදා ගැනීම

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය සිය ඩිජිටල් පරිවර්තන ගමනේ ප්‍රධාන සහකරුවා ලෙස ස්වයංක්‍රීය රොබෝ ක්‍රියාවලි (RPA) යොදා ගනිමින්, මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ නව යුගයක් ආරම්භ කරයි. සාම්ප්‍රදායික ක්‍රමවේදයේදී, සැලකිය යුතු කාලයක් වැයවන සහ නැවත නැවත අතින් සිදු කළ යුතු කටයුතු ඉහළ ප්‍රමාණයක් පැවතුණේය. ඊට පිළියම් ලෙස RPA යොදා ගනු ලබයි. මෙම මුලපිරීම් හේතුවෙන් ඉන්වොයිස් කිරීම, සැසඳුම් සහ දත්ත වලංගුකරණය වැනි කාර්යයන් RPA යොදා ගනිමින් සිදු කිරීමට අදහස් කරයි. මෙම ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම මඟින් සැකසුම් කාලය සැලකිය යුතු ලෙස අවම කිරීම, නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ වේගවත්, කඩිනම් සහ වඩාත් ඔරොත්තු දෙන මෙහෙයුම් වෙනුවෙන් ඉඩ සලසන වැඩ කටයුතු සක්‍රීය කිරීම අරමුණු කරයි.

### තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) වන "එයාර්ලයින්ස් ඉන්සයිට්", ආයතනය පුරා දිගු කාලීන සහ උපායශීලී තීරණ ගැනීම බලගන්වන, මූලික දැනුම ලබා දෙන ප්‍රවාහය ලෙස ක්‍රියා කරයි. වෙන්කිරීම්, ටිකට්පත නිකුත් කිරීම් සහ සංචාරක හැසිරීම් ඇතුළු පුළුල් දත්ත භාවිතයෙන්, එයාර්ලයින්ස් ඉන්සයිට් අන්තර්ක්‍රියාකාරී උපකරණ පුවරු, සවිස්තරාත්මක වාර්තා සහ ස්වයංක්‍රීය කාර්ය

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## බුද්ධිමය ප්‍රාග්ධනය තවදුරටත්.

සාධන දර්ශක ඇඟවීම් හරහා තත්‍ය කාලීන, අර්ථවත් අවබෝධයක් ලබා දෙයි.

ජ්‍යෙෂ්ඨ නායකත්වය සහ මෙහෙයුම් කණ්ඩායම්වලට සහය වීම සඳහා නිර්මාණය කර ඇති මෙම වේදිකා මඟින් දත්තවල විනිවිදභාවය, යුහුසුලු ප්‍රතිචාර වාර ගණන, ව්‍යාපාරයේ කාර්යක්ෂමභාවය සහතික කරයි. එමඟින් මෙහෙයුම් කාර්ය සාධනය ඉහළ දැමීම, ආදායම ප්‍රශස්තකරණය සහ පාරිභෝගික අත්දැකීම් ඉහළ නංවන දැනුවත් තීරණ ලබා දෙයි. ගුවන් සේවයේ ඩිජිටල්කරණයේ තීරණාත්මක අංගයක් ලෙස, එයාර්ලයින්ස් ඉන්සයිට් අඛණ්ඩව වෙනස්වීමට භාජනය වෙමින්, ගුවන් සේවයේ දිගුකාලීන ඉලක්ක සමඟ දත්ත පදනම් වූ අවබෝධය සංයෝග කරයි.

### දත්ත මත පදනම් වූ ගුවන් සේවා නඩත්තුව

වැඩිදියුණු කළ ගුවන් සේවා විශ්වසනීයත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වාගනු පිණිස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ඉංජිනේරු අංශය එහි නඩත්තු මෙහෙයුම් පරිවර්තනයකට ලක් කරමින් අති නවීන තාක්ෂණික විසඳුම් යොදා ගෙන ඇත. මෙම පරිවර්තනයට පාදක වන ප්‍රමුඛ වේදිකා දෙකක් ඇත; AMOS සහ Airbus Skywise. ඒවා සාමූහිකව පුරෝකථන, දත්ත මත පදනම් වූ ගුවන් යානා නඩත්තුව සඳහා ශක්තිමත් ජාලයක් සාදයි. AMOS සහ Skywise ඒකාබද්ධ කිරීම මඟින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ඉංජිනේරු අංශයේ කටයුතු සැලකිය යුතු ප්‍රතිසාධනයක් ලැබුවේය. AMOS නඩත්තු කාලසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, අනුකූලතා පිළිපැදීම සහ ඉන්වෙන්ටරි කළමනාකරණය සහතික කරන අතර, Skywise ගුවන් යානා සමූහය පුරා විභව අවදානම් පිළිබඳ පුරෝකථන සහ තත්‍ය කාලීන අධීක්ෂණ සිදු කරයි.

### ගුවන් භාණ්ඩ මෙහෙයුම්වල ඩිජිටල් පරිවර්තනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් භාණ්ඩ හැසිරවීමේ පියවරයන් ස්වයංක්‍රීය කිරීමට සහ සම්පූර්ණයෙන්ම ඩිජිටල් ලේඛන භාවිතයන්වලට යොමු වීමට කටයුතු කර ඇත. මෙහිදී මූලික වශයෙන් ඉලෙක්ට්‍රොනික Air Waybill (e-AWB) පද්ධතිය යොදා ගනු ලබයි. මේ අනුව ගෝලීය කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල වෙමින් කඩදාසි භාවිතයෙන් බැහැර වන අතර, එය වේගවත්, වඩා ආරක්ෂිත භාණ්ඩ හැසිරවීමට සහය දක්වයි. මෙම තාක්ෂණික දියුණුවේ ප්‍රමුඛතම අංගයක් ලෙස භාණ්ඩ නැව්ගත කිරීම්වල සම්පූර්ණ ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ කළමනාකරණය කිරීමට නිර්මාණය කර ඇති අති නවීන වේදිකාවක් වන IBS මෘදුකාංගය මඟින් iCargo ගබඩා කළමනාකරණ පද්ධතිය (WMS) යොදා ගැනීම දැක්විය හැකිය. පද්ධතිය මඟින් තත්‍ය කාලීන ඉන්වෙන්ටරි කළමනාකරණය අධීක්ෂණය කරයි. එය ගබඩා පහසුකම් තුළ නැව්ගත කිරීම් නිවැරදිව නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දෙයි; දේශසීමා හරහා නැව්ගත කිරීම් කඩිනම් කිරීමට ස්වයංක්‍රීය රේගු නිෂ්කාශන ක්‍රියාවලි සිදු කරයි; එමෙන්ම පැටවීමේ කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සහ ප්‍රමාදයන් අවම කිරීම සඳහා භාණ්ඩ මෙහෙයුම් සහ ගුවන් ගමන් කාලසටහන් අතර සංවිධානය වැඩිදියුණු කරයි. ඊට අතිරේකව, භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්, රේගු බලධාරීන් සහ සැපයුම් හවුල්කරුවන් සමඟ ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරුව (EDI) සඳහා පද්ධතිය සහය වන අතර, සැපයුම් දාමය පුරා විනිවිදභාවය සහ ප්‍රතිචාර දැක්වීම වැඩි දියුණු කරන ඒකාබද්ධ, කඩදාසි රහිත ක්‍රමවේදයක් නිර්මාණය කරයි.

### ආයතනික ගුණාත්මකභාවය සහ අනුකූලතාවය ඩිජිටල්කරණය

ඉලෙක්ට්‍රොනික ලේඛන කළමනාකරණ පද්ධතිය (EDMS) සහ AeroDocs වැනි හිමිකාර පද්ධති හරහා ආයතනික ගුණාත්මකභාවය සහ නියාමන අනුකූලතාව තවදුරටත් ශක්තිමත් කරනු ලබයි. එමඟින් මෙහෙයුම් කාර්ය මණ්ඩලයට අත්පොත් සහ ක්‍රියා පටිපාටි ලේඛන වෙත පහසු, යාවත්කාලීන ප්‍රවේශයක් ලබා දේ. ගුවන් කාර්ය මණ්ඩලය සඳහා, Airbus Electronic Flight Bag (EFB) මඟින් අත්‍යවශ්‍ය අත්පොත් සහ තත්‍ය කාලීන යාවත්කාලීන කිරීම් ලබා දෙන අතර, අනුකූලතාව පවත්වා ගැනීම සහ මෙහෙයුම් සඳහා සූදානම වෙනුවෙන් පහසුකම් සපයයි.

### වෙළඳ නාමය සහ ආයතනයේ කීර්තිය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, පාර්ශවකරුවන්ගේ විශ්වාසය සහ පක්ෂපාතිත්වය වැඩි දියුණු කරන මූලික වත්කමක් ලෙස තම සන්නාමය වෙනුවෙන් අතිමහත් වටිනාකමක් ලබා දෙයි. එමෙන්ම ඉහළ තරඟකාරී ගුවන් සේවා කර්මාන්තය තුළ එහි තත්ත්වය ශක්තිමත් කරයි. සන්නාමය; ගුවන් සමාගමේ මෙහෙයුම් විශිෂ්ටත්වයේ සංකේතයක් පමණක් නොව, ලෝක මට්ටමින් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කරයි. මෙකී අරමුණු වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ අද්විතීය සංස්කෘතික උරුමය සහ ස්වාභාවික සුන්දරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා එහි දැක්ම සමඟ සංයෝජනය වන අලෙවිකරණය, හවුල්කාරිත්වයන් සහ අනුග්‍රාහකත්වයන් වෙනුවෙන් ගුවන් සමාගම විසින් ආයෝජනය කරයි.

මෑත වසරවල ගුවන් සමාගමේ වඩාත්ම බලගතු අලෙවිකරණ මුලපිරීමක් ලෙස "Colours of Jaffna" ව්‍යාපාරය දැක්විය හැකිය. අවධානයෙන් යුතුව නිර්මාණය කරන ලද මෙම ප්‍රචාරණ ව්‍යාපාරය, මින් පෙර ජාත්‍යන්තර සංචාරකයින්ගේ අවධානයට එතරම් ලක් නොවූ ප්‍රදේශයක් වන යාපනයේ විචිත්‍රවත් සංස්කෘතිය, ඉතිහාසය, ආහාර සහ දර්ශනීය භූ දර්ශන පිළිබඳ හඳුන්වා දෙයි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගෝලීය ප්‍රේක්ෂකයින්ට ස්වාධීන ගමනාන්තයක් ලෙස යාපනය ප්‍රවර්ධනය කළ පළමු ජාතික ආයතනය ලෙස මෙහිදී කටයුතු කරයි. දේශීය ප්‍රජාවන්ගේ කුලුපගභාවය, ඓතිහාසික විහාරස්ථානවල සහ පිරිසිදු වෙරළබඩ තීරයේ සුන්දරත්වය ලොවට ප්‍රදර්ශනය කිරීමෙන්, මෙම ප්‍රචාරණ ව්‍යාපාරය සාර්ථිකව යාපනය ගෝලීය සංචාරක සිතියමට ඇතුළත් කිරීමට උපකාරී විය. චාරිකා සහ සංචාරක අංශයේ වඩාත්ම කීර්තිමත් ගෞරවයක් වන PATA රන් සම්මානය 2024 වසරේදී දිනා ගැනීමත් සමඟින් මෙම ප්‍රචාරණ ව්‍යාපාරයේ කාර්ය සාධනය ජාත්‍යන්තරව පිළිගැනීමට ලක් විය. මෙම සම්මානය මඟින් ඉහත කී සුවිශේෂී ගමනාන්තය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සහ සංචාරය සඳහා අනුප්‍රාණයක් ලබා දීම වෙනුවෙන් ව්‍යාපාරය කෙතරම් දුරට නිර්මාණශීලිත්වය, අව්‍යාජභාවය සහ ඵලදායීතාව පවත්වා ගත්තේ ද යන්න පිළිබිඹු කරයි. පහත දැක්වෙන QR කේතය ස්කෑන් කිරීමෙන් වීඩියෝව නැරඹිය හැකිය.

ඊට සමගාමීව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉන්දියානු වෙළඳපොළ සමඟ එහි සම්බන්ධතාවය ශක්තිමත් කරලීමට "Relive the Epic of the Ramayana Trail" ව්‍යාපාරය ආරම්භ කළේය. එය ගුවන් සමාගමේ විශාලතම සහ වඩාත්ම වැදගත් පාරිභෝගික කාණ්ඩ අතරින් එකකි. මෙම ව්‍යාපාරය, රාමායණයේ පිරිපුන් සංස්කෘතික සහ මිථ්‍යා ආඛ්‍යානය සමඟ ගුවන් සමාගමේ සන්නාමය සංකලනය කරයි. එනම් මෙම වීර කාව්‍යයට සම්බන්ධ ශ්‍රී ලංකාවේ ස්ථාන ගවේෂණය කිරීමට සංචාරකයින්ට ආරාධනා කරයි. සංස්කෘතික කතන්දර සංචාර ක්ෂේත්‍ර සමඟ බද්ධ කිරීමෙන්, ගුවන් සමාගම සිය තරඟකරුවන්ගෙන් වෙනස් වෙමින් චිත්තවේගීය සම්බන්ධතාවයක් නිර්මාණය කරයි. සංස්කෘතික වශයෙන් වැදගත් මෙම ගමනාන්තයක් වෙත පියාසර කිරීමට සංචාරකයින්ගේ ඉහළම තේරීම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් බවට පත් කිරීමට මෙහිදී කටයුතු කරයි. පහත දැක්වෙන QR කේතය ස්කෑන් කිරීමෙන් වීඩියෝව නැරඹිය හැකිය.

ගමනාන්ත පදනම් කරගත් ව්‍යාපාරවලට සහය දෙමින්, “Safety in the Shades of Paradise” ව්‍යාපාරය මඟින් මගී ආරක්ෂාව සම්බන්ධයෙන් ගුවන් සමාගමේ විශේෂ පණිවුඩය ගෙන හැර දැක්වීය. මෙම මුලපිරීම ශ්‍රී ලංකාවේ ස්වභාවික සුන්දරත්වය ප්‍රවර්ධනය කරලීම මෙන්ම ඉහළම ආරක්ෂක ප්‍රමිතීන් සඳහා ගුවන් සමාගමේ සම්මුති විරහිත කැපවීම නිසි සමතුලිතතාවයකින් ඉදිරිපත් කරයි. ආකර්ෂණීය වීඩියෝ සහ පණිවුඩ මඟින්, ගමනාන්තයේ සුන්දරත්වය ඉස්මතු කරන්නා සේම, මගීන්ගේ යහපැවැත්ම ඉතා වැදගත් බව ඔවුන්ට පසක් කරයි. නවෝත්පාදන සහ ජාත්‍යන්තර ප්‍රජාව ආකර්ෂණය අගයමින් ITB බර්ලින් 2025 ගෝල්ඩන් සිටි ගේට් සම්මාන උළෙලේදී ගෝල්ඩ් ස්ටාර් සහතිකයක් ලද අතර, එය ගුවන් සේවා අලෙවිකරණය සහ මගී සහභාගීත්වය සම්බන්ධයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් නායකත්වය පිළිබිඹු කරයි.

ව්‍යාපාරවලින් හැරුණු කොට, ගුවන් සේවය ඉහළ පෙළේ වටිනා අනුග්‍රාහකත්වයන් සහ හවුල්කාරිත්වයන් හරහා සිය සන්නාමයේ පැවැත්ම තහවුරු කරයි. ඕස්ට්‍රේලියාවේ Great Ocean Road Running උළෙල සහ NIKE මෙල්බර්න් මැරතන් උළෙල වැනි ජාත්‍යන්තරයේ කීර්තියක් උසුලන ක්‍රීඩා ඉසව්වල වෙළඳනාම අනුග්‍රාහකත්වයන් මේ සඳහා නිදසුනක්ය. මෙම අනුග්‍රාහකත්වයන් ගුවන් සේවය ගෝලීය වශයෙන් හඳුනා ගැනීමට ලක් වීම වැඩි දියුණු කරන්නා සේම, සෞඛ්‍ය, ශක්තිය සහ ජාත්‍යන්තර මිත්‍රත්වයේ වටිනාකම් පෙරදැරි කරගත් සන්නාමයක් ලෙස ලොව පුරා විවිධ ප්‍රේක්ෂකයින් සහ විභව සංචාරකයින් අතරට ගෙන යයි.

මෙහෙයුම් අභියෝග මධ්‍යයේ පාරිභෝගික විශ්වාසය පවත්වා ගැනීමේ වැදගත්කම හඳුනා ගනිමින්, අනුබද්ධ සන්නාමයක් වන ශ්‍රීලංකන් හොලිඩේස් මඟින්, බාධා හෝ අර්බුද කාලවලදී මගීන් සහ සැපයුම්කරුවන් සමඟ කාලෝචිත, විනිවිදභාවයෙන් යුතු සහ සහකම්පන සන්නිවේදනයක් සහතික කරයි. නිරන්තර යාවත්කාලීන කිරීම් සහ විකල්ප සංචාරක විධිවිධාන හරහා ක්‍රියාශීලී පාරිභෝගික සහභාගීත්වය මඟින් සේවා විශිෂ්ටත්වය වෙනුවෙන් ගුවන් සේවයේ කැපවීම පිළිබිඹු කරන්නා සේම, සන්නාමයේ කීර්ති නාමයට අත්‍යවශ්‍ය විශ්වාසය සහ යහපාලනය ආරක්ෂා කිරීමට උපකාරී වේ.

යානස්ථ භෝජන අත්දැකීම තවදුරටත් ඉහළ නැංවීම සහ වෙනස් සූපශාස්ත්‍ර පිරිනැමීම අරමුණු කරමින්, අඩි 35,000ක පමණ උසකින් ගමන් කරන මොහොතේ සුවිශේෂී ආහාර අත්දැකීම් විඳගැනීමට අදහස් කරන සංචාරකයින් වෙත සුවිශේෂී, උසස් තත්ත්වයේ සූපශාස්ත්‍ර නිර්මාණ ඉදිරිපත් කිරීමට අදහස් කරයි.

සමස්තයක් ලෙස මෙම මුලපිරීම් මඟින්, සන්නාමය සහ ආයතනික කීර්තිනාමය කළමනාකරණය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සතු බහු කාර්යය ප්‍රවේශය මනාව පැහැදිලි කරයි. සම්මානලාභී අලෙවිකරණ ව්‍යාපාර හරහා වැදගත් ගෝලීය හවුල්කාරිත්වයන් සහ නොසැලෙන පාරිභෝගික අවධානය පවත්වා ගනිමින්, ශ්‍රී ලංකාව ආකර්ශනීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහි උපකාරී වේ. එමෙන්ම එය ඉදිරිය සඳහා තිරසාර වර්ධනයක් සහ වෙළඳපළ නායකත්වයක් පිහිටුවමින් ආරක්ෂිත, විශ්වාසදායක සහ සංස්කෘතික වශයෙන් අනුගත වූ ගුවන් සේවයක් ලෙස තමන්ගේම අනන්‍යතාවය ශක්තිමත් කරයි.

## ප්‍රතීතන සහ අනුකූලතා ප්‍රමිතීන් පවත්වා ගැනීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් බුද්ධිමය දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් දැඩි ප්‍රමිතීන් පවත්වා ගෙන යන අතර, මෙහෙයුම් අනුකූලතාව, ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, දත්ත ආරක්ෂණ ක්ෂේත්‍ර ඇතුළු බහු ජාත්‍යන්තර සහතික සමඟ අනුකූල වීම පවත්වා ගනී.

### *ගොඩබිම් හැසිරවීම සහ ගුවන්තොටුපළ සේවා: ආරක්ෂාව සහ අනුකූලතාව*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි ගොඩබිම් හැසිරවීමේ සහ ගුවන්තොටුපළ සේවා මෙහෙයුම්වලදී ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ නියාමන අනුකූලතාව සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙයි. ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) සාමාජිකයෙකු ලෙස, ගුවන් සමාගම ගොඩබිම් මෙහෙයුම් සඳහා වන IATA ආරක්ෂණ විගණනය (ISAGO) වැඩසටහනට ක්‍රියාකාරීව සහභාගී වේ. ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව භූමි හැසිරවීමේ සේවාවන්හි ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය තක්සේරු කිරීමට සහ අඛණ්ඩව වැඩිදියුණු කිරීමට මෙම දැඩි විගණන ක්‍රියාවලිය නිර්මාණය කර ඇත. ISAGO සහතිකකරණයට අමතරව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගොඩබිම් මෙහෙයුම් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත් දැඩි ලෙස අනුගමනය කරයි. ජාතික ආරක්ෂාව සහ මෙහෙයුම් අවශ්‍යතා සමඟ පූර්ණ අනුකූලතාවයක් සහතික කරමින්, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) විසින් නියම කර ඇති රෙගුලාසිවලට ද ගුවන් සමාගම අනුකූල වේ.

ICAO සහ දේශීය නියාමන රාමු සමඟ අනුකූල වීම මගින් ගුවන් යානා හැසිරවීම, මගී සේවා, ගමන් මලු කළමනාකරණය සහ ගුවන් මං තීරු මෙහෙයුම් ඇතුළුව සියලුම ගොඩබිම් සේවා ක්‍රියාමාර්ග ආරක්ෂිතව, කාර්යක්ෂමව සහ අවදානම් අවම කරන ආකාරයෙන් සිදු කරනු ලබයි. මගීන්ට සහ හවුල්කරුවන්ට බාධාවකින් තොරව සහ ආරක්ෂිත ගුවන් තොටුපළ අත්දැකීම් ලබා දීම සඳහා ගුවන් සමාගමේ කැපවීම සඳහා පදනම මෙම ප්‍රමිතීන් මඟින් සාදයි.

### *ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය (SLAC): ගුවන් සේවා පුහුණුවේ ප්‍රතීතනය ලත් විශිෂ්ටත්වය*

SLAC හි විශිෂ්ටත්වයේ ලක්ෂණයක් වනුයේ එහි නියාමන අනුමැති සහ සහතිකවල පුළුල් පරාසයයි. ශ්‍රී ලංකාව, පකිස්ථානය, නේපාලය සහ මාලදිවයින යන රටවලට සිවිල් ගුවන් සේවා බලධාරීන්ගෙන් විද්‍යාලය සඳහා විධිමත් අනුමැතිය ලැබී ඇත. මෙය කලාපයේ බහු අධිකරණ බල ප්‍රදේශ හරහා දැඩි නියාමන සහ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලන පුහුණු කිරීම් ලබා දීමට ඇති හැකියාව පිළිබිඹු කරයි. මෙකී රටවල් බොහෝමයක පිළිගැනීම හේතුවෙන් SLAC වෙත විවිධ රටවලින් සිසුන් සහ වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීමට ඉඩ සලසයි. එසේම විවිධ ගුවන් සේවා සන්දර්භයන් සහ ප්‍රමිතීන් මගින් දැනුවත් කරන ලද උසස් ඉගෙනුම් පරිසරයක් සහතික කරයි.

ජාත්‍යන්තර ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කරමින්, SLAC, යුරෝපීය සංගමයේ ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සිය (EASA) විසින් පිළිගනු ලබයි. මෙම කීර්තිමත් සහතිකකරණය මඟින් යුරෝපීය ගුවන් සේවා ප්‍රජාව විසින් නියම කරන ලද දැඩි ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ පුහුණු ප්‍රමිතීන්ට විද්‍යාලයේ අනුගත වීම අවධාරණය කරයි. EASA අනුමැතිය  SLAC වෙත යුරෝපීය සම්මතයන්ට අනුව පුහුණු පාඨමාලා පිරිනමනු ලබයි. එහි සුදුසුකම් ගෝලීය වශයෙන් පිළිගැනීමට පහසුකම් සපයන්නා සේම එහි උපාධිධාරීන් ලෝකයා සමඟ මුහු වෙමින් සහ රැකියා නියුක්තිය වැඩි දියුණු කරගැනීමට උපකාරී වේ.

අනුමත කරන බලධාරීන් විසින් පවත්වනු ලබන නිතිපතා විගණන මගින් ගුණාත්මකභාවය සහ ආරක්ෂාව වෙනුවෙන් විද්‍යාලයේ කැපවීම තහවුරු කරනු ලබයි. SLAC හි වාර්ෂික විගණන සියල්ල සාර්ථකව නිම කර ඇති අතර, එහිදී අනුකූල නොවන සොයාගැනීම් වාර්තා වී නැත. එය එහි ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධති, පුළුල් පුහුණු ක්‍රමවේද සහ ඵලදායී ආරක්ෂක කළමනාකරණ පිළිවෙත් පිළිබඳ සහතිකකරණයකි. මෙම විගණන මගින් විෂයමාලා නිර්මාණය, උපදේශක සුදුසුකම්, පුහුණු යටිතල පහසුකම්, ශිෂ්‍ය තක්සේරු කිරීම් සහ නියාමන රාමු සමඟ අනුකූල වීම ඇතුළුව SLAC හි මෙහෙයුම්වල සියලුම අංශ දැඩි ලෙස ඇගයීමට ලක් කරයි.

### *ශ්‍රීලංකන් කේටරින්: ගුණාත්මකභාවය, සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික අනුකූලතා වෙනුවෙන් කැපවීම*

ශ්‍රීලංකන් කේටරින් ආයතනය ආහාර සුරක්ෂිතතාව, සනීපාරක්ෂාව,

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## *බුද්ධිමය ප්‍රාග්ධනය තවදුරටත්.*

ගුණාත්මකභාවය, සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික වගකීම යන ඉහළම ප්‍රමිතීන් ස්ථිරව ආරක්ෂා කරමින් ක්‍රියාත්මක වේ. මෙම සංවිධානය (උපද්‍රව විශ්ලේෂණය සහ තීරණාත්මක පාලන ලක්ෂ්‍ය) සහතිකය (HACCP) ලබා ඇත. එය මූලාශ්‍රයෙන් ලබා ගැනීමේ සහ සකස් කිරීමේ සිට ගුවන් යානයට ගබඩා කිරීම සහ බෙදා හැරීම දක්වා වූ ආහාර නිෂ්පාදනයේ සෑම අදියරකදීම දැඩි ලෙස පාලනය කිරීම සහ අධීක්ෂණය සහතික කරයි. ඊට අමතරව, තත්ත්ව කළමනාකරණය, ආහාර සුරක්ෂිතතා කළමනාකරණය, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂක කළමනාකරණය සහ පාරිසරික කළමනාකරණය සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිබිඹු කරමින්, ශ්‍රීලංකන් කේටරින් ආයතනය විසින් ISO සහතික හතරක් හිමිකරගෙන ඇත. ISO සහතික කිරීම; සංවිධානයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ පාරිභෝගික තෘප්තිය සඳහා වන ක්‍රමානුකූල ප්‍රවේශයට සහය වේ. ආහාර සුරක්ෂිතතාවයට අමතරව, ශ්‍රීලංකන් කේටරින් සමාගම ශ්‍රී ලංකාව සඳහා අදාළ වන සියලුම පාරිසරික නීති සහ රෙගුලාසි මෙන්ම ගුවන් සේවා ආහාර සැපයුම් කර්මාන්තය තුළ විකාශනය වන ගෝලීය පාරිසරික ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන්ම අනුකූල වේ.



වගකිවයුතු අපද්‍රව්‍ය කළමනාකරණය, තනි භාවිත ප්ලාස්ටික් අඩු කිරීම, කාර්යක්ෂම සම්පත් භාවිතය සහ එහි මෙහෙයුම් පුරා පාරිසරික බලපෑම අවම කිරීම සඳහා පූර්වගාමී පියවර මෙයට ඇතුළත් වේ.

### *ඉංජිනේරු ක්ෂේත්‍රයේ නියාමන සහභාගීත්වය සහ අනුකූලතාව*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ඉංජිනේරු අංශය, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL), යුරෝපීය සංගමයේ ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සිය (EASA) සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර ආයතන ඇතුළු එහි ප්‍රාථමික නියාමන බලධාරීන් සමඟ සමීප සහ පූර්වගාමී සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. අනුමත නඩත්තු සංවිධානය (AMO) සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය (CAMO) යන කාර්යයන් දෙකම, විකාශනය වන ගුවන් සේවා ආරක්ෂණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට දැඩි අනුකූලතාවයක් පවත්වා ගනිමින් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා මෙම සහයෝගීතාවය අත්‍යවශ්‍ය වේ.

මෙම අනුකූලතාවය තහවුරු කිරීම සඳහා, අංශය විසින් නියමිත විගණන, තාක්ෂණික සම්බන්ධීකරණ රැස්වීම් සහ නියාමකයින් සමඟ අඛණ්ඩ ප්‍රතිචාර දැක්වීම ක්‍රියාකාරීව සිදු කරනු ලබයි. මෙම කටයුතු මඟින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට නියාමන වෙනස්වීම්වලට සූදානම් වීම සහ ආරක්ෂාව සහ තත්ත්ව සහතික කිරීම සඳහා විනිවිදභාවය සහ කැපවීම පෙන්නුම් කිරීමට හැකියාව ලබා දේ.

ඊට අමතරව, ඉංජිනේරු කණ්ඩායම විසින් ආරක්ෂිත විධාන ඇතුළු ප්‍රධාන නියාමන ප්‍රකාශන සහ 145 කොටස සහ M කොටස වැනි තීරණාත්මක රාමු සඳහා වන සංශෝධන දැඩි ලෙස නිරීක්ෂණය කරයි. නඩත්තුව සහ ගුවන් යෝග්‍යතා කළමනාකරණයට බලපාන ඕනෑම වෙනස්කමක් වහාම හඳුනාගෙන ප්‍රමාදයකින් තොරව විසඳා ගැනීම මෙම සුපරීක්ෂාකාරීත්වය මඟින් සහතික කරයි.

මෙම නියාමන යාවත්කාලීන කිරීම් අභ්‍යන්තරව ඵලදායී ලෙස ව්‍යාප්ත කරලීමට, අංශය විසින් ශක්තිමත් ප්‍රතිපෝෂණ සහ සන්නිවේදන යාන්ත්‍රණ ස්ථාපිත කර ඇත. මේ සඳහා සේවකයින්ට නවතම විධාන සහ ක්‍රියා පටිපාටිමය වෙනස්කම් පිළිගැනීමට සහ අවබෝධ කර ගැනීමට අවශ්‍ය වන ව්‍යුහගත කියවීම සහ සංඥා වැඩසටහන් ඇතුළත් වේ. තවද, නඩත්තු සංවිධාන ප්‍රදර්ශනය (MOE), අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ ප්‍රදර්ශනය (CAME) සහ ඉංජිනේරු ක්‍රියා පටිපාටි අත්පොත (EPM) වැනි තීරණාත්මක ලේඛන වත්මන් නියාමන ප්‍රමිතීන් පිළිබිඹු කිරීම සඳහා අඛණ්ඩව යාවත්කාලීන කෙරේ.

### ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගුවන් සේවා ආරක්ෂාව (UL Avsec) - ආරක්ෂිත අනුකූලතාව

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගුවන් සේවා ආරක්ෂක අංශය මූල්‍ය වර්ෂය පුරා ජාතික හා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රමිතීන් පවත්වා ගැනීමට සහ අධීක්ෂණය කිරීමට දැඩි කැපවීමක් පෙන්නුම් කර ඇත. මෙය කීර්තිමත් ප්‍රතීතන සහ පිළිගැනීම් මාලාවකින් සනාථ වේ, ඒ සඳහා ඇතුළත් වන්නේ:

- BIA සහ MRIA සඳහා ACC3 සහ RA3 සහතික, යුරෝපීය සංගමය සහ එක්සත් රාජධානියේ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ (DfT) රෙගුලාසිවලට අනුකූල වීම තහවුරු කරයි.
- ICAO-USAP විගණන සාර්ථකත්වය (2023), ගොඩබිම් හසුරුවන්නෙකු සහ ගුවන් යානා ක්‍රියාකරුවෙකු ලෙස මෙහෙයුම් විශිෂ්ටත්වය තහවුරු කිරීම.
- BIA සඳහා TSA පිළිගැනීම, ඇමරිකා එක්සත් ජනපදයට අදාළ ගුවන් ගමන්වල අවසානයට පිටත් වූ ස්ථානයේ මෙහෙයුම් වාතාවරණය (LPD) තත්ත්වය තහවුරු කිරීම.
- එංගලන්තයට අදාළ භාණ්ඩ ප්‍රවාහන කටයුතු නැවත පරීක්ෂා කිරීම ඉවත් කිරීම හේතුවෙන් BIA හි දී නැවත පරීක්ෂා කිරීම ඉවත් කිරීම.
- බංග්ලාදේශයෙන් භාණ්ඩ ප්‍රවාහනයට අවසර ලබා දෙමින් (දැනට සමාලෝචනය කරමින් පවතී) ඕස්ට්‍රේලියාවේ LPoC අනුමැතිය.

මීට අමතරව, UL Avsec මඟින් ආරක්ෂක පාලිත ප්‍රදේශ (SCAs) ආරක්ෂා කිරීම අධීක්ෂණය කරන අතර, එහි පුළුල් ආරක්ෂාව සහ අනුකූලතා සැලසුම් තවදුරටත් ශක්තිමත් කරයි.

මෙම ජයග්‍රහණ ශක්තිමත් මගී සහ භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් සඳහා පහසුකම් සපයයි. එමෙන්ම ගුවන් සමාගම විශ්වසනීයත්වය සහ නියාමන පිළිපැදීම සම්බන්ධයෙන් ගෝලීය විශ්වාසය වැඩි කරයි.

### බුද්ධිමය දේපළ ආරක්ෂාව සහ පුළුල් සයිබර් ආරක්ෂණ රාමුව

බුද්ධිමය දේපළ (IP) සහ සංවේදී ආයතනික දත්ත ආරක්ෂා කිරීම වැදගත් ව්‍යාපාරික අවශ්‍යතාවයක් ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සලකයි. අනවසර ප්‍රවේශය, දත්ත කඩ කිරීම් සහ සයිබර් තර්ජන වැළැක්වීම සඳහා නිර්මාණය කර ඇති උසස් තොරතුරු තාක්ෂණ ආරක්ෂක ක්‍රියාමාර්ග හරහා ඩිජිටල් වත්කම් අඛණ්ඩව නිරීක්ෂණය කරමින්, බුද්ධිමය දේපළ ආරක්ෂාව සඳහා ගුවන් සමාගම ක්‍රියාශීලී, විවිධත්වයෙන් යුතු ප්‍රවේශයක් අනුගමනය කරයි. හිමිකාර තොරතුරු සහ මෙහෙයුම් දත්ත ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක ස්ථර සාමූහිකව ස්ථාපිත කරන මෙම ක්‍රියාමාර්ගවලට අති නවීන සංකේතන තාක්ෂණය, දැඩි අනන්‍යතා සහ ප්‍රවේශ කළමනාකරණ පාලනයන්, ජාල ඛණ්ඩනය සහ නිතිපතා අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් වේ.

තොරතුරු ආරක්ෂාව, පෞද්ගලිකත්වය, තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය සහ තත්ත්ව සහතිකය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වය සඳහා ඇති කැපවීම අවධාරණය කරමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන කිහිපයක් ගුවන් සමාගම විසින් සාඩම්බරයෙන් හිමිකරගෙන ඇති අතර, ඒවා පහත පරිදි වේ:

- ISO/IEC 27001:2013 - තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය, තොරතුරු ආරක්ෂණ අවදානම් දැඩි ලෙස කළමනාකරණය කිරීම තහවුරු කරයි.
- ISO/IEC 27701:2019 - රහස්‍යතා තොරතුරු කළමනාකරණ පද්ධතිය, පුළුල් දත්ත රහස්‍යතා පාලනයන් සහතික කරයි.
- ISO/IEC 20000:2018 - තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණ පද්ධතිය, තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේදී ඉහළ ප්‍රමිතීන් සහතික කරයි.

- ISO 9001:2015 - මෘදුකාංග සංවර්ධනය සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතිය, මෘදුකාංග සේවා කාලය කළමනාකරණයේදී ක්‍රමානුකූල ගුණාත්මක භාවිතයන් වලංගු කිරීම.

මෙම සහතික කිරීම් මගින් ගුවන් සමාගම ගෝලීය හොඳම භාවිතයන්ට අනුකූල වීම ශක්තිමත් කරයි. අනුකූලතාව, ඔරොත්තු දීමේ හැකියාව සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා සංවිධානය පුරා ව්‍යුහගත තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතියක් (ISMS) එමඟින් ක්‍රියාත්මක කරයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC), පැය 24 පුරාම ක්‍රියාත්මක වන අතර, උසස් ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණ (SIEM) පද්ධති, බුද්ධිමය කටයුතුවලට ඇතිවන තත්‍ය කාලීන තර්ජන පිළිබඳ තොරතුරු සහ කෘත්‍රිම බුද්ධිය මත පදනම් වූ විශ්ලේෂණ භාවිත කරමින් අසාමාන්‍යතා ඉක්මනින් හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම් ආදි දෑ පවත්වා ගෙන යනු ලබයි. සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ කණ්ඩායම විසින් අවදානම් අවම කරමින්, ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කරමින්  සිදුවීම් සඳහා ක්ෂණික ප්‍රතිචාර දැක්වීම්, තර්ජන පාලනය, අධිකරණ වෛද්‍ය පරීක්ෂණ සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග හසුරුවනු ලබයි.

ගුවන් සමාගමේ සයිබර් ආරක්ෂණ යටිතල පහසුකම් පුළුල් ස්ථර ආරක්ෂක උපාය මාර්ග යක් මත රඳා පවතී. ඒ සඳහා ෆයර්වෝල් සහ ආක්‍රමණ වැළැක්වීමේ පද්ධති, අන්ත ලක්ෂ්‍ය (endpoint) ආරක්ෂාව, ආරක්ෂිත වලාකුළු ප්‍රවේශ ක්‍රියාපිළිවෙත් (cloud access protocols) සහ දත්ත හානිය වැළැක්වීමේ (DLP) මෙවලම් වැනි පරිමිතිය ආරක්ෂා කිරීම් ඇතුළත් වේ. නිතිපතා පරිශීලක හැසිරීම් විශ්ලේෂණය සහ අනුකරණය කරන ලද තතුබෑම් ව්‍යාපාර (simulated phishing campaigns); අඛණ්ඩ කාර්ය මණ්ඩල අධ්‍යාපනයේ අනිවාර්ය අංගයක් වේ. එය සයිබර් ආරක්ෂාව පවත්වා ගැනීමට පුද්ගලයින් තීරණාත්මක සාධකයක් ලෙස සලකනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ජාත්‍යන්තර දත්ත ආරක්ෂණ රෙගුලාසි, විශේෂයෙන් සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි (GDPR) සමඟ දැඩි අනුකූලතාවයක් පවත්වා ගෙන යයි. ගනුදෙනුකරුවන්, සේවකයින් සහ හවුල්කරුවන්ගේ පෞද්ගලික දත්ත එහි ජීවන චක්‍රය පුරා උපරිම සැලකිල්ලෙන් හසුරුවන බවට එය සහතික කරයි. මේ සඳහා නිතිපතා රහස්‍යතා බලපෑම් තක්සේරු කිරීම්, දත්ත ආරක්ෂණ විගණන සහ තෙවන පාර්ශවීය විකුණුම්කරුවන්ගේ දැඩි අධීක්ෂණය සහය වේ.

විධායක කළමනාකරණයේ සහ මණ්ඩල කමිටුවල කැපවූ අධීක්ෂණයක් සහිතව, සයිබර් ආරක්ෂණ පාලනය ඉහළම ආයතනික මට්ටම් සඳහා යොදාගෙන ඇත. උපායමාර්ගික තීරණ ගැනීම සහ ආරක්ෂක තාක්ෂණයන් වෙත ආයෝජනය සඳහා නිතිපතා අභ්‍යන්තර හා බාහිර විගණන පැවැත්වීම, ආචාරධර්ම වල විනිවිදභාවයේ පරීක්ෂණ සහ අඛණ්ඩ අවදානම් ඇගයීම් උපකාරී වෙයි. මෙම පරිපූර්ණ ප්‍රවේශය මඟින් ආයතනය පුරා සුපරීක්ෂාකාරීත්වය, වගවීම සහ පැවැත්මක් සහිත සංස්කෘතියක් පවත්වා ගෙන යනු ලබයි.

දියුණු තාක්ෂණය යොදා ගැනීම, දැඩි ප්‍රතිපත්ති බලාත්මක කිරීම, අඛණ්ඩ කාර්ය මණ්ඩල සංවර්ධනය සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තුළින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි බුද්ධිමය දේපළ සහ තීරණාත්මක දත්ත වත්කම්වල අඛණ්ඩතාව, රහස්‍යභාවය සහ උපයෝජ්‍යතාව සහතික කරයි. මෙම පුළුල් සයිබර් ආරක්ෂණ රාමුව ගුවන් සමාගමේ තරඟකාරී වාසිදායක තත්ත්වය ආරක්ෂා කිරීම, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ වඩාත් සංකීර්ණ හා ඩිජිටල් ගුවන් සේවා පරිසරයක කොටස්කරුවන් අතර විශ්වාසය පවත්වා ගැනීමට උපකාරී වේ.

## නවෝත්පාදන සහ අඛණ්ඩ වර්ධනය

ගනුදෙනුකරුවන්, සේවකයින් සහ හවුල්කරුවන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ නිරන්තරයෙන් සැලකිල්ලට ගනිමින් විශ්ලේෂණය කරමින්, ආයතනය තුළ ව්‍යුහගත යාන්ත්‍රණයන් හරහා නවෝත්පාදනය පෝෂණය වේ. මෙම දත්ත මත පදනම් වූ ප්‍රවේශය, ගෝලීය හොඳම භාවිතයන්ට අනුව, වැඩිදියුණු කිරීම සඳහා පවතින ගැටලු සහ අවස්ථාවන් හඳුනා ගනී.

විවිධ මගී මනාපයන් සහ වෙනස් වන සූපශාස්ත්‍ර ප්‍රවණතාවලට අනුකූල වෙමින් නව්‍ය සහ වෙනස් නිෂ්පාදන පිරිනැමීම් හරහා ගුවන් ගමන තුළ භෝජන අත්දැකීම වැඩි දියුණු කිරීමට ශ්‍රීලංකන් කේටරින් නිරන්තරයෙන් උත්සාහ කරයි. මෙම ප්‍රවේශයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ සශ්‍රීක උරුමය සහ සූපශාස්ත්‍ර සම්ප්‍රදායන් පිළිබිඹු කරන සංස්කෘතිකමය ගැළපුමක් ඇති ආහාර වට්ටෝරු සකස් කිරීම සහ ජාත්‍යන්තර රුචි අරුචිකම් තෘප්තිමත් කිරීම සඳහා ගෝලීය රසයන් ද වැළඳ ගැනීමයි. ගෝලීය ආහාර ප්‍රවණතා සහ ජනප්‍රිය ආහාර මනාපයන් ඇතුළත් කිරීම සඳහා ආහාර ලැයිස්තු නිතිපතා යාවත්කාලීන කරනු ලබයි. සුවිශේෂී උසස් මට්ටමක් ගනිමින් මගී තෘප්තිය වර්ධනය කිරීම සඳහා එය උපකාරී වේ. නූතන සංචාරකයින්ගේ විවිධ අවශ්‍යතා අවබෝධ කර ගනිමින්, ශ්‍රීලංකන් කේටරින් විසින් විශේෂ ආහාර රසයන් රාශියක් ඉදිරිපත් කරයි. සෑම විශේෂ ආහාර වේලක්ම රසය හෝ ඉදිරිපත් කිරීම පමණක් නොව දැඩි පෝෂණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රවේශමෙන් සකස් කර ඇත.

## අනෙකුත් ප්‍රාග්ධනයන් සමඟ ඒකාබද්ධ වීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි බුද්ධිමය ප්‍රාග්ධනය පහත පරිදි අනෙකුත් ප්‍රාග්ධනයන්ට සහය දක්වමින් එහි වර්ධනයන් පවත්වා ගෙන යයි:

- මානව ප්‍රාග්ධනය: ව්‍යුහගත පුහුණු පද්ධති, සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සහ දැනුම බෙදා ගැනීමේ යාන්ත්‍රණයන් හරහා, බුද්ධිමය ප්‍රාග්ධනය එහි අඛණ්ඩ කුසලතා සංවර්ධනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සහතික කරයි. ආයතනික ගුණාත්මකභාවය මගින් පැවැත්වෙන අභ්‍යන්තර විගණන මගින් ප්‍රශස්ත මෙහෙයුම් සඳහා සුදුසු සම්පත් වෙන් කිරීම පිළිබඳ සහතිකයක් ලබා දෙයි.
- නිෂ්පාදිත ප්‍රාග්ධනය: භෞතික වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂාව සඳහා ලේඛනගත නඩත්තු පද්ධති සහ ආරක්ෂක ක්‍රියාමාර්ග උපකාරී වේ. ආයතනික තත්ත්ව විගණන මඟින් මෙම ක්‍රියාවලීන් දැඩි ලෙස පිළිපැදීම සහතික කරයි.
- පාරිභෝගික ප්‍රාග්ධනය: මෙවලම් මගී අත්දැකීම් වැඩි දියුණු කිරීමට සහ දිගුකාලීන පාරිභෝගික සබඳතා වර්ධනය කිරීමට පක්ෂපාතිත්ව වේදිකා සහ ඩිජිටල් සම්බන්ධතා යොදා ගැනීමට බුද්ධිමය ප්‍රාග්ධන අංශය තවත් උනන්දු කරවයි.

## ඉදිරි කටයුතු

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉදිරි මූල්‍ය වර්ෂය සහ ඉන් ඔබ්බට කටයුතු කිරීමේදී, බුද්ධිමය ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සහ පරිණාමය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. ගුවන් සේවය අති නවීන තාක්ෂණයන් සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඉලක්කගත පුහුණු සහ සංවර්ධන වැඩසටහන් හරහා එහි මානව ප්‍රාග්ධනයේ කුසලතා පුළුල් කිරීම සඳහා කැපවී සිටී. කෘත්‍රිම බුද්ධිය, යන්ත්‍ර ඉගෙනීම සහ උසස් දත්ත විශ්ලේෂණ වැනි නවෝත්පාදනයන් වැළඳ ගැනීමෙන් වඩාත් කාර්යක්ෂම මෙහෙයුම්, වැඩිදියුණු කළ පාරිභෝගික අත්දැකීම් සහ දක්ෂ තීරණ ගැනීමේ ශක්‍යතාව සහතික වේ. ඊට අමතරව, ශක්තිමත් සයිබර් ආරක්ෂණ වැඩ පිළිවෙලක් හරහා බුද්ධිමය දේපළ සහ දත්ත ආරක්ෂා කිරීමේ අඛණ්ඩ උත්සාහයන් ශක්තිමත් කරනු ලබයි. එමඟින් ඇතිවන සයිබර් තර්ජනවලට මුහුණ දීමේ හැකියාව ලබා දේ. දැනුම බෙදාගැනීම, සහයෝගීතාවය සහ නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කිරීමෙන්, වෙනස්කම්වලින් පිරි ගුවන් සේවා කර්මාන්තය තුළ එහි තරඟකාරීත්වය පවත්වා ගැනීමට සහ ඩිජිටල් අනාගතයක තිරසාර වර්ධනයක් පවත්වා ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අරමුණු කරයි.

කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.



# සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් දේශීය සහ ගෝලීය ප්‍රජාව අතර අත්‍යවශ්‍ය සම්බන්ධකයෙකු ලෙස සේවය කරයි. ප්‍රවාහන කටයුතුවලින් ඔබ්බට අපගේ කාර්යභාරය විහිදී යයි. අපි විකුණුම්, සංචාරක ව්‍යාපාරය, සංස්කෘතික හුවමාරුව සහ ජාත්‍යන්තර සම්බන්ධතාවයට පහසුකම් සපයන අතරම, ගෝලීය මට්ටමින් රටේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටිමු. මෙම අවශ්‍යතා ඉටු කිරීමේදී, සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන හරයක් ලෙස පවතී. විශ්වාසය, විනිවිදභාවය සහ අන්‍යෝන්‍ය ගෞරවය මත පදනම් වූ, මගීන්, සේවකයින්, හවුල්කරුවන් සහ ප්‍රජාවන් සමග අපගේ සම්බන්ධතා මඟින් තිරසාරත්වය සහ පූර්ණ වර්ධනය සහතික කරයි. මූල්‍ය වර්ෂය තුළ ශක්තිමත් කොටස්කරුවන්ගේ සබඳතා වර්ධනය කිරීමට, පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමට, ප්‍රජා යහපැවැත්ම පෝෂණය කිරීමට සහ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට අපගේ උත්සාහයන් පිළිබඳ පුළුල් සමාලෝචනයක් මෙමඟින් සපයයි.

### කොටස්කරුවන්ගේ සබඳතා සහ සහභාගීත්වය

අපගේ මෙහෙයුම්වලට අත්‍යවශ්‍ය විවිධ කොටස්කරුවන්ගේ ස්වභාවයන්ට වටිනාකමක් ලබා දීම අපගේ ක්‍රියාමාර්ගවල මූලික හරයකි. විවේකී නිවාඩු සඳහා පැමිණෙන සංචාරකයින් සහ ව්‍යාපාරික සේවාදායකයින්ගේ සිට රජයේ ආයතන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් දක්වා, ඔවුන්ගේ ඉදිරිදර්ශන සහ අවශ්‍යතා අපගේ ව්‍යාපාර අරමුණු සකස් කිරීමේදී ඉතා වැදගත් බව අපි හඳුනා ගනිමු. අපි ක්‍රියාශීලී, විනිවිදභාවයෙන් යුතු සහ සියල්ල ඇතුළත් සම්බන්ධතා ස්වරූපයන් පවත්වා ගන්නා අතර, තීරණ ගැනීම සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වෙනුවෙන් සියලුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ පිළිබඳ අවධානය යොමු කරන බවට එමඟින් සහතික කෙරේ.

මගීන් යනු අපගේ වටිනාකම්හි වැදගත් කාණ්ඩයකි. ඔවුන්ගේ විකාශනය වන මනාපයන් සහ ඉහළ යන අපේක්ෂාවන් හඳුනා ගනිමින්, පහසුව, සුවපහසුව සහ පුද්ගලාරෝපිත සේවා කැටි කරමින් බාධාවකින් තොරව, අමරණීය සංචාරක අත්දැකීම් ලබා දීමට අපි උත්සාහ කරමු. අපි ප්‍රජාවන් විශේෂයෙන් සංචාරක අංශය සමඟ ජීවනෝපායන් බැඳී ඇති පිරිස, කුඩා පරිමාණ ව්‍යවසායකයින් සහ විකුණුම්කරුවන් සමඟ සමීපව සම්බන්ධ වෙමු; එමඟින් අපි පූර්ණ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සහය වන්නෙමු. අපගේ හවුල්කාරිත්වයන් නියෝජිතයින් සහ සංචාරක ක්‍රියාකරුවන් වැනි සංචාරක වෙළඳ වෘත්තිකයන් මෙන්ම නියාමන බලධාරීන්, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් දක්වා විහිදේ. මෙකී සියලු පිරිස ඒකාබද්ධ, උසස් තත්ත්වයේ සේවා පරිසර පද්ධතියකට දායක වේ.

සවිස්තරාත්මක පාරිභෝගික සමීක්ෂණ, සමාජ මාධ්‍ය හැඟීම් විශ්ලේෂණය සහ සැඟවුණු විගණන ඇතුළු බහු නාලිකා දක්වා සම්බන්ධතා යාන්ත්‍රණයන් විහිදේ, එමඟින් අපට තත්‍ය කාලීන අවබෝධයන් ලබා දෙමින්, ඉක්මනින් අනුවර්තනය වීමට ඉඩ සලසයි. ආයතනික සේවාදායකයින් සහ විකුණුම් නියෝජිතයින් සමඟ උපායමාර්ගික සාකච්ඡා මඟින් ගුවන් ගමන් මාර්ග සැලසුම් කිරීම සහ අලෙවිකරණ උපාය මාර්ග සම්බන්ධයෙන් වටිනා අවබෝධයන් සපයයි. CSR සංසද සහ සම්බන්ධතා කණ්ඩායම් හරහා දේශීය ප්‍රජාවන් සමඟ අපගේ සහයෝගීතාවය මඟින් අපගේ සමාජ දායකත්වය වැදගත් මෙන්ම වෙනස්කම් ඇති කිරීමට උපකාරීවන බවත් සහතික කරයි.

### පාරිභෝගික වටිනාකම් සහ අත්දැකීම්

පාරිභෝගික පක්ෂපාතිත්වය සහ පහසුව වැඩි දියුණු කිරීම ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස පවතී. ගෝලීය පක්ෂපාතිත්ව පදනම පුළුල් කිරීම, බාධාවකින් තොරව සංචාරක අත්දැකීමක් ලබා දීම සහ අඛණ්ඩ ප්‍රජා සහභාගීත්වය පෝෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පාරිභෝගික විශ්වාසය නැවත ගොඩනැගීම සහ ශක්තිමත් කිරීම සඳහා ඉලක්කගත මුලපිරීම් මාලාවක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම උපාය මාර්ගයේ පදනම වනුයේ තනි මගී අවශ්‍යතා අවබෝධ කර ගැනීම සහ සේවා විශිෂ්ටත්වය සඳහා ගුවන් සේවයේ කැපවීම පිළිබිඹු කරන පුද්ගලාරෝපිත, මතකයේ රැඳෙන අත්දැකීම් ලබා දීමයි. අඛණ්ඩ කාර්ය මණ්ඩල පුහුණුව සහ ක්‍රියාවලි ශෝධනය මෙම අරමුණට තවදුරටත් සහය වන අතර, සුවිශේෂී සේවා පිරිනැමීම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සන්නාමයේ ගුණාංගයක් වශයෙන් පවතින බව සහතික කරයි.

#### තේමාත්මක ව්‍යාපාර

ශ්‍රී ලංකාව අද්විතීය හා සිත් තුළ රැඳෙන සංචාරක ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීමේ අඛණ්ඩ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් "Colours of Jaffna" සහ "Ramayana Trails" වැනි තේමාත්මක ව්‍යාපාර දියත් කරන ලදී. මේ පිළිබඳ බුද්ධිමය ප්‍රාග්ධනය යටතේ විස්තරාත්මකව සඳහන් කර ඇත. මෙම මුලපිරීම් සංචාරකයින් සහ දිවයිනේ සශ්‍රීක සංස්කෘතික හා ඓතිහාසික උරුමය අතර භාවාත්මක සම්බන්ධතාවයක් අරමුණු කරමින් නිර්මාණය කර ඇත. ඩිජිටල් තාක්ෂණය යොදා ගෙන මෙම සිදුවීම් ඉදිරිපත් කිරීමට අරමුණු කර ඇති අතර, මෙම ව්‍යාපාර සඳහා ආකර්ෂණීය වීඩියෝ ආඛ්‍යාන, අන්තර්ක්‍රියාකාරී අන්තර්ගතයන් ඇතුළත් කරමින්, එහි සංචාරය කිරීමට පෙර එම ස්ථානය පිළිබඳ හැඟීමක් සහ කුතුහලය ඇති කිරීමට අදහස් කරයි. මෙය සමාජ මාධ්‍ය ක්‍රියාකරුවන් සමඟ සහයෝගීතාවයෙන් සිදු කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ විචිත්‍රවත් සම්ප්‍රදායන් සහ මිථ්‍යා කථා පිළිබඳ ප්‍රේක්ෂකයින් වෙත ආසාවක් ඇතිවීමෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අර්ථවත් හා මතකයේ රැඳෙන අන්තර්ගතයන් හරහා අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය

කරන අතරම සන්නාමය සමඟ රැඳී සිටීම සාර්ථකව ඉහළ නැංවීය.

### පාරිභෝගික තෘප්තිමත්භාවය මැනීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පාරිභෝගික තෘප්තිමත්භාවය පවත්වා ගැනීම සඳහා ව්‍යුහගත සහ දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් අනුගමනය කරයි. ප්‍රධාන වශයෙන් ශුද්ධ ප්‍රවර්ධක ලකුණු (NPS) රාමුව භාවිතා කරමින්, ඇතුළුවීම, ගමන් මලු හැසිරවීම, උපකාරක කවුළු සහ විවේකාගාර වැනි ප්‍රධාන පාරිභෝගික ස්පර්ශක ස්ථාන හරහා රැස් කරන ලද ගුණාත්මක ප්‍රතිපෝෂණ මගින් සැදුම්ලත් වේ. මෙම පුළුල් ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය මඟින් ගුවන් සමාගමට පාරිභෝගිකයින්ගේ ගුවන් සංචාර පිළිබඳ විස්තරාත්මකව අවබෝධ කර ගැනීමට, සේවාවේ අඩුපාඩු හඳුනා ගැනීමට සහ සමස්ත සංචාරක අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා කාලෝචිත නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබේ. සියලුම ප්‍රතිපෝෂණ ඒකාබද්ධ කර කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හරහා ප්‍රකාශයට පත් කරන අතර, ප්‍රධාන මිනුම් සහ ප්‍රවණතා දෘශ්‍යමය වශයෙන් නියෝජනය කරන අභිරුචිකරණය කළ උපකරණ පුවරු යොදා ගනිමින් සිදු කරනු ලබයි. සැලසුම්ගත තීරණ දැනුම් දීම සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ රැස්වීම්වලදී මෙම දත්ත වලින් ලබාගත් අවබෝධය නිතිපතා සමාලෝචනය කෙරේ. ඒ හා සමානව, සේවා ගුණාත්මකභාවය පවත්වා ගැනීමට සහ පාරිභෝගික සත්කාරයේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීමට මෙහෙයුම් ක්ෂේත්‍ර පුරා විශේෂ විගණන සහ පරීක්ෂණ සිදු කරනු ලබයි. ඉදිරියේදී, ගුවන් සමාගම, මගීන් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා උසස් කෘතිම බුද්ධි මෙවලම් භාවිතය කිරීමට අදහස් කරන අතර, එමඟින් පවතින සහ නැගී එන පාරිභෝගික කාණ්ඩ දෙක පිළිබඳ වඩාත් සියුම් අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ. මෙම ඉදිරි දර්ශනය, ගෝලීය සංචාරක ප්‍රවණතාවලට අනුවර්තනය වීමට සහ වෙනස්වන ගුවන් සේවා පසුබිම තුළ මගී අත්දැකීම් ඉහළ නැංවීමට මහත් උපකාරී වේ.

### පාරිභෝගික වටිනාකම සහ දිගු කාලීන අරමුණු පාදක වූ ව්‍යාපාර අංශ මට්ටමේ අත්දැකීම්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පුද්ගලාරෝපිත සහ අන්තර්ක්‍රියාකාරී සැලසුම් පවත්වා ගනිමින් එහි සියලු උපායමාර්ගික ව්‍යාපාරික ඒකක හරහා පාරිභෝගික සහභාගීත්වයට ප්‍රමුඛත්වය දෙමින් කටයුතු කරයි. ශ්‍රීලංකන් ගුවන් සේවා පාසල (SLAC) විසින් නිතිපතා අධ්‍යාපනික ප්‍රදර්ශන සහ මහජන විවෘත දින සංවිධානය කරන අතර, ඉදිරියේදී ඇතුළත් වීමට අදහස් කරන සිසුන් සහ කර්මාන්ත කොටස්කරුවන් සමඟ ඍජු අන්තර්ක්‍රියා සඳහා අවස්ථා නිර්මාණය කරන අතර එමඟින් එහි ප්‍රජාව තුළ ශක්තිමත් සබඳතා සහ විශ්වාසය වර්ධනය කරයි.

කේටරින් අංශයේ (SLC), සෙරන්ඩිබ් විවේකාගාරය සඳහා පාරිභෝගික මනාපයන් සහ ගෝලීය සූපශාස්ත්‍ර ප්‍රවණතා පදනම් කරගනිමින් සකස් කළ උසස් ආහාර වට්ටෝරු හඳුන්වාදෙන ලදී. සියළු ගුවන් සේවා පාරිභෝගිකයින් වෙත වෙන් වූ ගිණුම් කළමනාකරුවෙකු විසින් සහය දක්වනු ලබන අතර, ගුවන් සේවා සැපයුම් සහ ආහාර සහ වෙළඳ නාම කණ්ඩායම් සමඟ සහයෝගයෙන් ද්වි-වාර්ෂික හෝ ඍතුමය පදනමින් ආහාර වට්ටෝරු පිළිබඳ වැඩමුළු පවත්වනු ලබයි. මෙම වැඩමුළුවලට රස පරීක්ෂා, සංස්කෘතික හා ආහාර සලකා බැලීම් සහ ගමන්මග අනුව විශේෂිත මනාපයන් ඇතුළත් වන අතර, අභිරුචිකරණය කළ සහ උසස් තත්ත්වයේ පිරිනැමීම් සහතික කරයි. තත්‍ය කාලීන සන්නිවේදන නාලිකා සහ ඒකාබද්ධ කාර්ය සාධන සමාලෝචන මඟින් සහයෝගීතාවය සහ සේවා සැපයීම තවදුරටත් වැඩි දියුණු කරයි.

භාණ්ඩ ප්‍රවාහන අංශය, එහි වෙළඳපළ පැවැත්ම ශක්තිමත් කිරීම සඳහා ඩිජිටල් සහ භෞතික වේදිකා උපයෝගී කර ගනිමින්, එයාර් කාගෝ අග්නිදිග ආසියාව (සිංගප්පූරුව) සහ එයාර් කාගෝ ඉන්දියා (මුම්බායි) වැනි ඉහළ පෙළේ ජාත්‍යන්තර ප්‍රදර්ශනවලට සහභාගී විය. පැය 24 පුරා කැපවූ ඇමතුම් මධ්‍යස්ථානයක් සහ ක්‍රියාකාරී සමාජ මාධ්‍ය සහභාගීත්වයක් මඟින් සේවාදායකයින් සහ හවුල්කරුවන් සමඟ ස්ථාවර සහ ප්‍රවේශ විය හැකි සන්නිවේදනයක් සහතික කළේය.

### පාරිභෝගික සහභාගීත්වය පෝෂණය කරලීමට ඩිජිටල්කරණ උත්සාහයන්

ශ්‍රීලංකන් හොලිඩේස් (SLH) පාරිභෝගික මනාපයන් සහ පෙර සංචාරක දත්ත මත පදනම්ව එහි නිවාඩු පැකේජ සකස් කර ඇත. එය පාරිභෝගික තෘප්තිය සහ සහභාගීත්වය වැඩි දියුණු කළේය. ක්‍රියාකාරී සමාජ මාධ්‍ය අන්තර්ක්‍රියා සහ සමාලෝචන සඳහා කඩිනම් ප්‍රතිචාර හරහා, අංශය විසින් විශ්වාසය සහ පක්ෂපාතිත්වය පවත්වා ගෙන ගියේය. නැගී එන සංචාරක ප්‍රවණතාවලට අනුකූල වනු පිණිස ප්‍රවර්ධන සහ නිෂ්පාදන ව්‍යාපාර නිර්මාණය කොට ඇත. විශේෂයෙන්, 2024/25 මූල්‍ය වර්ෂය තුළ, FlySmiLes පක්ෂපාතිත්ව වැඩසටහන සැලකිය යුතු වැඩිදියුණු කිරීම් වලට භාජනය වූ අතර, FlySmiLes Family වැඩසටහන ආරම්භ කිරීම මේ අතර වේ. එමඟින් පවුලේ අය විසින් නිරන්තරයෙන් සිදු කරන පියාසැරි එක ගිණුමකට එක් කිරීමේ සහ උපයා ගත් සැතපුම් භාවිත කිරීමේ අවස්ථාව ලබා දේ. එය සන්නාම සම්බන්ධතාවය සාමූහිකව ශක්තිමත් කරන්නා සේම පවුලේ සාමාජිකයින් සමඟ සංචාරක අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාව ලබා දේ. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි FlySmiLes පක්ෂපාතිත්වය වෙබ් අඩවිය සම්පූර්ණයෙන්ම වෙනස් කොට ඇති අතර, නව මුහුණුවරකින් නවීන, පරිශීලක-හිතකාමී අතුරුමුහුණතක් ලෙස දැකගත හැකිය. මෙම ප්‍රතිනිර්මාණයෙන් UI සහ UX යන අතුරු මුහුණත් වෙත සැලකිය යුතු වැඩිදියුණු කිරීම් ගෙන එයි. ජංගම උපකරණවලින් භාවිත කළ හැකි සහ ප්‍රවේශ්‍යතාව සහ පාරිභෝගික සහභාගීත්වය වැඩි දියුණු කරන සරල කළ වෙබ් පිටු මෙහි ඇතුළත් වේ. සාමාජිකයින්ට දැන් OTP සත්‍යාපනය හරහා අමතර ආරක්ෂාවක් සහිතව සැතපුම් බාධාවකින් තොරව මිලදී ගැනීමට සහ වවුචර් එක් කිරීමට හැකියාව ඇත. මෙම වැඩිදියුණු කිරීම් මඟින් සියලුම ශ්‍රීලංකන් ඩිජිටල් වේදිකා හරහා ස්ථාවර සන්නාමක් පවත්වා ගනිමින්, විධිමත්, පරිශීලකයින් පදනම් වූ අත්දැකීමක් ලබා දීමෙන් ඉහළ පාරිභෝගික තෘප්තියක් සහතික කර ඇත. මීට අමතරව, විශේෂ වෙළඳ පිවිසුමක් දියත් කරමින් උපැයීමට හැකි ප්‍රතිලාභ අවස්ථා සැලකිය යුතු ලෙස පුළුල් කර ඇති අතර, පක්ෂපාතිත්ව වැඩසටහනේ සමස්ත වටිනාකම් තවදුරටත් වැඩි දියුණු කරයි.




ශ්‍රීලංකන් එයාර්ලයින්ස් YAANA නමින් කෘත්‍රිම බුද්ධියෙන් සක්‍රියවන චැට්බොට් නිල වෙබ් අඩවියට හඳුන්වා දීමත් සමඟ ඩිජිටල් නවෝත්පාදනයේ සීමාවන් ජය ගැනීමට හැකි වී ඇත. සුහුරු ස්වයංක්‍රීයකරණය සහ පුද්ගලාරෝපිත සහය හරහා පාරිභෝගික සේවයට නව මුහුණුවරක් ගෙන ඒමට ගුවන් සමාගමේ කැපවීම මෙම සන්ධිස්ථානය මඟින් සනිටුහන් කරයි. YAANA දැනට විමසීම් වලට ක්ෂණික ප්‍රතිචාර ලබා දීමෙන්, සමස්ත පිරික්සුම් සහ වෙන්කරවා ගැනීම්වලදී උසස් අත්දැකීම් ලබා දෙමින් පරිශීලකයින්ට සහය වේ. ඉදිරි මූල්‍ය වර්ෂයේදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තොරතුරු තාක්ෂණ පද්ධති කණ්ඩායම, YAANA සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ වූ අතථ්‍ය සංචාරක සහායකයෙකු බවට පරිවර්තනය කිරීමට සැලසුම් සකස්

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## *සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය තවදුරටත්.*

කර ඇත. අනාගත වැඩිදියුණු කිරීම් මඟින් YAANA හට ගුවන් ගමන් වෙන්කරවා ගැනීම්, ජංගම දුරකථන පරීක්ෂා කිරීම්, තත්‍ය කාලීන ගමන් විස්තර කළමනාකරණය සහ පුද්ගලාරෝපිත යාවත්කාලීන කිරීම් ඇතුළු සියලු මගී අවශ්‍යතා සඳහා සහය වීමට හැකි වනු ඇත. මෙම දැක්ම මඟින් කෘත්‍රිම බුද්ධිය මගින් බල ගැන්වෙන සුහුරු, බාධා රහිත ගමන් සඳහා යොමු වීම පිළිබිඹු කරන අතර, මගීන්ට ඔවුන් තෝරා ගන්නා ඕනෑම වේලාවක සහ ඕනෑම තැනක ගුවන් සේවය සමඟ සම්බන්ධකම් පවත්වා ගැනීම කිරීම පහසු කරයි.




ගෝලීය ඩිජිටල් ගුවන් සේවා ප්‍රවණතාවලට අනුගත වෙමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ජංගම යෙදුම හරහා පුද්ගලාරෝපිත සහ බාධාවකින් තොරව ගමනාගමන පහසුකම් ලබා දීම කෙරෙහි අවධානය යොමු කළේය. ගැළපෙන අන්තර්ගතයන් සහ සේවා, ඇතුළුවීමේදී සහ ගොඩවීමේදී ඩිජිටල් තාක්ෂණය හරහා විධිමත් පරීක්ෂාව මෙන්ම පහසුව, ආරක්ෂාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ස්වයං සේවා සහ ස්පර්ශ රහිත විකල්ප හඳුන්වාදීම මෙම වැඩිදියුණු කිරීම්වලට ඇතුළත් විය. කෙටි පණිවුඩ  සහ ඇඟවීම් හරහා නියමිත වේලාවට සන්නිවේදනය මගින් ගමනාගමනයේ සෑම අදියරකදීම දැනුවත්ව සිටීම සහතික කරනු ලැබීය.

### සේවක සබඳතා සහ සහභාගීත්වය

අපගේ ශ්‍රම බලකාය අපගේ සාර්ථකත්වයේ තීරණාත්මක සාධකයකි. වසර පුරාවටම, අපි සියල්ල ඇතුළත් වූ, සහය දක්වන සහ අභිප්‍රේරිත වැඩ පරිසරයක් පෝෂණය කිරීම අරමුණු කරගත් මුලපිරීම් සඳහා ආයෝජනය කර ඇත්තෙමු. ඉදිරි පෙළ සහ මෙහෙයුම් කාර්ය මණ්ඩලය ඉලක්ක කරගත් මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම පිළිබඳ වැඩසටහන් හරහා කර්මාන්තයේ පවතින අභියෝග මධ්‍යයේ දරා ගැනීමේ හැකියාව ගොඩනැගීමට උපකාරී වී තිබේ. නායකත්ව සංවර්ධන මුලපිරීම් ඊළඟ පරම්පරාවේ ගුවන් සේවා වෘත්තිකයන් පෝෂණය කිරීමෙහි ලා නිර්මාණය කර ඇති අතර, විවෘත සන්නිවේදන නාලිකා සහ සේවක ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් මඟින් සේවා ස්ථාන ප්‍රතිපත්ති සහ සංස්කෘතිය හැඩගස්වනු ලබයි. මෙම උත්සාහයන් සාමූහිකව කාර්ය මණ්ඩල චිත්ත ධෛර්යය ශක්තිමත් කර, ඵලදායිතාව වැඩි දියුණු කරනු ලබයි. එමෙන්ම අපගේ ආයතනික වටිනාකම්වලට අනුගත වන පොදු අරමුණක් පිළිබඳ හැඟීමක් ඇති කරයි.

### ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීම

අන්තර් මාර්ග සහ කේත හුවමාරු ගිවිසුම් ඇතුළුව උපායමාර්ගික හවුල්කාරිත්වයන් හරහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය නිරන්තරයෙන් සිය ගෝලීය ජාලය ශක්තිමත් කළේය. මෙම සහයෝගීතාවයන් ගුවන් සේවයේ සම්බන්ධතාවය සැලකිය යුතු ලෙස පුළුල් කර ඇති අතර, පහසු නැවතුමක් හරහා පුළුල් පරාසයක සෙසු ගමනාන්ත වෙත මගීන්ට බාධාවකින් තොරව ප්‍රවේශය ලබා දෙයි. මෙම උපායමාර්ගික ව්‍යාප්තිය දිගු දුර වෙළඳපළවල ගුවන් සේවයේ සහභාගීත්වය වැඩි දියුණු කරන්නා සේම, එහි වර්ධනය වන පාරිභෝගික පදනමට වැඩි වටිනාකමක් සහ නම්‍යශීලී බවක් ලබා දෙයි. මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ෆ්ලයි ඩුබායි සමඟ නව අන්තර් මාර්ග ගිවිසුමකට සහ එයාර් සීෂෙල්ස් සමඟ කේත හුවමාරු ගිවිසුමකට එළැඹුණු අතර ඒවා මෙහෙයුම් අංශයේ විස්තරාත්මකව විස්තර කර ඇත.

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය (SLAC) ප්‍රධාන හවුල්කාරිත්වයන් හරහා එහි පුහුණු කිරීම්වල පරාසය තවදුරටත් විවිධාංගීකරණය කළේය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ නව ගිවිසුමක් මගින් ගුවන් යානා නඩත්තුව පිළිබඳ EASA කොටස 66 මූලික පාඨමාලාවට ඇතුළත් වූ සිසුන් සඳහා උසස් කළ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙයි. ඊට අමතරව, ඒවියේෂන් ඕස්ට්‍රේලියා සමඟ සහයෝගීතාවයෙන් ගුවන් යානා නඩත්තු ඉංජිනේරු ඩිප්ලෝමාව ලබා දෙයි. මෙමඟින් SLAC හි ජාත්‍යන්තර ප්‍රතීතනය, පුහුණු විසඳුම් පරාසය සහ පුළුල් වෙළඳපොළට ආකර්ෂණය වැඩිදියුණු කරයි.

ශ්‍රීලංකන් කේටරින් (SLC) සිය ආහාරපාන උසස් තත්ත්වයට ගෙන ඒම අඛණ්ඩව සිදු කරන අතර, ගුවන් යානා අභ්‍යන්තර භෝජන අත්දැකීම් ලබා දීමෙන් ප්‍රමුඛ ගුවන් සේවා ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට සහය ලබා දේ.

ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය (SLE) සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ සමීප සහයෝගීතාවයෙන් එහි මෙහෙයුම් විශිෂ්ටත්වය ශක්තිමත් කළේය. මෙම හවුල්කාරිත්වයන් මඟින් දැඩි තත්ත්ව පාලනය, කාර්ය සාධන අධීක්ෂණය, ඒකාබද්ධ පුහුණු වැඩසටහන් සහ තත්‍ය කාලීන කාලෝචිත සන්නිවේදනය සහ සම්බන්ධීකරණය කෙරෙහි අවධානය යොමු කළේය. ගුවන් යානා නඩත්තු කිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ දිගුකාලීන මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කරමින් තිරසාර හා පිරිවැය-ඵලදායී මූලාශ්‍ර භාවිතයන් කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කරන ලදී.

### මෙහෙයුම් විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ශක්තිමත් නියාමන හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අපි, අපගේ මගීන්ගේ, සේවකයින්ගේ සහ කොටස්කරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම මෙහෙයුම්වල මූලික අංගයක් ලෙස පවත්වා ගනිමු. අපි ජාතික සහ ජාත්‍යන්තර නියාමන ආයතන සමඟ සම්බන්ධතාවලදී අවශ්‍යතා සපුරාලීමට සීමා නොවී අඛණ්ඩ සංවාද, අන්‍යෝන්‍ය විශ්වාසය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් පිළිබඳව ද සැලකිලිමත් වන්නෙමු.

අපගේ මෙහෙයුම් අංශය, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) සමඟ ICAO ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (SMS) ක්‍රියාත්මක කිරීම සහ දියුණු කිරීම සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වේ. එමඟින් අපගේ අභ්‍යන්තර පද්ධති, ගෝලීය ගුවන් සේවා ආරක්ෂණ රාමු සමඟ අනුකූල වන බව සහතික කරයි. වසර පුරා, අපගේ කණ්ඩායම් විසින් අභ්‍යන්තර තත්ත්ව සහතික විගණන 50කට අධික සංඛ්‍යාවක් සිදු කළ අතර, මෙම නියාමකයින් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් වර්ධනය කරන ලද දැනුවත්භාවය සහ ප්‍රමිතීන් මගින් නිර්මාණය වූ නිරන්තර කෙටි පුහුණුවීම් සැසි සහ හදිසි අවස්ථා සඳහා සූදානම්වීමේ අභ්‍යාස වෙනුවෙන් සහය දක්වන ලදී. මෙම ක්‍රියාශීලී සහයෝගීතාවය, අපගේ ගුවන් ක්‍රියාකරු සහතිකය (AOC) බාධාවකින් තොරව නව්‍යකරණයට සහ IATA මෙහෙයුම් ආරක්ෂණ විගණනය (IOSA) සහ IATA ගොඩබිම් මෙහෙයුම් සඳහා වන ආරක්ෂණ විගණනය (ISAGO) ඇතුළු කීර්තිමත් ගෝලීය ප්‍රතීතන අඛණ්ඩව පවත්වාගෙන යාමට දායක විය.

ගුවන් සේවා ආරක්ෂණ ක්ෂේත්‍රය තුළ, අපගේ ගුවන් සේවා ආරක්ෂණ (Avsec) අංශය නියාමන ආයතන සමඟ සහයෝගීව කටයුතු කරමින් ශක්තිමත්, ඉදිරි දැක්මක් සහිත ආරක්ෂක රාමු සැලසුම් කර ක්‍රියාත්මක කරයි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මෙහෙයුම් දේශීය පදනමේ සහ විදේශයන්හි සුරක්ෂිත කිරීමට අමතරව, සේවාදායක ගුවන් සමාග ම්වල ආරක්ෂක රෙගුලාසි නිසි ලෙස සලකා බලමින් කොළඹ සහ මත්තල ගුවන්

තොටුපළ හි අනෙකුත් වාහකයන් වෙත තම විශේෂඥ සේවා ව්‍යාප්ත කරයි. ගෝලීය සහ දේශීය බලධාරීන් සමග ඒකාබද්ධ මුලපිරීම් හරහා, Avsec කණ්ඩායම දියුණු පරීක්ෂණ තාක්ෂණයන් සහ අවදානම් මත පදනම් වූ විශ්ලේෂණ ඒකාබද්ධ කරගෙන ඇත. එය වෙනස් වෙමින් පවතින ජාත්‍යන්තර ආරක්ෂක ක්‍රියාමාර්ග සමග අනුකූලවීම සහතික කරයි.

CAASL සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) සමඟ ශක්තිමත් සබඳතා පවත්වා ගනිමින් ගොඩබිම් හැසිරවීමේ අංශය මෙම සහයෝගී ප්‍රවේශය තවදුරටත් සහතික කරලයි. ගොඩබිම් හැසිරවීමේ සැපයුමේ සහතිකකරණය සහ ISAGO විගණන ක්‍රියාවලිය යටතේ අංශයේ අඛණ්ඩ ප්‍රතිතනය මඟින් මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා හවුල් කැපවීමක් පිළිබිඹු කරයි. ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම (AASL), ජාත්‍යන්තර ස්ථානවල සිවිල් ගුවන් සේවා බලධාරීන් සහ හවුල්කාර හසුරුවන්නන් සමඟ එහි කාර්යභාරය මඟින් ගෝලීය නියාමන අපේක්ෂාවන් සමඟ ගොඩබිම් මෙහෙයුම් අඛණ්ඩව සපුරාලන බවත්, වෙනස් වන බවත් සහතික කරයි.

අපගේ ඉංජිනේරු අංශය විසින් CAASL, යුරෝපීය සංගමයේ ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සිය (EASA) සහ අනෙකුත් ජාත්‍යන්තර බලධාරීන් සමඟ ක්‍රියාකාරී සහ ව්‍යුහගත සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. නිතිපතා විගණන, තාක්ෂණික සම්බන්ධීකරණ සැසි සහ තත්‍ය කාලීන නියාමන යාවත්කාලීන කිරීම් අපගේ අනුමත නඩත්තු සංවිධානය (AMO) සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානයේ (CAMO) කාර්යයන් පවත්වා ගැනීමට සහය වේ. මෙම කටයුතු මඟින් සංවිධානාත්මක කියවීම සහ අත්සන් කිරීමේ වැඩසටහන්, සංශෝධිත ක්‍රියා පටිපාටි සහ ඉලක්කගත පුහුණු යොදා ගනිමින් නියාමන සංශෝධන 145 කොටස/M කොටසට යාවත්කාලීන කිරීම් වැනි කඩිනමින් ක්‍රියාත්මක කිරීමට හැකි විය. එය සියලු ඉංජිනේරු මෙහෙයුම් සඳහා අනුකූලතාව සහ තාක්ෂණික විශිෂ්ටත්වය සහතික කරයි. මෙහෙයුම් ක්‍රියා පටිපාටි සඳහා අඛණ්ඩ තාක්ෂණික සම්බන්ධීකරණය සහ ව්‍යුහගත යාවත්කාලීන කිරීම් මඟින් වෙනස් වන නියාමන අපේක්ෂාවන්ට අනුකූල වීම, නියාමකයින් සමඟ විනිවිදභාවයෙන් යුතු සබඳතා පවත්වා ගැනීම සහ ආරක්ෂාව සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කැපවීම ශක්තිමත් කිරීම සහතික කරයි. මෙම භාවිතයන් පාර්ශවකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීමට සහ ගුවන් සමාගමේ මෙහෙයුම් අඛණ්ඩතාව පිළිබඳ විශ්වාසය පවත්වා ගැනීමට දායක වේ.

ශ්‍රී ලංකාව, පකිස්ථානය, නේපාලය සහ මාලදිවයින යන රටවල සිවිල් ගුවන් සේවා බලධාරීන්ගේ විධිමත් අනුමැතිය සහ EASA හි ප්‍රතීතනයේ සහය ඇතිව ගුවන් සේවා අධ්‍යාපනය සඳහා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය (SLAC) එහි භූමිකාව පුළුල් කරයි. මෙම නියාමන අනුමත කිරීම් අඛණ්ඩ තත්ත්ව සහතික සහයෝගීතාවයන් මත ගොඩනගා ඇත. එය කලාපයේ ගුවන් සේවා පුහුණු ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා SLAC හි දායකත්වය පෙන්නුම් කරයි.



ශ්‍රීලංකන් කේටරින් (SLC) ගෝලීය ප්‍රමිතීන් දැඩි ලෙස පවත්වා ගැනීම සඳහා ආහාර සුරක්ෂිතතා බලධාරීන් සහ සහතික කිරීමේ ආයතන සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. ගුවන් සේවයේ ආහාර සැපයීමේදී ආරක්ෂාව, සනීපාරක්ෂාව සහ නියාමන වගවීම සඳහා කැපවීම සහතික කරමින්, අංශයේ මෙහෙයුම් ISO සහ HACCP වැනි ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේද සමඟ අනුකූල වේ.

ISO/IEC 27001 යටතේ සහතික කර ඇති තොරතුරු තාක්ෂණ අංශය, ආරක්ෂිත සහ අනුකූල ඩිජිටල් යටිතල පහසුකම් පවත්වා ගැනීම සඳහා කර්මාන්ත සහ නියාමන විගණකවරුන් සමඟ සමීපව කටයුතු කරයි. මෙම හවුල්කාරිත්වයන් දත්ත ආරක්ෂණය සහ සයිබර් ඔරොත්තු දීමේ පියවර ක්‍රියාත්මක කිරීමට සහය වන අතර, ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ පද්ධති, තොරතුරු ආරක්ෂාවේ ඉහළම ගෝලීය ප්‍රමිතීන් සපුරාලන බව සහතික කරයි.

මෙම ඒකාබද්ධ, විවිධ මාධ්‍යවලින් යුතු සබඳතා හරහා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි මෙහෙයුම්වල අනුකූලතාව මෙන්ම, ගෝලීය ගුවන් සේවා පරිසර පද්ධතියේ වෙනස් වන අපේක්ෂාවන්ට ප්‍රතිචාර දක්වන බව සහතික කරයි. සියලුම ව්‍යාපාරික කාර්යයන් හරහා නියාමන කොටස්කරුවන් සමඟ අපගේ තිරසාර සම්බන්ධතාව මඟින් මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි, නවෝත්පාදනයන් පෝෂණය කරයි, සහ කලාපීය සහ ජාත්‍යන්තර ගුවන් සේවා ක්ෂේත්‍රයේ විශ්වාසදායක ප්‍රමුඛයෙකු ලෙස ගුවන් සේවය ස්ථානගත කරයි.

## ප්‍රජාවන් සහ සමාජ බලපෑම වෙනුවෙන් කැපවීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ආයතනික සමාජ වගකීම් (CSR) වේදිකාව වන ශ්‍රීලංකන් කෙයාර්ස්, ශ්‍රී ලංකාව පුරා අර්ථවත් සමාජ බලපෑමක් ඇති කිරීම වෙනුවෙන් කැප වූ කාර්ය මණ්ඩල අරමුදල් සහිත පුණ්‍යායතනයකි. සැලසුම් මඟින් ක්‍රියාත්මක වන මෙහි මුලපිරීම් වනුයේ ළමා සුභසාධනය, පාරිසරික තිරසාරභාවය සහ තරුණ කුසලතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමයි. දයානුකම්පාව සහ ස්වේච්ඡා සේවය තුළින් ප්‍රජාවන් නඟා සිටුවීම සඳහා ගුවන් සේවකයින්ගේ සාමූහික කැපවීම මෙමඟින් පිළිබිඹු කරයි.

2024/25 මූල්‍ය වර්ෂයේදී, ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් සහ පෝෂණය වැනි කාරණා කෙරෙහි අවධානයක් යොමු කළ අතර එමඟින් වරප්‍රසාද නොලත් දරුවන්ට සෘජු ප්‍රතිලාභ ලැබුණි. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සමඟ අපගේ අනුකූලතාව ශක්තිමත් කරමින් වෙරළබඩ පිරිසිදු කිරීම, නැවත වන වගා කිරීමේ කටයුතු සහ ප්ලාස්ටික් අවම කිරීමේ ව්‍යාපාර වැනි පාරිසරික මුලපිරීම් සිදු කරනු ලැබිණ. එමෙන්ම, ආර්ථික සවිබල ගැන්වීම සහ සමාජ සංචලනය පෝෂණය කිරීමට උපකාරී වන පරිදි, තරුණයින් සඳහා වෘත්තීය පුහුණුව, උපදේශකත්වය සහ නායකත්ව සංවර්ධන අවස්ථා ලබා දීම සඳහා අපි අධ්‍යාපන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කළෙමු.

### සෞඛ්‍ය සහ සුවතා සේවා

මූල්‍ය වර්ෂය තුළ, විවිධ ක්ෂේත්‍රවල සෞඛ්‍ය කේන්ද්‍ර කරගත් සේවා වැඩසටහන් හතරක් පවත්වන ලදී. මානසික හා ශාරීරික යහපැවැත්ම පිළිබඳ දැනුවත් කිරීමේ සැසි, සාමාන්‍ය වෛද්‍ය උපදේශන, දෘශ්‍ය පරීක්ෂණ සහ නොමිලේ ඖෂධ සහ ඇස් කණ්ණාඩි බෙදා හැරීම මේ අතර විය. වෛද්‍යවරුන්, මනෝවිද්‍යාඥයින් සහ අනුග්‍රාහකයින් සමඟ සහයෝගයෙන් සිදු කරන ලද මෙම මුලපිරීම් මඟින් ග්‍රාමීය සහ අඩු සේවා ලාභී ප්‍රජාවන්හි සෞඛ්‍ය ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් කෙයාර්ස් ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කොට දක්වයි.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය තවදුරටත්.

### *අධ්‍යාපනය සහ තරුණ බලගැන්වීම*

වසර තුළදී තරුණ අධ්‍යාපනය සහ වෘත්තීය නිරාවරණය වෙනුවෙන් ප්‍රධාන අවධානයක් යොමු කරන ලදී. ශ්‍රී ලංකාවේ පළමු ළමා සාහිත්‍ය උළෙල සඳහා සහය වීම ඔස්සේ පාසල් සහ රැකවරණ මධ්‍යස්ථානවල කතුවරුන් සඳහා සැසි පවත්වනු ලැබිණ. විශ්ව විද්‍යාල සිසුන් සඳහා ගුවන් ඉංජිනේරු අංශය සඳහා ක්ෂේත්‍ර සංචාරයක් පිළියෙල කළ අතර, 'Day with a Plane' වැඩසටහන මඟින් විවිධ ආයතන හරහා පාසල් දරුවන්ට ගුවන් සේවය පිළිබඳ හඳුන්වා දෙන ලදී. නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල පැවති පොත් පරිත්‍යාග මඟින් අඩු පහසුකම් සහිත ප්‍රජාවන්හි පුස්තකාල වෙනුවෙන් සහයෝග දෙනු ලැබිණ.

### *ළමා සුභසාධනය සහ ප්‍රජා සහභාගීත්වය*

ශ්‍රී ලංකන් කෙයාර්ස් විසින් අර්ථවත් ක්‍රියාකාරකම් හරහා අවදානමට ලක්විය හැකි දරුවන් සහ ප්‍රජා කණ්ඩායම්වලට සහය විය. ළමා පිළිකා රෝගීන් පිරිසක් ගුවන් සේවය යන තේමාව පදනම් වූ වැඩසටහන හා එක් වීමෙන් අමතක නොවන දිනයක මිහිරි අත්දැකීම් විඳ ගනු ලැබිණ. ඒ සඳහා, ගුවන්යානා නඩත්තු අංගනයේ සංචාරයක් සහ යානස්ථ ආහාර වේලක් ඇතුළත් විය. තවද, කාර්ය මණ්ඩල අරමුදල් යොදවමින් සිදු කළ මුලපිරීමක අංගයක් ලෙස පිළිකා රෝගීන් සහ රැකබලා ගන්නන් 500කට අධික සංඛ්‍යාවකට අත්‍යවශ්‍ය සැපයුම් පරිත්‍යාග කරන ලද අතර මේ ගෙවෙනුයේ එහි අඛණ්ඩව සිව්වන වසරයි. මෙම උත්සාහයන් මඟින් දයානුකම්පාව මත පදනම් වූ ප්‍රජාවක් වෙනුවෙන් සහයෝගය දැක්වීමට ගුවන් සේවයේ අඛණ්ඩ කැපවීම ඉස්මතු කරයි.

### *ජාත්‍යන්තර දින සැමරුම්*

ගෝලීය සැමරුම්, සැම දෙනෙකුගේම සහභාගීත්වයෙන් පවත්වන ලදී. ලෝක ළමා දිනයේදී සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන් වෙත ගුවන් සේවාව යන තේමාව පදනම් කර ගනිමින් අත්දැකීම් පිරි වැඩසටහන් ඉදිරිපත් කරන ලද අතර, ජාත්‍යන්තර කාන්තා දිනයේදී සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ස්වයං රැකවරණය කෙරෙහි අවධානය යොමු කරන සුවතා වැඩමුළු සහ ප්‍රජා සැසි පවත්වනු ලැබිණ.




2024 ලෝක ළමා දිනය දා, ළමුන් වෙනුවෙන් විශේෂ වැඩසටහනක් සංවිධානය කරන ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි 747 නඩත්තු අංගනයේ සහ ගුවන් යානයක් ඇතුළත නැරඹීමට අවස්ථාවක් ලබාදීම, අනෙකුත් විනෝදාත්මක අංග, එමෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ දැනුම ලබාදීම සිදු කෙරිණ.

### *පරිසර කළමනාකරණය*

ශ්‍රීලංකන් කෙයාර්ස් මඟින් ප්‍රායෝගික සංරක්ෂණ ප්‍රයත්නයන් හරහා පාරිසරික වගකීම පවත්වා ගෙන යනු ලබයි. මීගමුවේ කඩොලාන පිරිසිදු කිරීම සඳහා තරුණයින් සහ ප්‍රාදේශීය ප්‍රජා සාමාජිකයින් සම්බන්ධ කර ගත් අතර, මාර්තු මාසයේ පැවති දැනුවත් කිරීමේ චාරිකාවක් වන රක්ෂිත පිරිසිදු කිරීමකින් එය සමාප්ත කරනු ලැබිණ.

### *යටිතල පහසුකම් සහ ප්‍රජා ප්‍රවේශය වැඩිදියුණු කිරීම*

අඩු පහසුකම් සහිත ප්‍රදේශවල අධ්‍යාපනය සහ ප්‍රජා සෞඛ්‍යයට සහය වීම සඳහා, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ මුලපිරීම් සිදු කරන ලදී. අනාරක්ෂිත ජල ප්‍රභවයන්ට හේතුවෙන් ඇතිවන නිදන්ගත වකුගඩු ආශ්‍රිත රෝගවලට එරෙහිව සටන් කිරීම සඳහා ග්‍රාමීය පාසල් දෙකක ප්‍රතිලෝම ඔස්මෝසිස් (RO) පානීය ජල පද්ධති ස්ථාපනය කරන ලදී. එමෙන්ම, බහුමාධ්‍ය උපකරණ පරිත්‍යාග කිරීම තුළින් තවත් ප්‍රජාවක ඩිජිටල් ඉගෙනුම් හැකියාවන් පිහිටුවන ලදී. ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ සහය ඇතිව සිදු කළ මෙම උත්සාහයන් මඟින්, අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල ආරක්ෂිත ජලය සහ නවීන අධ්‍යාපනික මෙවලම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම වෙනුවෙන් අඛණ්ඩ ප්‍රයත්නයන් පිළිබිඹු කරයි.

### ඉදිරි දැක්ම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙනසක් වෙනුවෙන් මුලපුරන මොහොතේ, අපගේ සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය පෝෂණය කිරීම සහ පුළුල් කිරීම සඳහා අපගේ කැපවීම අපි නැවත තහවුරු කරන්නෙමු. අනාගත ප්‍රමුඛතා අතරට නිරන්තර පියාසර කරන්නන් සහ හවුල්කරුවන් සමඟ සම්බන්ධතා ශක්තිමත් කරලීමට ඩිජිටල් නවෝත්පාදනයන් උපයෝගී කර ගැනීම, ජාතික සංවර්ධන ඉලක්කවලට අනුකූල වන පරිමාණය කළ හැකි ප්‍රජා වැඩසටහන් දියත් කිරීම සහ මඟී සහ සේවක අත්දැකීම්වල සියලු ස්පර්ශක ස්ථාන හරහා ඔවුන්ව පිළිගැනීම ආදිය ඇතුළත් වේ.

දත්ත මත පදනම් වූ අවබෝධය උපයෝගී කර ගැනීමෙන් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය වඩාත් ප්‍රතිචාරාත්මක සහ පෞද්ගලික මට්ටමින් පවත්වා ගැනීමට හැකි වේ. එමෙන්ම ලෝක මට්ටමේ ආරක්ෂාව සහ ආරක්ෂක ප්‍රමිතීන් සඳහා අපගේ ස්ථිර කැපවීම පවත්වා ගත හැකි අතර, මහජන විශ්වාසය නිරතුරුව රැකෙනු ඇත.

අව්‍යාජ සබඳතා, සහයෝගීතා හවුල්කාරිත්වයන් සහ සේවා විශිෂ්ටත්වය වෙනුවෙන් නොසැලෙන කැපවීමක් තුළින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ගෝලීය වේදිකාව තුළ ශ්‍රී ලංකාව ආඩම්බරයෙන් නියෝජනය කරමින් වගකිවයුතු ජාතික ගුවන් සේවයක් ලෙස අඛණ්ඩව කටයුතු කරනු ඇත.



# ස්වභාවික ප්‍රාග්ධනය

විශ්වාසදායක, ගෝලීය ගුවන් සේවාවක් ලබා දෙමින් පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් අප දරන ප්‍රයත්නයන් ස්වභාවික ප්‍රාග්ධනය ලෙස අර්ථ දැක්වේ. ජාතිකයේ ගමන්කරු ලෙස, අපගේ මෙහෙයුම්වලට අදාළ පාරිසරික පියසටහන පිළිබඳව අපි දැනුවත්භාවයක් ලබා ඇත්තෙමු. තිරසාරභාවය පිළිබඳ අපගේ උපායමාර්ගික අවධානය සඳහා අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ගෝලීය ගුවන් සේවා කර්මාන්තයේ පාරිසරික ඉලක්කවලට දායක වීම සහ අපගේ ක්‍රියාකාරකම් තුළ පාරිසරික තිරසාරභාවය ඇතුළත් ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීමෙහිලා තක්සේරු කළ හැකි උත්සාහයන් ඇතුළත් වේ. අපගේ ස්වාභාවික ප්‍රාග්ධන උපාය මාර්ගය ප්‍රධාන ක්ෂේත්‍ර හයක් කෙරෙහි අවධානය යොමු කරයි: එනම් කාබන් පියසටහන අවම කිරීම, සම්පත් කාර්යක්ෂමතාව සහ අපද්‍රව්‍ය අවම කිරීම, පාරිසරික අනුකූලතාව, ජෛව විවිධත්වය සංරක්ෂණය සහ ආරක්ෂාව, ළමා හා තරුණ බලගැන්වීම සහ ප්‍රජා සවිබල ගැන්වීම වේ.

## අපගේ කාබන් පියසටහන අවම කිරීම

ගුවන් යානා ඉන්ධන පරිභෝජනය අපගේ කාබන් විමෝචනය සහ මෙහෙයුම් පිරිවැයට විශාලතම බලපෑමක් සිදු කරයි. ඊට පිළියම් වශයෙන්, අපි එයාර්බස් Neo ශ්‍රේණිය වැනි ඉන්ධන කාර්යක්ෂම ගුවන් යානා යොදා ගැනීම වැනි සැලසුම් කෙරෙහි යොමු වූවෙමු. එමඟින් විමෝචනය සැලකිය යුතු ලෙස අවම කරයි.

එදිනෙදා කටයුතුවලදී, අපගේ පියාසැරි මෙහෙයුම් කණ්ඩායම විසින් ඉන්ධන කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහා එයාර්බස්වලට නිර්දේශිත හරිත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ ප්‍රශස්ත ගුවන් ගමන් සැලසුම් ක්‍රියාත්මක කරයි. ගුවන් යානා බර ප්‍රශස්ත කිරීමට සහ ගුවන් යානය තුළ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට අපගේ අන්තර් ක්‍රියාකාරී කණ්ඩායම් ද සාමූහිකව කටයුතු කරයි.

ඉංජිනේරු ක්ෂේත්‍රයේ, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් ගුවන් යානාවල ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් නිශ්චිත කාර්යයන් ඉටු කරයි. එනම් නිතිපතා බාහිර පිරිසිදු කිරීම සහ එන්ජින් ඇතුළත පිරිසිදු කිරීම මඟින් ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි.

2050 වර්ෂය වන විට ශුද්ධ ශුන්‍ය විමෝචනය යනු ICAO සහ IATA විසින් අනුමත කරන ලද ඉලක්කයක් වන අතර, එය කර්මාන්තය පුරා විමෝචන පාලනය සඳහා ඉලක්කයක් බවට පත් වී ඇත. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඒ සම්බන්ධයෙන් අපගේ ව්‍යාපාරයේ අනුකූලතාව, මෙහෙයුම් සහ තාක්ෂණික අංශ ආවරණය වන පරිදි බහුවිධ පියවර ගෙන ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන්, ගුවන් සමාගම විමෝචන වාර්තාකරණයේ ICAO CORSIA අවශ්‍යතා දැඩි ලෙස පිළිපදින අතර, එය EU/UK ETS සහ Refuel EU විධාන වැනි කලාපීය-විශේෂිත රෙගුලාසිවලට ද අනුගත වේ.

තිරසාරභාවය වාර්තා කිරීම සඳහා වන එහි අඛණ්ඩ කැපවීමේ කොටසක් ලෙස, සමාගම GHG ක්‍රියාමාර්ගවලට අනුකූලව අඛණ්ඩව දෙවන වසරටත් එහි මෙහෙයුම්වල හරිතාගාර වායු (GHG) විමෝචනය සත්‍යාපනය කර ඇත. සමාලෝචනයට භාජනය වන මූල්‍ය වර්ෂය සඳහා, කන්ට්‍රෝල් යූනියන් ඉන්ස්පෙක්ෂන් (පුද්.) සමාගම විසින් සිදු කරන ලද ක්‍රියාවලිය සමඟින් එහි විෂය පථය 1 සහ විෂය පථය 2 විමෝචනය සත්‍යාපනය කළේය. විෂය පථය 1 සහ විෂය පථය 2 යනු GHG ක්‍රියාමාර්ග මගින් අර්ථ දක්වා ඇති GHG විමෝචන කාණ්ඩ වේ. විෂය පථය 1 හි සමාගම සතු හෝ පාලනය කරන ප්‍රභවයන්ගෙන් නිකුත් කරන සෘජු විමෝචනය ඇතුළත් වේ. විෂය පථය 2 විමෝචනය යනු සමාගමේ බලශක්ති භාවිතයේ ප්‍රතිවිපාකයක් වන නමුත් සාමාන්‍යයෙන් උපයෝගිතා සැපයුම්කරුවෙකු වන වෙනත් ආයතනයක් විසින් හිමිකාරීත්වය දරන හෝ පාලනය කරන ප්‍රභවයන්ගෙන් සිදුවන වක්‍ර GHG විමෝචනයකි. සත්‍යාපනයේ වාර්තා කිරීමේ සීමාවන් සහ විෂය පථය පිළිබඳ වැඩිදුර විස්තර පහත දක්වා ඇත.

මෙම ස්වේච්ඡා මුලපිරීම හරහා, සමාගම පාරිසරික තිරසාරභාවය පිළිබඳ දත්තවල විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ පාරිසරික වගකීම සහ දේශගුණික ක්‍රියාමාර්ගවල වැදගත්කම අවධාරණය කරන නියාමන උත්සාහයන්ට දායක වීම අරමුණු කරයි. ඊට අමතරව, මෙමඟින් ලබාගත් අවබෝධය සමාගමේ පාරිසරික කාර්ය සාධනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා භාවිත කරනු ඇත.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## ස්වභාවික ප්‍රාග්ධනය තවදුරටත්.

2023/24 සහ 2025 මූල්‍ය වර්ෂය සඳහා සමූහයේ හරිතාගාර වායු විමෝචනය පහත පරිදි වේ.

| MT $CO_2e$ (මිලි) | 23/24 මූල්‍ය වර්ෂය | | | 24/25 මූල්‍ය වර්ෂය | | | වෙනස % |
|---|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් වර්ගය | විෂය පථය 1 | විෂය පථය 2 | එකතුව | විෂය පථය 1 | විෂය පථය 2 | එකතුව | |
| භාණ්ඩ මෙහෙයුම් | 0.001 | 0.001 | 0.002 | 0.001 | 0.001 | 0.002 | 6 |
| ගොඩබිම් හැසිරවීම් | 0.003 | 0.001 | 0.004 | 0.004 | 0.001 | 0.004 | 10 |
| ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය | 0.001 | 0.002 | 0.003 | 0.001 | 0.002 | 0.002 | (16) |
| ශ්‍රීලංකන් කේටරින් | 0.007 | 0.005 | 0.012 | 0.008 | 0.005 | 0.012 | 2 |
| එයාර්ලයින්ස් (ඉහත කටයුතු නොමැතිව) | 1.192 | 0.002 | 1.193 | 1.182 | 0.002 | 1.184 | (1) |
| එයාර්ලයින්ස් සමූහයේ සමස්ත GHG විමෝචනය | 1.204 | 0.010 | 1.213 | 1.194 | 0.010 | 1.204 | (1) |

සටහන්:

- GHG ක්‍රියාමාර්ගවල මාර්ගෝපදේශ අනුව තක්සේරු කිරීම සිදු කරයි.
- වාර්තාකරණ කාල සීමාව වනුයේ අදාළ මූල්‍ය වර්ෂවල අප්‍රේල් 1 සිට මාර්තු 31 දක්වා ය.
- මෙට්‍රික්ටොන් කාබන්ඩයොක්සයිඩ් සමතුල්‍ය ඒකකය ($CO_2e$) යනු ගෝලීය උෂ්ණත්ව විභවය අනුව සෘජු හරිතාගාර වායු විමෝචනය සංසන්දනය හා ගිණුම් තැබීමට යොදාගන්නා ඒකකයි.
- විෂය පථය 1 මඟින් සෘජු විමෝචනය සහ විෂය පථය 2 මඟින් මිලදී ගත් බලශක්ති විමෝචනය අනාවරණය කෙරේ.
- ඇගයීමේ විචල්‍යත්වය 5% ලෙස සකසා ඇත.

### බලශක්ති කාර්යක්ෂමතාව පවත්වා ගැනීම

බලශක්ති කාර්යක්ෂමතාව යනු අපගේ පහසුකම් කළමනාකරණ උපාය මාර්ගයේ ප්‍රධාන අංගයකි. ගුවන් සමාගම බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුතු ආලෝකකරණය, ස්වාභාවික ආලෝකකරණය සඳහා සූර්ය නල සහ ප්‍රශස්ත වායු සමීකරණ භාවිතය ඇතුළු පියවර මාලාවක් අනුගමනය කර ඇත. අවම කිරීමේ අවස්ථා හඳුනා ගැනීම සඳහා අපගේ දේපළ සහ පහසුකම් කණ්ඩායම විසින් සියලු ප්‍රදේශවල බලශක්ති පරිභෝජනය මනාව නිරීක්ෂණය කරයි.

එපමණක් නොව, හැකි අවස්ථාවලදී බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීමේ අපගේ අභිප්‍රායට අනුකූල වෙමින්, අපගේ කාර්ය මණ්ඩල ආපනශාලාව සඳහා ඉවුම් පිහුම් ගෑස් අවශ්‍යතාවලින් කොටසක් සපුරාලන ජීව වායු ඒකකයක් අපි ක්‍රියාත්මක කරන්නෙමු.

### ජල කළමනාකරණය සහ සංරක්ෂණය

අපගේ මෙහෙයුම්වලදී ජලය අත්‍යවශ්‍ය අංගයක් වන අතර, අපගේ ජල කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා; ජල සුරැකීමේ උපකරණ සවිකිරීම් භාවිතය සහ ගෙවතු වගාව සඳහා පිරිපහදු කළ අපජලය භාවිතය වැනි නැවත භාවිත කිරීමේ මුලපිරීම් ඇතුළත් වේ. මෙම පියවර අපගේ පහසුකම් හරහා ජල භාවිතය කාර්යක්ෂමව සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීමේ අපගේ ඉලක්කය සමඟ සමපාත වේ.

අපගේ කටුනායක පහසුකම්වල අපජල පිරිපහදු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෑතකදී කරන ලද රුපියල් මිලියන 12.6 ක ආයෝජනයක් සිදු කරමින් ජල සම්පත ආරක්ෂා කිරීම සඳහා අපි කටයුතු කළෙමු.

### අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රලේඛනය

අපද්‍රව්‍ය කළමනාකරණයේදී ඒවා අවම කිරීම සහ වෙන් කිරීම සහ හැකි සෑම අවස්ථාවකදීම නැවත භාවිත කිරීම කෙරෙහි අපි ප්‍රමුඛත්වය දෙන්නෙමු. සේවකයින් මුල් අවස්ථාවේදීම අපද්‍රව්‍ය වෙන් කිරීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන අතර, බලයලත් විකුණුම්කරුවන් හරහා ඊට ප්‍රතිචක්‍රීකරණ පහසුකම් ලැබේ. ඊට අමතරව, අපගේ අභ්‍යන්තර කණ්ඩායම් විසින් නවීන ERP පද්ධති සහ විද්‍යුත් අත්සන මෙවලම් වැනි ඩිජිටල් ක්‍රම යොදා ගනිමින් කඩදාසි භාවිතය අවම කිරීම සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සිදු කරයි.

එමෙන්ම, ගෘහ භාණ්ඩ සහ රෝද පුටු සඳහා අලුත්වැඩියා සහ නැවත භාවිතා කිරීමේ වැඩසටහන් සංවිධානයෙන් නව මිලදී ගැනීම් සඳහා ඇති අවශ්‍යතාවය සහ අපද්‍රව්‍ය එකතු වීම අවම ලදී. අපගේ සම්පත් ප්‍රතිසාධන හවුල්කාරිත්වයන් මඟින් චක්‍රලේඛන ප්‍රතිඵල සඳහා වටිනා දායකත්වයක් ලබා දේ.

### පාරිසරික අනුකූලතාව පවත්වා ගැනීම

පාරිසරික අනුකූලතාවය අපගේ ප්‍රමුඛතාවයකි. ICAO හි CORSIA, එංගලන්තයේ විමෝචන වෙළඳ යෝජනා ක්‍රමය (ETS) සහ EU ETS වැනි වැඩසටහන් හරහා අපි ජාත්‍යන්තර ගුවන් සේවා ප්‍රමිතීන් සපුරාලීම සහතික කළෙමු. දේශීය වශයෙන්, අපි ශ්‍රී ලංකාවේ ජාතික පාරිසරික පනත සමඟ, විශේෂයෙන් අපගේ නඩත්තුව, අලුත්වැඩියා සහ ප්‍රතිසංස්කරණ (MRO) පහසුකම තුළ අපද්‍රව්‍ය කළමනාකරණය සහ රසායනික හා අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල අනුකූලතාව පවත්වා ගන්නෙමු.

### ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රජා සහභාගීත්වය

පාලිත ගුවන්තොටුපළ පරිසරයන් තුළ අපගේ ප්‍රාථමික මෙහෙයුම් සිදු වුවද, දේශීය පරිසර පද්ධති සංරක්ෂණය කිරීමට අපි කැපවී සිටිමු. අපගේ කටුනායක මෙහෙයුම් වලට යාබදව පිහිටි මීගමුව කලපු කඩොලාන පරිසර පද්ධතියේ ආරක්ෂාව සහතික කිරීමට අපි ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ හවුල් වී කටයුතු කරන්නෙමු. ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කරන සංරක්ෂණ ක්‍රියාකාරකම් සහ ප්‍රජා සහභාගීත්ව මුලපිරීම් මේ සඳහා ඇතුළත් වේ.

ජෛව විවිධත්වය සංරක්ෂණය අපගේ පාරිසරික උපාය මාර්ගවලදී ප්‍රමුඛ කාර්යභාරයක් වන අතර, කාලයත් සමඟ සංරක්ෂණ කොටස්කරුවන් වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ අපගේ හවුල්කාරිත්වයන් පුළුල් කිරීමට අපි අරමුණු කරන්නෙමු.

### දේශගුණික අවදානම්වලට අනුවර්තනය වීම

ආන්තික කාලගුණික සිදුවීම් සහ දේශගුණික විපර්යාස කළමනාකරණය සඳහා අපි සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) සකස් කර ඇත්තෙමු. අපගේ උසස් ගුවන් ගමන් සැලසුම් පද්ධති සහ ක්‍රියා පටිපාටි මඟින් අහිතකර තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් ගුවන් මාර්ග ප්‍රශස්ත කිරීම, මගීන්ගේ ආරක්ෂාව සහ මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කිරීම සඳහා හැකියාව ලබා දේ.

### තිරසාරභාවය සඳහා නවෝත්පාදනය

නවෝත්පාදනය පාරිසරික ප්‍රගතියේ ප්‍රධාන කොටස්කරුවෙකි. 2025 ශ්‍රී ලංකා නිර්මාණ උළෙලේදී ඉදිරිපත් කරන ලද සම්මානලාභී 'මතක' ව්‍යාපෘතියේ අඛණ්ඩ සාර්ථකත්වය මඟින් තිරසාරභාවය සහ නිර්මාණශීලිත්වය යොදා ගනිමින් පාරිසරික සහ වෙළඳ නාම වටිනාකම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගත හැකි බව පෙන්නුම් කරයි.



2025 ශ්‍රී ලංකා නිර්මාණ උලෙළේදී ඉදිරිපත් කළ සම්මානලාභී 'මතක' ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය

දෙපාර්තමේන්තුව විසින් සිදු කරන නව ව්‍යාපෘති ඇගයීම්වලදී තිරසාරභාවය සලකා බැලීමට අවශ්‍ය බැව් අපගේ පාරිසරික ප්‍රතිපත්ති මඟින් දක්වයි. මෙය මෙහෙයුම් සහ උපායමාර්ගික තීරණ ගැනීමේදී පාරිසරික වගකීමේ කාර්යභාරය ශක්තිමත් කරයි.

ප්‍රතිචක්‍රීකරණය කරන ලද PET ප්ලාස්ටික් (R-PET) වලින් සාදන ලද නව පරිසර හිතකාමී කොට්ට ආවරණ සහ හිස සඳහා ආවරණ (antimacassars) හඳුන්වා දීමෙන් ගුවන් යානාවල ව්‍යාපාරික පන්තියේ තිරසාරභාවය පවත්වා ගෙන යනු ලබයි. තවද, සමස්ත පියාසැරි බර අඩු කිරීම සහ ඉන්පසු ඉන්ධන පිරිවැය අවම කිරීම අරමුණු කරමින්, පුනර්ජනනීය නයිලෝන් වලින් සාදන ලද පරිසර හිතකාමී, සැහැල්ලු ගුවන් යානා කාපට් යොදා ගැනීම සිදු කරයි. එය පොසිල ඉන්ධන වලින් ලබාගත් නැවුම් නයිලෝන් භාවිතය අවම කරමින්, පරිසරයෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීමට සහය දක්වයි. මේවා ගුවන් සේවය සිය මෙහෙයුම්වල තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත් නව්‍ය උත්සාහයන් වේ.

### ඉදිරිය සැලසුම්

2025 වර්ෂයේදී පාරිසරික කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපි සැලසුම් කරන බැවින්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපගේ පාරිසරික කාර්ය සාධනය උසස් කිරීමට අපි කැපවී සිටිමු. විමෝචන අවම කිරීම සහ සම්පත් ප්‍රශස්තිකරණයේ සිට බාහිර හවුල්කාරිත්වයන් සහ කාර්ය මණ්ඩල සහභාගීත්වය දක්වා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වඩාත් තිරසාර, වගකිවයුතු ගුවන් සේවා අනාගතයක් සඳහා පදනම සපයයි.

කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.




# මූල්‍ය ප්‍රාග්ධනය

2024/25 මූල්‍ය වර්ෂය සඳහා ගුවන් සමාගමේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය; මෙහෙයුම් සීමාවන් සහ පිරිවැය කළමනාකරණ ප්‍රයත්නයන් අනුව තීරණය විය. ගෝලීය මට්ටමින් ගුවන් ගමන් ප්‍රකෘතිමත් වුවද, භූ දේශපාලනික නොසන්සුන්තාව, සැපයුම් දාමයේ දුෂ්කරතා, ගුවන් යානා හිඟය සහ ගුවන් යානා නඩත්තු කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන්, කර්මාන්තයේ එකී පුනර්ජීවනයේ සම්පූර්ණ ප්‍රතිලාභ විඳගැනීමට සීමා පමුණුවන අභියෝග කිහිපයකට ගුවන් සමාගම මුහුණ දුන්නේය. කෙසේ වෙතත්, විසඳුම් සෙවීම සහ කර්මාන්තයේ වර්ධනයෙන් ලාභයන් ඉපැයීමට අරමුණු කිරීම යන සමාගමේ ප්‍රතිසාධන ගුණාංග හේතුවෙන් මෙහෙයුම් පවත්නා ගැනීමට සහ සේවා අඛණ්ඩතාව පවත්වා ගැනීමට හැකි විය.

ධාරිතාව සහ ඵලදායීතාව අවම වීම හේතුවෙන් මගී ආදායම අඩු වුවද, සමූහය විසින් මූල්‍ය පිරිවැය සහ බදුකරණයට පෙර ලාභය රුපියල් බිලියන 29.7 ක් ලෙස වාර්තා කරන ලදී. මේ සඳහා ඉන්ධන මිල අඩුවීම සහ එහි උපායමාර්ගික ව්‍යාපාර ඒකකවල (SBUs), විශේෂයෙන් ගුවන් පර්යන්තය සහ අනෙකුත් සේවාවන්ගේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය බලපාන ලදී. කෙසේ වෙතත්, සමූහය රුපියල් බිලියන 2.7ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ රුපියල් බිලියන 31.6 ක් වූ පොලී දරන වගකීම් සඳහා විනිමය ලාභය/(අලාභය) ඇතුළුව ශුද්ධ මූල්‍ය පිරිවැය.

| සමූහයේ මූල්‍ය කාර්ය දර්ශක | 2024/25 | 2023/24 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | % |
| ආදායම | 303,094 | 339,592 | (36,498) | (11) |
| මෙහෙයුම් වියදම් | (274,104) | (301,357) | (27,253) | 9 |
| වෙනත් ආදායම් සහ ප්‍රතිලාභ | 1,661 | 1,486 | 175 | 12 |
| විනිමය හුවමාරු ලාභය/(අලාභය) සහ සැලසුම් නොකළ අලුත්වැඩියා කිරීමේ පිරිවැයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය) | 30,651 | 39,720 | (9,069) | (23) |
| පොලී දරන වගකීම් හැර විනිමය හුවමාරු ලාභය/(අලාභය) | 1,262 | 1,943 | (681) | (35) |
| Neo එන්ජින්වල සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැය | (2,228) | (11,572) | (9,344) | 81 |
| විනිමය හුවමාරු ලාභය/(අලාභය) සහ සැලසුම් නොකළ අලුත්වැඩියා කිරීමේ පිරිවැයට පසු මෙහෙයුම් ලාභය/(අලාභය) | 29,685 | 30,091 | (406) | (1) |
| ගිවිසුම කඩ කිරීම මත දඩ ගාස්තු | - | (11,837) | (11,837) | 100 |
| මූල්‍ය වියදම් සහ බදුකරණයට පෙර ලාභය | 29,685 | 18,254 | 11,431 | 63 |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (31,574) | (9,847) | 21,727 | (221) |
| බදුකරණයට පෙර ලාභය/(අලාභය) | (1,889) | 8,407 | (10,296) | (122) |
| ආදායම් බදු වියදම් | (846) | (482) | 364 | (76) |
| වසර සඳහා ලාභය/(අලාභය) | (2,735) | 7,925 | (10,660) | (135) |

**ඉපැයීම්**

මූල්‍ය වර්ෂයේදී, ජාත්‍යන්තර මගී ගමනාගමනය හමුවේ ගෝලීය ගුවන් සේවා අංශය විසින් ශක්තිමත් ප්‍රතිසාධනයක් අත්විඳින ලදී. ගෝලීය වශයෙන් ඇති වූ මෙකී පිබිදීමට සමගාමීව, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2024 වර්ෂයේදී කැපී පෙනෙන වර්ධනයක් ලබා ගත් අතර, ජාත්‍යන්තර සංචාරකයින් මිලියන 2.1 කට අධික පිරිසක් ආකර්ෂණය කර ගනු ලැබීය. එය පෙර වසරට සාපේක්ෂව 38%ක වර්ධනයකි.

සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනයක් ඇති වුවද, ගුවන් සේවය විසින් සේවය කරන ලද්දේ මගීන් මිලියන 3. 5කට පමණි. එය පෙර වසරට සාපේක්ෂව 4%ක සංකෝචනයකි. 2024/25 මූල්‍ය වර්ෂය සඳහා මගී ආදායම රුපියල් බිලියන 234.5 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 15% ක සංකෝචනයකි (2023/24: රුපියල් බිලියන 276.2). සේවයේ යෙදවිය හැකි ගුවන් යානා සීමිත වීම, නඩත්තු කටයුතුවලින් ගුවන් යානා මුදා

හැරීමේ ප්‍රමාදයන් සහ වසර පුරා ගුවන් සමාගම අත්විඳින ලද ඉංජිනේරු කටයුතු ආශ්‍රිත බාධා හේතුවෙන් ගෝලීය ආදයම අඩුවීම සහ ධාරිතාව සීමිත වීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. ගුවන් සේවා මට්ටමින්, වාර්ෂිකව ලබා ගත හැකි ආසන කිලෝමීටර ප්‍රමාණය (ASK) 5%කින් සංකෝචනය වූ අතර, මැද පෙරදිග කලාපයේ සැලකිය යුතු 15%ක අඩුවීමක් වාර්තා විය; එමඟින් විශේෂයෙන් මැද පෙරදිග ගමනාගමන ප්‍රවාහයන් මත දැඩි ලෙස රඳා පවතින දකුණු ඉන්දියානු ගමනාන්තවල ජාල සම්බන්ධතාවයට බලපෑම් ඇති කරනු ලැබීය.

2024/25 මූල්‍ය වර්ෂයේදී සමූහයේ භාණ්ඩ ප්‍රවාහන ආදායම රුපියල් බිලියන 32 ක් ලෙස 2%කින් වර්ධනය විය. වෙනස්වන මිලකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ආදායම 9%කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. ඉල්ලුම් රටා, පවතින ධාරිතාව, සෘතුමය උච්චාවචනයන් සහ පාරිභෝගික භාණ්ඩ වැනි සාධක මත පදනම්ව මිල ගණන් සකස් කිරීමෙන්, ගුවන් සේවය විසින් විශේෂයෙන් ඉල්ලුම අවම කාලවලදී අභ්‍යවකාශය ප්‍රශස්ත ලෙස යොදා ගනිමින්, සාර්ථකව ලෙස ඉහළ ආදායමක් උපයන ලදී.

මූලික මඟී සහ භාණ්ඩ මෙහෙයුම් හැරුණු කොට, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නිරන්තරයෙන් ආදායම් වර්ධනය සහ ප්‍රතිසාධන ගුණය පෙන්නුම් කළ, උපාය මාර්ගික ව්‍යාපාර ඒකකවලින් සැලකිය යුතු ප්‍රතිලාභ අත් කර ගන්නා ලදී. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (BIA) එකම ගොඩබිම් හසුරුවන්නා ලෙස, සමාගම විසින් පාරිභෝගිකයින් පදනම් කරගත් අත්දැකීමක් ලබා දීම සඳහා සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමෙන් ඉහළ ප්‍රගතියක් අත් කර ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස, එයාර්ලයින්ස් විසින් ගුවන් පර්යන්තය සහ ඒ ආශ්‍රිත සේවාවන්ගෙන් රුපියල් බිලියන 24.9ක මුළු ආදායමක් උපයා ගනු ලැබීය. එය පෙර වසරට සාපේක්ෂව 17%ක වර්ධනයකි (2023/24: රුපියල් බිලියන 21.2). අනෙකුත් මූලාශ්‍රවලින් උපයන ලද වාර්ෂික ආදායම ද 10%ක වර්ධනයක් පෙන්නුම් කළේය.

### වියදම්

විනිමය අලාභ/ලාභ සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැයට පෙර සමූහය දරන ලද පිරිවැය 9%කින් සංකෝචනය විය. සමූහයේ පිරිවැය පිළිබඳ සවිස්තරාත්මක බෙදා දැක්වීක් පහත වගුවේ දක්වා ඇත.

| | 2024/25 | | 2023/24 | | විචලනය | |
|---|---|---|---|---|---|---|
| | (රු. මිලි.) | % | (රු. මිලි.) | % | (රු. මිලි.) | % |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | 91,687 | 30 | 115,119 | 35 | (23,432) | (20) |
| සේවක පිරිවැය | 32,799 | 11 | 32,261 | 10 | 538 | 2 |
| ගුවන් තොටුපළ, මාර්ගය සහ මඟී වියදම් | 38,601 | 13 | 39,187 | 12 | (586) | (1) |
| ගුවන් යානා නඩත්තු හා අලුත්වැඩියා පිරිවැය | 43,783 | 14 | 40,359 | 12 | 3,424 | 8 |
| ක්ෂයවීම්/ ක්ෂය කිරීම් | 15,975 | 5 | 14,138 | 4 | 1,837 | 13 |
| කෙටි කාලීන කල්බදු ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා කුලිය | 3,556 | 1 | 10,723 | 3 | (7,167) | (67) |
| විකිණුම්, අලෙවිකරණය සහ ප්‍රචාරණ වියදම් | 20,286 | 7 | 22,082 | 7 | (1,796) | (8) |
| කාර්ය මණ්ඩල වියදම් | 9,469 | 3 | 9,701 | 3 | (232) | (2) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 17,949 | 6 | 17,786 | 5 | 163 | 1 |
| මෙහෙයුම් වියදම් (විනිමය අලාභය/(ලාභ) සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැයට පෙර) | 274,104 | 89 | 301,357 | 90 | (27,253) | (9) |
| පොලී දරන වගකීම් හැර විනිමය හුවමාරු (ලාභය)/අලාභය | (1,262) | (0.4) | (1,943) | (1) | (681) | 35 |
| Neo එන්ජින්වල සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැය | 2,228 | 1 | 11,572 | 3 | (9,344) | (81) |
| වියදම් (විනිමය අලාභය/(ලාභ) සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැයට පසු) | 275,070 | 89 | 310,986 | 93 | (35,916) | (12) |
| ගිවිසුම කඩ කිරීම මත දඩ ගාස්තු | - | - | 11,837 | 4 | (11,837) | (100) |
| මූල්‍ය පිරිවැය සහ බදුකරණයට පෙර වියදම් | 275,070 | 89 | 322,823 | 97 | (47,753) | (15) |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | 31,574 | 10 | 9,847 | 3 | 21,727 | 221 |
| ආදායම් බදු වියදම් | 846 | 0.3 | 482 | 0.1 | 364 | 76 |
| මුළු වියදම් | 307,490 | 100 | 333,152 | 100 | (25,662) | (8) |

සමූහයේ මුළු පිරිවැයෙන් 30%ක් ගුවන් යානා ඉන්ධන පිරිවැය සඳහා වැය විය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ගුවන් යානා ඉන්ධන පිරිවැය, 2023/24 වර්ෂයට සාපේක්ෂව 20%කින් සංකෝචනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්, පෙර වසරේ US ගැලුමකට ඇමරිකානු ඩොලර් 2.7 සිට US ගැලුමකට ඇමරිකානු ඩොලර් 2.5 දක්වා ගෝලීය ඉන්ධන මිල ගණන් සැලකිය යුතු ලෙස අඩුවීම සහ මෙහෙයුම් අඩුවීම මේ සඳහා බලපාන ලදී.

පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා කෙටි කාලීන කල්බදු කුලී පිරිවැය 67%කින් සංකෝචනය විය. 2023/24 වර්ෂය සඳහා ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා කෙටි කාලීන කල්බදු කුලී පිරිවැය රු. බිලියන 10.7ක් විය. පුළුල් බඳ ගුවන් යානා සඳහා අමතර එන්ජින් සැපයුම් පහසුකම නොමැතිකම හේතුවෙන් පූර්ණ සේවා ලීසිං ගුවන් යානා සහ අමතර (wet lease) එන්ජින් පහසුකම් කල්බදු

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

*මූල්‍ය ප්‍රාග්ධනය තවදුරටත්.*

ලෙස යොදා ගැනීම මේ සඳහා බලපාන ලදී. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, මෙම සැපයුම් පහසුකම ප්‍රතිෂ්ඨාපනය කිරීම හේතුවෙන් කල්බදු එන්ජින් මත වන යැපීම අඩුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස බදු ආශ්‍රිත වියදම් අවම විය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් එයාර්බස් A320/321 Neo ගුවන් යානා එන්ජින්වල සැලසුම් නොකළ අලුත්වැඩියාවන්ට අදාළ ප්‍රතිපාදන වැඩි කළේය. 2023/24 වර්ෂයේදී, රුපියල් බිලියන 11.6 ක ප්‍රතිපාදනයක් හඳුනා ගන්නා ලදී. සැබෑ අලුත්වැඩියා පිරිවැය සහ සංශෝධිත පුරෝකථන මත පදනම් වූ සංශෝධිත ඇස්තමේන්තු අනුව, 2024/25 වර්ෂයේදී එය රුපියල් බිලියන2.2 කින් තවදුරටත් වර්ධනය විය. සමාගමේ පිරිවැය ඉතිරිකිරීමේ න්‍යායට අනුකූලව, මෙහෙයුම් වියදම් අඩු කිරීම සඳහා දැඩි පියවර ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රයත්නවල ප්‍රධාන අරමුණ වූයේ, දිගු කාලීන සංවර්ධන ව්‍යාපෘතියක් දියත් කිරීමයි. ස්ථිර අනාගතයක් වෙනුවෙන් පවතින වියදම් රටා විශ්ලේෂණය කොට නිගමනවලට එළැඹීම මෙහි මූලික කාර්යභාරය විය. මෙම ව්‍යාපෘතිය මඟින් පිරිවැය අවම කිරීම, සම්පත් යෙදවීම ප්‍රශස්ත කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ සමස්ත කර්මාන්ත තරඟකාරිත්වය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණ. එමෙන්ම, අකාර්යක්ෂමතා හඳුනා ගැනීම සහ ඒ ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා සැපයුම් දාම පිරිවැය පිළිබඳ සූක්ෂම ඇගයීමක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සිදු කරන ලදී.

### මූල්‍ය තත්ත්වය

2025 මාර්තු 31 වන විට, සමූහයේ මුළු වත්කම් රුපියල් බිලියන 189.3ක් වූ අතර, වත්කම් භාවිත අයිතිය රුපියල් බිලියන 64.8ක් ලෙස වාර්තා විය. මුළු වගකීම් රුපියල් බිලියන 568.8ක් වූ අතර, රාජ්‍ය බැංකු ණය රුපියල් බිලියන 91.3ක් සහ ස්වෛරී සහතික කළ ජාත්‍යන්තර බැඳුම්කර ඇ.ඩො.මිලියන 175 ක් ලෙස වාර්තා විය; මෙම අංශ දෙක දැනට ප්‍රතිව්‍යුහගත කරමින් පවතී. රාජ්‍ය බැංකු ණය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජය (GoSL) අඛණ්ඩ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙනුවෙන් වසර පහක කාලයක් තුළ මෙම බැඳීම් ආපසු ගෙවීමට භාරගෙන ඇත. ස්වෛරී සහතික කළ ජාත්‍යන්තර බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම, ශ්‍රී ලංකා රජයේ සහය ඇතිව දැනට සිදුවෙමින් පවතී.

හදිසි මෙහෙයුම් මුදල් හිඟයන් පියවා ගැනීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් වන තෙක්, අතුරු සහයක් ලෙස රාජ්‍ය බැංකු ණය ගැනීම්වල පොලී බැඳීම් සපුරාලීම සඳහා, 2024 අප්‍රේල් සහ සැප්තැම්බර් සහ 2025 ජනවාරි මාසවලදී ශ්‍රී ලංකා රජයෙන් විසින් සමාගමට රුපියල් බිලියන 6.3ක කොටස් ආයෝජන පිරිනමන ලදී.

### මුදල් තත්ත්වය

මූල්‍ය වර්ෂය තුළ, සමූහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රවාහය රුපියල් බිලියන 64.2ක් ලෙස ධනාත්මක අගයක් සනිටුහන් විය. කෙසේ වෙතත්, රුපියල් බිලියන 24.8ක මූල්‍ය පිරිවැය පියවීමෙන් සහ කල්බදු ආපසු ගෙවීම සහ අනෙකුත් පොලී දරන වගකීම් ඇතුළු මූල්‍ය ක්‍රියාකාරකම්වලින් රුපියල් බිලියන 38.9ක ශුද්ධ මුදල් පිටතට ගලායාම වාර්තා කළ පසුව, සමූහය විසින් මුදල් සහ මුදල් හා සමාන දෑ හි රුපියල් බිලියන 3 ක ශුද්ධ සංකෝචනයක් වාර්තා කරන ලදී.

### අනුබද්ධිත ආයතනයේ මූල්‍ය කාර්ය සාධනය

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් විසින් වසර තුළ රුපියල් බිලියන 5.9ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී (2023/24 මූල්‍ය වර්ෂය රුපියල් බිලියන 5.8). එය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2%ක වර්ධනයකි. වසර තුළ ශුද්ධ ලාභය රුපියල් බිලියන 4.8 ක් (2023/24 මූල්‍ය වර්ෂය - රුපියල් බිලියන 4.1) ලෙස වාර්තා විය. එය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 17% ක වර්ධනයකි. මගීන්ගේ පැමිණීම සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ නව ගුවන් සමාගම් විසින් මෙහෙයුම් ආරම්භ කිරීම මෙන්ම හිතකර විනිමය අනුපාතික උච්චාවචනයන් ද මෙම හිතකර ප්‍රතිඵල සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් විසින් ප්‍රධාන වශයෙන් යානස්ථ ආහාර සැපයුම්, ගුවන්තොටුපළ අවන්හල් (පොදු සහ ප්‍රවාහන) හි මෙහෙයුම්වලින් රුපියල් බිලියන 14.1ක (2023/24 මූල්‍ය වර්ෂය රුපියල් බිලියන 14) පිරිවැටුමක් වාර්තා කරන ලදී. ගුවන් යානා මුළුතැන්ගෙයෙන් ලැබෙන ආදායම ඇමරිකානු ඩොලර් වලින් 8%ක වර්ධනයක් දක්වයි (2023/24 මූල්‍ය වර්ෂය ඇමරිකානු ඩොලර් මිලියන 32). යානස්ථ ආහාර සැපයුම්වල ප්‍රධාන පාර්භෝගිකයා වන ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සමස්ත යානස්ථ ආහාර සැපයුම් පිරිවැටුමෙන් 58%ක් සඳහා දායක වූ අතර වසර තුළ නිෂ්පාදනය කරන ලද මුළු ආහාර සංඛ්‍යාවෙන් 68%ක් භාවිත කළේය.

### ඉදිරි දැක්ම

සමූහය තවමත් දැඩි මූල්‍ය තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක වන අතර, 2024/25 වර්ෂයේදී ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩ නැඟීම සඳහා පිරිවැය ප්‍රශස්ත කිරීම සහ ආදායම වර්ධනය කිරීම කෙරෙහි මූලිකව අවධානය යොමු කරයි. ගුවන් සේවය තිරසාර මූල්‍ය ප්‍රකෘතියක් අරමුණු කරන හෙයින්, 2025/26 වර්ෂයේදී උසස් අධීක්ෂණ යාන්ත්‍රණ, ශක්තිමත් ද්‍රවශීලතා කළමනාකරණය සහ පාර්භෝගික තෘප්තිමත්භාවය ඉහළ නංවමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව අඛණ්ඩව පවත්වා ගැනීම තීරණාත්මක වනු ඇත.

සාරාංශයක් ලෙස, ප්‍රාග්ධන හය හරහා අපගේ කාර්ය සාධනය වටිනාකම් නිර්මාණය කිරීමේ සමබර සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අපි අනුගමනය කරන්නෙමු. අපගේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව, මෙහෙයුම් වත්කම්, බුද්ධිමය හැකියාවන්, පුද්ගල සංවර්ධනය, පාර්ශවකරුවන්ගේ සබඳතා සහ පාරිසරික කළමනාකාරිත්වය අඛණ්ඩව ශක්තිමත් කිරීමෙන්, අපි ගුවන් සේවය තුළ තිරසාර දිගුකාලීන වර්ධනයක් සහතික කරන්නෙමු. මෙම ඒකාබද්ධ උත්සාහයන් මගින් වෙනස්වීම්වලට භාජනය වන ගෝලීය පසුබිමක නවෝත්පාදනය, අනුවර්තනය වීමේ හැකියාව සහ වගකිවයුතු පාලනය පවත්වා ගනිමින්, ප්‍රතිඵල සහිත බලපෑමක් ඇති කිරීම කෙරෙහි අපගේ ප්‍රයත්නයන් අවධාරණය කරයි.



# ආයතනික පාලන වාර්තාව

සමාගමේ කාර්යසාධනයේ තිරසාරත්වය උදෙසා මනා ආයතනික පාලනයක් අත්‍යවශ්‍ය වන බවත්, කළමනාකාරීත්වයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වන හෙයින් රජය සතු ව්‍යාපාරයන්හි යහපාලන භාවිතයන් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බවත්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් විශ්වාස කරනු ලබයි.

යුතුකම්, වගකීම, විනිවිදභාවය සහ වගවීම යන අංශ තුළ හිතකර සමතුලිතතාව වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ආයතනික පාලන මූලධර්ම සහ භාවිතයන්හි ප්‍රමිතීන් අඛණ්ඩව ඉහළ නැංවීමට සමාගම කැපවී සිටී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය ආයතනික පාලනයේ අංගයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද පහත සඳහන් නීති සම්පාදන, කේත සහ ස්වේච්ඡා ප්‍රතිපත්ති රාමුවලට අනුකූල වේ.

2007 අංක 7 දරන සමාගම් පනත

- සමාගමේ සාංගමික ලේඛන
- 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ යටතේ නිකුත් කරන ලද, රජය සතු ව්‍යාපාරයන් සඳහා ආයතනික පාලනය සහ මෙහෙයුම් සංග්‍රහය පිළිබඳ මාර්ගෝපදේශ
- අභ්‍යන්තර සමාගම් නීති සහ ක්‍රියාවලි සහ කර්මාන්තයේ විශේෂිත නීති සහ රෙගුලාසි

## අධ්‍යක්ෂ මණ්ඩලය

### අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

සමාගමේ සාංගමික ලේඛන ප්‍රකාරව, සමාග මේ කොටස්වලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් රජය සතු වන තෙක්, ශ්‍රී ලංකා රජය විසින් භාණ්ඩාගාර ලේකම්තුමාගේ මැදිහත්වීමෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. ව්‍යාපාරයන්හි පොදු අයිතිය රජයට පැවරී ඇති බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකියනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

සමාගමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් සහය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික මගපෙන්වීමක් සපයන අතර, ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූල වන බව උපායමාර්ගික සැලැස්ම මඟින් තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමතුලිතතාවය සහ බලය සහ අධිකාරිය සඳහා පහසුකම් සලසනු ලබන කළමනාකරණය අතර පැහැදිලි වගකීම් බෙදීමක් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම්;

- විශේෂයෙන්ම උපායමාර්ගික නියෝග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසෙන මෙහෙයුම් තීරණ ගැනීමේදී, කළමනාකරණයට ප්‍රමාණවත් බලයක් පැවරීම තහවුරු කිරීම.
- තීරණ ගැනීම සහ වගවීම සඳහා පහසුකම් සපයන, ස්ථිර සහ විශ්වසනීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් සමාගම සතු බව තහවුරු කිරීම.
- ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ පද්ධති, අවදානම් කළමනාකරණ සහ මෙහෙයුම් පාලනය වැනි පාලන පද්ධතිවල සම්පූර්ණත්වය සහතික කිරීම හා නීති, රෙගුලාසි සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම.
- මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාවලි ඇතුළු ප්‍රධාන ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර ඇති බවට සහ කාලානුරූපීව යාවත්කාලීන කරන බවට තහවුරු කිරීම.
- සමාගමේ වෙබ් අඩවිය හරහා කිසිදු ව්‍යවස්ථාපිත හෝ මෙහෙයුම් අවශ්‍යතාවකට හානියක් නොවන පරිදි, මූල්‍ය සහ මූල්‍ය නොවන ආකාරයේ උපරිම තොරතුරු එහි පාර්ශ්වකරුවන්ට හෙළිදරව් කිරීම තහවුරු කිරීම.

අධ්‍යක්ෂවරුන්ට සිය වගකීම් ඉටු කිරීමට, කාලීන සහ නිරවද්‍ය තොරතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරනු ලබයි.

- සියලුම අධ්‍යක්ෂවරුන් සඳහා නිරවද්‍ය, උචිත, කාලෝචිත, පැහැදිලි සහ සමබර තොරතුරු ලබා දෙනු ලබයි.
- කමිටු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් ප්‍රධාන කළමනාකාරීත්වය අතර තොරතුරු ලබා දීම සඳහා සමාගම් ලේකම්තුමිය සම්බන්ධක ලෙස කටයුතු කරනු ලබයි.
- ප්‍රධාන විධායක නිලධාරීතුමා ඇතුළු අදාළ අංශ ප්‍රධානීන් විසින් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දෙනු ලබයි.
- ඊට අමතරව, සමාගමේ තිරසාර මුලපිරීම්වලට අනුකූලව, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන, විද්‍යුත් ලේඛන ලෙස ලබා ගත හැකිය.

සවිමත් තොරතුරු තාක්ෂණය ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාකාරකම් සඳහා සහය ලබා ගන්නා අතර, ආරක්ෂිත සම්බන්ධතාවයක් හරහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන වෙත ප්‍රවේශ වීමට සහ දුරස්ථ රැස්වීම් සඳහා සහභාගී වීමට හැකියාව ලබා දෙනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත බලය පැවරීම

මනා පාලනයක් සහ හොඳම භාවිතයන් සපුරාලීම සඳහා එයාර්ලයින්ස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත. පවරන ලද කමිටු වෙත තම විශේෂඥතාවය සහ පළපුරුද්ද ලබා දිය හැකි අධ්‍යක්ෂවරුන්ගෙන් මෙම කමිටු සමන්විත වේ. වගකීම්, යොමු කිරීමේ අනුදේශයන්හි විධිමත්ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ලේකම්තුමා, සමාගම් ලේකම්තුමිය වේ.

කමිටුව, යොමු කිරීමේ අනුදේශයන්හි නිශ්චිතව දක්වා ඇති, ඔවුන්ගේ අධිකාරිය සහ වගවීම සම්බන්ධ කරුණු සලකා බැලීමට සහ සාකච්ඡා කිරීමට නිතිපතා රැස්වේ. ඔවුන්ගේ නිරීක්ෂණ සහ නිර්දේශ නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

### අධ්‍යක්ෂවරුන්ට වන්දි පූරණය

සමාගමේ සාංගමික ලේඛනයන්ට අනුකූලව, අධ්‍යක්ෂවරුන්ට, සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ඔවුන්ගේ තනතුරු අනුව වගකීම් ඉටුකිරීම සඳහා, දරනු ලබන වගකීම් සම්බන්ධයෙන් නීතියෙන් අවසර දී ඇති ප්‍රමාණයට සමාගමෙන් වන්දි පූර්ණයක් ලබාදෙනු ලැබේ. අධ්‍යක්ෂතුමා විසින් වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියා කර ඇති බව ඔප්පු වුවහොත්, වන්දිය මඟින් කිසිදු ආවරණයක් සපයන්නේ නැත. සමාගම විසින් වසර පුරාවට අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ වගකීම් රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යනු ලැබ ඇත.

### සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ කාර්යභාරය

උපායමාර්ගික සහ මෙහෙයුම් කරුණු අතර වෙනස, සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ වගකීම් බෙදීම අනුව පැහැදිලිව දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමා, විධායක නොවන පත්වීමක් වන අතර, උපායමාර්ගික ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම, ව්‍යාපාර සහ ජ්‍යෙෂ්ඨ

කළමනාකරණ කණ්ඩායම අධීක්ෂණය සිදු කරනු ලබයි. ඔහු විසින් අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කරන බවටත්, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් රැස්වීම් සඳහා ඵලදායී ලෙස සහභාගී වන බවටත් තහවුරු කරනු ලබයි.

එදිනෙදා ව්‍යාපාර කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම වෙත නායකත්වය සැපයීම සහ සමූහයේ උපායමාර්ගික සහ මෙහෙයුම් සැලසුම් හි කාර්යසාධන සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරිතුමා වගකීමෙන් බැඳේ. සමාගමේ කාර්යසාධනය, මෙහෙයුම් කටයුතු සහ මානව සම්පත් සම්බන්ධ ඕනෑම ගැටලුවක් සාකච්ඡා කිරීමට සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරිතුමා නිරන්තරයෙන් රැස් වනු ලබයි.

### අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය

දැනට පවතින අභ්‍යන්තර පාලන රාමුව සකසා ඇත්තේ, ආයතනික අවදානම් කළමනාකරණ රාමුව, මූල්‍ය පාලනය, අභ්‍යන්තර විගණනය සහ ආධාරක ප්‍රතිපත්ති මඟිනි. සමාගමේ අභ්‍යන්තර පාලන රාමුවේ පරමාර්ථය වනුයේ, මෙහෙයුම්හි ඵලදායීත්වය සහ උපායමාර්ගික ඉලක්ක සමඟ මනාව ගැළපීම සහතික කිරීමයි. අභ්‍යන්තර පාලන රාමුව මඟින් මූල්‍ය වාර්තාකරණයේ සහ කළමනාකරණ තොරතුරුවල නිවැරදිභාවය, විශ්වසනීයත්ව, සම්පූර්ණත්වය සහ කාලෝචිත බව සහතික කරලීම අරමුණු කරයි. මෙම රාමුව මඟින් සදාචාරාත්මක වටිනාකම්, යහපත් ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන් අනුමත කරනු ලබයි.

### ව්‍යවස්ථාපිත අනුකූලතාවය

අධ්‍යක්ෂකවරුන්, ඔවුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, එයාර්ලයින්ස් හි සේවකයන්ට අදාළ ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.

# ආයතනික අවදානම් කළමනාකරණය

ලොව ඉහළම විවිධත්වයකින් සහ අනපේක්ෂිතතායවන්ගෙන් පිරි කර්මාන්තයක සිය මෙහෙයුම් සිදු කරන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (SLA) විසින් නිරන්තරයෙන් වෙනස්වීම්වලට භාජනය වන, පූර්ව අනතුරු ඇඟවීමකින් තොර වූ පුළුල් පරාසයක අවදානම්වලට මුහුණ දෙනු ලබයි. මෙකී අභියෝගාත්මක පරිසරය ජය ගනු පිණිස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් එහි පවතින උපායමාර්ග සහ මෙහෙයුම් සඳහා ප්‍රායෝගික මෙන්ම ශක්තිමත් පදනමකින් සහිත පුළුල් ආයතනික අවදානම් කළමනාකරණ (ERM) රාමුවක් පිහිටුවා ඇත. අවදානම් කළමනාකරණය සඳහා වන මෙම ඒකාබද්ධ ප්‍රවේශය මඟින් එයාර්ලයින්ස් සමාගම වෙත දැනුවත්භාවයකින් යුතු තීරණ ගැනීමට, ආයතනයක් ලෙස ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමට සහ සියලුම කොටස්කරුවන් සඳහා තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමට හැකියාව ලබා දේ.

අවදානම යනු හුදෙක් අවම කළ යුතු තර්ජනයක් පමණක් නොව, දිගුකාලීන සැලසුම්කරණය සහ කාර්ය සාධනය සඳහා අතිශය වැදගත් කාරණාවක් බැව් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් හඳුනා ගනු ලබයි. ISO 31000, COSO රාමුව සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් ලබා දෙන කර්මාන්තය පදනම් කර ගත් මග පෙන්වීම වැනි ප්‍රමුඛ ගෝලීය ප්‍රමිතීන් පදනම් කරගනිමින්, ගුවන් සමාගමේ ආයතනික අවදානම් කළමනාකරණ රාමුව, ගුවන් සේවා කර්මාන්තයේ සංකීර්ණතා සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මෙහෙයුම්වල අද්විතීය ලක්ෂණ කෙරෙහි මූලිකත්වය දෙමින් සකස් කර ඇත. එය සියලුම ව්‍යාපාර ඒකක ඇතුළු සමස්ත සංවිධානය පුරාම විහිදී යයි. එමඟින් ගුවන් සමාගමේ සැලසුම්, කීර්ති නාමය, මූල්‍ය තත්ත්වය හෝ මෙහෙයුම් අඛණ්ඩතාවය සඳහා බලපෑම් කළ හැකි අවදානම් කල්තියා හඳුනා ගැනීම, පුළුල් තක්සේරුවක් ලබා ගැනීම සහ කාලෝචිත ලෙස අවම කිරීම සඳහා හැකියාව ලබා දේ.

එදිනෙදා ක්‍රියාකාරකම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා අවදානම් පිළිබඳ අවධානය යොමු කිරීම ක්‍රමානුකූලව යොදා ගැනීමෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි බාධා පුරෝකථනය කිරීම, නවෝත්පාදන වගකීමෙන් යුතුව මෙහෙයවීම සහ අභ්‍යන්තර හා බාහිර අනපේක්ෂිතතාවයන්ට කාර්යක්ෂමව සහ විශ්වාසයෙන් ප්‍රතිචාර දැක්වීම කෙරෙහි පවතින ශක්‍යතාව වැඩි දියුණු කරයි.

## අවදානම් පාලන රාමුව

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ආයතනික අවදානම් කළමනාකරණ පද්ධතියේ හරය වන්නේ වගවීම, අධීක්ෂණය සහ අන්තර් ක්‍රියාකාරී සම්බන්ධීකරණය සහතික කරන මනාව අර්ථ දැක්වූ පාලන ව්‍යුහයකි. සංවිධානයේ සියලුම මට්ටම් වෙත අවදානම් පිළිබඳ වගකීම් නිශ්චිතව පවරා ඇති බවට මෙකී කාණ්ඩවලින් සමන්විත ප්‍රවේශය මඟින් සහතික කරයි:

- **අධ්‍යක්ෂ මණ්ඩලය:** සමාගමේ අවදානම් පිළිබඳ අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වගකිව යුතුය.
- **සමූහයේ අවදානම් කළමනාකරණ පාලන කමිටුව:** සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ ව්‍යාපාර කටයුතු වලට බලපෑමක් ඇතිකළ හැකි අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සහ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් වල බලපෑම තක්සේරු කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටුවක් වන අවදානම් කමිටුවට මණ්ඩලයෙන් බලය පවරා ඇත. අධ්‍යක්ෂක මණ්ඩල සමූහ අවදානම් කමිටුවේ සාකච්ඡා මඟින් මෙහෙයුම් වලට බලපාන අවදානමේ බලපෑම විසඳීමට සහ ඕනෑම අහිතකර බලපෑමක් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට පහසුකම් සැලසිය යුතුය.
- **ප්‍රධාන විධායක නිලධාරී (CEO):** අවදානම් පිළිබඳ උපායමාර්ගික න්‍යාය පත්‍රයට නායකත්වය දෙනු ලබයි. අවදානම් කළමනාකරණය ආයතනික ඉලක්කවලට සර්ලන බවටත්, තීරණ ගැනීමේදී ඒවා යොදා ගන්නා බවටත් සහතික කරයි.
- **අවදානම් නිලධාරී (සමූහයේ අවදානම් පාලන කළමනාකරු):** සමූහය පුරා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ රාමු ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලබයි. දෙපාර්තමේන්තු අතර සහයෝගීතාවය සහ වැඩිදියුණු කිරීම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පහසුකම් සපයයි.
- **ව්‍යාපාර ඒකක ප්‍රධානීන්:** මොවුන් විසින් අවදානම් සම්බන්ධයෙන් ප්‍රාථමික පියවර ගනු ලබයි. ඔවුන්ගේ ක්‍රියාකාරී වපසරිය සඳහා එදිනෙදා අවදානම් හඳුනා ගැනීම, අවම කිරීම, ඉහළට දැනුම්දීම සහ අවදානම් වාර්තා කිරීම සම්බන්ධයෙන් වගකීම් ඇතුළත් වේ.
- **සමූහයේ අභ්‍යන්තර විගණනය:** ආයතනික අවදානම් කළමනාකරණ රාමුවේ ශක්තිමත්භාවය, පාලනයන්හි ප්‍රමාණවත්භාවය, අවම කිරීමේ සැලසුම් සහ පාලන ක්‍රියාවලින් ඇගයීම පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දේ.




## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

පුළුල් සහ අනුවර්තනය වීමේ හැකියාව සහතික කරනු ලබන අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්වල අඛණ්ඩ සහ පුනරාවර්තන චක්‍රය පදනම් කර ගනිමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ආයතනික අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක වේ.

1. **අවදානම් හඳුනා ගැනීම:** දෙපාර්තමේන්තු මට්ටමින් පවත්වනු ලබන මෙම පියවර මඟින් උපායමාර්ග, මෙහෙයුම්, මූල්‍ය, තාක්ෂණික සහ අනුකූලතා ක්ෂේත්‍ර හි පවතින සහ ඇතිවන අවදානම් හඳුනා ගනු ලබයි.
2. **අවදානම් තක්සේරුව:** හඳුනාගත් අවදානම් ඒවායේ සිදුවීමේ සම්භාවිතාව සහ විභව බලපෑම මත පදනම්ව ඇගයීමට ලක් කරනු ලබන අතර, පසුව ප්‍රමුඛතාවය සහ තීව්‍රතාවය දැනුම් දීම සඳහා සැලකිය යුතු, ඉහළ, මධ්‍යම හෝ අඩු අවදානම් යනුවෙන් වර්ගීකරණය කරනු ලබයි.
3. **අවදානම් අවම කිරීම:** අවදානම් තීරණාත්මක බව මත පදනම්ව ඉලක්කගත අවම කිරීමේ උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ලබයි. අන්තර් ක්‍රියාකාරී විසඳුම සඳහා ප්‍රධාන විධායක නිලධාරී සහ අවදානම් නිලධාරියා වෙත ඉහළ සහ සැලකිය යුතු අවදානම් දැනුම් දෙනු ලබයි.
4. **අධීක්ෂණය සහ වාර්තා කිරීම:** අවදානම් සම්බන්ධයෙන් වගකීම් දරන්නන් විසින් නිතිපතා යාවත්කාලීන කරනු ලබන සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරනු ලබන මධ්‍යගත දත්ත පදනමක් අනුව ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අවදානම් ලේඛන පවත්වාගෙන යයි. මෙමඟින් අවදානම් පසුබිම මඟින් යාවත්කාලීන දත්ත ලබා දෙන අතර ගතික වාර්තාකරණය සහ තීරණ ගැනීම සඳහා උපකාරී වේ.




### ප්‍රධාන අවදානම් අංශ සහ වෙනස් වන පසුබිම (2024/25)

2024/25 මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ක්‍රියාත්මක වූයේ ඉහළ අස්ථාවරත්වයකින් සහ ව්‍යුහාත්මක අභියෝගවලින් පිරි පරිසරයක ය. ගෝලීය මගී ඉල්ලුම යථා තත්ත්වයට පත් වුවද, අභ්‍යන්තර සීමාවන් සහ බාහිර අවිනිශ්චිතතා හේතුවෙන් අවදානම් පසුබිමක් පැවති අතර, එමගින් ශක්තිමත් ආයතනික අවදානම් කළමනාකරණ රාමුවක් පැවතීමේ වැදගත්කම පසක් කරයි.

### ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ ද්‍රවශීලතාවය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සැලකිය යුතු මූල්‍ය පීඩනයක් යටතේ දිගටම ක්‍රියාත්මක වන අතර, එහි සෘණ කොටස් තත්ත්වය, උරුම ණය බර සහ බාහිර අරමුදල් සඳහා සීමිත ප්‍රවේශය ඊට ප්‍රධාන වශයෙන් බලපානු ලබයි. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මෙහෙයුම් මුදල් ප්‍රවාහ, වත්මන් බැඳීම් සපුරාලීමට ප්‍රමාණවත් වුවද, ඓතිහාසික වගකීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සහ ගුවන් යානා අලුත් කිරීම වැනි තීරණාත්මක ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමේදී ඇති වන අභියෝග ගුවන් සමාගමේ දිගුකාලීන තරඟකාරීත්වයට සහ උපායමාර්ගික ස්ථානගත කිරීමට අඛණ්ඩ අවදානම් ඇති කරයි.

ඊට පිළියම් වශයෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි මූල්‍ය තත්ත්වය ස්ථාවර කිරීම සඳහා ප්‍රධාන පියවරක් ලෙස රජයේ සහය ඇතිව එහි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාකාරීව නිරත වී ඇත.

### ගුවන් යානා ඇණියේ සීමාවන් සහ මෙහෙයුම් කටයුතුවල බාධා

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සැලසුම් කළ ජාලයට අවශ්‍ය ගුවන් යානා ලබා ගැනීමේ හැකියාව සීමිත වීම වසර තුළ පැවති ප්‍රධාන මෙහෙයුම් අභියෝගයක් විය. ගුවන් යානා අලුත් කිරීමේ ප්‍රමාදය, දීර්ඝ නඩත්තු වාර සහ එන්ජින් ආශ්‍රිත සීමාවන් වැනි සාධක කාලසටහන්වල අඛණ්ඩතාවයට බලපෑම් ඇති කළ අතර, මෙහෙයුම් බාධා සහ ආදායම් පීඩනයන්ට හේතු විය.

ගුවන් යානා ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා, ගුවන් යානා භාවිතය ප්‍රශස්ත කිරීම සහ කාලසටහන්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ උපායමාර්ගික සහ මෙහෙයුම් මුලපිරීම් මාලාවක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ක්‍රියාත්මක කරන ලදී. වෙනස්වන කාලසටහන් ගැළපීම්, එන්ජින් ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ ගුවන් යානා අලුත් කිරීමේ සැලසුම්කරණයේදී ක්‍රියාකාරීව කටයුතු කිරීම මෙහි මූලික පියවර අතරට ඇතුළත් විය.

### ගෝලීය සැපයුම් දාමයේ පීඩා

අමතර කොටස් හිඟය, විකුණුම්කරුවන්ගේ පසුබෑම සහ දිගු කාල පරාසය ඇතුළුව සැපයුම් දාමයේ අස්ථාවරත්වය නඩත්තු සහ ප්‍රතිසංස්කරණ (MRO) ක්‍රියාකාරකම් කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපාන ලදී. ගෝලීය වශයෙන් පැවති සහතික ලත් ගුවන් ඉංජිනේරුවන්ගේ හිඟය හේතුවෙන් මෙම තත්ත්වය උග්‍ර වූ අතර මෙම අභියෝග සේවා සැපයීම සහ කාලසටහන්වල නිශ්චිතභාවය කෙරෙහි තවත් බලපෑම් ඇති කළේය.

### සීමිත මානව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකාව තුළ සහ ගෝලීය වශයෙන් ගුවන් සේවා ක්ෂේත්‍රයේ පැවති විශේෂිත දක්ෂතාවල හිඟය හේතුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අභියෝගවලට මුහුණ දෙන ලදී. ඉංජිනේරු සහ ගුවන් ගමන් මෙහෙයුම් ඇතුළු ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්හි අඛණ්ඩතාවය කෙරෙහි ඉහළ ආතතීන්, බුද්ධි ගලනය සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමේ සහ රඳවා ගැනීමේ අභියෝග බලපෑවේය.

මෙම අභියෝගවලට පිළියම් යෙදීම සඳහා, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් තිරසාර කුසලතා ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම සඳහා සිය ගුවන් සේවා පුහුණු අංශය ශක්තිමත් කළ අතර ශ්‍රම බලකායේ ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයට සහය වීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බඳවා ගැනීම් පුළුල් කරන ලදී.

### ආයතනික අවදානම් කළමනාකරණ සඳහා ඉදිරි දැක්ම සහ උපායමාර්ගික ප්‍රමුඛතා (2025/26)

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අර්බුධවලින් පසු ප්‍රතිසාධන අවධියක් පසු කරමින් සිටින හෙයින්, උපායමාර්ගික පරිවර්තනය, මෙහෙයුම් අඛණ්ඩතාව සහ මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන් සවියක් වීමට එහි අවදානම් කළමනාකරණ කාර්යය ඉතා වැදගත් වේ. 2025/26 සඳහා ප්‍රධාන අවදානම් කළමනාකරණ ප්‍රමුඛතා අතරට පහත දෑ ඇතුළත් වේ:

- **උපායමාර්ගික ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම:** කාලෝචිත, සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා ආයතනික අවදානම් අවබෝධය සහ ආයතනික සැලසුම් අතර ගැළපීම වැඩි දියුණු කිරීම.
- **ඩිජිටල් අවදානම් පිළිබඳ දැනුම පුළුල් කිරීම:** දෘශ්‍යතාව සහ ප්‍රතිචාර දැක්වීම වැඩි දියුණු කිරීම සඳහා තත්‍ය කාලීන අවදානම් පාලක පුවරු සංවර්ධනය කිරීම.
- **ආයතනික ශක්‍යතාව ගොඩනැගීම:** ඉලක්කගත දැනුවත් කිරීමේ ව්‍යාපාර, නායකත්ව පුහුණුව සහ කාර්ය සාධන සමාලෝචනවල ඇතුළත් කර ඇති වගවීම හරහා අවදානම් සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම.
- **අන්තර් ක්‍රියාකාරී ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම:** අංශ අවම කිරීමට සහ පද්ධතියේ අවදානම් සූදානම ශක්තිමත් කිරීමට මූල්‍ය, සැපයුම් දාමය, ඉංජිනේරු විද්‍යාව සහ මෙහෙයුම් අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.
- **බාහිර පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීම:** පෙර සිට පවතින මූල්‍ය අභියෝගවලට මුහුණ දීම සහ උපායමාර්ගික ප්‍රතිව්‍යුහගත කිරීමේ උත්සාහයන්ට සහය දැක්වීමට නියාමකයින්, ලීසිං සමාගම් සහ ණයහිමියන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

### නිගමනය

අවදානම් යනු ගුවන් සේවා ක්ෂේත්‍රයට ආවේණික අංගයකි. එනමුත් එය තීක්ෂණ බුද්ධිය, නවෝත්පාදනය සහ උපායමාර්ගික දුරදක්නාභාවයේ පදනමයි. අවදානම් කළමනාකරණය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ව්‍යවසායික පුළුල් ප්‍රවේශය ඔස්සේ ඔරොත්තු දෙන මෙහෙයුම්, විනිවිදභාවයෙන් යුතු පාලනය සහ දිගුකාලීන පාර්ශවකරුවන්ගේ වටිනාකම කෙරෙහි ඇති කැපවීම පිළිබිඹු වේ. ගුවන් සේවය සංකීර්ණ මෙහෙයුම් පරිසරයක් තුළ අඛණ්ඩව පරිණාමය වන විට, විශේෂ වාසි අත්කර ගැනීමටත්, තිරසාර අනාගතයක් සුරක්ෂිත කිරීමටත් ආයතනික අවදානම් කළමනාකරණය වැදගත් කාර්යභාරයක් සිදු කරනු ඇත.




# සුරක්ෂිතභාවයේ හිනිපෙත කරා

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2025 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා වාර්ෂික වාර්තාව සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉතා සතුටින් ඉදිරිපත් කර සිටී.

## මූලික ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

ශ්‍රී ලංකාවේ නිල ගුවන් සේවය වශයෙන් සමාගමේ මූලික ව්‍යාපාර කටයුතු වනුයේ, මගී ප්‍රවාහනය, භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා කාර්ය සටහන් සහිතව සහ රහිතව ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම් සම්පාදනයයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (“MRIA”) හරහා ගුවන් පර්යන්ත සේවාවන් සැපයීම, ගුවන් මගීන් වෙත තීරු බදු රහිත භාණ්ඩ අලෙවි කිරීම, අභ්‍යන්තර සහ බාහිර නිවාඩු ගත කිරීමේ සැලසුම් අලෙවි කිරීම සමාගමෙහි අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තෙවන පාර්ශ්ව ගුවන්යානා නඩත්තු සේවා, ගුවන්යානා මෙහෙයුම් සේවා ප්‍රතිපාදනය කරමින් සමාගමේ ගුවන්සේවා ආශ්‍රිත පුහුණු පැවැත්වීම ආදිය සමාගම විසින් සිදු කරන අතිරේක ක්‍රියාකාරකම් යටතට ඇතුළත් වේ. මූල්‍ය වර්ෂය තුළ සමාග මේ ක්‍රියාකාරකම්වල ස්වාභාවයේ සැලකිය යුතු වෙනසක් නොපැවතුණි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (“MRIA”) හරහා මෙහෙයුම් කටයුතුවල යෙදෙන ගුවන් සමාගම් සඳහා ආහාරපාන සේවා සැපයීම මූලික කාර්යය ලෙස සිදුකරනු ලබන, සමාගමෙහි සම්පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙන් සමූහය සමන්විත වේ. මහජන සහ සංක්‍රමණික අවන්හල් පවත්වාගෙන යාම, අධි ශීතකළ ආහාර කාණ්ඩ, ලොන්ඩරි සේවා සැපයීම සහ සංක්‍රමණික හෝටල් කළමනාකරණය කිරීම එහි අතිරේක සේවා වේ.

## මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව

සමූහයේ මූල්‍ය කළමනාකරණ ප්‍රධානී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් තබන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ සහ ඒ පිළිබඳ 2025 මාර්තු 31 දිනට අවසන් වන වසර සඳහා වන විගණන වාර්තාව මෙම වාර්තාව සමඟ අමුණා තිබේ.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති 71 සිට 114 පිටුවල ඉදිරිපත් කර ඇත.

## සමූහයේ පිරිවැටුම

සමූහයේ පිරිවැටුම රුපියල් මිලියන 303,094 (2023/24 : රුපියල් මිලියන 339,592) කි. සමූහයේ පිරිවැටුමෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 20හි දක්වා ඇත. සමාගම සහ එහි පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර ගනුදෙනු සාධාරණ වෙළඳපොළ මිල ගණන් අනුව සිදුකරනු ලබයි.

## ප්‍රතිඵල

වසර සඳහා සමූහයෙහි බදුවලට පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 2,735 (2023/24 : රුපියල් මිලියන 7,925 ශුද්ධ ලාභය) කි. සමූහය විසින් රුපියල් මිලියන 846ක (2023/24 : රුපියල් මිලියන 482) බදුකරණ වියදමක් දරන ලදී. වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය 67 පිටුවෙහි දක්වා ඇත.

## සමූහයේ ආයෝජන

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ සඳහා සමූහයේ ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 1,952 (2023/24: රුපියල් මිලියන 1,693) ක් විය.

## දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනට සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා ගිණුම් පොතෙහි සඳහන් ශුද්ධ වටිනාකම රුපියල් මිලියන 12,191ක් (2023/24: රුපියල් මිලියන 11,582 ) විය.

දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සංචලනයන් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන 3 හි දක්වා ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 203,860,665,500 ක් වේ.

## සංචිත

2025 මාර්තු 31 දිනට එකතු වූ මුළු අලාභය රුපියල් මිලියන 596,461 (2023/24: රුපියල් මිලියන 592,627) කි.

ප්‍රාග්ධන සංචිත රුපියල් මිලියන 8,292 (2023/24 රුපියල් මිලියන 8,542) වේ. මෙම සංචිතවල චලනය මූල්‍ය ප්‍රකාශනවල කොටස්වල වෙනස්වීම් ප්‍රකාශයේ දැක්වේ.

## ආයතනික පරිත්‍යාග

සමූහය විසින් වර්ෂය තුළ කිසිදු පරිත්‍යාගයක් සිදුකර නැත.

## අයබදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මත පදනම්ව 2018 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමෙහි සියලුම ව්‍යාපාරික කටයුතුවලට අදාළව ආදායම් බද්ද සඳහා සමාගම බැඳී සිටී. දැනට ද්විත්ව බදු ගිවිසුම් නොමැති රටවල සමාගමෙහි විදේශීය මෙහෙයුම්වලට අදාළ බදු සඳහා සමාගම බැඳී සිටී.

ගුවන් යානා මුළුතැන්ගෙය සහ සංක්‍රමණික අවන්හල වෙතින් ලැබෙන ආදායම 2021 මැයි 31 දක්වා ආදායම් බද්දෙන් නිදහස් කර ඇති අතර ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව 2029 මැයි 31 දිනෙන් අවසන් වන වසර 8ක් සඳහා 15%ක සහනදායී අනුපාතයකට බදු ගෙවිය හැකිය. වෙනත් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආදායමට අදාළව සාමාන්‍ය අනුපාතයට වගකීමෙන් බැඳී ඇත.

## කොටස් පිළිබඳ විස්තර

2025 මාර්තු 31 දින වන විට කොටස් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| කොටස් හිමිකාරිත්වය | කොටස් සංඛ්‍යාව | හිමිකාරීත්වය % |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 2,034,006,469 | 99.77% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0.09% |
| වෙනත් | 2,736,510 | 0.14% |

## නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලත්වය

සමාගම සෑමවිටකම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කොට ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරණ නිලධාරීන් විසින් විගණන කමිටුවේ කාර්තුමය රැස්වීම්වලදී අනුකූලතාවය සම්බන්ධ වාර්තාවක් සභාගත කරනු ලබයි.

## සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 28 හි දක්වා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව තවදුරටත්.

### අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්
2025 මාර්තු 31 වැනි දිනට අසම්භාව්‍ය වගකීම් සහ එම දිනට ප්‍රාග්ධන වියදම් මත දරන ලද බැඳීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 25 හි ඉදිරිපත් කොට ඇත.

### වාර්තාකරණ දිනට පසු සිදුවීම්
මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 27 හි දක්වා ඇති කරුණු හැරුණු විට, වෙනස් කිරීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් වාර්තාකරණ දින සිට උද්ගතව නැත.

### මානව සම්පත්/සේවා නියුක්ති ප්‍රතිපත්ති
මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා ආයෝජනයන් සිදු කිරීමත්, නව ව්‍යාපාර ප්‍රමුඛතා වටා ඵලදායී ශ්‍රම බලකායක් ඒකරාශී කිරීමත්, සමාගමේ ඉදිරි සාර්ථකත්වය සඳහා අවශ්‍ය කරන දැනුමින් සහ කුසලතාවලින් සිය සේවකයින් සන්නද්ධ වන්නේදැයි සහතික කර ගැනීමත් සඳහා සමාගම නිරන්තරයෙන් කටයුතු කරයි. සමූහයේ සේවා නියුක්ති ප්‍රතිපත්ති මගින් පුද්ගලයින්ට නිසි ගෞරවය ලබා දෙමින්, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ ආගම නොසලකා ඔවුන්ට සම වෘත්තීය අවස්ථා පිරිනමයි. එමෙන්ම, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් වෙත සැලකිය යුතු අවධානයක් ලබා දේ. වසර අවසානයේ සමාගම විසින් සේවයේ යොදවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව 6,071 (2023/24: 5,935) වන අතර, පරිපාලිතය විසින් සේවයේ යොදවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව 713 (2023/24:737) විය.

### ව්‍යවස්ථාපිත ගෙවීම්
සේවකයින්ට සහ ශ්‍රී ලංකා රජයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ පරම දැනුම හා විශ්වාසය අනුව සෑහීමකට පත්වේ.

### පරිසර ආරක්ෂණය
සමූහයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් මඟින් පරිසරයට සෘජු හා වක්‍ර බලපෑම් ඇති විය හැකිය. පරිසරයට අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගැනීම සහ අදාළ බලධාරීන් සහ රෙගුලාසි සමඟ අනුකූලතාව පවත්වා ගැනීම සඳහා සහයෝගීව කටයුතු කිරීම සමූහයේ ප්‍රතිපත්තිය වේ.

### අඛණ්ඩ පැවැත්ම
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි, භාණ්ඩාගාර ලේකම්වරයාගේ සහතිකය මත අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම අනුගමනය කර ඇත. ඒ අනුව, ආයතනය ප්‍රතිව්‍යුහගත කරන තෙක් අඛණ්ඩ පැවැත්ම අනුව ඉදිරියට යාමට, 2024/25 වසර සඳහා අවශ්‍ය විටෙක ශ්‍රී ලංකා රජය විසින් සමාගමට මූල්‍ය සහය ලබා දෙනු ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය
සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියෙහි 79 වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂවරුන් භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ කෙටි හඳුන්වාදීමක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 13 සිට 15 දක්වා ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 17 ක් කැඳවා තිබූ අතර, ඒවා සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

| 2024/25 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධුර කාලය තුළ සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| අසෝක පතිරගේ මහතා (සභාපති) (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 07/07 |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 06/07 |
| ආචාර්ය ශ්‍රීධීර සාරිපුත්ත හංස විජයසූරිය මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 04/07 |
| ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 06/07 |
| ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (2024 ඔක්තෝබර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 07/07 |
| ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත | 16/17 |
| ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා (2024 ඔක්තෝබර් 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 05/07 |
| ඩී. ඩී. ශිරාන් චමින්ද ධම්මගේ මහතා (2024 මැයි 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 02/02 |
| ෆ්‍රෑන්ක් නිරන්ජන් අරුල්ප්‍රගාසම් මහතා (2024 ජුනි 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්වීම් ලද අතර 2024 ඔක්තෝබර් 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 05/05 |
| සරත් ගනේගොඩ මහතා (සභාපති) (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 10/10 |
| රොහාන් ගුණතිලක මහතා (2024 ඔක්තෝබර් 9 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 10/10 |
| Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 09/10 |
| විපුල ගුණතිලක මහතා (2024 ඔක්තෝබර් 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 09/10 |
| ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ (2024 ඔක්තෝබර් 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 06/09 |
| දුමිත් ප්‍රනාන්දු මහතා (2024 ඔක්තෝබර් 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 08/09 |
| සෙනරත් ඩී. ලියනගේ මහතා (2024 දෙසැම්බර් 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 05/06 |

## විගණන කමිටුවේ සාමාජිකයින්

පහත සඳහන් සාමාජිකයින් විගණන කමිටුවට ඇතුළත් වේ.

| කමිටු සාමාජිකයින් - 2024/25 මූල්‍ය වර්ෂය | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 4/4 |
| ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත | 6/7 |
| ඩී. ඩී. ශිරාන් චමින්ද ධම්මගේ මහතා (2024 මැයි 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 1/1 |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා (2024 ජූනි 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 1/1 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා (2024 ජූනි 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 1/1 |
| ආනන්ද අතුකෝරල මහතා (2024 ඔක්තෝම්බර් 14 වන දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 3/4 |
| ෆ්‍රෑන්ක් නිරංජන් අරුල්ප්‍රගාසම් මහතා (2024 ජූනි 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්වීම් ලද අතර 2024 ඔක්තෝබර් 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී) | 3/3 |
| විපුල ගුණතිලක මහතා - සභාපති (2024 ඔක්තෝබර් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 3/3 |
| රොහාන් ගුණතිලක මහතා (2024 ඔක්තෝබර් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 3/3 |
| දුමිත් ප්‍රනාන්දු මහතා (2024 ඔක්තෝබර් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 3/3 |
| Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා (2025 ජනවාරි 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 2/2 |
| සෙනරත් ඩී. ලියනගේ මහතා (2025 ජනවාරි 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 1/2 |

විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 59 සිට 60 දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුවෙහි ප්‍රධාන අරමුණු වනුයේ, පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් වැඩි දියුණු කිරීම සහ පාරිශ්‍රමික ව්‍යුහයක් ස්ථාපනය කිරීම උදෙසා විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීමේ කාර්යය වෙනුවෙන් මගපෙන්වීමයි.

වෙළඳපොළ සහ කර්මාන්ත සාධක සහ සමූහයේ සියලු සමාගම්වල පුද්ගල කාර්යසාධනය මත පදනම්ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර ඇත. මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව අවශ්‍යතාව පරිදි රැස්වේ.

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව, පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| කමිටු සාමාජිකයින් - 2024/25 මූල්‍ය වර්ෂය | සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 4/5 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 1/5 |
| ජෝශප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා (2024 ඔක්තෝම්බර් 9 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 5/5 |
| ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත | 9/10 |
| ඒ.එම්.ඒ.ඒ. ලක්මාල් රත්නායක මහතා (2024 ඔක්තෝබර් 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 3/5 |
| රොහාන් ගුණතිලක මහතා - සභාපති (2024 ඔක්තෝබර් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 6/6 |
| Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා (2024 ඔක්තෝබර් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 6/6 |
| ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ (2024 ඔක්තෝබර් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් වන ලදී) | 5/6 |

## සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව (BGRC)

ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අවදානම් හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට මෙන්ම මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීමට සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව අවශ්‍ය වේ. BGRC හි සාකච්ඡා මඟින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම්වල බලපෑම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සහ කිසියම් අහිතකර බලපෑමක් වේ නම් එය අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වනු ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව තවදුරටත්.

සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ;

| කමිටු සාමාජිකයින් - 2024/25 මූල්‍ය වර්ෂය | සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 2/2 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා (2024 ඔක්තෝබර් 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 1/2 |
| ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත - සභාපති | 3/3 |
| ආනන්ද අතුකෝරල මහතා (2024 ඔක්තෝබර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 1/2 |
| ෆ්‍රෑන්ක් නිරංජන් අරුල්ප්‍රගාසම් මහතා (2024 ඔක්තෝබර් 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 2/2 |
| විපුල ගුණතිලක මහතා (2024 ඔක්තෝබර් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 1/1 |
| දුමිත් ප්‍රනාන්දු මහතා (2024 ඔක්තෝබර් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 1/1 |
| සෙනරත් ඩී. ලියනගේ මහතා (2025 ජනවාරි 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී) | 1/1 |

### සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුව

සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුවේ මංගල රැස්වීම 2025 මාර්තු 25 වන දින පැවැත්විණි. ආයතනයේ ව්‍යාපාර මෙහෙයුම් හෝ මූල්‍ය තත්ත්වයට බලපෑ හැකි සම්බන්ධිත පාර්ශ්වයන්ගේ සියලු ගනුදෙනු සහ සම්බන්ධතා හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුව වගකිව යුතුය. විනිවිදභාවය, නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහ ආයතනයේ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා කමිටුව එවැනි ගනුදෙනුවල ස්වභාවය සහ ප්‍රමාණය ඇගයීමට ලක් කරයි. සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුවේ සාකච්ඡා මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඕනෑම විභව උනන්දුවක් දක්වන ගැටුම් ආමන්ත්‍රණය කිරීමට, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලට අදාළ අවදානම් තක්සේරු කිරීමට සහ ආයතනයේ මෙහෙයුම්වල අඛණ්ඩතාව සහ සාධාරණත්වය ආරක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල කණ්ඩායම් අවදානම් කමිටුවට පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඇතුළත් වේ;

| කමිටු සාමාජිකයින් - 2024/25 මූල්‍ය වර්ෂය | සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත - සභාපති | 1/1 |
| විපුල ගුණතිලක මහතා | 1/1 |
| දුමිත් ප්‍රනාන්දු මහතා | 1/1 |

### ශ්‍රී ලංකන් කේටරින් සමාගම, පරිපාලිතය

ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙහි වත්මන් අධ්‍යක්ෂක මණ්ඩලය:-

| |
|---|
| සරත් ගනේගොඩ මහතා (සභාපති) |
| ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත |
| රොහාන් ගුණතිලක මහතා |
| Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා |
| විපුල ගුණතිලක මහතා |
| ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ |
| දුමිත් ප්‍රනාන්දු මහතා |

### අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

මූල්‍ය වර්ෂය සඳහා ගෙවූ සමස්ත මුදල රුපියල් 3.2 මිලියනකි.

### අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

කාර්යාලයේ බලතල අනුව, ශ්‍රී ලංකා රජයේ (GOSL) නාමයෝජක අධ්‍යක්ෂ සරත් ගනේගොඩ මහතා/සභාපති, සමාගමෙහි සාමාන්‍ය කොටස් 3ක හිමිකාරීත්වය දරයි.

### සබඳතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය අනුව සමාගම මගින් සබඳතා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. සියලුම අධ්‍යක්ෂවරුන් තමන් වෙනත් සමාගම්වල පවත්වාගෙන යන සබඳතා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කොට ඇති අතර 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අංක 192 (1) සහ 192 (2) යන වගන්ති ප්‍රකාරව අදාළ සබඳතා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සබඳතා ලේඛනයෙහි වාර්තා කොට ඇත.

### අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් සබඳතා

මූල්‍ය ප්‍රකාශ සටහන් අංක 28 හි අනාවරණය කොට ඇති දෑට අමතරව සමාගමෙහි ව්‍යාපාරික කටයුතුවලට අදාළ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ට කිසිදු සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොතිබුණි.

### වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ හතළිස් හයවන වාර්ෂික මහා සභා රැස්වීම, 2025 සැප්තැම්බර් 12 වන සිකුරාදා දින ප.ව. 3.00ට බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව, ලිපිනයේ පිහිටි 'මිහිලක මැදුර' බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වේ.

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය, වාර්ෂික වාර්තාවේ 123 පිටුවේ දක්වා ඇත.

### විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විගණකවරුන්, විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. විගණක ගාස්තු පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 22 හි දක්වා ඇත. සමාගම හෝ එහි පරිපාලිත ආයතනය සමඟ (විගණකවරයෙකු වශයෙන් පවතින සම්බන්ධය හැරුණු විට) විගණකවරුන්ගේ කිසිදු සබඳතාවයක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී,

**සරත් ගනේගොඩ**
*සභාපති*

**විපුල ගුණතිලක**
*අධ්‍යක්ෂ*

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*සමූහයේ ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2025 ජූලි 29
කටුනායක

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

## කාර්යභාරය සහ වගකීම්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) විෂය පථය සහ වගකීම් පාලනය වේ. අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාපටිපාටි, පාලන ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාපටිපාටි, සහ නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය නිරීක්ෂණය කිරීමේ ක්‍රියාපටිපාටි පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සපයමින්, අධීක්ෂණ වගකීම් ඉටු කිරීම සඳහා සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය වීම අධ්‍යක්ෂ මාණ්ඩල විගණන කමිටුවේ කාර්යභාරය වේ.

## කමිටු සංයුතිය

2025 මාර්තු 31 වැනිදා අවසන් වූ වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ විශේෂ වෙනස්කම් සිදු විය. ජයන්ත් පෙරේරා මහතා (2024 මැයි 31 වැනිදා පාර්ශ්වකාලීන සභාපති ලෙස පත්කළ) 2024 ඔක්තෝම්බර් 9 වැනිදා ඉල්ලා අස්වන තෙක් සේවය කළ අතර, ශිරාන් දම්මගේ මහතා (විගණන කමිටුවේ හිටපු සභාපති) 2024 මැයි 31 වැනිදා සේවයෙන් ඉල්ලා අස් විය. මලික් ප්‍රනාන්දු මහතා (සාමාජික) සහ ආචාර්ය හංස විජයසූරිය මහතා (සාමාජික) 2024 ජුනි මස 25 වැනිදා ඉල්ලා අස් විය. ආනන්ද අතුකෝරල මහතා 2024 ඔක්තෝම්බර් 14 දින සිට බලපැවැත්වෙන පරිදි තනතුරෙන් ඉවත් වූ අතර, නිරංජන් අරුල්ප්‍රගාසම් මහතා 2024 ජුනි 25 වැනිදා පත් වීම් ලද අතර 2024 ඔක්තෝම්බර් 15 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ මෙම වෙනස්කම් වලින් පසුව, අඛණ්ඩතාව සහ ඵලදායී පාලනය සහතික කිරීම සඳහා නව පත්වීම් කිහිපයක් සිදු කරන ලදී. 2024 ඔක්තෝබර් 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති ලෙස විපුල ගුණතිලක මහතා පත් කරන ලද අතර, එම දිනයේම සාමාජිකයින් ලෙස රොහාන් ගුණතිලක මහතා සහ දුමිත් ප්‍රනාන්දු මහතා පත් කරන ලදී. පසුව, 2025 ජනවාරි 10 වන දින Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා සහ සෙනරත් ලියනගේ මහතා සාමාජිකයින් ලෙස පත් කරන ලදී. ඩී.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා පසුගිය මූල්‍ය වර්ෂයේ සිට විගණන කමිටුවේ සේවයේ යෙදුණු අතර වාර්තාකරණ කාලය පුරාම සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.

## රැස්වීම්

2024 මාර්තු 31 වැනිදා අවසන් වූ වසර තුළ පාලක විගණන කමිටුව රැස්වීම් හතක් (7) පවත්වන ලදී. සමූහ සහතිකකරණ සහ උපදේශන සේවා ජ්‍යෙෂ්ඨ කළමනාකරු සහ ප්‍රධාන විධායක නිලධාරී මෙම රැස්වීම්වලට සහභාගී වූ අතර, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කළමනාකාරිත්වයේ අනෙකුත් සාමාජිකයින් ඔවුන්ගේ වගකීම් ක්ෂේත්‍ර තුළ අදාළ ගැටළු පිළිබඳව කෙටි විස්තර සැපයීමට අවශ්‍ය පරිදි සහභාගී වූහ.

වාර්තාකරණ කාලය තුළ, ජාතික විගණන කාර්යාලයේ (NAO) පහත සඳහන් නියෝජිතයින්, එනම් සුරංගි ගුණතිලක මහත්මිය, එන්.ඩී.එන්.සී. කුමාරි මහත්මිය සහ ඩී.එම්.එම්.ජී.එස්.එස්.ජේ.බී. අබේකෝන් මහත්මිය ඔවුන්ගේ නිල තනතුරු නියෝජනය කරමින් රැස්වීම්වලට සහභාගී වූහ. ඊට අමතරව, නම් කරන ලද අමාත්‍යාංශ නියෝජිතයා ලෙස මුදල් අමාත්‍යාංශය (MoF) නියෝජනය කරමින් බන්දුල අබේරත්න මහතා සහභාගී වූවේය.

## සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සමූහ සහතික කිරීමේ සහ උපදේශන සේවා (GAAS) අංශය අභ්‍යන්තර විගණන සිදු කිරීම සහ අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලීන්හි ඵලදායීතාවය පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීම සඳහා වගකිම් දරයි. මෙම අංශය විසින් කාර්ය භාරය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවටත්, පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාටත් වාර්තා කරනු ලබයි. ඒ අනුව එහි සංවිධානාත්මක තත්ත්වය ශක්තිමත් කරන අතර, විගණන සැලසුම්කරණයේ සහ වාර්තාකරණයේ ස්වාධීනත්වය සහතික කරයි.

## මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

විගණන කමිටුව වෙත නිවැරදි, සම්පූර්ණ සහ විශ්වාසදායක තොරතුරු කාලෝචිත ලෙස ලබා දීම සහතික කිරීම ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ කළමනාකාරිත්වයේ මූලික වගකීමකි. මෙමගින් කමිටුවට තම අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකියාව ලැබෙන අතර, එහි අනෙකුත් රාජකාරි අතර, මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛන සම්මත කර ගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් දැනුමක් මත පදනම් වූ යෝජනා ඉදිරිපත් කිරීම ඇතුළත් වේ. සමාලෝචනයට භාජනය වන මූල්‍ය වර්ෂය තුළ, විගණන කමිටුව එහි වගකීම්වලට අනුකූලව වැදගත් ක්‍රියාකාරකම් රාශියක් සිදු කළේය.

- කළමනාකාරිත්වය විසින් සකස් කරන ලද අතුරු සහ වර්ෂ අවසාන විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- ප්‍රධාන මිනුම් දර්ශක, අයවැය විචලනයන් සහ පාදක වන ප්‍රවණතා කෙරෙහි අවධානය යොමු කරමින් සමාගමේ මාසික මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ සැලකිය යුතු විෂමතා අවබෝධ කර ගැනීමට කළමනාකරණය සමඟ සාකච්ඡා පවත්වන ලදී.
- ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණය සහ ඔවුන්ගේ අයකර ගැනීමේ හැකියාව පිළිබඳ තක්සේරු කිරීම් ඇතුළුව, හිඟ ණයගැතියන්ගේ තත්ත්වය වරින් වර සමාලෝචනය කරන ලදී. කළමනාකරණ නිර්දේශය මත පදනම්ව, කමිටුව විසින් සුදුසු පරිදි අයකර ගත නොහැකි ලැබිය යුතු මුදල් කපා හැරීමට නිර්දේශ කරන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර, කළමනාකාරිත්වය විසින් සාධාරණත්වය සඳහා ඉදිරිපත් කරන ලද තොග කපා හැරීමේ නිර්දේශය සමාලෝචනය කරන ලදී.

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව තවදුරටත්.

- ස්වාධීනත්වය, සම්පත් ප්‍රමාණවත් බව සහ එහි වාර්තාකරණ මාර්ග සහ අධිකාරියේ ඵලදායීතාවය සහතික කරලීමට අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.
- ආයතනික අරමුණු සහ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර සමඟ පෙළගැස්වීම සහතික කරලීමට සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා (GAAS) සම්බන්ධීකරණ සැලැස්ම සමාලෝචනය කර අනුමත කරන ලදී.
- අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විගණන කමිටු ප්‍රඥප්තිය සමාලෝචනය කර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- අභ්‍යන්තර විගණන වාර්තා සහ කළමනාකරණ ප්‍රතිචාර සමාලෝචනය කර අවශ්‍ය පරිදි සාකච්ඡා සඳහා කළමනාකාරිත්වය සමඟ සම්බන්ධ විය.
- විශ්වසනීයත්වය, අවශ්‍යතාව, ආයතනික අරමුණු සමඟ අනුකූලවීම සහ නියාමන රාමුවට ඇති විය හැකි බලපෑම වැනි සාධක මත පදනම්ව, අකටයුතු හෙළි කිරීමේ පැමිණිලි සමාලෝචනය කර සුදුසු අවස්ථාවලදී ඒවාට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.
- අදාළ සියලුම නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම වාර්තා වී ඇති ආකාරය තක්සේරු කිරීමට කළමනාකරණය විසින් ඉදිරිපත් කළ කාර්තුමය අනුකූලතා වාර්තා සමාලෝචනය කරන ලදී.
- සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩ පාලනය සඳහා කළමනාකාරිත්වයේ වගකීම අවධාරණය කරමින් විගණන කමිටුවට ඉදිරිපත් කරන ලද සමාගමේ නිශ්චිත ප්‍රතිපත්ති සමාලෝචනය කරන ලදී.

**විපුල ගුණතිලක**
*විගණන කමිටු සභාපති*
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2025 ජූනි 24

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, 63 පිටුවෙහි දක්වා ඇති විගණකවරුන්ගේ වාර්තාවේ සඳහන් ඔවුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ.

2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතා ප්‍රකාරව අධ්‍යක්ෂකවරුන් විසින්, මූල්‍ය වර්ෂය අවසානය සඳහා සමාගම සහ සමූහයේ ක්‍රියාකාරකම් පිළිබඳව නිවැරදි, සාධාරණ විනිශ්චයක් ලබා දෙමින්, මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ ලාභ හෝ අලාභ දක්වමින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශය සැකසිය යුතුය. මූල්‍ය ප්‍රකාශය සැකසීමේ දී උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන ඒවා අවශ්‍ය පරිදි යොදා ගෙන ඇති අතර සාධාරණ සහ විචක්ෂණශීලි විනිශ්චයන් සහ තක්සේරු සිදු කරමින් අදාළ වන්නා වූ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන පනතේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවට සහතික කරලීම සඳහා, සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වයෙහි නිවැරදි බව සමග අනාවරණය කිරීමට ප්‍රමාණවත් ගිණුම්කරණ වාර්තා සමාගම සහ සමූහය පවත්වා ගෙන යන බවට සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි. එමෙන්ම ඔවුන්, සමූහයේ වත්කම් සඳහා ආරක්ෂාව සැලසීමට අවැසි ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ සම්බන්ධව වංචා සහ අක්‍රමිකතා සිදුවීම හඳුනාගැනීමට සහ වැළැක්වීම සඳහා ගැළපෙන අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම වෙනුවෙන් නිසි සැලකිල්ලක් දැක්වීමට වගකියනු ලැබේ.

බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සහනශීලී ලිපි සපයමින් රජයේ සහතිකවීම මාර්ගයෙන් ශ්‍රී ලංකා රජය (GoSL) විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය සහ ශ්‍රී ලංකා රජය විසින් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් ප්‍රයත්නයන් සහ සමාගමේ මෙහෙයුම් සහ මූල්‍ය තත්ත්වයන් නගා සිටුවීම පිළිබඳ සැලකීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරුන් විසින් 'අඛණ්ඩ පැවැත්ම' යන සංකල්පය මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී තවදුරටත් පවත්වා ගෙන යන ලදී. එමෙන්ම, මූල්‍ය ප්‍රකාශනවල සටහන 2.1.1 යටතේ විස්තර කර ඇති පරිදි යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2025 ජූනි 23 වන දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත (2025 ජූනි 30 දින භාණ්ඩාගාරික ලේකම් විසින් ලිපිය නිකුත් කර ඇත).

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ මතය ගොඩනැගීම සඳහා සුදුසු යැයි සලකනු ලබන කවර හෝ පරීක්ෂාවක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා ඇති බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාග මට සහ එහි පරිපාලිත සමාගමට අදාළ සියලු බදු, අයකිරීම් සහ මූල්‍ය බැඳීම් ගෙවා හෝ ඊට අදාළ ප්‍රමාණවත් ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය දැනුම අනුව තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*සමූහයේ ආයතනික ලේකම් සේවා ප්‍රධානී/*
*සමාගම් ලේකම්*

2025 ජූලි 29

# ස්වාධීන විගණකගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } AAV/B/SLAL/FA/2025/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 12 August 2025

**සභාපති**
**ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම**

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තියට ප්‍රකාරව සීමාසහිත ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශයේ විගණනය සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ (සමූහය) මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණක පනතෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට මවිසින් ඉදිරිපත් කළයුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරී වරුන්ගේ ආයතනයක් මට සහය විය.

මාගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සමාගමේ සහ සමූහයේ මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන 2025 මාර්තු 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ ඉන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිඹිබු කරයි.

### 1.2 මතය සඳහා පදනම

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරයාගේ වගකීම් තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගෙන ඇති විගණන සාක්ෂි මාගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

### 1.3 කාරණා අවධාරණය කිරීම

**(අ) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව**

2025 මාර්තු 31 දිනින් අවසන් වූ වර්ෂය තුළ සමූහය රුපියල් මිලියන 2,735.28ක ශුද්ධ අලාභයක් (2024 - රුපියල් මිලියන 7,925.01ක ලාභයක්) සහ රුපියල් මිලියන 596,461.28ක සමුච්චිත අලාභයක් (2024 - රුපියල් මිලියන 592,626.52) ඇති බව හෙළි කරන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 2.1.1 වෙත අවධානය යොමු කරමි. එම දිනය වන විට, සමූහයේ ජංගම වගකීම් එහි ජංගම වත්කම්වලට වඩා රුපියල් මිලියන 346,479.55 කින් (2024 - රුපියල් මිලියන 327,144.66) ඉක්මවා ඇති අතර, සමූහයේ මුළු කොටස් හිමිකම් සෘණ රුපියල් මිලියන 379,519.61 ක (2024 - රුපියල් මිලියන 381,723.67 ක සෘණ අගයකි). තවද, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී සමාගම රුපියල් මිලියන 7,594.56 ක ශුද්ධ අලාභයක් (2024- රුපියල් මිලියන 3,870.86ක ලාභයක්) හා රුපියල් මිලියන 616,306.06ක සමුච්චිත අලාභයක් (2024 - රුපියල් මිලියන 607,613.60) ලබා ඇති බවට සටහන් කරයි. එදිනට සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම්වලට වඩා රුපියල් මිලියන 368,296.84 කින් (2024 - රුපියල් මිලියන 344,130.60) ඉක්මවා ඇති අතර, සමූහයේ මුළු කොටස් හිමිකම් ප්‍රතිඵලය රුපියල් මිලියන 403,172.55 ක (2024 - රුපියල් මිලියන 400,534.71 සෘණ අගයකි) සෘණ අගයකි.

සටහන 2.1.1 හි දක්වා ඇති අනෙකුත් කාරණා සමඟ එවැනි අවස්ථාවක් හෝ කොන්දේසියක පැවැත්ම දක්වනුයේ, සමූහයට/සමාගමට අඛණ්ඩ පැවැත්මක් පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි අවිනිශ්චිතතාවයක් පවතින බවයි.

**(ආ) ගුවන් යානා පූර්ව ලබාගැනීමේ ගෙවීම්**

2025 මාර්තු 31 වන දිනට රුපියල් මිලියන 5,692ක් (ඇ.ඩො. මිලියන 19.21ක්) වූ ගුවන්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

යානා පූර්ව ගෙවීම්වලට අදාළව, සමාගම විසින් එම මුදල හා හානියන් අයකර ගැනීම සඳහා සැපයුම්කරු සමඟ ගිවිසුමේ දැක්වූ ආරවුල් විසඳීමේ ක්‍රමවේදය හරහා හිමිකම් ඉදිරිපත් කර ඇති බැවින්, මූල්‍ය ප්‍රකාශයේ සටහන 5 වෙත මාගේ අවධානය යොමු කරන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය වෙනස් කර නැත.

### 1.4 සමූහයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

වෙනත් තොරතුරු සඳහා වගකීම කළමනාකාරීත්වයට අයත් වේ. මෙම වෙනත් තොරතුරු සමූහයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වන අතර, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශ සහ මෙම විගණක වාර්තාවේ දිනට පෙර ලබාගත් මාගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් මාගේ මතය මෙම වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර, ඒ පිළිබඳව මවිසින් කිසිදු ආකාරයක තහවුරු කිරීමක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සමඟ සම්බන්ධව, මාගේ වගකීම වන්නේ මෙම වෙනත් තොරතුරු කියවා බැලීම හා එම තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමඟ ප්‍රමාණාත්මකව නොගැළපීමක් හෝ විගණනයේදී මවිසින් ලබා ගත් දැනුමට අනුව ප්‍රමාණාත්මකව වැරදි දත්තක් ලෙස පෙනී යනවද යන්න සොයා බැලීමයි.

මවිසින් කළ කටයුතු අනුව, මෙම වෙනත් තොරතුරු පිළිබඳව ප්‍රමාණාත්මක වැරදි දත්තක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, ඒ පිළිබඳව වාර්තා කිරීම මාගේ වගකීමයි. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට කිසිවක් නැත.

### 1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය සඳහා වගකීමක් පැවරුණු අයගේ වගකීම්

කළමනාකාරීත්වයේ වගකීම් වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්වීමක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහායි. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමක් වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, සමූහයට අඛණ්ඩ පැවැත්මක් පවත්වා ගැනීමේ හැකියාව ඇගයීම, අදාළ විටදී අඛණ්ඩ පැවැත්මට සම්බන්ධ කරුණු අනාවරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම කළමනාකාරීත්වයේ වගකීමක් වේ. කළමනාකාරීත්වය විසින් සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, සමාගමේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකීම පාලනය සඳහා වගකීමක් පැවරුණු අයගේ වගකීමකි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා, සමාගම සහ සමූහය විසින් සිය ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.6 මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්

මාගේ අරමුණ වන්නේ, මූල්‍ය ප්‍රකාශ තුළ ඇති ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් හෝ වංචා සහ වැරදි නිසා ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ එහි ඇති මාගේ මතය ඇතුළත් විගණක වාර්තාව නිකුත් කිරීමයි. සාධාරණ සහතිකය උසස් මට්ටමක් වන නමුත්, එය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව සිදුකළ විගණනයක් සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනාගන්නා බවට සහතිකයක් නොවේ. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණයන්ට සාධාරණ ලෙස බලපාන පරිදි පවතින විට, එම ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සැලකේ.

# ස්වාධීන විගණකගේ වාර්තාව තවදුරටත්.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවය ක්‍රියාත්මක කරමින් මවිසින් විගණනය සිදුකරන ලදී. තවද මවිසින්:

- වංචාව හෝ වැරැද්ද නිසා ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් හඳුනාගෙන, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කරමින්, මාගේ මතයට සුදුසු, ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාව නිසා ඇතිවන සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීමේ අවදානම, වැරැද්ද නිසා ඇතිවන එකක් නොහඳුනා ගැනීමේ අවදානමට වඩා වැඩි ය, මන්ද වංචාවට දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන, හිතාමතා ඌනතා ඇති කිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැක.
- විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමින්, අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සිදුකරමි. නමුත් එය සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගේ ඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා නොවේ.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරීත්වය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඒවාට අදාළ අනාවරණයන්ගේ සාධාරණත්වය ඇගයීම සිදුකරමි.
- කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් පවත්වා ගැනීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශවල අදාළ අනාවරණයන් පිළිබඳ මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණයන් ප්‍රමාණවත් නොවේ නම්, මාගේ මතය වෙනස් කිරීම සිදුකළ යුතුය. මාගේ නිගමන මාගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත පදනම්වී ඇත. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හේතු විය හැක.
- අනාවරණයන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශ මඟින් පවතින ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. කණ්ඩායම් විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා අපි පූර්ණ වගකීමක් භාරගනිමු. මවිසින් පිරිනමන මතය සඳහා මම පමණක් වගකියමි.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව, අනෙකුත් කරුණු අතර සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමග මම සන්නිවේදනය කරමි.

## 2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ, පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධව නිශ්චිත විධිවිධාන ඇතුළත් කර ඇත.

*2.1.1* මා හට විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගැනීමට හැකි වූ අතර, මාගේ පරීක්ෂාව අනුව, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියට අනුකූලව සමාගම විසින් නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත.

*2.1.2* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියට අනුව, ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ පෙර වසරට අනුකූල වේ.

*2.1.3* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියට අනුව, ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ වල පෙර වසරේ මවිසින් කර ඇති සියලුම නිර්දේශ ඇතුළත් වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි සහ සාක්ෂි මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණු වලට සීමා වූ කිසිවක් මාගේ අවධානයට ලක්ව නැත;

*2.2.1* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියට අනුව, සමාගමේ පාලන මණ්ඩලයේ කිසිවකු, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු පිටතින් සමාගම විසින් ඇති කරනු ලබන ඕනෑම කොන්ත්‍රාත්තුවක සෘජු හෝ වක්‍ර උනන්දුවක් නොමැති බව ප්‍රකාශ කිරීම.

*2.2.2* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියට අනුව, සමාගම අදාළ ලිඛිත නීති, සාමාන්‍ය සහ විශේෂ උපදේශනවලට අනුකූල නොවී ඇති බව ප්‍රකාශ කිරීම.

*2.2.3* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියට අනුව, සමාගම එහි බලතල, කාර්යයන් සහ රාජකාරිවලට අනුව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

*2.2.4* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියට අනුව, සමාගමේ සම්පත් සම්පූර්ණයෙන්ම නිසි පරිදි සපයා, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාවිතා නොකළ බව ප්‍රකාශ කිරීම.

**ජී.එච්.ඩී. ධර්මපාල**
*වැඩබලන විගණකාධිපති*

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| 2025 මාර්තු 31 දිනට | සටහන | සමූහය 2025 රු. මිලියන | සමූහය 2024 රු. මිලියන | සමාගම 2025 රු. මිලියන | සමාගම 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3. | 12,190.98 | 11,582.46 | 8,224.16 | 7,470.61 |
| භාවිත හිමිකම් වත්කම් | 4. | 64,791.84 | 74,848.14 | 64,654.20 | 74,648.10 |
| ගුවන් යානා පූර්ව බෙදාහැරීමේ ගාස්තු | 5. | 5,692.34 | 5,774.00 | 5,692.34 | 5,774.00 |
| ගුවන් යානා නඩත්තු සඳහා සංචිත | 6. | 46,565.36 | 37,389.27 | 46,565.36 | 37,389.27 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් සඳහා තැන්පතු | 7. | 6,714.72 | 6,129.29 | 6,714.72 | 6,129.29 |
| අස්පෘශ්‍ය වත්කම් | 8. | 61.52 | 51.94 | 56.55 | 44.82 |
| ආයෝජන | 9.1 | 0.40 | 0.40 | 42.44 | 42.44 |
| | | 136,017.16 | 135,775.50 | 131,949.77 | 131,498.53 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 10. | 7,439.72 | 7,493.15 | 6,824.85 | 6,983.64 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 11. | 24,660.24 | 27,022.97 | 22,870.91 | 25,586.27 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 6. | 11,928.75 | 17,168.29 | 11,928.75 | 17,168.29 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | 7. | 1,620.41 | 2,838.31 | 1,620.41 | 2,838.31 |
| ආයෝජන | 9.2 | 2,390.13 | 2,508.42 | 1,641.66 | 1,715.99 |
| මුදල් සහ බැංකු ශේෂයන් | 12. | 5,200.39 | 8,842.07 | 5,134.74 | 8,466.98 |
| | | 53,239.64 | 65,873.21 | 50,021.32 | 62,759.48 |
| **මුළු වත්කම්** | | 189,256.80 | 201,648.71 | 181,971.09 | 194,258.01 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13. | 208,649.23 | 202,360.67 | 208,649.23 | 202,360.67 |
| සංචිත | 14. | 8,292.44 | 8,542.18 | 4,484.28 | 4,718.22 |
| සමුච්චිත අලාභ | | (596,461.28) | (592,626.52) | (616,306.06) | (607,613.60) |
| | | (379,519.61) | (381,723.67) | (403,172.55) | (400,534.71) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පොලී සහිත වගකීම් | 15. | 102,694.00 | 133,108.77 | 102,291.24 | 132,532.88 |
| වෙනත් වගකීම් | 16. | 66,363.22 | 57,245.74 | 64,534.24 | 55,369.76 |
| | | 169,057.22 | 190,354.51 | 166,825.48 | 187,902.64 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 17. | 40,623.56 | 44,977.47 | 40,623.56 | 44,977.47 |
| වෙනත් වගකීම් | 16. | 22,400.84 | 21,658.63 | 22,400.84 | 21,658.63 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 18. | 108,459.00 | 95,113.21 | 127,254.34 | 109,174.99 |
| පොලී දරන වගකීම් | 15. | 228,235.79 | 231,268.56 | 228,039.42 | 231,078.99 |
| | | 399,719.19 | 393,017.87 | 418,318.16 | 406,890.08 |
| **මුළු වගකීම්** | | 568,776.41 | 583,372.38 | 585,143.64 | 594,792.72 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 189,256.80 | 201,648.71 | 181,971.09 | 194,258.01 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

**යසන්ත දිසානායක**
*සමූහයේ මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද්දේ,

**විපුල ගුණතිලක**
*අධ්‍යක්ෂ*

**සරත් ගනේගොඩ**
*අධ්‍යක්ෂ*

පිටු අංක 71 සිට 114 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

2025 ජූලි 29
කොළඹ

# ලාභ හෝ අලාභ ප්‍රකාශය

| 2025 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| **ආදායම** | 20. | 303,093.89 | 339,591.65 | 296,506.00 | 333,614.09 |
| **වියදම** | | | | | |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | | (91,687.41) | (115,119.33) | (91,687.41) | (115,119.33) |
| සේවක පිරිවැය | | (32,798.56) | (32,261.33) | (30,159.20) | (29,845.14) |
| ගුවන්තොටුපළ, ගමන් සහ මඟී වියදම් | | (38,600.92) | (39,186.89) | (45,437.50) | (46,713.52) |
| ගුවන් යානා නඩත්තු සහ අලුත්වැඩියා පිරිවැය, | | (43,783.25) | (40,358.53) | (43,783.25) | (40,358.53) |
| ක්ෂයවීම් / ක්‍රමක්ෂය | | (15,974.55) | (14,138.07) | (15,679.72) | (13,869.28) |
| කෙටිකාලීන බදු ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා බදු කුලිය, | | (3,555.58) | (10,722.70) | (3,555.58) | (10,722.70) |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | | (20,286.30) | (22,082.36) | (20,280.47) | (22,077.80) |
| ගුවන් කාර්ය මණ්ඩල වියදම් | | (9,468.56) | (9,701.41) | (9,468.56) | (9,701.41) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (17,948.77) | (17,786.36) | (13,414.85) | (12,759.04) |
| | | 28,989.99 | 38,234.67 | 23,039.46 | 32,447.34 |
| වෙනත් ආදායම් සහ ප්‍රතිලාභ | 21. | 1,661.32 | 1,485.64 | 1,661.32 | 1,485.64 |
| **විනිමය ලාභය/(අලාභය) ට සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 30,651.31 | 39,720.31 | 24,700.78 | 33,932.98 |
| පොලී දරන වගකීම් හැර විනිමය ලාභය/(අලාභය) | | 1,261.61 | 1,943.17 | 1,524.08 | 3,260.78 |
| Neo එන්ජින් සඳහා සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැය | 18. | (2,228.41) | (11,572.39) | (2,228.41) | (11,572.39) |
| **විනිමය ලාභය/(අලාභය) ට සහ සැලසුම් නොකළ අලුත්වැඩියා පිරිවැයට පසු මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 29,684.51 | 30,091.09 | 23,996.45 | 25,621.37 |
| ගිවිසුම් කඩ කිරීම මත දඩ ගාස්තුව | 18. | - | (11,837.12) | - | (11,837.12) |
| **බදු සහ මූල්‍ය පිරිවැයට පෙර ලාභය** | | 29,684.51 | 18,253.97 | 23,996.45 | 13,784.25 |
| **ශුද්ධ මූල්‍ය පිරිවැය** | | | | | |
| මූල්‍ය ආදායම | 23.1 | 804.79 | 823.06 | 742.40 | 710.90 |
| මූල්‍ය පිරිවැය | 23.2 | (36,303.24) | (37,387.22) | (36,236.73) | (37,311.84) |
| පොලී දරන වගකීම් මත විනිමය ලාභය/(අලාභය) | 23.3 | 3,924.53 | 26,716.81 | 3,903.32 | 26,687.55 |
| | | (31,573.92) | (9,847.35) | (31,591.01) | (9,913.39) |
| **බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය)** | | (1,889.41) | 8,406.62 | (7,594.56) | 3,870.86 |
| ආදායම් බදු වියදම් | 24. | (845.87) | (481.61) | - | - |
| **වසර සඳහා ලාභය/(අලාභය)** | | (2,735.28) | 7,925.01 | (7,594.56) | 3,870.86 |

පිටු අංක 71 සිට 114 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| 2025 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | සමූහය 2025 රු. මිලියන | සමූහය 2024 රු. මිලියන | සමාගම 2025 රු. මිලියන | සමාගම 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|
| වසර සඳහා ලාභය/(අලාභය) | | (2,735.28) | 7,925.01 | (7,594.56) | 3,870.86 |
| වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය) | | | | | |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම/ (අලාභ):** | | | | | |
| **පාරිතෝෂිකය මත ආයුගණන ලැබීම්/(අලාභය)** | 16.3 | (1,366.80) | (729.62) | (1,338.25) | (773.72) |
| පාරිතෝෂකය සඳහා වන ආයුගණන ලැබීම්/(අලාභය) මත විලම්බිත බදු බලපෑම | 24.2 | 8.57 | (13.23) | - | - |
| උපයාගත් නිවාඩු ගෙවීම් මත ආයුගණන ලැබීම්/(අලාභය) | 16.3 | 0.46 | (460.39) | 6.41 | (456.97) |
| උපයාගත් නිවාඩු ගෙවීම් සඳහා වන ආයුගණන ලැබීම් / (අලාභය) මත විලම්බිත බදු බලපෑම | 24.2 | 1.79 | 1.03 | - | - |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය | 3. | - | (23.54) | - | - |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම මත විලම්බිත බදු බලපෑම | 24.2 | 6.77 | 7.06 | - | - |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය), ශුද්ධ බදු** | | (1,349.21) | (1,218.69) | (1,331.84) | (1,230.69) |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම/(අලාභය), ශුද්ධ බදු** | | (4,084.49) | 6,706.32 | (8,926.40) | 2,640.17 |

පිටු අංක 71 සිට 114 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| 2025 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා සමූහය | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන | ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන | ප්‍රාග්ධන සංචිතය රු. මිලියන | සමුච්චිත අලාභ රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2023 අප්‍රේල් 01 දිනට ශේෂය (ප්‍රතිෂ්ඨාපනය කරන ලද)** | 96,360.67 | 7,823.56 | 991.74 | (599,605.96) | (494,429.99) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | 3,500.00 | - | - | - | 3,500.00 |
| කොටස් නිකුතුව (සටහන 13) | 102,500.00 | - | - | - | 102,500.00 |
| වත්කම් උපයෝජනය මත පදනම්ව ප්‍රත්‍යාගණන සංචිතය මාරු කිරීම | - | (256.64) | - | 256.64 | - |
| මාරු කිරීම, වසර සඳහා ලාභය | - | - | - | 7,925.01 | 7,925.01 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | (16.48) | - | (1,202.21) | (1,218.69) |
| සම්පූර්ණ විස්තීර්ණ ආදායම/(අලාභය) | - | (16.48) | - | 6,722.80 | 6,706.32 |
| **2024 මාර්තු 31 දිනට ශේෂය** | 202,360.67 | 7,550.44 | 991.74 | (592,626.52) | (381,723.67) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | 1,288.56 | - | - | - | 1,288.56 |
| කොටස් නිකුතුව (සටහන 13) | 5,000.00 | - | - | - | 5,000.00 |
| වත්කම් උපයෝජනය මත පදනම්ව ප්‍රත්‍යාගණන සංචිතය මාරු කිරීම | - | (256.51) | - | 256.51 | - |
| වසර සඳහා ලාභය | - | - | - | (2,735.28) | (2,735.28) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | 6.77 | - | (1,355.99) | (1,349.22) |
| සම්පූර්ණ විස්තීර්ණ ආදායම/(අලාභය) | - | 6.77 | - | (4,091.27) | (4,084.50) |
| **2025 මාර්තු 31 දිනට ශේෂය** | 208,649.23 | 7,300.70 | 991.74 | (596,461.28) | (379,519.61) |

| 2025 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගම | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන | ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන | ප්‍රාග්ධන සංචිතය රු. මිලියන | සමුච්චිත අලාභ රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2023 අප්‍රේල් 01 දිනට ශේෂය (ප්‍රතිෂ්ඨාපනය කරන ලද)** | 96,360.67 | 3,960.47 | 991.74 | (610,487.76) | (509,174.88) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | 3,500.00 | - | - | - | 3,500.00 |
| කොටස් නිකුතුව (සටහන 13) | 102,500.00 | - | - | - | 102,500.00 |
| වත්කම් උපයෝජනය මත පදනම්ව ප්‍රත්‍යාගණන සංචිතය මාරු කිරීම | - | (233.99) | - | 233.99 | - |
| වසර සඳහා ලාභය | - | - | - | 3,870.86 | 3,870.86 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | (1,230.69) | (1,230.69) |
| සම්පූර්ණ විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | - | 2,640.17 | 2,640.17 |
| **2024 මාර්තු 31 දිනට ශේෂය** | 202,360.67 | 3,726.48 | 991.74 | (607,613.60) | (400,534.71) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | 1,288.56 | - | - | - | 1,288.56 |
| කොටස් නිකුතුව (සටහන 13) | 5,000.00 | - | - | - | 5,000.00 |
| වත්කම් උපයෝජනය මත පදනම්ව ප්‍රත්‍යාගණන සංචිතය මාරු කිරීම | - | (233.94) | - | 233.94 | - |
| වසර සඳහා ලාභය | - | - | - | (7,594.56) | (7,594.56) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | (1,331.84) | (1,331.84) |
| සම්පූර්ණ විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | - | (8,926.40) | (8,926.40) |
| **2025 මාර්තු 31 දිනට ශේෂය** | 208,649.23 | 3,492.54 | 991.74 | (616,306.06) | (403,172.55) |

පිටු අංක 71 සිට 114 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2025 මාර්තු 31 දිනට | සටහන | සමූහය 2025 රු. මිලියන | සමූහය 2024 රු. මිලියන | සමාගම 2025 රු. මිලියන | සමාගම 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කළ) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදමට පෙර ලාභය/(අලාභය) | | (1,889.41) | 8,406.62 | (7,594.56) | 3,870.86 |
| ගැළපුම්: | | | | | |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය/හානිකරණය | | 15,974.55 | 14,138.07 | 15,679.72 | 13,869.27 |
| මූල්‍ය පිරිවැය | 23.2 | 36,303.24 | 37,387.22 | 36,236.73 | 37,311.84 |
| දේපළ, පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම බැහැර කිරීමෙන් ලද අලාභය/(ලැබීම්) | | 3.55 | 0.71 | 3.05 | 0.15 |
| මූල්‍ය ආදායම | 23.1 | (804.79) | (823.06) | (742.40) | (710.90) |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 11.3 | (161.83) | (187.97) | (164.42) | (134.44) |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදනය | 10.1 | 326.40 | 171.54 | 327.10 | 174.81 |
| නඩත්තු සංචිතය හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 6.2 | 6,159.76 | 11,878.14 | 6,159.76 | 11,878.14 |
| බදු සහන | 15.4 | - | (44.97) | - | (44.97) |
| උපලබ්ධි නොවන ලද විනිමය (ලාභයෙහි)/අලාභයෙහි බලපෑම | | (4,248.84) | (27,797.68) | (4,227.68) | (27,768.41) |
| අත්තිකාරම්වල විකුණුම් ආපසු ලිවීම | | (4,122.23) | (1,474.09) | (4,122.23) | (1,474.09) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදනය | 16.3 | 1,513.20 | 1,595.32 | 1,382.08 | 1,427.02 |
| **කාර්ය ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 49,053.60 | 43,249.85 | 42,937.15 | 38,399.28 |
| තොගවල පහළයාම/(ඉහළයාම) | | (272.97) | (1,691.72) | (168.31) | (1,765.93) |
| පූර්ව ප්‍රවාහන විකුණුම්වල (පහළයාම)/ඉහළයාම | | (231.68) | (6,939.36) | (231.68) | (6,939.36) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ හි (ඉහළයාම)/පහළයාම | | 2,310.97 | 6,851.88 | 2,879.78 | 2,869.85 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හි ඉහළයාම/(පහළයාම) | | 23,644.36 | (46,039.16) | 28,459.31 | (37,936.69) |
| නඩත්තු සංචිතවල (ඉහළයාම)/පහළයාම | | (11,128.50) | (12,886.65) | (11,128.50) | (12,886.65) |
| ගුවන්යානා සුරැකුම් තැන්පතුවල පහළයාම/(ඉහළයාම) | | 834.30 | (1,156.80) | 834.30 | (1,156.80) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) උත්පාදිත මුදල්** | | 64,210.08 | (18,611.96) | 63,582.05 | (19,416.30) |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | | (24,816.34) | (53,051.62) | (24,816.34) | (53,051.62) |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ | 16.3 | (1,213.32) | (1,517.53) | (1,053.94) | (1,434.64) |
| ගෙවන ලද ආදායම් බදු | | (653.60) | (895.83) | - | (33.83) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 37,526.82 | (74,076.94) | 37,711.78 | (73,936.39) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලද පොලිය | | 411.39 | 378.78 | 306.46 | 299.71 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | | (2,054.85) | (1,422.01) | (1,969.55) | (1,355.53) |
| (ආයෝජන)/කෙටි කාලීන ආයෝජන තැන්පතු උපලබ්ධි වීම | | 70.89 | (200.76) | 69.47 | 131.44 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | | (30.43) | (5.48) | (29.79) | (5.48) |
| දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද මුදල් | | 3.24 | 7.59 | 3.05 | 0.15 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලදී භාවිත කරන ලද ශුද්ධ මුදල** | | (1,599.76) | (1,241.88) | (1,620.36) | (929.71) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| රජය විසින් ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන | | 6,288.56 | 106,000.00 | 6,288.56 | 106,000.00 |
| පොලී දරන වගකීම් ආපසු ගෙවීම | | (5,852.95) | (1,985.64) | (5,852.95) | (1,985.64) |
| කල්බදු වගකීම් ආපසු ගෙවීම | 15.4 | (39,359.27) | (34,690.31) | (39,172.44) | (34,511.69) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) ශුද්ධ මුදල** | | (38,923.66) | 69,324.05 | (38,736.83) | 69,502.67 |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ ඉහළ යෑම/(පහළ යෑම)** | | (2,996.60) | (5,994.77) | (2,645.41) | (5,363.43) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 12. | (14,647.84) | (8,653.07) | (15,022.93) | (9,659.50) |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 12. | (17,644.44) | (14,647.84) | (17,668.34) | (15,022.93) |

පිටු අංක 71 සිට 114 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සාංගමික තොරතුරු

### 1.1. සාමාන්‍ය තොරතුරු

**සමාගම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ("සමාගම") ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යනු සමූහයේ සමස්ත පරිපාලක සමාගම වේ.

**පරිපාලිතය - සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**
ශ්‍රීලංකන් කේටරින් සමාගම ("පරිපාලිතය") යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි පූර්ණ පරිපාලිත වන අතර, එය ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ නේවාසික සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

**සමාගම**
සමාගමේ මූලික කාර්යභාරය වනුයේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහකයා වශයෙන් මගීන් ප්‍රවාහනය කිරීම සඳහා නිශ්චිත සහ නිශ්චිත නොවන කාලසටහනකට අනුව ගුවන් සේවා පවත්වාගෙන යාම සහ, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය කිරීම වේ. එහි අනෙකුත් ප්‍රධාන කටයුතු ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (BIA) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (MRIA) ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීම, අභ්‍යන්තර සහ බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීම දැක්විය හැකිය. සමාගමේ උපකාරී සේවා කටයුතු වනුයේ තෙවන පාර්ශවයට ගුවන් යානා නඩත්තු සේවා සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සහ ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීම යනාදිය වේ.

**පරිපාලිතය - සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**
සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි ("පරිපාලිත") මූලික කාර්යභාරය වනුයේ, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළ හරහා ක්‍රියාත්මක වනු ලබන ගුවන් සේවා සඳහා ආහාරපාන සේවා සැපයීමයි. අනෙකුත් අතිරේක කටයුතු සඳහා මහජන සහ අතරමැදි මගී සංක්‍රමණ අවන්හල් පවත්වාගෙන යාම, ලොන්ඩරි සේවා ලබාදීම සහ අතරමැදි මගී සංක්‍රමණ හෝටලය කළමනාකරණය ඇතුළත් වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 ජූලි මස 29 දින අනුමැතිය ලබාදෙන ලදී.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ අගය මත ගණනය කර ඇති ඉඩම්, ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ ඇතුළු සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇති අතර, එසේ නොමැති නම් අවස්ථා සඳහන් කොට ඇත.

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කොට ඇති අතර එසේ නොමැති අවස්ථා සඳහන් කර ඇත.

#### *2.1.1 අඛණ්ඩ පැවැත්ම*

සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළ, 2025 මාර්තු 31 දිනට සමූහය විසින් රුපියල් මිලියන 2,735.28ක අලාභයක් (2024 - රු.මිලියන 7,925.01ක ලාභයක්) සහ රුපියල් මිලියන 596,461.28ක (2024 - රු.මිලියන 592,626.52) සමුච්චිත අලාභයක් වාර්තා කරන ලදී. එමෙන්ම සමූහයේ ජංගම වගකීම් රු. මිලියන 346,479.55 (2024 - රු. මිලියන 327,144.66) කින් එහි ජංගම වත්කම් ඉක්මවූ අතර, වාර්තා කරන දිනයට අනුව සමූහයේ මුළු හිමිකම් රු. මිලියන 379,519.61 (2024 - රුපියල් මිලියන 381,723.67ක සෘණ අගයක්) සෘණ අගයක් වී ඇත.

2025 මාර්තු 31 දිනට සමාගම විසින් රු. මිලියන 7,594.56ක අලාභයක් (2024 - රු. මිලියන 3,870.86 ලාභයක්) සහ රු. මිලියන 616,306.06ක සමුච්චිත අලාභයක් (2024 - රු. මිලියන 607,613.60) වාර්තා කරන ලදී. එමෙන්ම සමාගමේ ජංගම වගකීම් රු. මිලියන 368,296.84කින් (2024 - රු. මිලියන 344,130.60) එහි ජංගම වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කරනු ලබන දිනට සමාගමේ මුළු හිමිකම් රු. මිලියන 403,172.55 (2024 - රු. මිලියන 400,534.71 ක සෘණ අගයක්) සෘණ අගයක් විය.

ශ්‍රී ලංකා රජය (GoSL) දැනට පෞද්ගලීකරණ විකල්පය අනුගමනය නොකිරීමට සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉදිරි සැලසුම්වලට සහයවීමට තීරණය කර ඇති අතර, එහි මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ජාතික ආර්ථිකය තුළ එහි තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා ගුවන් සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි අවධානය යොමු කොට ඇත. සමාගම විසින් ගුවන් යානා සමූහය පුළුල් කිරීම, වෙළඳ පොළ නායකත්වය ප්‍රතිසාධනය සහ ආදායම් වැඩි දියුණු කිරීම සඳහා නිශ්චිත අරමුණු සහිත පස් අවුරුදු ව්‍යාපාර සැලැස්මක් සකස් කර ඇත. ධාරිතා සීමාව සඳහා පිළියමක් ලෙස ඉදිරි වසර පහ තුළ ක්‍රමයෙන් තම ගුවන් යානා සමූහය වැඩි කිරීමට ගුවන් සමාගම සැලසුම් කර ඇති අතර, 2025/26 සඳහා තවත් පුළුල් බඳ සහිත ගුවන් යානා තුනක් යොදා ගැනීමට සැලසුම් කර ඇත. කොළඹ හරහා ශක්තිමත් වෙළඳ පොළ සම්බන්ධ කරලීමට සහ සෘජු සේවා වැඩි ගමන්වාර ප්‍රමාණයක් ලබා දීමෙන් මෙහෙයුම් පුළුල් කිරීමට ගුවන් සමාගම අදහස් කරනු ලබයි. එමෙන්ම, පිරිවැය අඩු කිරීමේ පියවර සහ වැඩිදියුණු කළ ඵලදායිතාවය සමඟ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි ගුවන් සමාගම අවධානය යොමු කර ඇති අතර එමගින් හිතකර මෙහෙයුම් ප්‍රතිඵල ලැබෙනු ඇත. තවද ගුවන් සේවය එහි උපායමාර්ගික ව්‍යාපාර ඒකක (SBU) හි වර්ධන අවස්ථා පිළිබඳ අවධානය යොමු කොට ඇත.

රජය රාජ්‍ය බැංකු ද්විත්වයක ණය ආපසු ගෙවීමට සෘජුවම සහය දක්වන අතර, එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ජාතික අයවැයට ඇතුළත් කර ඇත. මේ අනුව, ඉදිරි වසර පහ තුළ ණය ප්‍රාග්ධනය සහ පොලී ආපසු ගෙවීම් සඳහා ශ්‍රී ලංකා රජය එම බැංකු සමඟ ගිවිසුම්වලට එළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, ඇමරිකානු ඩොලර් මිලියන 175ක ස්වෛරී සහතික කළ ජාත්‍යන්තර බැඳුම්කරය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූල්‍ය උපදේශකවරයා, ශ්‍රී ලංකා රජය සමඟ එම බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේදී බැඳුම්කර හිමියන් සමඟ සාකච්ඡා කළ යුතු යෝජනා දැනට ඇගයීමට ලක් කරමින් සිටී.

යෝජිත රාජ්‍ය බැංකු ණය රුපියල් මිලියන 91,315.23ක් සහ ජාත්‍යන්තර බැඳුම්කර රුපියල් මිලියන 62,677.04ක් ප්‍රතිව්‍යුහගත කිරීම මගින් සමූහයේ ශුද්ධ වත්මන් වගකීම් තත්ත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වනු ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

2025 ජූනි මස 23 දිනැති කැබිනට් අනුමැතිය සහ 2025 ජූනි මස 30 දිනැති භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලිපිය මගින්, රජය විසින් සමාගමට එහි මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය සහය අඛණ්ඩව ලබා දෙන බව තහවුරු කර ඇත. එහි අඛණ්ඩ සහයෝගය තහවුරු කරමින්, සමාගමෙහි ද්‍රවශීලතා තත්ත්වයට සහය වීම සඳහා රජය විසින් සමාලෝචිත වසර තුළදී 2024 අප්‍රේල් මාසයේදී රුපියල් බිලියන 1.5 ක්, 2024 සැප්තැම්බර් මාසයේදී රුපියල් බිලියන 2.4ක් සහ 2025 ජනවාරි මාසයේදී රුපියල් බිලියන 2.4ක්. ලෙස කොටස් තුනකින් රුපියල් බිලියන 6.3ක මුළු කොටස් ප්‍රමාණයක් යොදවා ඇත. තවද, සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විකල්ප අරමුදල් විධිවිධාන ක්‍රම ඇගයීමට ලක් කරයි.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය අඛණ්ඩව සහය වීම හේතුවෙන් අනාගතයේදී සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් වනු ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම සාධක සැලකිල්ලට ගනිමින්, මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සුදුසු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

### 2.1.2 අනුකූලතා ප්‍රකාශය
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS/SLFRS) අනුකූලව සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම, 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සිදු කරනු ලබයි.

### 2.1.3 සංසන්දනාත්මක තොරතුරු
නිසි ඉදිරිපත් කිරීම සඳහා වර්තමාන වසර සමඟ සංසන්දනයට අදාළ වූ විටක, පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

### 2.1.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල
සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන විනිමය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබයි. සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් මිලියන වලින් ඉදිරිපත්කොට ඇති අතර, එසේ නොවන අවස්ථා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් - LKAS 01 හි 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' මගින් අවසරදී ඇති ආකාරයට සඳහන් කොට ඇත.

## 2.2 ඒකාබද්ධකරණයෙහි පදනම
මූල්‍ය ප්‍රකාශ, 2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසරට සමාගමේ සහ එහි අනුබද්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලින් සමූහයේ සැකසී ඇත. ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් සමාගමේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශ එම වාර්තාකරණ වසර සඳහා සකස් කර ඇත.

### 2.2.1 ව්‍යාපාර සංයෝජනය
අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් කාණ්ඩයක් මගින් ව්‍යාපාරයක අර්ථ දැක්වීම සපුරාලන විට සහ පාලනය සමූහය වෙත පවරන අවස්ථාවක, අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිත කරමින් සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයන් ගිණුම්ගත කරයි. අත්පත් කරගත් කිසියම් ක්‍රියාකාරකමක් හෝ වත්කමක් ව්‍යාපාරයක්ද නැද්ද යන්න හඳුනා ගැනීමේදී, අවම ලෙස එය ආදානයක් සහ ස්වාධීන ක්‍රියාවලියක් මෙන්ම එයට නිපැයුමක් කිරීමේ හැකියාවක් තිබේද යන්න සමූහය තක්සේරු කරනු ලබයි.

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම්, ව්‍යාපාරයක් නොවන්නේද යන්න සරලව තක්සේරු කරනු ලබන 'ඒකාග්‍රතා පරීක්ෂණයක්' කිරීමට සමූහයට විකල්පයක් ඇත. හඳුනාගත හැකි වත්කම් හෝ සමානව හඳුනාගත හැකි වත්කම් සමූහයක් තුළ අත්පත් කරගත් දළ වත්කම්වල සාධාරණ අගය සැලකිය යුතු ලෙස සංකේන්ද්‍රණය වී ඇත්නම් විකල්ප ඒකාග්‍රතා පරීක්ෂණය සපුරාලනු ඇත.

අත්කරගැනීම් පවරන ලද වටිනාකම් මෙන්ම හඳුනාගත් ශුද්ධ දළ වත්කම්ද සාමාන්‍යයෙන් සාධාරණ අගය මත ගණනය කරනු ලබයි. ඇතිවන්නා වූ ඕනෑම කීර්තිනාමයක්, හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි. කේවල් කිරීමක ඕනෑම ලාභයක්, ලාභ සහ අලාභවල කඩිනමින් හඳුනා ගනු ලබයි. ණය හෝ අවශිෂ්ට සුරැකුම්පතකට සම්බන්ධ වීමකදී හැර ගනුදෙනු පිරිවැය දැරූ වියදම් ලෙස සලකනු ලබයි.

පූර්ව පවත්නා සම්බන්ධතා පියවීමේ වටිනාකම්, පැවරීම්වල අන්තර්ගත නොවේ. සාමාන්‍යයෙන් එවැනි අගයන් ලාභ සහ අලාභවල හඳුනාගත හැකිය.

ඕනෑම අවිනිශ්චිත වටිනාකමක්, අත්පත් කර ගැනීමේ දිනට එහි සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. අවිනිශ්චිත ගෙවීමට ඇති බැඳීම, මූල්‍ය උපකරණයක නිර්වචන සමඟ සැසඳේ නම් සහ එය හිමිකම් වර්ගීකරණය යටතට වැටේ නම්, එවිට එය නැවත ගණනය නොකරන අතර ගාස්තු ගෙවීම හිමිකම් සමඟ ගිණුම්ගත කරනු ලබයි. ඒ හැරුණු කොට, අනෙකුත් ප්‍රතිලාභ හඳුනාගැනීම සෑම වාර්තාකරණ දිනකම සාධාරණ අගය මත නැවත ගණනය කරනු ලබන අතර, අවිනිශ්චිත ප්‍රතිලාභ හඳුනාගැනීමේ සාධාරණ අගයන්වල සමාගම් වෙනස්කම් ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

### 2.2.2 පරිපාලිතයන්
පරිපාලිතයන් යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය විසින් ආයතනයන් 'පාලනය' කරනු ලබන්නේ, එයට නිරාවරණය වූ විටක හෝ, එහි සම්බන්ධවීම තුළ පරිපාලිතයේ විචල්‍ය ප්‍රතිලාභ සඳහා අයිතියක් ඇති විටක සහ, සිය බලය යොදවමින්, එවැනි ප්‍රතිලාභ පරිපාලිතයකට බලපෑමක් ඇති කිරීමට හැකි අවස්ථාවකය. පාලනය ආරම්භ කරන දිනයේ සිට අවසන් දිනය තෙක් පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශ, ඒකාබද්ධ මූල්‍ය වාර්තාවේ අන්තර්ගත වේ.

### 2.2.3 පාලනයට නතු නොවන අයිතීන්
සෑම ව්‍යාපාර සංයෝජනයකදීම සමූහය විසින් අත්කර ගැනීමට අදාළ පාලනය නතු නොවන අයිතීන් ගණනය කරනු ලබන අතර, එය සාධාරණ අගය මත හෝ සමානුපාතික කොටස්වල හඳුනාගත් ශුද්ධ වත්කම්වල අගය මත ගණනය වේ. කෙසේ වෙතත් මෙය සාමාන්‍යයෙන් සාධාරණ අගය මත ගණනය වේ.

පාලනයට නතු නොවන අයිතීන් අත්පත් කර ගැනීම, හිමිකරුවන් සමඟ හිමිකරුගේ ධාරිතාවය මත සිදුවූ ගනුදෙනුවක් ලෙස සලකා ගණනය කරනු ලබයි. එවැනි ගනුදෙනු නිසාවෙන් කීර්තිනාමයක් හඳුනා ගත නොහැකිය. පාලනයට නතු නොවන අයිතීන්වල වෙනස්කම්, පරිපාලිතයේ ශුද්ධ වත්කම්වල සමානුපාතික අගය මත පදනම්ව ගණනය කරනු ලබයි.

සමූහයට පරිපාලිතයේ තිබෙන අයිතියේ අහිමිවීමක් ගෙන නොදෙන වෙනස්කම්, හිමිකම් ගනුදෙනුවක් ලෙස ගණනය කරනු ලබයි.

### 2.2.4 පාලනය අහිමි වීම
පරිපාලිතයේ පාලනය සමූහයෙන් ගිලිහී යන විටක, එය පරිපාලිතයේ වත්කම් සහ වගකීම් සහ එයට අදාළ පාලනය ප්‍රමාණවත් නොවන අයිතීන් (NIC) හා අනෙකුත් හිමිකම්වල අංග ලෙස හඳුනා නොගනී. ප්‍රතිඵලයක් ලෙස ලාභ හෝ අලාභයක් වෙතොත් එය ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලබයි. පෙර පරිපාලිතයේ ඕනෑම රඳවා ගන්නා ලද අයිතියක්, සාධාරණ අගය මත ගණනය කරනු ලබයි.

### 2.2.5 ඒකාබද්ධ කිරීම මත ඉවත් කළ ගනුදෙනු
අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු, සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් ඇතිවන උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඉවත් කෙරේ. හිමිකම් ගිණුම්ගත ආයෝජිතයන් සමඟ ගනුදෙනුවලදී උපලබ්ධි නොවූ ලාභ, ආයෝජිතයාගේ සමූහයේ පොලිය දක්වා එම ආයෝජනවලට එරෙහිව එම හිමිකම් මත

ඉවත්කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ, උපලබ්ධි නොවූ ප්‍රතිලාභ ආකාරයටම ඉවත් කරනු ලබන්නේ හානිකරණය පිළිබඳ සාක්ෂි නොමැති වීම පමණි.

### 2.3 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිති, මෙම මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන සියලුම කාල පරිච්ඡේදයන්ට අදාළව අඛණ්ඩව යොදා ගෙන ඇත.

### *2.3.1 සැලකියයුතු ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන්*

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි බලපෑම් කළ හැකි විනිශ්චයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට සහ හෙළිදරව් කිරීම් සිදු කිරීමට සහ අවිනිශ්චිත වගකීම් පිළිබඳ අනාවරණය කිරීමට කළමනාකරණයට සිදුවේ. මෙම උපකල්පන සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව හේතුවෙන් අනාගතයේ බලපෑම් ඇති කළ හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ අගය සඳහා ද්‍රව්‍යාත්මක ගැළපීම් සිදු කිරීමට වනු ඇත.

**(අ) විනිශ්චයන්**

**(i) අසම්භාව්‍ය වගකීම් - නඩු කටයුතු**

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානය වන විට විවිධ පාර්ශ්වකරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ නීතිඥයන්ගේ උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කටයුතුවල තත්ත්වය ඇගයුමට ලක් කරන අතර, අනාගතයේදී සම්පත් ගලායෑමක් පවතී යයි නිශ්චය කළහොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරනු ලබයි.

ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවකයින් විසින් සමූහයට එරෙහිව සිදු කරන නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම් ඉල්ලීමක් සහ විය හැකි හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන්, සමූහයේ ව්‍යාපාර කටයුතුවලට ඇති වන කිසියම් අවිනිශ්චිත සැලකිය යුතු බලපෑමක් අධ්‍යක්ෂවරුන් අපේක්ෂා නොකරන කාරණා සඳහා, අදාළ මුදල් ප්‍රමාණයන් සටහන 25.2 හි දක්වා ඇත.

**(ii) කල්බදු**

කොන්ත්‍රාත්තුවක් තක්සේරු කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු ක්‍රමයක් ද යන්න බැලීම සඳහාය. හඳුනාගත් වත්කම් කිසියම් කාල සීමාවකට යම් වටිනාකමක් වෙනුවෙන් භාවිතය සහ පාලනය කිරීමට අයිතියක් ප්‍රකාශ කරන්නේ නම් එය කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු වේ. කොන්ත්‍රාත්තුවක් හඳුනාගත් වත්කමක් පාලනයට අයිතිය ප්‍රකාශ කරන්නේද යන්න තීරණය කිරීමට සැලකිය යුතු සාධකයන් වන්නේ; කොන්ත්‍රාත් පදනම අනුව හඳුනාගත් වත්කම් භාවිතයට ගැනීමට, භාවිත කාලය පුරාම තක්සේරුව යොදාගෙන සියලු ආර්ථික වාසි ලබා ගැනීමට මෙන්ම තක්සේරුවන් සෘජුව භාවිත කිරීමට සමූහයට අයිතියක් ඇත.

**(ආ) ඇස්තමේන්තු**

**(i) පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය වීම/ක්‍රමක්ෂය**

කළමනාකරණය විසින් වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වලට, යම් ඵලදායී ජීවකාලයක් හා අවශේෂ වටිනාකමක් පවරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ඵලදායී ජීවකාලයද එක් එක් වාර්තා කරන දිනට ඒවායේ ක්ෂයවීම්/ක්‍රමක්ෂය ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම් සඳහා පෙර සිදුකළ ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමග එය අනුගත වන බවටද සහතික කරනු ලබයි. මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා අවශේෂ වටිනාකම්වල වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සංශෝධනවලට හේතුවිය හැකිය. (2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්ති විමසා බලන්න).

**(ii) නිරන්තර පියාසර වැඩසටහන**

ලකුණු ප්‍රදානයන් (Award Credits) ආදායමෙහි වෙනම හඳුනාගැනෙන සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ. ලකුණු ප්‍රදාන සඳහා වෙන්කළ අදාළ ප්‍රතිෂ්ඨාව ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර, ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීමක් (විලම්බිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් ලකුණු ප්‍රධානවල (Mile/ Credit) සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණ ශිල්ප ක්‍රම භාවිත කරන අතර, අංශයක් (Sector) සඳහා ගාස්තුව, ඉහළ පංතියක ආසනයක් ලබාගැනීම සහ හවුල්කාර ප්‍රදාන වැනි සාධක ගණනාවක් සඳහා බර තැබූ සාමාන්‍යයක් නිරූපණය කෙරේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවණතා යොදා ගැනේ.

සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂා නොකරන සැතපුම් සඳහා සහ කල් ඉකුත් සැතපුම් සඳහා, සැතපුම්වල සාධාරණ අගය වෙනුවෙන් ගැළපීම් සිදු කරනු ලබයි. සැතපුම්වල සාධාරණ අගය නිශ්චය කිරීමෙහිලා යොදාගැනෙන යෙදවුම්වල විවිධත්වය හේතුවෙන් කළමනාකරණය විසින් විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

**(iii) නඩත්තු සංචිතය**

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් කල්බදු යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම විසින් මාසික ගෙවීම් සිදු කරයි. පියාසර කරන ලද පැය ගණන හෝ වාර ගණන හෝ ගත වූ කාලය අනුව මෙම මාසික ගෙවීම් පදනම් වේ. ආපසු අයකර හැකි වටිනාකම්වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම්වල ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳ කළමනාකරණය කලින් කලට ඇගයීම් සිදු කරයි. කිසියම් වත්කමක ධාරණ අගය, එහි ආපසු අයකර ගතහැකි මුදල ඉක්මවන විට, එම වත්කම හානිකරණය වූ වත්කමක් සේ සලකා එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා හැරේ (සටහන 6 බලන්න).

**(iv) ගුවන් යානා නඩත්තු සහ අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන්කිරීම**

නඩත්තු කටයුතු සඳහා එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා බඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබෑසුම් උපකරණ සම්බන්ධ විශාල නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. පිරික්සුමේ ස්වාභාවය මත භාවිතය සහ කාලය යෙදවීම මත පදනම්ව මූල්‍ය ප්‍රකාශ තුළ විශාල නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදන සිදුකරයි. මෙම ප්‍රතිපාදන තීරණය කිරීමෙහිදී, අදාළ පරික්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේදී පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත තත්ත්වය මත, යෙදවිය යුතු අමුද්‍රව්‍ය හා දැරිය යුතු පොදුකාර්ය පිරිවැය මත සහ අදාළ පරික්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මත සුදුසු උපකල්පනවලට එළඹේ. මෙම උපකල්පනවලට අතීත අත්දැකීම් පාදක කරගන්නා අතර, ඒවා සත්‍ය මට්ටමට ආසන්න බව තහවුරු කරගැනීම සඳහා නිරන්තර සමාලෝචනයට ලක්කරනු ලැබේ. ප්‍රතිපාදන කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිකරන උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් සංශෝධන වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපීමක් සිදුකරනු ලැබේ. (සටහන 16.1 බලන්න)

**(v) ගුවන් යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා විධිවිධාන**

කල්බදු ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියක් යටතේ කල්බදු ගුවන් යානා නැවත ලබා දීමට සමාගම බැඳී සිටී. ගුවන් යානා ආපසු ලබා දීමේ කොන්දේසිවලට

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

අපේක්ෂිත පිරිවැය, තීව් කිරීමේ අනුපාත, අපේක්ෂිත වගකීම් කල් පිරීම සමඟ සර්ලන වට්ටම් අනුපාතවලට අදාළ උපකල්පන ඇතුළත් වේ. ප්‍රතිපාදනය පිළිබඳ තීරණය කිරීමේදී, නැවත භාරදීමේ කාලසීමාව වන විට වත්කමේ ඇස්තමේන්තුගත තත්ත්වය, දැරීමට සිදුවන ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය සහ නැවත භාරදීම සිදු කරන වේලාව මත උපකල්පන කරනු ලැබේ. මෙම උපකල්පන අතීත අත්දැකීම් මත පදනම්ව පිහිටුවා ඇති අතර ඒවා සත්‍ය තත්ත්වයට ආසන්න බව සහතික කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ. ප්‍රතිපාදනයට ද්‍රව්‍යමය බලපෑමක් ඇති කරනු ලබන උපකල්පනවල සහ ඇස්තමේන්තුවල පවතින කිසියම් සංශෝධනයක් වේ නම් එය ඉදිරි මූල්‍ය ප්‍රකාශවල සකස් කරනු ලැබේ (සටහන 16.2 බලන්න).

**(vi) ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත සෘජු මෙහෙයුම් වියදම් සඳහා වෙන්කිරීම**

ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කටයුතුවලදී ඉන්ධන ගාස්තු, ගොඩබිම් මෙහෙයුම් සේවා සඳහා ගාස්තු, ගොඩබෑම් හා නවතා තැබීමේ ගාස්තු, ගුවන්යානා තුළ ආහාර පාන, ප්‍රවේශපත්‍ර වෙන්කරවා ගැනීමේ පද්ධති ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි සෘජු වියදම් සම්බන්ධයෙන් වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අවස්ථානුකූල පරිදි සාධාරණ වේ යැයි විශ්වාස කෙරෙන බොහෝ අනිකුත් සාධක මතද පදනම් වන අතර, ඉන් උද්ගත වන ප්‍රතිඵල වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වගකීම්වල ධාරණ අගය මත ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවේ.

**(vii) තොග**

සමූහය විසින් භෞතික පරීක්ෂා කිරීම් සහ කල් ඉකුත්වීම් මත පදනම්ව තොගවල පැවැත්ම හා ප්‍රයෝජනවත්භාවය, සමාලෝචනය කරයි. කළමනාකරණය විසින් යල්පැන ගිය තොග නිශ්චය කළ අවස්ථාවක ප්‍රතිපාදන සිදුකරයි.

**(viii) මූල්‍ය වත්කම්වල හානිකරණය**

යම් වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි සොයා බැලීමට එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කිරීම් සිදු කරයි. නොගෙවා ඇති කාල සීමාව, ආරක්ෂාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය විසින් දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට කළමනාකරණය විසින් සිය විනිශ්චය භාවිත කරනු ලබයි.

**(ඇ) උපකල්පන**

**(i) නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්ම**

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය තීරණය කෙරෙනුයේ ආයුගණන තක්සේරුව ආශ්‍රයෙනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොලී අනුපාතය, වැටුප් වර්ධන අනුපාතය, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවලට යටත් වේ. (2.4.16 (අ) සටහන බලන්න.)

**(ii) දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය**

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ඉඩම් සහ ගොඩනැගිලිවල සහ ගුවන් යානා මුළුතැන්ගෙයි උපකරණ ප්‍රත්‍යාගණන අගය මත මනිනු ලැබේ. සාධාරණ අගය තීරණය කිරීම පිණිස එකී තක්සේරුකරු විසින් උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිත කරනු ලැබේ. අදාළ තක්සේරු කිරීමේ පදනම සටහන 3 හි දක්වා ඇත.

## 2.4. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් ආශ්‍රිත සාරාංශය

*2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය*

සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු ඒවා සිදුවන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදලින් ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැයට ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම, අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

*2.4.2 බදුකරණය*

ආදායම් බදු සඳහා ප්‍රවර්තන සහ විලම්බිත බදු අඩංගු වේ. එය ව්‍යාපාර සංයෝජනයකට සම්බන්ධවන ප්‍රමාණයට හෝ හිමිකම් හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි (OCI) සෘජුවම හඳුනාගත් අයිතමයක් නොවන අවස්ථාවක ලාභ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ. අවිනිශ්චිත බදු පිරියම් ඇතුළුව ආදායම් බදුවලට සම්බන්ධ පොලී සහ දඩ මුදල්, ආදායම් බදුවල අර්ථකථනයට නොගැලපෙන බව සමූහය තීරණය කර ඇති හෙයින් එය LKAS37 ප්‍රතිපාදනයෙහි අවිනිශ්චිත වගකීම් සහ වත්කම් යටතේ ගිණුම්ගත කර ඇත.

**(i) ප්‍රවර්තන ආදායම් බදු**

ප්‍රවර්තන බදු යනු වසර සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ වියදම මත අපේක්ෂිත බදු ගෙවීම් හෝ ආදායම් බදුවල ලැබිය යුතු සහ පෙර වසරට අනුව ගෙවිය යුතු බදු හෝ ලැබිය යුතු බදු සඳහා ඕනෑම වෙනස් කිරීමක් වේ. ප්‍රවර්තන බදු ගෙවිය යුතු හෝ ලැබිය යුතු ප්‍රමාණයන් යනු ආදායම් බදු සම්බන්ධ අවිනිශ්චිතතාවයක් පවතී නම් පිළිබිඹු කරනු ලබන ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත බදු ප්‍රමාණයන්වල සුදුසුතම තක්සේරුවයි. වාර්තාකළ දිනයට පැනවූ බදු අනුපාතික හෝ නිත්‍ය ලෙස පැනවීම් පාදක කරගනිමින් එය මනිනු ලැබේ. ලාභාංශයෙන් ඇතිවන ඕනෑම බදු ප්‍රමාණයක් ප්‍රවර්තන බදුවල අන්තර්ගතය.

කිසියම් නිර්ණායකයක් තිබේ නම් පමණක්, ප්‍රවර්තන බදු වත්කම් හෝ වගකීම්වලට හිලව් කරගනු ලැබේ.

**සමාගම**

**(අ) දේශීය බදුකරණය**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත බලාත්මක වීම සමඟ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම ව්‍යාපාර කටයුතු සඳහා ආදායම් බදු ගෙවීමේ වගකීමක් සමාගම සතු වේ.

**(ආ) විදේශීය බදුකරණය**

දැනට ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුළ තම මෙහෙයුම් කටයුතු මත බදු ගෙවීමේ වගකීමට සමාගම යටත් වේ.

**පරිපාලිත සමාගම - ශ්‍රීලංකන් කේටරින් සමාගම**

ගුවන්යානා මුළුතැන්ගෙයි සහ ගුවන් සංක්‍රමණ අවන්හල් වෙතින් ලැබෙන ආදායම 2021 මැයි 31 දක්වා ආදායම් බද්දෙන් නිදහස් කොට ඇති අතර, ඉන් පසු ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව 2029 මාර්තු 29 දිනෙන් අවසන් වන වසර අටක කාලයක් සඳහා 15% ක සහනදායී අනුපාතයට බදු ගෙවිය හැකිය. වෙනත් මූලයන් වෙතින් උපයන ආදායම සාමාන්‍ය බදු අනුපාත යටතේ බදු වගකීමට බැඳේ

**(ii) විලම්බිත ආදායම් බදු**

වත්කම් සහ වගකීම්වල බදු පදනමේ සහ ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා වූ ධාරණ අගයන් අතර වාර්තා කරන

දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ වගකීම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත ආදායම් බදු සලසනු ලැබේ.

විලම්බිත බදු, වාර්තාකරණ දිනයට පනවන ලද හෝ නිත්‍ය ලෙස පනවන ලද නීති මත පදනම්ව, ප්‍රතිවර්තනය කරන අවස්ථාවක තාවකාලිකව වෙනස් කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික අනුව ගණනය කරනු ලබයි.

භාවිත නොකළ බදු අලාභයන් සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් පිළිගනු ලබන අතර, ඒවා ප්‍රයෝජනට ගත හැකි අනාගත බදු ආදායම් වලට එදිරිව භාවිත කළ හැකිය. විලම්බිත බදු වත්කම් වාර්තා කරන දිනයට විමර්ශනය කරන අතර අදාළ බදු ප්‍රතිලාභයන් තැබිය හැකි, තවදුරටත් සම්භාවී විය නොහැකි වන තෙක් අඩුකරනු ලබයි.

### 2.4.3 දේපළ, පිරියත සහ උපකරණ

**(අ) පිරිවැය සහ තක්සේරු කිරීම**
දේපළ, පිරියත සහ උපකරණ සියලුම අයිතම මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරනු ලබයි. අත්පත්කර ගැනීම් හෝ ඉදිකිරීම සඳහා සෘජුව ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ යනාදිය පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරනු ලබන අවස්ථාවේදී, එවැනි දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රත්‍යාගණිත අගයෙන් යම් ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකර ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැයෙන්, ක්ෂයවීම් සහ/හෝ සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් ඒවාද අඩු කිරීමෙන් ලබා ගනී.

සමාන වත්කමකට අයත් මීට පෙර ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ප්‍රත්‍යාග ණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වීම හැරුණුකොට, ඉඩම්, ගොඩනැගිලි සහ ගුවන් යානාස්ථ මුළුතැන්ගෙහි උපකරණ ප්‍රත්‍යාග ණන අගයට ගණනය කරන අතර, ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගන්නා අතර හිමිකම තුළ වූ ප්‍රත්‍යාගණන සංචිතය තුළ සමුච්චිත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුළ හඳුනාගෙන ඇති එම වත්කමට අදාළ දැනටමත් පවත්නා අතිරික්තයක් හිලව් කළ පසු ඉතිරියට වේ.

ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයට විශාල වෙනසක් සිදුනොකරනු ලබන බවට සහතිකවනු පිණිස වත්කම් තක්සේරු කටයුතු ප්‍රමාණවත් වාර ගණනක් සිදු කෙරේ. අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒ නම් හෝ අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් ගණනය කළ හැකි නම්, පසුව ඇතිවන පිරිවැය අදාළ වත්කමෙහි ධාරණ අගය තුළ අන්තර්ගත කිරීම හෝ වෙනම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදුකෙරේ.

අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදය තුළ ලාභ අලාභ ප්‍රකාශයට අය කෙරේ.

දේපළ, පිරියත සහ උපකරණ තුළ පහත සඳහන් වෙනත් දෑ ඇතුළත් වේ;

**(i) ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්**
ස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් මූලික වශයෙන් පිරිවැය මත වාර්තා කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය "ගුවන්යානා ආශ්‍රිත උපකරණ" යටතේ වර්ග කර ඇත.

**(ii) නොනිමි ප්‍රාග්ධනය**
නොනිමි ප්‍රාග්ධනය, ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපිත දිනය දක්වා දරන ලද සියලු වියදම් ඇතුළත් පිරිවැයට වාර්තා කරනු ලබයි. වැඩ ස්ථාපනය කළ විට නොනිමි ප්‍රාග්ධනය දේපළ, පිරියත සහ උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි.

**(ආ) ක්ෂයවීම**
සින්නක්කර ඉඩම් හැර, සියලුම දේපළ, පිරියත සහ උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමවේදය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සමාන වාරිකවලින් කපා හරිමින් ක්ෂයවීම් සඳහා වූ වෙන්කිරීම් ගණනය කෙරේ.

| | |
|---|---|
| ගුවන් යානා ආශ්‍රිත උපකරණ | වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා |
| දේපළ, පිරියත සහ උපකරණ | උපකරණයේ වර්ගීකරණය /ස්වභාවය මත පදනම්ව වසර 3-10 දක්වා කාලපරිච්ඡේදය පුරා |
| ගොඩනැගිලි | වසර 15 සිට 50 දක්වා වූ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීවකාලය මත |
| මෙහෙයුම් කල්බදු මත වූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් | වසර 10 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව තුළ |

සුන්බුන් අගය, ඵලදායී ජීවකාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තාකරණ දිනට සමාලෝචනය කෙරෙන අතර සුදුසු පරිදි අදාළ ගැළපීම් සිදුකෙරේ.

ඉහත සඳහන් ක්ෂයවීමේ අනුපාත ඉදිරිපත් කළ සියලුම කාලපරිච්ඡේදවලට අදාළ වේ.

**(ඇ) හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
කිසියම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමකදී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇති නොවන විට හඳුනාගැනීමෙන් බැහැර කරනු ලැබේ. යම් වත්කමක් එසේ බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (බැහැර කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) අදාළ වත්කම බැහැර කරනු ලබන වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

**(ඈ) වත්කම් භාවිතය මත ප්‍රත්‍යාගණන සංචිතය රඳවා ගත් ඉපැයීම් වලට මාරු කිරීම**
කල්බදු ඉඩම්හි ඉදිකරන ලද ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් ඉහළ යන ක්ෂය (වත්කම්වල ප්‍රත්‍යාගණන අගය මත ගණනය කළ ක්ෂය සහ වත්කමේ මූලික පිරිවැය මත ගණනය කරනු ලබන ක්ෂය අතර වෙනස) වෙනුවෙන් ප්‍රත්‍යාග ණන අතිරික්තය රඳවා ගත් ඉපැයීම් වලට වාර්ෂිකව මාරුකිරීම කරනු ලැබේ.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා ඇතිවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එවැනි වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කල හැකි නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගනු ලැබේ. ඒ අනුව සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැය මත මෙම වත්කම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන් කරගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්පත්කර ගැනීමේ හෝ සැකසීමේ පිරිවැය වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, එය සරල රේඛීය පදනම මත වසර 05කට නොවැඩි කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තා කරන දිනට විමර්ශනයට ලක් කරනු ලබයි. මෙම වත්කමේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බව යම් අවස්ථානුකූල සිදුවීම් සහ වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් හානිකරණය සඳහා එම වත්කමේ ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

*2.4.5 කල්බදු*

කොන්ත්‍රාත්තුවක් ආරම්භ කිරීමේදී, එය කල්බදු වේද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් ඇගයුමට ලක් කෙරේ. කොන්ත්‍රාත්තුව මගින් හිලව් කිරීමකට හුවමාරු වශයෙන් කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේ නම්, එම කොන්ත්‍රාත්තුව කල්බදු වේ හෝ එහි කල්බදු ඇතුළත් වේ. කිසියම් කොන්ත්‍රාත්තුවක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේද යන්න ඇගයුමට ලක් කිරීමේදී සමූහය මගින් පහත දැක්වෙන කරුණු සලකා බලනු ලබයි.

- කොන්ත්‍රාත්තුව තුළ භාවිත වන හඳුනාගත් වත්කමක් පවතීද යන්න - මෙය සෘජුව හෝ වක්‍රව විශේෂ කොට දැක්විය යුතු වන අතර, එහිදී අදාළ වත්කම භෞතිකව අනන්‍ය ස්වභාවයෙන් යුතු වීම හෝ එහි සම්පූර්ණ ධාරිතාව ප්‍රමාණවත් අයුරින් නියෝජනය වීම අවශ්‍ය වේ. සැපයුම්කරුට සැලකිය යුතු ආදේශක අයිතියක් පවතී නම්, වත්කම හඳුනා ගනු නොලැබේ.
- භාවිත කරනු ලබන කාල පරිච්ඡේදය පුරා අදාළ වත්කම භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණවත් ආකාරයෙන් ලබාගැනීමේ හිමිකම, සමූහය සතු වේද යන්න; සහ
- වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේද යන්න. අදාළ වත්කම කෙසේ කුමන අරමුණු මත භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳ වෙනස් කිරීමට වඩාත්ම අදාළ තීරණ ගැනීමේ අයිතිය පවතින විටකදී මෙම හිමිකම සමූහය සතු වේ. වත්කම කෙසේ කුමන අරමුණු මත භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳ තීරණය පූර්ව නිශ්චිත වූ දුර්ලභ අවස්ථාවන්හිදී, පහත සඳහන් තත්ත්ව යටතේ වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේ:
  - වත්කම මෙහෙයවීමේ හිමිකම සමූහය සතු වේ නම්; හෝ
  - සමූහය මගින් අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරබයා භාවිත කෙරෙන්නේද යන්න

පූර්ව නිශ්චය කළ හැකි ආකාරයෙන් සකසා ඇති නම් කල්බදු සංරචකයක් සහිත කොන්ත්‍රාත්තුවක ආරම්භයේදී හෝ නැවත තක්සේරුවකදී, සමූහය විසින් එක් එක් කල්බදු සංරචකය සඳහා එහි අදාළ සාපේක්ෂ තනි අගයන්වල පදනම මත කොන්ත්‍රාත්තුවල ප්‍රතිෂ්ඨාව වෙන් කරනු ලැබේ.

කෙසේ වෙතත්, එය බදුකරු වන ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ කල්බදුවලදී, සමූහය මගින් කල්බදු නොවන සංරචකයන් වෙන් කිරීමට අදහස් නොකරන අතර, කල්බදු සහ කල්බදු නොවන සංරචකයන් තනි කල්බදු සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ.

*2.4.5.1 භාවිත හිමිකම් වත්කම් (ROU)*

සමූහය මගින් කල්බදු ඇරඹෙන දිනයේදී භාවිත හිමිකම් වත්කමක් සහ කල්බදු වගකීම හඳුනාගනී. භාවිත හිමිකම් වත්කම මූලිකව පිරිවැයට ගණනය කෙරෙන අතර, ආරම්භක දිනයේදී හෝ එයට පෙර සිදුකරන ලද කවර හෝ කල්බදු ගෙවීම් වෙත ගළපන ලද අනාගත කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමේ ආරම්භක අගයට, කවර හෝ මූලික සෘජු පිරිවැයක් සහ පවත්නා වත්කමක් කොටස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ අවශ්‍ය ප්‍රතිලාභ තත්ත්වයට පාදක කර ගත් වත්කම් නැවත පිහිටුවීමට ඇස්තමේන්තු පිරිවැය එකතු කිරීමෙන්, ඕනෑම ලද බදු දිරිගැන්වීම් වලින් අඩු කොට මෙය ගණනය කරනු ලබයි.

**(අ) ගුවන්යානා සහ අමතර එන්ජින් කල්බදු ගැනීම**

සමාගම මගින් සිය යානා සමූහය සඳහා ගුවන්යානා සහ එන්ජින් කල්බදු ගැනීම සිදුකරයි. ගුවන්යානා සහ එන්ජින් කල්බදුවල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 2 සිට 15 දක්වා වේ.

ගුවන්යානා කල්බදු සඳහා ගුවන්යානාවේ ආපසු ලබාදෙන තත්වය සඳහා වෙන්කිරීමක් ඇතුළත් වේ. එය වගකීම නිර්මාණය කරනු ලබන අවස්ථාවේදී, වත්කම් භාවිතයේ හිමිකම් වෙත කල්බදු ආශ්‍රිත නීතිරීති හා කොන්දේසි මගින් ඉල්ලා සිටින පරිදි පාදක වන වත්කම යථා තත්වයට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා බදුකරු විසින් දරනු ලබන පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුවකි (සටහන 15.2). සෙසු ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානා විශාල නඩත්තු, එන්ජින් අළුත්වැඩියා සහ ගොඩබෑමේ උපාංග අළුත්වැඩියා වියදම් හැර) දරන ලද පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනෙන අතර, අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන අංක 2.4.15. හි දක්වා ඇත.

කල්බදු ඇරඹුමේදී තැන්පතු ගෙවීම සහ සෙසු කල්බදු ගෙවීම් සියල්ල එකම ගනුදෙනුවකින් ආරම්භ වේ. එමනිසා, ප්‍රවර්තන වටිනාකම සහ ආරම්භයේදී ගෙවනු ලබන මූලික මුදල අතර වෙනස බදුකරු විසින් ගෙවිය යුතු අමතර මුදලක් වශයෙන් සැලකේ.

තැන්පතුව SLFRS 9 හි විෂය පථය තුළ පවතින අතර, මූලිකව සාධාරණ අගයට ගිණුම්ගත කළ යුතු වන අතර, මූලික මුදල හා තැන්පතුව අතර අතිරික්තය එහි සාධාරණ අගය SLFRS 16 - කල්බදුහි විෂය පථයට ඇතුළත් වේ. තැන්පතු සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන 2.4.9. හි දැක්වේ.

මාස 12 ක් ඇතුළත අවසන් වන කල්බදු කාලසීමාවන් සහිත ගුවන්යානාවන්හි කල්බදු සැලකිල්ලට නොගැනුණු අතර, ඒවා කෙටි කාලීන කල්බදු ආකාරයෙන්ම ගිණුම්ගත කොට ලාභ අලාභ ප්‍රකාශයෙහි කල්බදු ගුවන්යානා මත කුලිය යටතේ ඇතුළත් කොට අනාවරණය කර ඇත.

**(ආ) ඉඩම් හා ගොඩනැගිලි ආශ්‍රිත කල්බදු**

සමූහය මගින් ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි ඉඩම් සහ ගොඩනැගිලි කල්බදු පදනමට ගනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ඇතැම් කල්බදුවල, අවලංගු කළ නොහැකි ගිවිසුම් කාලසීමාව අවසන් වීමට පෙරාතුව සමූහයට සිදුකළ හැකි කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් වේ. අදාළ අවස්ථාවන්හිදී, සමූහය මගින් මෙහෙයුම් නම්‍යශීලීත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව නව කල්බදු ගිවිසුම් තුළ කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

සමූහය මගින් කල්බදු ආරම්භයේදී කාලසීමා දිගු කිරීමේ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ ඇගයීමක් සිදු කෙරේ. සැලකියයුතු සිදුවීමක් හෝ තත්ත්වවල සැලකිය යුතු වෙනසක් සිය පාලනය තුළ පවතී නම්, අදාළ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ සමූහය මගින් ප්‍රති ඇගයුමක් සිදු කරනු ලැබේ.

**(ඇ) රථවාහන ආශ්‍රිත කල්බදු**

සමූහය මගින් වසර 2 සිට 5 දක්වා කාලසීමා යටතේ රථවාහන කල්බදු පදනමට ලබා ගැනේ.

**වත්කම් භාවිතයේ හිමිකම් ක්ෂයවීම**

වත්කම් භාවිතයේ හිමිකම්, සරල රේඛීය ක්‍රමවේදයට අනුව පසුව ක්ෂය කෙරෙනුයේ ආරම්භක දිනයේ සිට වත්කම් භාවිතයේ හිමිකම්හි ප්‍රයෝජ්‍ය ජීව කාලය අවසන් වීම හෝ කල්බදු කාලසීමාව අවසන් වීම යන දෙකෙන් වඩාත් කලින් එළඹෙන දිනය දක්වාය. වත්කම් භාවිතයේ හිමිකම් හි ඵලදායී ජීව කාලය නිර්ණය කිරීමේදී දේපළ හා උපකරණ සම්බන්ධයෙන් යොදාගත් පදනම භාවිත කෙරේ. ඊට අමතරව, භාවිත හිමිකම් වත්කම් සම්බන්ධ හානිකරණ අලාභ වෙතොත් ඒ සඳහා අඩු කෙරෙන අතර, කල්බදු වගකීමෙහි ඇතැම් ප්‍රතිමිනුම්ගත කිරීම් සඳහා ගලපනු ලබයි.

*2.4.5.2 කල්බදු වගකීම*

කල්බදු වගකීම, මුලිකව ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල ප්‍රවර්තන වටිනාකමට ගණනය කෙරෙන අතර, කල්බදුවල පැහැදිලි පොලී අනුපාතය භාවිත කරමින් හෝ එම අගය නිසි පරිදි නිර්ණය කළ නොහැකි වේ නම්, සමූහයේ වර්ධනීය ණය ලබාගැනීමේ අනුපාතය යොදා ගනිමින් වට්ටම් කෙරේ. සාමාන්‍යයෙන් සමූහය එහි වර්ධක ණය ගැනීම් අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිත කරනු ලබයි.

කල්බදු වගකීම් ගණනය කිරීමේදී ඇතුළත් කරන ලද කල්බදු ගෙවීම් පහත දැක්වේ:

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම්ද ඇතුළු ස්ථාවර ගෙවීම්;
- ආරම්භක දිනයේදී අදාළ දර්ශකය හෝ අනුපාතය යොදාගනිමින් ගණනය කරන ලද, දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණ; සහ
- ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොටගත් මිල, කාලසීමා දිගු කිරීමේ වරණයක් ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට ගත්තේ නම්, වෛකල්පිත නැවත අලුත්කිරීමේ කාලසීමාවක කල්බදු ගෙවීම්, සහ කලින් අවසන් නොකිරීමට සමූහය සාධාරණ ලෙස ස්ථිර වන්නේ නම් කල්බදු ගිවිසුමක් කලින් අවසන් කිරීම සඳහා වන දඩ මුදල්.

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කෙරේ. කිසියම් දර්ශකයක හෝ අනුපාතයක වෙනස්වීමක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් උද්ගත වන විටකදී, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවියයුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය සම්බන්ධ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් පවතින විටකදී, හෝ සමූහය මගින් මිලදී ගැනීමක්, කාලසීමා දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ වරණයක් තෝරාගන්නේද යන්න පිළිබඳ ස්වකීය ඇගයුම වෙනස් කළ අවස්ථාවකදී එය ප්‍රතිගණනය කරයි.

මේ අයුරින් කල්බදු වගකීම ගණනය කළ අවස්ථාවකදී, වත්කම් භාවිතයේ හිමිකම්හි ධාරණ අගය වෙත අනුරූපී ගැළපීමක් සිදු කිරීම හෝ, වත්කම් භාවිතයේ හිමිකම්හි ධාරණ අගය ශුන්‍ය දක්වා පහත වැටී ඇත්නම් එය ලාභ අලාභ ප්‍රකාශයෙහි වාර්තා කිරීම සිදු කරයි.

*2.4.5.3 කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු*

මාස 12ට හෝ ඊට අඩු කල්බදු කාලසීමාවන් සහිත කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු සඳහා වත්කම් භාවිතයේ හිමිකම් සහ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට සමූහය තීරණය කර ඇත. සමූහය මගින් මෙකී කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

*2.4.5.4 කොවිඩ්-19 ට අදාළ බදු කුලී සහන*

කොවිඩ්-19 ට අදාළ බදු කුලී සහන - IFRS 16 සඳහා සංශෝධන සමූහය විසින් යොදා ගන්නා ලදී. සමූහය විසින් කොවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයක් වන කල්බදු වෙනස් කිරීම්, සුදුසුකම්ලත් බදු සහනවලට යොදා ගැනීම තක්සේරු කිරීමට අවශ්‍ය නොවන ප්‍රායෝගික ක්‍රියාමාර්ග යොදා ගනු ලබයි. සමාන අවස්ථාවන්හි සමාන ලක්ෂණ ඇති ගිවිසුම් සඳහා සමූහය ප්‍රායෝගික ක්‍රියාමාර්ග අඛණ්ඩව යොදාගනු ලබයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ග නොයෙදීමට තෝරා ගනු ලබන හෝ ප්‍රායෝගික ක්‍රියාමාර්ග සඳහා සුදුසුකම් නොලබන කල්බදුවල සහනයන්ට කල්බදු නව්‍යකරණයකට යොමු විය හැකි දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි.

## 2.4.6 තොග

ගුවන් යානා හා ගුවන් පර්යන්ත සේවා ආශ්‍රිත තොග, අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ.

තොග වාර්තා කරනුයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයෙන් අවම අගයට වේ. තොගවල පිරිවැය යනු සියලු ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ එම තොග වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්ය.

තොගවල පිරිවැය ගණනය කිරීමට බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනේ. ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන්, සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුමක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පිරිවැය අඩු කිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ලබා ගැනේ.

## 2.4.7 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

කිසියම් වත්කමක් හානිකරණය වූ බවට පෙන්නුම් කිරීමක් ඇත්දැයි පරීක්ෂා කිරීමට සමූහය විසින් එක් එක් වාර්තා කරන දිනට තක්සේරුවක් සිදුකරයි. එබඳු යම් පෙන්නුම් කිරීමක් වුවහොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් අවශ්‍ය වන විට සමූහය විසින් වත්කමෙහි ආපසු අයකරගත හැකි මුදල පිළිබඳ තක්සේරුවක් සිදු කරනු ලබයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගයෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම්, වත්කම හානිකරණයට පත්ව ඇතැයි සලකන අතර එය ආපසු අයකරගත හැකි අගය දක්වා කපා හැරේ.

## 2.4.8 සාධාරණ අගයට ගණනය කිරීම

සමූහය මගින් ඉඩම් හා ගොඩනැගිලි, සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය මත ගණනය කරයි. සාධාරණ අගය ආශ්‍රිත අනාවරණය කිරීම සටහන 03 හි දක්වා ඇත.

සාධාරණ අගය යනු එය ගණනය කරනු ලබන දිනකදී වෙළඳ පොළේ සහභාගී වන්නන් අතර විධිමත් ගනුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීමේ පදනම වනුයේ යම් වත්කමක් විකිණීම හෝ යම් වගකීමක් පැවරීම:

- වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළඳ පොළේ හෝ
- මූලික වෙළෙඳපොළක් නොමැති විට, වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසි සහගතම වෙළඳ පොළේදී සිදු වේ යන උපකල්පනය මතය.

සමූහයට මූලික වෙළඳ පොළ හෝ වඩාත් වාසි සහගතම වෙළඳ පොළ වෙත ප්‍රවේශය සලසා ගත හැකි විය යුතුය.

එබඳු වත්කම්වල සාධාරණ අගය ගණනය කරනුයේ, වෙළඳ පොළ සහභාගීවන්නන් අදාළ වත්කම හෝ වගකීම මිල කිරීමේදී සිය ප්‍රශස්ත ආර්ථික අපේක්ෂාවන් ඔස්සේ ක්‍රියා කරනු ඇතැයි උපකල්පනය කරමිනි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීම මගින්, වත්කම්වල ඉහළ සහ හොඳම භාවිතය හෝ වත්කම එහි ඉහළ සහ හොඳම භාවිතය සඳහා යොදා ගන්නා වෙනත් වෙළඳ පොළ සහභාගීවන්නෙකුට විකිණීමෙන්, ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට වෙළඳපොළ සහභාගීවන්නන්ගේ හැකියාව සැලකිල්ලට ගනී.

අදාළ තත්ත්වයට ගැළපීම සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය විසින් භාවිත කරනු ලබයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිනුම්කරණයේදී වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය මනිනු ලබන සියලු වත්කම් සාධාරණ අගය ආශ්‍රිත ධුරාවලිය තුළ පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

- 01 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳ පොළේ ලැයිස්තුගත මිල ගණන් (නොගළපන ලද)
- 02 වන මට්ටම - ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම
- 03 වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි සාධාරණ අගයට මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනෙන වත්කම් සහ වගකීම් සඳහා එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේද අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරුවක් මගින් (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) ධුරාවලියෙහි මට්ටම අතර මාරුවීම් සිදුවී ඇත්ද යන්න සමූහය තීරණය කරනු ලබයි.

පිරියත සහ උපකරණ වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ. බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේ නිර්ණායක සඳහා වෙළඳ පොළ දැනුම, කීර්තිනාමය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව කටයුතු ඉටු කරන්නේද යන දෑ ඇතුළත් වේ. බාහිර තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගන්නේද යන්න සමූහය මගින් තීරණය කරනු ලැබේ.

සාධාරණ අගය අනාවරණය කිරීමේ අරමුණ සඳහා, වත්කමට හෝ වගකීමට අදාළ ස්වභාවය, ගති ලක්ෂණ සහ අවදානම් මෙන්ම ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය පිළිබඳ ධුරාවලියේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් සහ වගකීම්වල කාණ්ඩය තීරණය කරනු ලැබේ.

## 2.4.9 මූල්‍ය උපකරණ

### 2.4.9.1 මූල්‍ය වත්කම්

**මූලික හඳුනාගැනීම සහ මිනුම් කිරීම**
ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) වශයෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද වත්කම් ඇතුළුව) ආරම්භයේදී හඳුනාග නු ලබන්නේ සමූහය විසින් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු සමඟ වෙළඳාම කරන දිනයේදීය.

මූල්‍ය වත්කම්, සාධාරණ අගය අනුව මුලින් ගණනය කරනු ලබයි. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් නොමැති අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා ඍජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
මූල්‍ය වත්කමක් කළමනාකරණය කරනු ලබන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත මූල්‍ය වත්කම් වර්ගීකරණය සාමාන්‍යයෙන් පදනම් වේ.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ FVTPL වශයෙන් නම් කර නොමැති නම් එය ක්‍රමක්ෂය පිරිවැයකින් ගණනය කරනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම අරමුණු වූ ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති වත්කම්; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය මුල් ගෙවීම සහ හිඟ මුදලෙහි පොලී මත පමණක් සිදු වේ.

වෙළඳාම සඳහා නොපවතින කොටස් ආයෝජනයක් මුලින් පිළිගැනීමෙන් පසු, වෙනත් විස්තීර්ණ ආදායම් හි සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීම සඳහා සමූහයට ආපසු හැරවිය නොහැකි ලෙස තෝරා ගත හැකිය. උපකරණයක් - උපකරණයක් පාසා මෙම තෝරාගැනීම සිදු කරනු ලබයි.

වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ, ගුවන් යානා නඩත්තු සංචිතය, ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් සහ බැංකු ශේෂ සමූහය මගින් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර, පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය මත ගණනය කරනු ලැබේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
මූල්‍ය වත්කම්වලින් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට සමූහය මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි, නැතහොත් ගනුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරන අතර, එමගින් සැලකිය යුතු ලෙස මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර එය මූල්‍ය වත්කම්වල පාලනයේ රඳවා නොගනී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය (හෝ හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වත්කම් කොටසට අදාළ ධාරණ අගය) සහ:

(i) ලද ප්‍රතිශ්ඨාව (අත්කරගත් නව වත්කම්වලින් අඩු කළ ඕනෑම උපකල්පිත නව වගකීම් ඇතුළත්ව) සහ
(ii) වෙනත් විස්තීර්ණ ආදායම්වලින් හඳුනාගෙන ඇති කවර හෝ සමුච්චිත ලාභ හෝ අලාභ යන ඒවායේ එකතුව අතර වෙනස ලාභ සහ අලාභවල හඳුනාගෙන ඇත.

**මූල්‍ය වත්කම් හානිකරණය**
ක්‍රමක්ෂය පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් ගණනය කරනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් සමූහය විසින් හඳුනාගනු ලැබේ.

සමූහය මගින් සියලුම වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ සඳහා ජීවිත කාලය පුරාම අපේක්ෂිත අලාභ දීමනාවක් භාවිත කරන අපේක්ෂිත ණය පාඩු ගණනය සඳහා සරල ප්‍රවේශයක් භාවිත කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනා රැගෙන යන දළ වත්කම් ප්‍රමාණයේ ධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

මෙම විනිශ්චයන් සහ ආශ්‍රිත උපකල්පනයන්, පවතින තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි අනාගත සිදුවීම් සම්බන්ධ අපේක්ෂාවන්ද ඇතුළුව, ඓතිහාසික අත්දැකීම් සහ අදාළ යැයි සැලකෙන සෙසු සාධක පිළිබිඹු වේ.

### 2.4.9.2 මූල්‍ය වගකීම්

**මූලික හඳුනාගැනීම සහ ගණනය**
සියලුම මූල්‍ය වගකීම් (ලාභය හෝ අලාභය තුළ සාධාරණ වටිනාකමින් නියම කර ඇති වගකීම් ඇතුළුව) පළමුව හඳුනාගනු ලබන්නේ වෙළඳ ගනුදෙනුව සිදුවන දිනයේදී සමූහය, උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානයන්හි පාර්ශ්වකරුවෙකු වන විටය.

වගකීම අත්පත් කර ගත් අරමුණ මත පදනම්ව සමාගම සිය මූල්‍ය වගකීම් පහත කාණ්ඩ දෙකෙන් එකකට වර්ග කරයි. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) හෝ වෙනත් මූල්‍ය වගකීම් එකී කාණ්ඩ දෙක වේ.

මූල්‍ය වගකීමක් පළමුවෙන් ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභය හෝ අලාභය තුළ සාධාරණ අගයක් නොමැති භාණ්ඩයක් සඳහා, එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**

සමූහයේ මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද පොලී දරන ණය සහ ණය ගැනීම්, ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ පිරිවැය සඳහා වූ වෙන් කිරීම් වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පවතී.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මනිනු ලැබේ.

මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වගකීම ගණනය කරනු ලබන ප්‍රමාණයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර, හඳුනාගත් ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ඇති කිසියම් වෙනසක් සඳහා සඵල පොලී අනුපාතික ක්‍රමයක් භාවිත කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩු කර ඉන් හානිකරණය අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**

වගකීම් යටතේ ඇති බැඳීම නිදහස් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

එකම ණය දෙන්නාගෙන් පවත්නා මූල්‍ය වගකීමක් වෙනත් වගකීමක් මඟින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනාගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

*2.4.9.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම*

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව්කර, ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනුයේ:

- හඳුනාගත් මුදල් පියවා ගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතී නම් සහ
- ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කර වගකීම් එකවර පියවා ගැනීමට අභිලාෂයක් පවතී නම් පමණි.

*2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය*

මෙහෙයුම් කල්බදු ගිවිසුම් අනුව ගුවන් යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි අළුත්වැඩියාවන් සඳහා මාසික පදනමක් මත කල්බදු හිමිකරුවන් වෙත කරනු ලබන ගෙවීම්වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග අළුත්වැඩියා සඳහා දරන ලද වියදම (මෙතෙක් සංචිතයට ගෙවූ ප්‍රමාණයන් දක්වා) අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අය කර ගනී.

එහි ස්වභාවය මත පදනම්ව ගුවන්යානා නඩත්තු සංචිතය, මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, මෙම මූල්‍ය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1. හි දැක්වේ.

*2.4.11 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ*

වෙළඳ ණයගැතියන්, තැන්පතු සහ අනෙකුත් ණය ගැතියන් (තැන්පතු යටතේ වර්ගීකරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් සහ පිරිවැයෙන් මනිනු ලබන අනෙකුත් ලැබිය යුතු දේ හැර) ණය සහ ලැබිය යුතු ලෙස වර්ගීකරණය කර ගිණුම්ගත කර ඇත. ස්වභාවය මත පදනම්ව මෙම මූල්‍ය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1 හි දක්වා ඇත.

*2.4.12 ආයෝජන*

**පරිපාලිත සමාගමෙහි ආයෝජන**

පරිපාලිත සමාගමෙහි ආයෝජන, සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ තාවකාලිකව අගය අවප්‍රමාණ වීම් නොවන, හානිකරණයන් ගැළපීමෙන් අනතුරුව ශුද්ධ පිරිවැයට ගිණුම්ගත කරනු ලැබ ඇත.

*2.4.13 කෙටි කාලීන ආයෝජන*

කෙටි කාලීන ආයෝජන යනු මාස තුනට වැඩි කල්පිරීමක් සහිත බැංකුවල පවතින ස්ථාවර වත්කම් වේ. කෙටි කාලීන ආයෝජන ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය මත ගණනය කර ඇත.

*2.4.14 මුදල් සහ මුදල්වලට සමාන දෑ*

මුදල් සහ මුදල්වලට සමාන දෑ, බැංකුවේ සහ අතේ ඇති මුදල් ලෙස අර්ථ දැක්වෙන අතර, කැඳවීම් තැන්පතු සහ කෙටි කාලීන අධි ද්‍රවශීල ආයෝජන පහසුවෙන්, අදාළ මුදල් ප්‍රමාණයට පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ සැලකිය යුතු වෙනස් වීමේ අවදානමකට යටත් නොවේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් සහ මුදල් සමාන දෑ සඳහා බැංකුවේ සහ අතැති මුදල්, ශුද්ධ ගෙවීමට ඇති බැංකු අයිරා, කැඳවීම් තැන්පතු ඇතුළත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත අයෝජනද (එනම් අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ පොලී දරන වගකීම් යටතේය.

*2.4.15 වෙන්කිරීම්*

**(i) සාමාන්‍ය තොරතුරු**

වෙන්කිරීම් හඳුනාගැනෙනුයේ, කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය සතුව කිසියම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදී, එය බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභවල අන්තර්ගත යම් සම්පත් ගලායෑමක් අවශ්‍ය වන සහ එකී බැඳීමේ වටිනාකම මත විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදුකළ හැකි විටය. වෙන්කිරීම් කිහිපයක් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කළ යුතු යැයි සමූහය අපේක්ෂා කරන්නේ නම්, එකී ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනාගැනෙනමුත්, එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත වූ විට පමණි. ප්‍රතිපූර්ණයන්ට ශුද්ධව මොනයම් හෝ වෙන්කිරීමක් වෙතොත්, අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ ඉදිරිපත් කරනු ලැබේ.

**(ii) ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම්**

ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් සටහන 2.3.1 (ආ) (iv) හි සඳහන් කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත. "පැය ගණනට අනුව කාර්යක්ෂමතාව" තෙවන පාර්ශව නඩත්තු ගිවිසුම් මගින් ආවරණය කළ එන්ජින් අළුත්වැඩියා පිරිවැය සඳහා, පිරිවැය අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයට පත් ස්ථිර මිල ප්‍රමාණයන් අනුව ලියා හරියි.

**(iii) ගුවන්යානා ආපසු ලබාදීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන**

ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා වන ප්‍රතිපාදන (ප්‍රතිසංස්කරණ වගකීම්) මගින් නැවත බාරදීමේදී ඇතැම් ගුවන්යානා සහ එන්ජින් සඳහා ගිවිසුම්ගත කල්බදු අවසන් වගකීම සපුරාලිය යුතු

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

පිරිවැයේ ඇස්තමේන්තුව නියෝජනය කරයි. කල්බදු ආරම්භයේදී, පවත්නා ගුවන්යානා සැලැස්ම සහ දිගු කාලීන නඩත්තු කාලසටහන් සැලකිල්ලට ගනිමින්, එක් එක් ප්‍රතිසංස්කරණ වගකීම් සඳහා අපේක්ෂිත පිරිවැයේ වර්තමාන වටිනාකම ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය වත්කම් භාවිතයේ හිමිකම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කර, කල්බදු සීමාව තුළ අගය අඩු කර ඇත. ආශ්‍රිත වට්ටම් ඉවත් කිරීම කල්බදු සීමාව තුළ මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගනී. වත්කම් භාවිතයේ හිමිකම් සඳහා අනුරූප බලපෑමක් ඇතිව ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන නැවත මිනුම් කිරීමක් ලෙස ගණනය කරනු ලබන අතර, ඉතිරි කල්බදු කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේ නොමැතිනම්, නැවත මිනුම් කිරීම ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ගිණුම් කරනු ලැබේ. සටහන 2.3.1 (ආ) (v) හි ඇස්තමේන්තු පදනම පිළිබඳ දක්වා ඇත.

### 2.4.16 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික**

පාරිතෝෂිකය යනු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මකි; 1983 අංක 12 පාරිතෝෂික පනත සහ 2021 අංක 28 දරන සේවකයින්ගේ විශ්‍රාම යන අවම වයස පිළිබඳ පනත අනුව සමාගම සහ එහි පරිපාලිත ආයතනය ගෙවීමට බැඳී සිටී. ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් ආයුගණක උපදෙස් අනුව සෑම වසරකම, සමූහය විසින් දේශීය සේවකයින්ගේ අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන වටිනාකම ගණනය කරනු ලබයි.

එතෙර රැකියාවේ නිරත සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ, අදාළ නීති මත පදනම්ව ඇස්තමේන්තු කරනු ලබයි.

සමූහය විසින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම මගින් ඇතිවන ආයුගණක ලාභ/අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාග න්නා අතර, නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

පාරිතෝෂික වගකීම් සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "වෙනත් දිගු කාලීන වගකීම්" යටතේ දක්වයි.

එතෙර රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි සත්කාරක රටවලට අදාළ නීති/ යෝජනා ක්‍රම යටතේය.

**(ආ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම - ඉපැයූ නිවාඩු මත ගෙවීම්**

විශ්‍රාම ගැනීමේදී දේශීය රැකියා කොන්ත්‍රාත්තුව මත පදනම්ව වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිට භාවිත නොකළ එකතු වූ නිවාඩු සඳහා සමූහය වගකිව යුතුය. භාවිත නොකළ එකතු වූ නිවාඩු සඳහා සමූහයේ ශුද්ධ බැඳීම, සෑම වසරකම ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් ආයුගණක උපදෙස් අනුව, දේශීය සේවකයින්ගේ නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන අගය මත මනිනු ලැබේ.

සමූහය විසින් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ නිවාඩු මුදල් බවට පත් කිරීමට අදාළ, නිවාඩු මුදල් බවට පත් කිරීම මගින් ඇතිවන ආයුග ණන ලාභය හෝ අලාභ, වෙනත් විස්තීර්ණ ආදයම් සහ වියදම්හි හඳුනාගනු ලබයි.

නිවාඩු මුදල් බවට පත් කිරීමේ වගකීම සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. මෙම කරුණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "වෙනත් වගකීම්" යටතේ දක්වයි.

**(ඇ) නිර්වචනය කළ දායකත්ව සැලැසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිභාර අරමුදල**

ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු සේවා නියුක්තිකයන්, අදාළ අණපනත් සහ රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිභාර අරමුදලේ දායකත්වයන්ට සුදුසුකම් ලබයි. සමාගම විසින් සේවක දළ සංවේතන ප්‍රමාණයෙන් 15% ක් සහ 3% ක ප්‍රමාණයක්ද, පරිපාලිත සමාගම විසින් 12% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලටද දායක කරනු ලැබේ.

විදේශයන්හි සිටින සේවකයින් ඔවුන්ගේ සත්කාරක රටවල අදාළ වන නීති/යෝජනා ක්‍රම යටතේ ආවරණය වේ.

### 2.4.17 Frequent Flyer වැඩසටහන

වැඩසටහනේ සාමාජිකයින්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදානය කරනු ලබන 'FlySmiLes' නමින් වැඩිවාර ගණනක් පියාසර කිරීම් පිළිබඳ වැඩසටහනක් (frequent flyer programme) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම Frequent Flyer වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මගී ආදායමෙන් කොටසක් උපයෝජනයට ගනු ලබන තෙක් විලම්භනය කර තබයි. ආදායම කල් දැමීම තක්සේරු කරනු ලබන්නේ නිදහස් කරගැනීමේ ඓතිහාසික ප්‍රවණතා මත පදනම්ව වන අතර, පසුව එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකථනය කිරීම පිණිස යොදා ගෙන ඇත. ප්‍රදානය කරනු ලබන බැරවල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කරගත හැකි සේවාවල බර තැබූ සාමාන්‍ය අගය සලකමිනි. මෙම ඇස්තමේන්තු එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ වගකීම් ඒ අනුව ගළපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා භාවිතය හරහා උපචිතවන්නා වූ සහ සහභාගී හවුල්කරුවන් විසින් ගෙවනු ලබන්නා වූ සැතපුම් ප්‍රමාණ, ඒවා භාවිත කරන තෙක් විලම්බිත ආදායම ලෙස ගණනය කරයි. කල් ඉකුත්වීමට අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා වගකීමක් හඳුනා නොගැනේ.

### 2.4.18 ආදායම් හඳුනාගැනීම

ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම, සමූහය විසින් පියවර පහක ආකෘතියක් පදනම් කරගනිමින් හඳුනාගනී.

ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩ හෝ සේවාවක් පාරිභෝගිකයෙකු වෙත මාරු කිරීම සඳහා යම් ආයතනයක් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිශ්ඨාව පිළිබිඹු වන වටිනාකම අනුවය.

**(අ) ගුවන් සේවාවේ ආදායම**

මගී ප්‍රවාහනය, ගුවන් භාණ්ඩ, අතිරික්ත ගමන්මලු සහ තැපැල් ප්‍රවාහන, ගුවන්තොටුපළ පර්යන්ත සේවා, ඉංජිනේරු සේවා, ගුවන්යානා කුලී පදනම මත සැපයීම සහ ආශ්‍රිත සේවා මගින් ආදායම ප්‍රධාන වශයෙන් උත්පාදනය කරනු ලබයි.

(i) ප්‍රවාහනය/පහසුකම් සැපයීමෙන් ජනිත වන මගී ප්‍රවාහනය, ගුවන් භාණ්ඩ, අතිරික්ත ගමන් මලු සහ අනෙක් අදාළ ගාස්තු මෙහෙයුම් ආදායම ලෙස හඳුනාගනු ලබන්නේ සේවය සැපයීමෙන් පසුවයි.
(ii) භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ ගුවන් මාර්ග බිල්පත්වල අගය, ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම වගකීම්වල ඇතුළත් කෙරේ. භාවිතයට නොගත් ප්‍රවේශපත්‍ර වටිනාකම ආදායමක් ලෙස හඳුනාගන්නේ, කල් ඉකුත්වීමේදී පවා එය භාවිතයට නොගත් අවධියේ පැවතුනහොත් පමණි.
(iii) ගුවන්තොටුපළ පර්යන්ත සේවා සැපයීමෙන් උත්පාදනය වන ආදායම අදාළ සේවා සැපයීම මත හඳුනාගැනේ.
(iv) තෙවන පාර්ශ්ව නඩත්තු සේවා මත උපයන ආදායම එකී කටයුතු නිමවීමෙන් අනතුරුව හඳුනාගැනේ.

(v) ගුවන් ගමන් මෙහෙයුම් සේවා මත උපයන ආදායම අදාළ සේවා සැපයීමෙන් පසුව හඳුනාගැනේ.

**(ආ) භාණ්ඩ විකිණීම**

පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා ගැණුම්කරු වෙත පැවරීමෙන් ආයතනය කාර්යසාධන වගකීම් තෘප්තිමත් කරන පරිදි සහ එසේ කරන විට සමූහය විසින් ආදායම හඳුනාග ැනේ. ආදායම සඳහා එකතු කළ අගය මත විකුණුම් බදු ඇතුළත් නොවන අතර, ආදායම වෙළඳ වට්ටම් අඩු කිරීමෙන් පසු අගයට තීරණය වේ. හිඟ මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් සහ භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇත්නම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

**(ඇ) ලාභාංශ ආදායම**

කොටස් හිමියන්ට අදාළ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

**(ඈ) පොලී ආදායම**

සඵල පොලී අනුපාතය යටතේ ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කළ සියලුම මූල්‍ය උපකරණ සඳහා, පොලී ආදායම හෝ වියදම වාර්තා කරනු ලබයි.

**(ඉ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### *2.4.19 වියදම් හඳුනාගැනීම*

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයුම අතර සෘජු සම්බන්ධය මත පදනම්ව ලාභ අලාභ ප්‍රකාශය යටතේ වියදම් හඳුනා ගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාම සහ කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා වත්කම් භාවිතයේ හිමිකම් සඳහා දරන ලද සියලු වියදම්, ලාභ අලාභ ප්‍රකාශයේ දක්වා ඇත. ලාභ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට, “වියදම්වල ස්වාභාවය” නැමැති ක්‍රමය අනුගමනය කර ඇති අතර, සමූහයේ කාර්යසාධනය සම්බන්ධව අංග සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ පදනම මත එය අනුග මනය කර ඇත.

### *2.4.20 ණය ගැනුම් පිරිවැය*

අපේක්ෂිත භාවිතයට හෝ විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් වැයවන, කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් සඳහා සෘජුවම වෙන් කළ හැකි ණය ලබාගැනීමේ පිරිවැය සහ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන ඒවා හැර, අනෙක් ණය ගැනුම් පිරිවැය ඒවා දරනු ලබන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනාගැනේ.

### *2.4.21 ආංශික වාර්තාකරණය*

අංශයක් යන්නෙන් සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයක් අදහස් වන අතර, එය අනෙකුත් කාණ්ඩවලට වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් සහ ප්‍රතිලාභවලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ නිරත වේ.

සමූහයේ අවදානම සහ ප්‍රතිලාභ අනුපාතය කෙරෙහි විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකිරීම යන සාධකය ප්‍රධාන ලෙස බලපෑම් ඇතිකරන බැවින්, මෙහෙයුම් කටයුතුවල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික ඛණ්ඩ තීරණය කරනු ලැබේ. විකුණුම් සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීමෙන් විකුණුම් මඟින් සැකසෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනේ. නිශ්චිත කාණ්ඩයකට සෘජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන් කොට හෙළිදරවු නොකෙරේ.

භූගෝලීය බෙදීම වෙත වත්කම් සහ අදාළ වගකීම් වෙන්කිරීම සඳහා කිසිදු සුදුසු පදනමක් නොපවතින බවට කළමනාකරණය අදහස් කරයි. ඒ අනුව කාණ්ඩ වත්කම්, කාණ්ඩ වගකීම් සහ භූගෝලීය බෙදීම ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් අනාවරණය කරනු නොලබයි.

ව්‍යාපාර කාණ්ඩය අනුව දෙවන වාර්තාකරණය, සමූහය විසින් සපයන ලද සේවාව මත රදා පවතී. ගුවන් ප්‍රවාහන කටයුතු සහ සිය පරිපාලිත සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු ලෙස සමූහයේ ව්‍යාපාර ප්‍රධාන ඛණ්ඩ දෙකක් යටතේ සිදුවෙයි.

## 2.5 නව ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කළ නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිති

සමූහයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය දක්වා නිකුත් කරනු ලබන නමුත් වත්මන් වාර්ෂික වාර්තාකරණ කාල සීමාව සඳහා ක්‍රියාත්මක නොවන, නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන පහතින් අනාවරණය කර ඇත. මෙම නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන අදාළ වන්නේ නම්, ඒවා ක්‍රියාත්මක වන විට ඒවා අනුගමනය කිරීමට සමූහය විසින් අදහස් කරනු ලබයි.

### *2.5.1 SLFRS 17 රක්ෂණ ගිවිසුම්*

මෙම ප්‍රමිතිය සමාගමට අදාළ නොවේ, එබැවින් මෙම සන්දර්භය තුළ එහි බලපෑමක් නැත.

### *2.5.2 හුවමාරු කිරීමේ නොහැකියාව - LKAS 21 සඳහා සංශෝධන*

මුදල් ඒකකයක් හුවමාරු කළ හැකිද යන්න තක්සේරු කළ යුතු ආකාරය සහ හුවමාරු කිරීමේ හැකියාව නොමැති විට ස්ථානීය විනිමය අනුපාතයක් තීරණය කළ යුතු ආකාරය සංශෝධන මගින් දක්වා ඇත.

සංශෝධන මගින් මුදල් ඒකකයක් වෙනත් මුදල් ඒකකයකට හුවමාරු කළ නොහැකි වීම ආයතනයේ මූල්‍ය කාර්ය සාධනය, මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ කෙරෙහි බලපාන්නේ කෙසේද හෝ බලපානු ඇතැයි අපේක්ෂා කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට එහි මූල්‍ය ප්‍රකාශන භාවිත කරන්නන්ට හැකි වන පරිදි තොරතුරු හෙළිදරව් කිරීම ද අවශ්‍ය වේ.

මෙම සංශෝධන 2025 ජනවාරි 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලපැවැත්වෙනු ඇත. කලින් සම්මත කරගත හැකි වූවද, හෙළිදරව් නොකළ යුතුය. සංශෝධන යොදන විට, ආයතනයකට සංසන්දනාත්මක තොරතුරු නැවත ඉදිරිපත් කළ නොහැක.

සංශෝධන සමූහයේ / සමාගමේ මූල්‍ය ප්‍රකාශනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 3. දේපළ, පිරියත සහ උපකරණ

### 3.1 සමූහය

| | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | පිරියත සහ උපකරණ රු. මිලියන | කල්බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම් රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ රු. මිලියන | අත්තිකාරම්/ ප්‍රාග්ධන නොනිමි වැඩ රු. මිලියන | එකතුව 2025 රු. මිලියන | එකතුව 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 6,397.96 | 11,845.35 | 572.15 | 11,525.00 | 0.27 | 30,340.73 | 30,429.63 |
| අත්පත් කරගැනීම්/ නවීකරණයන්/ වැඩිදියුණු කිරීම් | 3.39 | 992.15 | - | 956.52 | (0.27) | 1,951.79 | 1,669.77 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (18.49) | - | (79.70) | - | (98.19) | (1,758.67) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 6,401.35 | 12,819.01 | 572.15 | 12,401.82 | - | 32,194.33 | 30,340.73 |
| | | | | | | | |
| **සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 404.78 | 8,401.02 | 548.25 | 9,404.22 | - | 18,758.27 | 18,969.91 |
| වසර සඳහා අයකිරීම | 311.28 | 539.50 | 7.36 | 484.44 | - | 1,342.58 | 1,232.68 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (17.80) | - | (79.70) | - | (97.50) | (1,444.32) |
| මාර්තු 31 දිනට ශේෂය | 716.06 | 8,922.72 | 555.61 | 9,808.96 | - | 20,003.35 | 18,758.27 |
| | | | | | | | |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 5,685.29 | 3,896.29 | 16.54 | 2,592.86 | - | 12,190.98 | 11,582.46 |

**3.2 (අ)** සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී. ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් සිදු කරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේ වන අතර, 2023 මාර්තු 31 දිනට පරිපාලිතයෙහි ඉඩම්, ගොඩනැගිලි හා පවත්නා මුළුතැන්ගෙයි උපකරණවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයෙහි සංස්ථාපිත තක්සේරුකරු ඒ. ආර්. අජිත් ප්‍රනාන්දු මහතා විසිනි.

**තක්සේරුකරණයේදී ප්‍රකාශිත සමූහයේ ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ.**

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණන වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොළ අගය**<br>නැවත අගය කළ දේපළ සමාන දේපළවල සාධාරණ අගය තීරණය කිරීමේදී, සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළ විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මඟින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ, ස්වාභාවයේ සහ පිහිටීමේ වෙනස අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොළෙහි සමාන වත්කම් ඇගයීම පාදක කරගනී. | 2023 මාර්තු 31 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 20 | 715.00 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ/ කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය**<br>මෙම ක්‍රමය මඟින් වත්කමක් එහි සමාන වත්මන් පිරිවැයට ආදේශනයෙන් භෞතික ක්ෂයවීම් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප සඳහා අඩු කිරීමෙන් වත්මන් පිරිවැය ගණනය කරනු ලබයි.<br><br>තවද, බදු පදනම මත ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, අදාළ සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී පාදක කරගත් දේපළ "සින්නක්කර පදනම" ලෙස සලකනු ලැබේ. මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ පාදක කරගත් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික වැදගත්කමක් සහිත අදාළ කල්බදු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවට කළමනාකාරිත්වය විසින් සිදු කරන තක්සේරුව මතය. | 2023 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 850 - රු. 15,000 අදාළ ඉඩම් බදු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ කළමනාකාරීත්වයේ තක්සේරුව | 3,804.48 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණන වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| **පරිපාලිතය** | | | | | | |
| ගොඩනැගිලි - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය**<br>මෙම ක්‍රමය මගින් වත්කමක් එහි සමාන වත්මන් පිරිවැයට ආදේශනයෙන් භෞතික ක්ෂයවීම් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප සඳහා අඩු කිරීමෙන් වත්මන් පිරිවැය ගණනය කරනු ලබයි.<br><br>තවද, බදු පදනම මත ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, අදාළ සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී පාදක කරගත් දේපළ "සින්නක්කර පදනම" ලෙස සලකනු ලැබේ. මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ පාදක කරගත් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික වැදගත්කමක් සහිත අදාළ කල්බදු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවට කළමනාකාරිත්වය විසින් සිදු කරන තක්සේරුව මතය. | 2023 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 4,000 - රු. 12,000 අදාළ ඉඩම් බදු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ කළමනාකාරිත්වයේ තක්සේරුව | 1,762.70 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කළ ගුවන් සේවා මුළුතැන්ගෙයි උපකරණ - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය**<br>මෙම ක්‍රමය මගින් වත්කමක් එහි සමාන වත්මන් පිරිවැයට ආදේශනයෙන් භෞතික ක්ෂයවීම් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප සඳහා අඩු කිරීමෙන් වත්මන් පිරිවැය ගණනය කරනු ලබයි. | 2023 මාර්තු 31 | එක් එක් උපකරණය සඳහා ශුද්ධ ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමවේදය (NRC) යොදා ගනිමින් සාධාරණ අගය ගණනය කෙරිණි. | 2,532.03 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |

ක්ෂයවීම් අඩු කරන ලද පිරිවැය යටතේ වත්කම් ධාරණය කළේ නම්, මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කළ හැකිව තිබූ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | පිරිවැය රු. මිලියන | වත්කම පිරිවැය අනුව ධාරණය කරනු ලැබුවේ නම් සමුච්චිත ක්ෂය රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2025 රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2024 රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 3,101.56 | 2,623.60 | 477.96 | 365.29 |
| පිරියත සහ උපකරණ | 2,669.39 | 2,510.24 | 159.15 | 139.48 |

(ආ) වසර තුළ, සමූහය විසින් රුපියල් මිලියන 1,951.79ක (2024 රුපියල් මිලියන 1,669.77) සමස්ත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිණි. වසර තුළ, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා රුපියල් මිලියන 2,054.85 ක (2024 රුපියල් මිලියන 1,422.01) වටිනාකමකින් යුතු මුදල් ගෙවීම් සිදු කරන ලදී.

(ඇ) සමූහයේ සහ සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 16,315.31ක ශුද්ධ ධාරණ වටිනාකමකින් යුතු (2024 රුපියල් මිලියන 15,765.48) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්ද ඇතුළත් වේ.

(ඈ) බැංකු පහසුකම් සඳහා උකස් කරන ලද දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොමැත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 3. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

### 3.3 සමාගම

| | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | පිරියත සහ උපකරණ රු. මිලියන | කල්බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම් රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ රු. මිලියන | අත්තිකාරම්/ ප්‍රාග්ධන නොනිමි වැඩ රු. මිලියන | එකතුව 2025 රු. මිලියන | එකතුව 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය/ප්‍රත්‍යාගණනය | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 4,614.74 | 9,263.01 | 572.15 | 11,525.00 | 0.27 | 25,975.17 | 26,099.01 |
| අත්පත් කරගැනීම්/නවීකරණයන්/වැඩිදියුණු කිරීම්/පැවරුම් | - | 910.24 | - | 956.52 | (0.27) | 1,866.49 | 1,626.83 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (17.74) | - | (79.70) | - | (97.44) | (1,750.67) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 4,614.74 | 10,155.51 | 572.15 | 12,401.82 | - | 27,744.22 | 25,975.17 |
| | | | | | | | |
| **සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 347.32 | 8,204.77 | 548.25 | 9,404.22 | - | 18,504.56 | 18,934.11 |
| වසර සඳහා අයකිරීම | 253.31 | 367.83 | 7.36 | 484.44 | - | 1,112.94 | 1,014.77 |
| **බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම්** | - | (17.74) | - | (79.70) | - | (97.44) | (1,444.32) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 600.63 | 8,554.86 | 555.61 | 9,808.96 | - | 19,520.06 | 18,504.56 |
| | | | | | | | |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 4,014.11 | 1,600.65 | 16.54 | 2,592.86 | - | 8,224.16 | 7,470.61 |

**3.4 (අ)** 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ ස්වාධීන තක්සේරුකරුවෙකු වන රන්ජන් ජේ. සමරකෝන් මහතා (A.I.V. ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් සිදු කරන ලද නැවත තක්සේරුවක් මගින් සමාගමේ ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම තීරණය කරන ලදී. එවැනි නැවත තක්සේරුවක ප්‍රතිඵල 2023 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත.

තක්සේරුකරණයේදී ප්‍රකාශිත සමාගමේ ඉඩම්, ගොඩනැගිලි පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණනවල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොළ අගය**<br>නැවත අගය කළ දේපළ සමාන දේපළවල සාධාරණ අගය තීරණය කිරීමේදී, සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළ විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මගින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ, ස්වාභාවයේ සහ පිහිටීමේ වෙනස අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොළෙහි සමාන වත්කම් ඇගයීම පාදක කරගනී. | 2023 මාර්තු 31 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 20 | 715.00 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ/ කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය**<br>මෙම ක්‍රමය මගින් වත්කමක් එහි සමාන වත්මන් පිරිවැයට ආදේශ කිරීමෙන් භෞතික ක්ෂයවීම් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප සඳහා අඩු කිරීමෙන් වත්මන් පිරිවැය ගණනය කරනු ලබයි.<br><br>තවද, බදු පදනම මත ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, අදාළ සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී පාදක කරගත් දේපළ "සින්නක්කර පදනම" ලෙස සලකනු ලැබේ. මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ පාදක කරගත් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික වැදගත්කමක් සහිත අදාළ කල්බදු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවට කළමනාකාරිත්වය විසින් සිදු කරන තක්සේරුව මතය. | 2023 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 850 - රු. 15,000 අදාළ ඉඩම් බදු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ කළමනා-කාරිත්වයේ තක්සේරුව | 3,804.48 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |

ක්ෂයවීම් අඩු කරන ලද පිරිවැය යටතේ වත්කම් ධාරණය කළේ නම්, මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කළ හැකිව තිබූ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | පිරිවැය රු. මිලියන | වත්කම පිරිවැය අනුව ධාරණය කරනු ලැබුවේ නම් සමුච්චිත ක්ෂය රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2025 රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2024 රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 1,246.74 | 1,046.80 | 199.94 | 237.10 |

(ආ) වසර තුළ, සමාගම විසින් රුපියල් මිලියන 1,866.49ක (2024 - රුපියල් මිලියන 1,626.83) සමස්ත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිණි. වසර තුළ, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා රුපියල් මිලියන 1,969.55ක (2024- රුපියල් මිලියන 1,355.53) වටිනාකමකින් යුතු මුදල් ගෙවීම් සිදු කරන ලදී.

(ඇ)සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 16,315.31ක ශුද්ධ ධාරණ වටිනාකමකින් යුතු (2024- රුපියල් මිලියන 15,765.48) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් වේ.

(ඈ)බැංකු පහසුකම් සඳහා උකස් කරන ලද දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොමැත.

## 4. වත්කම් භාවිතයේ හිමිකම්

### 4.1 වත්කම් භාවිතයේ හිමිකම්හි සංචලනය

| සමූහය | ගුවන්යානා අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | රථවාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2025 රු. මිලියන | එකතුව 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 132,036.66 | 4,180.85 | 180.79 | 5,875.64 | 142,273.94 | 132,110.62 |
| එකතු කිරීම් | 4,355.96 | 140.87 | 62.49 | - | 4,559.32 | 17,298.76 |
| බැහැර කිරීම් | (849.90) | - | (9.04) | - | (858.94) | (7,069.85) |
| ගැළපීම් | - | - | - | - | - | (65.57) |
| මාර්තු 31 දිනට ශේෂය | 135,542.72 | 4,321.72 | 234.24 | 5,875.64 | 145,974.32 | 142,273.94 |
| | | | | | | |
| **ක්ෂයවීම** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 62,763.93 | 1,728.98 | 98.12 | 2,834.77 | 67,425.80 | 61,613.75 |
| ක්ෂයවීම | 13,636.07 | 509.71 | 67.53 | 396.64 | 14,609.95 | 12,881.17 |
| බැහැර කිරීම් | (849.90) | - | (3.37) | - | (853.27) | (7,069.12) |
| මාර්තු 31 දිනට ශේෂය | 75,550.10 | 2,238.69 | 162.28 | 3,231.41 | 81,182.48 | 67,425.80 |
| | | | | | | |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 59,992.62 | 2,083.03 | 71.96 | 2,644.23 | 64,791.84 | 74,848.14 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

| සමාගම | ගුවන්යානා අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | රථවාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2025 රු. මිලියන | එකතුව 2024 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 132,036.66 | 3,488.57 | 180.79 | 5,875.64 | 141,581.66 | 131,488.40 |
| එකතු කිරීම් | 4,355.96 | 140.86 | 62.49 | - | 4,559.31 | 17,226.84 |
| බැහැර කිරීම් | (849.90) | - | (9.04) | - | (858.94) | (7,069.85) |
| ගැළපීම් | - | - | - | - | - | (63.73) |
| මාර්තු 31 දිනට ශේෂය | 135,542.72 | 3,629.43 | 234.24 | 5,875.64 | 145,282.03 | 141,581.66 |
| **ක්ෂයවීම** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 62,763.93 | 1,236.75 | 98.12 | 2,834.77 | 66,933.57 | 61,167.71 |
| ක්ෂයවීම | 13,636.07 | 447.29 | 67.53 | 396.64 | 14,547.53 | 12,834.97 |
| බැහැර කිරීම් | (849.90) | - | (3.37) | - | (853.27) | (7,069.12) |
| මාර්තු 31 දිනට ශේෂය | 75,550.10 | 1,684.04 | 162.28 | 3,231.41 | 80,627.83 | 66,933.56 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 59,992.62 | 1,945.39 | 71.96 | 2,644.23 | 64,654.20 | 74,648.10 |

**කෙටි කාලීන කල්බදු**

සමූහය මඟින් මාස 12 ක් හෝ එයට අඩු කල්බදු කාලසීමා සහිත ගුවන් යානා, ඉඩම් හා ගොඩනැගිලි සහ රථවාහන සම්බන්ධ කෙටි කාලීන කල්බදු සඳහා වත්කම් භාවිතයේ හිමිකම් හා කල්බදු වගකීම් හඳුනානොගැනීමට තීරණය කෙරිණි. සමූහය මඟින් මෙම කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| කල්බදු ගුවන්යානා මත කුලී ගෙවීම්/අමතර එන්ජින් | 3,555.58 | 10,722.70 | 3,555.58 | 10,722.70 |
| ඉඩම් හා ගොඩනැගිලි මත කුලී ගෙවීම් | 156.21 | 121.39 | 156.21 | 121.39 |
| රථවාහන මත කුලී ගෙවීම් | 87.41 | 101.68 | 87.41 | 101.68 |

**අඩු වටිනාකමකින් යුතු වත්කම්**

සමූහය මඟින් අඩු වටිනාකමකින් යුතු වත්කම් සඳහා වත්කම් භාවිතයේ හිමිකම් හා කල්බදු වගකීම් හඳුනා නොගැනීමට තීරණය කෙරිණි. සමූහය මඟින් මෙම කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

### 5. ගුවන්යානා පූර්ව ගෙවීම්

2025 මාර්තු 31 දිනට ගුවන්යානා ලබාගැනීම සඳහා වන පූර්ව ගෙවීම් (PDPs) සමන්විත වන්නේ එයාර්බස් A350-900 ගුවන් යානා හතරක් සඳහා සිදු කරන ලද රුපියල් මිලියන 5,692.34 (ඇ.ඩො. මිලියන 19.21) ක පූර්ව ගෙවීම්වලින් වන අතර එම ගුවන්යානා 2020 සහ 2021 දී ලබා දීමට නියමිතව තිබිණි.

සැපයුම්කරු සමඟ ඇතිකර ගත් ගිවිසුමේ දක්වා ඇති පරිදි ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය හරහා ඉහත මුදල අයකර ගැනීම සඳහා සමාගම විසින් අලාභ හානි සමඟ හිමිකම් පෑමක් කර ඇත. අදාළ මුදල අයකර ගැනීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ ගරු නීතිපතිවරයා සහ සමාගම විසින් පත් කරන ලද එක්සත් රාජධානියේ සොලිසිටර්වරුන්ගේ උපදෙස් මත සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය සඳහා වසරකට වැඩි කාලයක කාල නියමයක් සඳහා පාර්ශ්වයන් විසින් එකඟත්වය පළ කොට ඇත. ඒ අනුව අදාළ ශේෂය ජංගම නොවන ශේෂයක් ලෙස වර්ගීකරණය කර ඇත.

ගුවන්යානා ලබා ගැනීම සඳහා වන පූර්ව ගෙවීම් අයකර ගැනීමෙන් ඇතිවන ප්‍රතිඵලය සමාගමට අවාසිදායක විය හැකි බවට විශ්වාස කිරීමට මේ මොහොතේ සමාගමට තොරතුරු නොමැත.

LKAS 37 හි 92 ඡේදයට අනුකූලව, රහස්‍යභාවය සුරැකිය යුතු තොරතුරු සැපයීම සඳහා වන ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයේ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව අපට සීමා පැනවී ඇත.

### 6. ගුවන්යානා නඩත්තු සංචිතය

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | 2025<br>රු. මිලියන | 2024<br>රු. මිලියන |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 79,240.94 | 97,765.31 |
| එකතු කිරීම් | 17,368.95 | 19,484.59 |
| නැවත භාරදීම හා හිලව් කළ මුදල | (7,621.26) | (22,842.86) |
| අයකර ගැනීම් | (6,240.45) | (6,597.94) |
| විනිමය ලාභය/(අලාභය) | (1,167.11) | (8,568.18) |
| | 81,581.07 | 79,240.94 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදන (සටහන 6.2) | (23,086.96) | (24,683.38) |
| **මාර්තු 31 දිනට අයකර ගත හැකි ශුද්ධ ශේෂය (සටහන 6.1)** | 58,494.11 | 54,557.56 |

#### 6.1 ජංගම / ජංගම නොවන වර්ගීකරණය

| | දළ<br>රු. මිලියන | හානිකරණය සඳහා වෙන්කිරීම<br>රු. මිලියන | ශුද්ධ<br>රු. මිලියන | එක් වසරක් ඇතුළත අයකර ගත හැකි මුදල<br>රු. මිලියන | වසරකට පසු අයකර ගත හැකි මුදල<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| 2025 මාර්තු 31 දිනට ශේෂය | 81,581.07 | (23,086.96) | 58,494.11 | 11,928.75 | 46,565.36 |
| 2024 මාර්තු 31 දිනට ශේෂය | 79,240.94 | (24,683.38) | 54,557.56 | 17,168.29 | 37,389.27 |

#### 6.2 හානිකරණය සඳහා ප්‍රතිපාදන සංචලනය

| | 2025<br>රු. මිලියන | 2024<br>රු. මිලියන |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 24,683.38 | 35,791.70 |
| වසර තුළදී අයකරන ලද | 6,159.76 | 11,878.14 |
| නැවත භාරදීම මත හිලව් කළ මුදල | (7,621.26) | (22,842.86) |
| ගැළපුම්* | 186.49 | 3,481.06 |
| විනිමය (ලාභය)/අලාභය | (321.41) | (3,624.66) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 23,086.96 | 24,683.38 |

*ගැළපුම් මගින් විවිධ ගුවන්යානා අලුත්වැඩියා කටයුතුවල සැලසුමෙහි හෝ විෂයපථයෙහි වෙනස්වීම් හේතුවෙන් නඩත්තු සංචිත හා අනාගත ගුවන්යානා නඩත්තු හා අලුත්වැඩියා ප්‍රතිපාදන අතර මාරුකිරීම් නියෝජනය වේ. අදාළ ගැළපුම, ඉදිරි ගුවන්යානා නඩත්තු සහ අලුත්වැඩියා ගාස්තුවල ප්‍රතිපාදන වශයෙන් සටහන 16 හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 7. ගුවන් යානා සහ අතිරේක එන්ජින් සඳහා තැන්පතු

### 7.1 (අ) සංචලනය

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 8,967.60 | 8,060.46 |
| එකතු කිරීම් | 469.30 | 1,501.93 |
| අභිවෘද්ධි බලපෑම | 435.94 | 411.19 |
| අයකර ගැනීම් | (1,469.31) | (345.14) |
| විනිමය ලාභය/(අලාභය) | (68.40) | (660.84) |
| | 8,335.13 | 8,967.60 |

### (ආ). ජංගම/ජංගම නොවන වර්ගීකරණය

| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
|---|---|---|
| වසර තුළ අයකර ගත හැකි | 1,620.41 | 2,838.31 |
| වසරකට පසු අයකර ගත හැකි | 6,714.72 | 6,129.29 |
| | 8,335.13 | 8,967.60 |

## 8. අස්පෘශ්‍ය වත්කම්

| | සමූහය | | | | සමාගම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෘදුකාංග රු. මිලියන | නොනිමි ප්‍රාග්ධන රු. මිලියන | එකතුව 2025 රු. මිලියන | එකතුව 2024 රු. මිලියන | මෘදුකාංග රු. මිලියන | නොනිමි ප්‍රාග්ධන රු. මිලියන | එකතුව 2025 රු. මිලියන | එකතුව 2024 රු. මිලියන |
| **පිරිවැය** | | | | | | | | |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 1,230.66 | 2.60 | 1,233.26 | 1,559.75 | 1,130.17 | 2.60 | 1,132.77 | 1,459.26 |
| අත්පත් කරගැනීම් / නවීකරණයන් / වැඩිදියුණු කිරීම් | 31.63 | - | 31.63 | 5.48 | 31.00 | - | 31.00 | 5.48 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | - | - | (265.14) | - | - | - | (265.14) |
| මාරු කිරීම් / ගැලපීම් | - | - | - | (66.83) | - | - | - | (66.83) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 1,262.29 | 2.60 | 1,264.89 | 1,233.26 | 1,161.17 | 2.60 | 1,163.77 | 1,132.77 |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | | | | | | |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 1,181.32 | - | 1,181.32 | 1,423.95 | 1,087.95 | - | 1,087.95 | 1,333.54 |
| වසර සඳහා ගාස්තුව | 22.05 | - | 22.05 | 22.51 | 19.27 | - | 19.27 | 19.55 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | - | - | (265.14) | - | - | - | (265.14) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 1,203.37 | - | 1,203.37 | 1,181.32 | 1,107.22 | - | 1,107.22 | 1,087.95 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 58.92 | 2.60 | 61.52 | 51.94 | 53.95 | 2.60 | 56.55 | 44.82 |

වාර්තාකරණ දින වන විට සමූහයේ සහ සමාගමෙහි අස්පෘශ්‍ය වත්කම් අතරට, පිළිවෙළින් රුපියල් මිලියන 1,145.07 ක් සහ රුපියල් මිලියන 1,058.43 දළ ධාරණ අගයකින් යුතු (2024 - රුපියල් මිලියන 1,119.76 සහ රුපියල් මිලියන 1,037.04) පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය වූ වත්කම් ඇතුළත් විය.

## 9. ආයෝජන

### 9.1 ජංගම නොවන ආයෝජන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| **ශ්‍රීලංකාවේ පරිපාලිතය තුළ ආයෝජන** | | | | |
| සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් (කොටස් 940,268,456 හිමිකම් 100%) | - | - | 42.24 | 42.24 |
| එයාර්ලංකා (පුද්ගලික) සමාගම (කොටස් 40,000)* | 0.40 | 0.40 | 0.20 | 0.20 |
| | 0.40 | 0.40 | 42.44 | 42.44 |

*එයාර්ලංකා (පුද්ගලික) සමාගමෙහි කොටස් ප්‍රාග්ධනයෙන් 50% ක් සමාගම මගින් දරනු ලබන අතර ඉතිරි 50% පරිපාලිත සමාගම මගින් දරනු ලැබේ.
එයාර්ලංකා (පුද්ගලික) සමාගම ආරම්භයේ සිටම අක්‍රීය සමාගමක් වන අතර ප්‍රමාණාත්මකභාවය හේතුවෙන් එය ඒකාබද්ධ කර නොමැත.

### 9.2 ජංගම ආයෝජන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| බැංකුවේ ස්ථාවර තැන්පතු | 2,390.13 | 2,508.42 | 1,641.66 | 1,715.99 |

කල්බදු ලබා දෙන්නන් වෙත නිකුත් කරන ලද ණයවර ලිපි සඳහා මෙය ආරක්ෂණයක් ලෙස බැංකුවේ සමාගමේ ස්ථාවර තැන්පතුවක් තබා ඇත.

## 10. තොග

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| ඉංජිනේරු කටයුතු ආශ්‍රිත තොග | 8,740.08 | 8,622.79 | 8,740.08 | 8,622.79 |
| භූමි සේවා ආශ්‍රිත තොග | 857.76 | 686.65 | 857.76 | 686.65 |
| අමුද්‍රව්‍ය හා පරිභෝජනය කළ හැකි දෑ | 1,757.87 | 1,780.74 | 1,023.09 | 1,150.62 |
| | 11,355.71 | 11,090.18 | 10,620.93 | 10,460.06 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන (සටහන 10.1) | (3,915.99) | (3,597.03) | (3,796.08) | (3,476.42) |
| | 7,439.72 | 7,493.15 | 6,824.85 | 6,983.64 |

තොගයේ පිරිවැය, සමූහයට හා සමාගමට පිළිවෙළින් රුපියල් මිලියන 9,682.89ක් සහ රුපියල් මිලියන 6,413.62ක් වශයෙන් ලාභය හෝ අලාභය තුළ වියදමක් ලෙස හඳුනාගැනේ. (2024-රුපියල් මිලියන 11,009.10 සහ රුපියල් මිලියන 7,638.53).

### 10.1 මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා සමාගම | රජයට අයත් | ගොඩබෑම්, ගුවන් පාලම්, මඟී විවේකාගාර, කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු ආදිය | (5,161.49) | (4,179.17) | (3,667.87) | (1,531.65) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයේ පාලනයට අයත් | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (21,449.90) | (23,219.81) | (26,286.53) | (12,822.88) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.58 | 0.58 | 1,013.40 | 1,013.40 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (1,420.20) | (1,646.27) | - | - |
| ලංකා බැංකුව* | රජයට අයත් | ණය | - | - | (44,006.25) | (44,452.50) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 115.94 | 2,921.65 |
| | | බැංකු අයිරා | - | - | (20,182.99) | (20,851.14) |
| | | පොලිය | (7,471.92) | (8,424.95) | - | - |
| මහජන බැංකුව* | රජයට අයත් | ණය | - | - | (47,308.98) | (47,756.86) |
| | | කෙටි කාලීන තැන්පත | - | - | 1.44 | 0.87 |
| | | බැංකු අයිරා | - | - | (2,620.09) | (2,638.77) |
| | | පොලිය | (6,458.06) | (8,162.88) | - | - |

වාර්තාකරණ දිනය වනවිට, සමූහය විසින් ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 2,891.38 (2024 - රුපියල් මිලියන 2,416.71) බැංකු ඇපකර පහසුකම් භාවිත කර තිබේ.

*සමාගම වෙනුවෙන් ලබාදී ඇති රජයේ ඇපකර සහ සහන ලිපි පිළිබඳව වැඩිදුර විස්තර සඳහා සටහන 15.3 බලන්න.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරන ආයතන සමඟ පවතින/ තිබෙන ශේෂයන් පිළිබඳ මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු සහ පොලී දරන වගකීම් යටතේ ඇතුළත් වේ.

වාර්තාකරණ දිනය වනවිට, ආශ්‍රිත පාර්ශ්වයන්ට අදාළ හානිකරණ සඳහා සමූහය සහ සමාගම විසින් පිළිවෙලින් රුපියල් මිලියන 1,222.12ක් සහ රුපියල් මිලියන 1,120.89ක් වෙන් කොට තිබේ : (2024- සමූහය සඳහා රුපියල් මිලියන 1,240.04ක් සහ සමාගම සඳහා රුපියල් මිලියන 1,136.36කි).

සියලුම රාජ්‍ය පාලිත/ආශ්‍රිත ආයතන සමඟ ඇති ගනුදෙනු සඳහා LKAS 24 - 'ආශ්‍රිත පාර්ශ්ව හෙළි කිරීම' හි පවතින නිදහස් කිරීම් යොදා ගනිමින් සීමිත හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)

### 28.3 සමාගම

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ශ්‍රී ලංකා රජය (GOSL) විසින් පාලනය කරනු ලබන පරිපාලිතය සහ ආයතන සමඟ පහත දැක්වෙන කරුණු ඇතුළුව සැලකිය යුතු ගනුදෙනු සිදු කර ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනුවල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2025 රු. මිලියන | 2024 රු. මිලියන | 2025 රු. මිලියන | 2024 රු. මිලියන |
| සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම | පරිපාලිතය | භාණ්ඩ ප්‍රවාහන | 524.64 | 305.04 | (20,062.41) | (14,360.25) |
| | | සේවායානාස්ථ ආහාරපාන සැපයීම සහ වෙනත් සේවා | (7,932.07) | (10,788.47) | - | - |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (50,565.31) | (63,602.94) | 172.81 | 682.27 |
| සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා සමාගම | රජයට අයත් | ගොඩබෑම්, ගුවන් පාලම්, මගී විවේකාගාර, කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු ආදිය | (6,313.15) | (5,336.61) | (3,864.03) | (1,693.99) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයේ පාලනයට අයත් | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (21,449.90) | (23,219.81) | (26,286.53) | (12,822.88) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.58 | 0.58 | 1,013.40 | 1,013.40 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (1,420.20) | (1,646.27) | - | - |
| ලංකා බැංකුව* | රජයට අයත් | ණය | - | - | (44,006.25) | (44,452.50) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 115.94 | 2,921.65 |
| | | පොලිය | (7,471.92) | (8,424.95) | - | - |
| | | බැංකු අයිරා | | | (20,182.99) | (20,851.14) |
| මහජන බැංකුව* | රජයට අයත් | ණය | - | - | (47,308.98) | (47,756.86) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 1.44 | 0.87 |
| | | පොලිය | (6,458.06) | (8,162.88) | - | - |
| | | බැංකු අයිරා | - | - | (2,620.09) | (2,638.77) |

වාර්තාකරණ දිනය වනවිට, සමාගම විසින් ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 2,863.93 (2024 - රුපියල් මිලියන 2,389.25) බැංකු ඇපකර පහසුකම් භාවිත කර තිබේ.

*සමාගම වෙනුවෙන් ලබාදී ඇති රජයේ ඇපකර සහ සහන ලිපි පිළිබඳව වැඩිදුර විස්තර සඳහා සටහන 15.3 බලන්න.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරන ආයතන සමඟ පවතින/ තිබෙන ශේෂයන් පිළිබඳ මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු සහ පොලී දරන වගකීම් යටතේ ඇතුළත් වේ.

වාර්තාකරණ දිනය වනවිට, ආශ්‍රිත පාර්ශවයන්ට අදාළ හානිකරණ සඳහා රුපියල් මිලියන 1,120.89ක් වෙන් කොට තිබේ (2024- රුපියල් මිලියන 1,137.36ක්).

සියලුම රාජ්‍ය පාලිත/ආශ්‍රිත ආයතන සමඟ ඇති ගනුදෙනු සඳහා LKAS 24 - 'ආශ්‍රිත පාර්ශ්ව හෙළි කිරීම' හි පවතින නිදහස් කිරීම් යොදා ගනිමින් සීමිත හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය සහ ණය ගැනීම්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම්වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ මෙහෙයුම් සඳහා මූල්‍ය සම්පාදනයයි. සමූහයේ මූල්‍ය වත්කම් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ එහි මෙහෙයුම්වලින් ඍජුව ලබාගත් මුදල් සහ කෙටි කාලීන තැන්පතුවලිනි.

ආයතනික කළමනාකාරිත්වය විසින් වරින් වර, පුළුල් අවදානම් කළමනාකරණ අනුකෘතිය විමර්ශනය කර යාවත්කාලීන කරන අතර, සැලකිය යුතු බලපෑමක් ඇති පහත සඳහන් මූල්‍ය අවදානම් හඳුනාගෙන ඇත.

(i) වෙළඳපොළ අවදානම
- පොලී අනුපාත අවදානම
- විනිමය අවදානම

(ii) ද්‍රවශීලතා අවදානම
(iii) ණය අවදානම

වෙළඳපොළ වෙනස්වීම් සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු වන පරිදි සමූහය සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර, මේවා නියම කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අවදානම් හඳුනාගෙන මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කරලීමට යෝග්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මඟින් පාලනය කරනු ලබයි.

(i) වෙළඳපොළ අවදානම

**පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතවල වෙනස් වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම සඳහා මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමූහයේ දිගු කාලීන ණය බැඳීම් අදාළ වේ.

පොලී අනුපාත උච්චාවචනයන්හි බලපෑම අවම කිරීම සඳහා ගුවන් යානා කල්බදු ඇතුළු ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය ගැනීම් අතර ප්‍රශස්ත සමබරතාවයක් පවත්වා ගැනීම සමූහයේ ප්‍රතිපත්තියයි.

ණය සහ ණය ගැනීම් සඳහා පොලී අනුපාතවල සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පහත වගුව මඟින් ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විචල්‍යයන් නියතව පැවතුනහොත්, පහත සඳහන් පරිදි පාවෙන අනුපාත ණය ගැනීම් සඳහා වන බලපෑම මඟින් බදුවලට පෙර සමූහයේ/සමාගමේ අලාභයට බලපානු ඇත.

| | බදුවලට පෙර ලාභය/(අලාභය) මත බලපෑම | | | |
|---|---|---|---|---|
| | 2025 | | 2024 | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| පොලී අනුපාත ඉහළයාම/(පහළයාම) | | | | |
| +1% | 915.91 | 915.91 | 922.09 | 922.09 |

*පොලී අනුපාත ඉහළ යාම අලාභ ඉහළයාම කෙරෙහි හේතු වේ.

බැංකු වලින් ලබාගත් ණය පහසුකම් සඳහා වන පොලී අනුපාතය අවම පොලී අනුපාතයට යටත්ව ලබාගන්නා ලදී. ඒ අනුව පොලී අනුපාතය අවම පොලී අනුපාතයට වඩා අඩුවන්නේ නම් ඉහත සංවේදීතාවයන් අදාළ නොවිය හැක.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

**විදේශ විනිමය අවදානම**

විදේශ විනිමය අවදානම යනු විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. සමූහය විසින් එහි විදේශ මුදල් ඒකක මඟින් ආදායම, වියදම්, ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය උපකරණ නියම කර ඇති බැවින් විදේශ විනිමය අනුපාතයේ උච්චාවචනයන්හි බලපෑමට නිරාවරණය වී ඇත.

සමූහය සිය විදේශ විනිමය නිරාවරණය කළමනාකරණය කරනුයේ රිසිට්පත් තැබීම සහ ගෙවීම හැකිතාක් දුරට අදාළ මුදල් ඒකකවලින්ම ගැළපීමේ ප්‍රතිපත්තියක් මඟිනි.

පහත දැක්වෙන වගුව මඟින් සමූහයේ/ සමාගමේ බදුවලට පෙර අලාභයේ (වාර්තා කරන දිනය වන විට මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී වාර්තා වී ඇති හිඟ මුදල් වත්කම් සහ වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන්) ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල වෙනස් විය හැකි සංවේදීතාව පෙන්නුම් කරන අතර, සෙසු සියලුම විචල්‍යයන් නියතව පවතී. අනෙකුත් සියලුම මුදල් සඳහා සමූහයේ විදේශ මුදල් වෙනස්වීම්වලට නිරාවරණය වීම, ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරයි.

| | බදුවලට පෙර ලාභය/(අලාභය) මත බලපෑම | | | |
|---|---|---|---|---|
| | 2025 | | 2024 | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| ඇමරිකානු ඩොලරයට එරෙහිව රුපියලයේ අගය ඉහළයාම/(පහළයාම) | | | | |
| +1% | 3,837.84 | 3,837.84 | 4,045.01 | 4,033.27 |
| -1% | (3,837.84) | (3,837.84) | (4,045.01) | (4,033.27) |

* ඇමරිකානු ඩොලරයේ අගය ඉහළ යාම, අලාභ ඉහළ යාම කෙරෙහි හේතු වේ.

ඇමරිකානු ඩොලර් වලින් ගණනය කරන ලද වත්කම් සහ වගකීම්, 2025 මාර්තු 31 දිනට වන ශ්‍රී ලංකා රුපියල් 296.25ක්වූ විනිමය අනුපාතයට පරිවර්තනය කරන ලදී (2024 රුපියල් 300.50).

**(ii)** ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු සමූහයට එහි වර්තමාන සහ අනාගත මුදල් බැඳීම් නියමිත පරිදි සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. සමූහය විසින් දෛනික/සතිපතා/මාසික සහ වාර්ෂික මුදල් කළමනාකරණ සහ අයවැයකරණ ක්‍රියාවලියක් භාවිත කරමින් අරමුදල් හිඟවීමේ අවදානම පිළිබඳ අධීක්ෂණය කරයි. අවදානම අවම කිරීම සඳහා දිගු කාලීන සහ කෙටි කාලීන ණය, බැංකු අයිරා පහසුකම්, සැපයුම්කරු මූල්‍යකරණය, කල්බදු ඇතුළු මූල්‍ය ආයතනවලින් අරමුදල් ලබා ගැනීම සඳහා සමූහය විසින් කටයුතු කරනු ලැබේ.

පහත වගුව මඟින් ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව සමූහයේ/සමාගමේ මූල්‍ය වගකීම්වල කල්පිරීම් පිළිබඳ විස්තර සාරාංශ කොට දැක්වේ.

| | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2025 | ඉල්ලීම මත රු. මිලියන | මාස 3 ට අඩු රු. මිලියන | මාස 3 සිට මාස 12 දක්වා රු. මිලියන | වසර 2 සිට 5 දක්වා රු. මිලියන | වසර 5 ට වැඩි රු. මිලියන | එකතුව රු. මිලියන | ධාරණ අගය රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 22,844.83 | 62,677.04 | 96,581.56 | 6,248.18 | - | 188,351.61 | 188,351.61 |
| කල්බදු වගකීම | 13,752.61 | 9,420.41 | 28,741.60 | 110,394.27 | 2,407.78 | 164,716.67 | 142,578.18 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 11,311.14 | 756.43 | 7,482.79 | 47,822.90 | 15.96 | 67,389.22 | 67,389.22 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 2,143.82 | 706.68 | - | 3,957.45 | 2,551.31 | 9,359.26 | 9,359.26 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 100,998.28 | - | - | - | 100,998.28 | 100,998.28 |
| | 50,052.40 | 174,558.84 | 132,805.95 | 168,422.80 | 4,975.05 | 530,815.04 | 508,676.55 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 22,803.08 | 62,677.04 | 96,581.56 | 6,248.18 | - | 188,309.86 | 188,309.86 |
| කල්බදු වගකීම | 13,752.61 | 9,420.41 | 27,986.74 | 108,234.26 | 2,407.78 | 161,801.80 | 142,020.80 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 11,311.14 | 756.43 | 7,482.79 | 47,822.90 | 15.96 | 67,389.22 | 67,389.22 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 2,143.82 | 706.68 | - | 3,957.45 | 2,551.31 | 9,359.26 | 9,359.26 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 119,793.62 | - | - | - | 119,793.62 | 119,793.62 |
| | 50,010.65 | 193,354.18 | 132,051.09 | 166,262.79 | 4,975.05 | 546,653.76 | 526,872.76 |

### 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

| | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **2024** | ඉල්ලීම මත | මාස 3 ට අඩු | මාස 3 සිට මාස 12 දක්වා | වසර 2 සිට 5 දක්වා | වසර 5 ට වැඩි | එකතුව | ධාරණ අගය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 23,489.91 | 96,752.50 | 48,868.47 | 8,415.29 | - | 177,526.17 | 177,526.17 |
| කල්බදු වගකීම | 23,218.29 | 9,630.41 | 29,598.25 | 138,409.02 | 9,763.91 | 210,619.88 | 180,058.44 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 10,976.37 | - | 8,698.94 | 40,246.93 | - | 59,922.24 | 59,922.24 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 1,983.32 | - | - | 4,399.54 | 2,196.67 | 8,579.53 | 8,579.53 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 93,419.84 | - | - | - | 93,419.84 | 93,419.84 |
| | 59,667.89 | 199,802.75 | 87,165.66 | 191,470.78 | 11,960.58 | 550,067.66 | 519,506.22 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 23,489.91 | 96,752.50 | 48,868.47 | 8,415.29 | - | 177,526.17 | 177,526.17 |
| කල්බදු වගකීම | 23,218.29 | 9,630.41 | 28,808.47 | 136,009.80 | 9,763.91 | 207,430.88 | 179,293.00 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 10,976.37 | - | 8,698.94 | 40,246.93 | - | 59,922.24 | 59,922.24 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 1,983.32 | - | - | 4,399.54 | 2,196.67 | 8,579.53 | 8,579.53 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 107,648.62 | - | - | - | 107,648.62 | 107,648.62 |
| | 59,667.89 | 214,031.53 | 86,375.88 | 189,071.56 | 11,960.58 | 561,107.44 | 532,969.56 |

**(iii)** ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට තුඩු දෙන මූල්‍ය උපකරණයක් හෝ පාරිභෝගික ගිවිසුමක් යටතේ ප්‍රති පාර්ශ්වයක් විසින් තම වගකීම් ඉටු නොකිරීම නිසා ඇති වන අවදානමයි. සමූහය ප්‍රධාන වශයෙන් ණය අවදානමට නිරාවරණය වන්නේ එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දෑ) හේතුවෙනි.

මගී සහ භාණ්ඩ ප්‍රවාහනය විකිණීම මූලික වශයෙන් IATA අනුමැතිය ලත් විකුණුම් නියෝජිතයින් හරහා සිදු වේ. පුළුල් විවිධාංගීකරණයක් හේතුවෙන් එවැනි විකුණුම්වල ණය අවදානම සාපේක්ෂව අවම වේ. IATA විසින් මෙම නියෝජිතයින් විසින් සිදු කරන ලද පියවීම් ඔවුන්ගේ මගී සහ භාණ්ඩ පියවීම් යෝජනා ක්‍රම හරහා එකතු කරනු ලැබේ. එකතු කරන ලද අරමුදල් IATA විසින් සෘජුවම ගුවන් සමාගම වෙත පියවනු ලබන අතර එමඟින් එවැනි නියෝජිතයින්ගේ ණය සුදුසුකම් පිළිබඳ තවදුරටත් සහතික වීමක් සිදු වේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල් ප්‍රධාන වශයෙන් IATA නිෂ්කාශන ආයතනය හරහා පියවනු ලැබේ. ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ සාමාන්‍යයෙන් ශුද්ධ වටිනාකමක් බවට පත්කොට සතිපතා කාල පරතරයන් මත පියවනු ලබන අතර, එමඟින් පැහැර හැරීමේ අවදානම පැහැදිලි ලෙස අඩු වේ. වෙනත් සේවා සම්බන්ධතා සඳහා, සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ විෂය පථය මත ඇපකරයක් අවශ්‍ය වේ. ණය ගැතියන්ගෙන් ලැබෙන එවැනි ඇපකරයන්ට බැංකු ඇපකර, ආරක්ෂක තැන්පතු සහ වෙනත් යාන්ත්‍රණ ඇතුළත් වේ.

අවදානම් හඳුනාගත් සෑම අවස්ථාවකම ලැබිය යුතු සැක සහිත ගිණුම් සඳහා හානිකරණය සිදු කෙරේ.

**ප්‍රාග්ධන කළමනාකරණය**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 2.1.1හි සවිස්තරාත්මකව දක්වා ඇති සාධක මත පදනම්ව, යෝජිත ප්‍රාග්ධන මුදල් සම්භාරය සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය සමඟ ණය මූල්‍යකරණය සඳහා ස්වෛරී ඇපකර/සහනශීලී ලිපි ලබා දීමෙන් සමූහයට ශ්‍රී ලංකා රජය සිය දායකත්වය ලබා දී ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 30. සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීමේ අරමුණින්, මෙම මූල්‍ය ප්‍රකාශවල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ සහ පොලී දරන වගකීම්වලට අදාළ පහත අයිතම ඉදිරිපත් කිරීමේදී සහ වර්ගීකරණයේදී, වත්මන් වසරේ වර්ගීකරණය සමඟ ගළපා සංශෝධනය කරනු ලැබේ.

| | සමූහය | | |
|---|---|---|---|
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** | කලින් වාර්තා කර ඇති පරිදි රු. මිලියන | නැවත වර්ගීකරණය රු. මිලියන | නැවත වර්ගීකරණයෙන් පසු රු. මිලියන |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 101,597.30 | (6,484.09) | 95,113.21 |
| පොලී දරන වගකීම් | 224,475.86 | 6,792.70 | 231,268.56 |
| ආදායම් බදු වගකීම | 308.61 | (308.61) | - |

| | සමාගම | | |
|---|---|---|---|
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** | කලින් වාර්තා කර ඇති පරිදි රු. මිලියන | නැවත වර්ගීකරණය රු. මිලියන | නැවත වර්ගීකරණයෙන් පසු රු. මිලියන |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 115,826.08 | (6,651.09) | 109,174.99 |
| පොලී දරන වගකීම් | 224,286.29 | 6,792.70 | 231,078.99 |
| ආදායම් බදු වගකීම | 141.61 | (141.61) | - |

ඉහත වර්ගීකරණය මගින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම, කොටසකට ඉපැයීම, මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍යකරණ මූල්‍ය ප්‍රවාහ කෙරෙහි බලපෑමක් ඇති නොකළේය.

# පාරිභාෂික පද මාලාව

### ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය (ASK)

අලෙවිය සඳහා පවතින ආසන ප්‍රමාණය සහ ඒවා ප්‍රවාහනය කරන දුර ප්‍රමාණයේ ගුණිත වේ.

### ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය (ATK)

මෙය ප්‍රවාහන නිෂ්පාදනයෙහි මිනුම වේ. ගුවන් යානාවක් විසින් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණය, ටොන් ප්‍රමාණයෙන් ගුණවීමෙන් ගණනය වන ගුවන් යානාවේ බර සඳහා ධාරිතාවයි.

### ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය (RPK)

ප්‍රවාහනය කළ මගීන් සහ ඔවුන් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණයේ ගුණිතය වේ.

### ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණ (RTK)

ටොන් වලින් ප්‍රවාහනය කළ මගී සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

### පැටවුම් සාධකය

සපයන ලද ධාරිතාවයට පැටවුමේ සබඳතාවය අනුව ප්‍රතිශතය වේ. මගී පැටවුම් සාධකය කෙරෙහි ASK සහ RPK අදාළ වන අතර, සමස්ත පැටවුම් සාධකය කෙරෙහි RTK සහ ATK අදාළ වේ.

### මගී කිලෝමීටරයට ආදායම

මගී ආදායම, ආදයම් මගී කිලෝමීටරයට දක්වන සබඳතාවය වේ.

### ඒකක පිරිවැය

ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (ATK) ගුවන්සේවා මෙහෙයුම්වල මුළු මෙහෙයුම් පිරිවැය ගැළපීමෙන් ඒකක පිරිවැය ගණනය කෙරේ.

### සමස්ත එලදාව

ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (RTK) ශුද්ධ ප්‍රවාහන ආදායම ගැළපීමෙන් සමස්ත එලදාව ගණනය කෙරේ. ශුද්ධ ප්‍රවාහන ආදායම යනු මගී, අතිරේක ගුවන්මලු, ගුවන් භාණ්ඩ හා තැපැල් යන ඒවායේ, වැඩසටහන්ගත හා වැඩසටහන්ගත නොකළ සේවාවල එකතුවයි.

### වියදම් ආවරණය කිරීම සඳහා සමස්ත පැටවුම් සාධකය

ගුවන් සේවා මෙහෙයුම් වලින් ලැබෙන ආදායම, මෙහෙයුම් පිරිවැය සමඟ සමාන කිරීමට අදාළ පැටවුම් සාධකය වේ.

# දස අවුරුදු සමාලෝචනය
## (සමාගම)

| | | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රකාශය** | | | | | |
| ආදායම | රු. මිලි | 129,480.41 | 135,491.19 | 161,433.87 | 180,340.32 |
| මෙහෙයුම් පිරිවැය | රු. මිලි | 137,311.44 | 146,760.80 | 175,883.85 | 206,344.66 |
| ශුද්ධ ලාභය/(අලාභය) | රු. මිලි | (12,621.69) | (28,929.99) | (17,213.57) | (44,022.67) |
| **ශේෂ පත්‍රය** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. මිලි | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 |
| ජංගම නොවන වත්කම් | රු. මිලි | 23,548.01 | 24,660.56 | 37,476.46 | 36,596.59 |
| ජංගම වත්කම් | රු. මිලි | 26,901.02 | 26,973.07 | 30,090.50 | 40,742.41 |
| මුළු වත්කම් | රු. මිලි | 50,449.03 | 51,633.63 | 67,566.96 | 77,338.99 |
| ජංගම වගකීම් | රු. මිලි | 100,334.44 | 126,302.55 | 130,358.61 | 227,081.67 |
| **ප්‍රතිලාභය /ඒකක පිරිවැය** | | | | | |
| සමස්ත ප්‍රතිලාභ | රු. tkm | 79.06 | 80.08 | 84.24 | 91.32 |
| ඒකක පිරිවැය | රු. tkm | 58.72 | 61.61 | 65.74 | 74.31 |
| මගී කි.මී. 1ක ආදායම | රු./RPK | 8.2 | 8.4 | 8.6 | 9.4 |
| **නිෂ්පාදනය** | | | | | |
| මගී ධාරිතාවය | ASK මිලි | 15,790.28 | 15,608.10 | 18,487.54 | 18,925.40 |
| සමස්ත ධාරිතාවය | ATK මිලි | 2,165.21 | 2,167.92 | 2,549.88 | 2,577.53 |
| **ප්‍රවාහනය** | | | | | |
| ප්‍රවාහනය කළ මගීන් | සංඛ්‍යාව දහස් | 4,328 | 4,446 | 5,839 | 5,663 |
| | RPK මිලි | 12,727.66 | 12,455.05 | 15,280.78 | 15,689.19 |
| මගී පැටවුම් සාධකය | % | 80.60 | 79.80 | 82.65 | 82.90 |
| ප්‍රවාහනය කළ භාණ්ඩ | ටොන් | 102,082 | 116,221 | 132,958 | 125,753 |
| | RTK මිලි | 356.76 | 374.46 | 401.66 | 408.71 |
| ප්‍රවාහනය කළ සමස්ත පැටවුම් | RTK මිලි | 1,484.77 | 1,475.29 | 1,749.14 | 1,806.58 |
| සමස්ත පැටවුම් සාධකය | % | 68.57 | 68.05 | 68.60 | 70.09 |
| **කාර්ය මණ්ඩලය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,959 | 7,021 | 7,019 | 6,794 |
| සේවකයෙකුගේ ආදායම | රු. | 18,606,181 | 19,297,991 | 22,999,555 | 26,544,057 |
| සේවකයෙකුගේ ධාරිතාව | ටොන් කි.මී. | 311,139 | 308,776 | 363,283 | 379,383 |
| සේවකයෙකු ප්‍රවාහනය කළ පැටවුම් | ටොන් කි.මී. | 213,359 | 210,126 | 249,201 | 265,908 |
| **සමස්ත ප්‍රවාහන යානා** | | | | | |
| පටු බඳ සහිත | සංඛ්‍යාව | 8 | 11 | 13 | 13 |
| පුළුල් බඳ සහිත | සංඛ්‍යාව | 13 | 13 | 13 | 14 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | 21 | 24 | 26 | 27 |
| ගුවන් යානා භාවිතය | දිනකට පියාසර පැය | 12.02 | 12.44 | 13.25 | 12.60 |

| 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| | | | | | |
| 180,151.02 | 50,693.85 | 132,936.23 | 365,171.77 | 333,614.09 | **296,506.00** |
| 190,321.69 | 81,405.99 | 170,209.86 | 330,568.53 | 312,739.14 | **275,694.95** |
| (47,197.86) | (45,231.46) | (166,369.68) | (73,621.53) | 3,870.86 | **(7,594.56)** |
| | | | | | |
| 51,617.44 | 79,352.43 | 96,360.67 | 96,360.67 | 202,360.67 | **208,649.23** |
| 150,013.50 | 122,471.42 | 122,685.53 | 132,772.81 | 131,498.53 | **131,949.77** |
| 31,176.10 | 31,909.99 | 55,458.64 | 66,681.95 | 62,759.48 | **50,021.32** |
| 181,189.60 | 154,381.41 | 178,144.17 | 199,454.76 | 194,258.01 | **181,971.09** |
| 242,821.23 | 253,218.98 | 358,161.14 | 498,306.50 | 406,890.08 | **418,318.16** |
| | | | | | |
| 99.03 | 146.86 | 147.06 | 253.97 | 220.17 | **199.20** |
| 74.22 | 105.23 | 89.02 | 163.87 | 149.53 | **142.29** |
| 10.2 | 21.8 | 15.0 | 24.4 | 22.2 | **19.2** |
| | | | | | |
| 18,041.41 | 3,816.40 | 10,144.12 | 15,188.00 | 15,425.45 | **14,714.85** |
| 2,454.30 | 794.52 | 1,531.28 | 2,044.45 | 2,072.57 | **1,908.92** |
| | | | | | |
| 5,256 | 167 | 1,468 | 3,484 | 3,619 | **3,466.05** |
| 14,547.97 | 748.13 | 4,968.59 | 11,793.72 | 12,198.65 | **11,571.61** |
| 80.64 | 19.60 | 48.98 | 77.65 | 79.08 | **78.64** |
| | | | | | |
| 113,971 | 56,406 | 97,695 | 80,827 | 84,210 | **83,801** |
| 363.31 | 244.93 | 400.16 | 294.56 | 296.62 | **296.63** |
| 1,664.49 | 312.26 | 847.33 | 1,355.99 | 1,394.50 | **1,338.08** |
| 67.82 | 39.30 | 55.33 | 66.33 | 67.28 | **70.10** |
| | | | | | |
| 6,693 | 5,965 | 5,833 | 5,440 | 5,935 | **6,071** |
| 26,916,333 | 8,498,550 | 22,790,370 | 67,127,164 | 56,211,304 | **48,839,730** |
| 366,697 | 133,196 | 262,520 | 375,819 | 349,211 | **314,432** |
| 248,691 | 52,349 | 145,265 | 249,263 | 234,962 | **220,405** |
| | | | | | |
| 13 | 12 | 12 | 12 | 12 | **13** |
| 12 | 12 | 12 | 11 | 9 | **9** |
| 25 | 24 | 24 | 23 | 21 | **22** |
| | | | | | |
| 12.18 | 2.98 | 7.21 | 10.14 | 11.48 | **12.46** |

# ගුවන් මාර්ග සිතියම

## 117 Destinations in 59 Countries

SriLankan Airlines brings more of the world to you




දැනට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යුරෝපය, මැද පෙරදිග, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග, ඕස්ට්‍රේලියාව සහ උතුරු අමෙරිකාව තුළ රටවල් 59 ක ගමනාන්ත 117 ක් සඳහා සිය සේවය සපයයි.


Helsinki
Oslo
Stockholm
Moscow
Edinburgh
Copenhagen
Manchester
Warsaw
Birmingham
Amsterdam
Dublin
Berlin
Brussels
Düsseldorf
Prague
London
Frankfurt
Vienna
Budapest
Paris
Munich
Geneva
Zurich
Milan
Belgrade
Sofia
Lisbon
Barcelona
Rome
Istanbul
Madrid
Ankara
Heydar Aliyev
Málaga-Costa del Sol
Athens
Casablanca
Larnaca
Tel Aviv
Amman
Kuwait
Dammam
Bahrain
Riyadh
Doha
Dubai
Abu Dhabi
Jeddah
Karachi
Lahore
Amritsar
New Delhi
Lucknow
Kathmandu
Varanasi
Patna
Guwahati
Ahmedabad
Bhubaneswar
Dhaka
Mumbai
Bangalore
Hyderabad
Chennai
Tiruchirappalli
Kochi
Madurai
Trivandrum
Colombo
Malé
Gan Island
Seychelles
Addis Ababa
Nairobi
Tanzania
Victoria Falls
Johannesburg
Cape Town
Chitose*
Seoul
Tokyo (Narita)
Tokyo (Haneda)
Osaka (Itami)
Nagoya
Fukuoka*
Osaka (Kansai)
Guangzhou
Hong Kong
Hanoi
Mandalay
Yangon
Bangkok
Phnom Penh
Ho Chi Minh
Phuket
Langkawi
Penang
Kuala Lumpur
Singapore
Jakarta
Darwin
Brisbane
Perth
Sydney
Adelaide
Melbourne
Auckland

# විශේෂ කඩඉම්

## 2013/2014

එයාර් බස් A330 නියමුවන් පුහුණු කිරීම සඳහා පියාසැරි සිමියුලේටරය දියත් කෙරිණ. සමාගම විසින් 2013 දෙසැම්බර් මාසයේදී මගී සේවා පද්ධතිය ඇමඩියස් ඇල්ටියා (Amadeus Altea) වෙතට මාරු කරන ලදී.

2014 මාර්තු මාසයේදී සමාගම විසින් මධ්‍ය කාලීන මූල්‍යකරණය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 150ක් ලබා ගැනීමට බැංකු සමූහයක් සමඟ මූල්‍යකරණ ගිවිසුමකට එළැඹෙන ලදී.



## 2014/2015

සමාගම විසින් 2014 මැයි මාසයේදී වන්වර්ල්ඩ් එකමුතුව සමඟ ගිවිසුම්වලට එළැඹෙන ලදී. 2014 ජූනි මාසයේදී සමාගම විසින් පළමුවරට පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරය නිකුත් කරන ලදී.

පුළුල් බඳ සහිත ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනේ අංගයක් වශයෙන් සමාගම විසින් පිළිවෙලින් 2014 ඔක්තෝබර් සහ 2015 මාර්තු මාසවලදී නවතම A330 - 300 ගුවන් යානා තුනක් ලබා ගන්නා ලදී.

## 2015/2016

එයාර්ලයින්ස් සමාගම කීර්තිමත් ගෞරව නාම හතරක් සඳහා ලැයිස්තුගත කෙරිණ: එනම් ආසියානු සහ ඔස්ට්‍රේලියා කලාපයේ හොඳම ගුවන් සේවය, හොඳම ගුවන් යානස්ථ ප්‍රකාශනය, 'හොඳම ගුවන් යානාස්ථ (Inflight) වීඩියෝව සහ ඇපෙක්ස් මගී තේරීම් සම්මාන - 2015 හි හොඳම ගොඩබිම අත්දැකීම යනුවෙනි. එයාර්ලයින්ස් සමාගම කාණ්ඩ හතරක් සඳහා නම් කරන ලද පළමු අවස්ථාව මෙයයි. එයාර්ලයින්ස් සමාගම විසින් ආසියාවේ සහ ඔස්ට්‍රලේෂියාවේ මගී අත්දැකීම් සඳහා විශිෂ්ට ජයග්‍රහණ සම්මානය දිනා ගන්නා ලදී - 2015 සැප්තැම්බර් ඇපෙක්ස් පෝට්ලන්ඩ් ඔරේගන් සහ ගුවන් සේවයේ හොඳම පූර්ණ සේවා ත්‍යාගය, මධ්‍යම හා දකුණු ආසියාව - ආසියාවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන 2015 - සිංගප්පූරුව.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනේ අංගයක් වශයෙන් සමාගම විසින් අගෝස්තු සහ නොවැම්බර් මාසවලදී අති නවීන A330- 300 ගුවන් යානා හතරක් සහ 2015 දෙසැම්බර් මාසයේදී ගුවන් යානා දෙකක් ලබා ගන්නා ලදී.

## 2016/2017

2017 පෙබරවාරි සහ 2017 මාර්තු මාසවලදී A320 නව ගුවන් යානා දෙකක් හඳුන්වා දීම - A320/ A321 පවුලේ නව එන්ජින් විකල්ප ගුවන් යානා දෙක සමූහයට එක්වීම. ශ්‍රීලංකන් විසින් ලාහෝර්, ජකර්තා, ඩකා, කල්කටා, මදුරෙයි, වරනාසි, බුද්ධගයා, මස්කට්, බහරේන්, සීෂෙල්ස් සහ ගැන් දූපත් යන ආකර්ෂණීය නව ගමනාන්ත එකොළහකට ගුවන් සේවා ආරම්භ කරන ලදී.

"දකුණු ආසියාවේ හොඳම ගුවන් සමාග ම", අඛණ්ඩව දෙවන වරටත් ට්‍රිප්වයිසර් ට්‍රැවලර්ස් චොයිස් සම්මාන 2016 හි "මධ්‍යම හා දකුණු ආසියාවේ හොඳම පූර්ණ සේවා ගුවන් සේවය" යන ඉහළම සංචාරක සම්මානවලින් සමාගම පිදුම් ලැබීය. එයාර්ලයින්ස් සමාගම විසින් 7 වන ආසියා සේවායෝජක සන්නාම සම්මාන උලෙළේදී "පුහුණු විශිෂ්ටතා සම්මානය" සහ "ව්‍යාපාරයට අනුකූලව හොඳම මානව සම්පත් ක්‍රමෝපාය සඳහා සම්මානය"ද හිමිකර ගන්නා ලදී.

## 2017/2018

සමාගම විසින් ගුවන් යානා සමූහය සඳහා 2017 ජූනි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී නවතම එයාර්බස් A321- 200 neo ගුවන් යානා තුනක් ලබා ගන්නා ලදී.

ශ්‍රීලංකන් සමාගම විසින් මෙල්බර්න්, හයිද්‍රාබාද්, කොයිම්බතූර් සහ විශාකාපට්නම් යන නව ගමනාන්ත හතරකට සේවා ආරම්භ කරන ලදී.

ගුවන් සමාගම විසින් ගුවන් සේවා මගී අත්දැකීම් සංගමයෙන් (ඇපෙක්ස්) තරු හතරේ විශිෂ්ටතා ශ්‍රේණිගත කිරීමක් ලබාගත් අතර, 2017 සිංගප්පූරුවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන උලෙළේදී නොකඩවා තෙවන වරටත් විශිෂ්ට සේවා සඳහා සම්මානය ලබා ගන්නා ලදී. සමාගම විසින් සිංගප්පූරුවේ පැවති 2017 ආසියා පැසිෆික් සම්මාන උලෙළේදී "වාණිජ ගුවන් සේවා මැදිරිවල නවෝත්පාදන" සම්මානයද දිනා ගන්නා ලදී.

## 2018/2019

සමාගම විසින් 2018 ජූලි මාසයේදී නියෝ යානා සමූහයේ නිල ආරම්භය සනිටුහන් කළ, තවත් නවතම එයාර්බස් A321neo ගුවන් යානයක් ලබා ගන්නා ලදී.

පියාසැරි දත්ත විශ්ලේෂණ සමාගමක් වන ෆ්ලයිට්ස්ටැට්ස්.කොම් (Flightstats. com.) විසින් ශ්‍රේණිගත කරන ලද 'ගෝලීය ගුවන් සේවා' සහ 'ප්‍රධාන ගුවන් සේවා' යන ප්‍රධාන කාණ්ඩ යටතේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 2018 සැප්තැම්බර් මාසයේදී ලොව වඩාත් කාර්යක්ෂම ගුවන් සේවය බවට පත්විය.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අඛණ්ඩව දෙවන වරටත් ගුවන් මගී අත්දැකීම් සංගමයේ (ඇපෙක්ස්) ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීම පවත්වා ගෙන ගිය අතර, ජාත්‍යන්තර සම්මාන කිහිපයක් ද හිමි කර ගනු ලැබිණ. මේ අතරට අඛණ්ඩව තෙවැනි වරටත් ඉන්දියානු සාගරයේ ලොව ප්‍රමුඛ ගුවන් සේවය සම්මානය දිනා ගැනීම සහ අයි.ටී.බී බර්ලිනයේ ගෝල්ඩන් සිටි ගේට් සම්මාන තුනක් ලබා ගැනීම ඇතුළත් වේ.

## 2019/2020

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම 2019 වර්ෂයේ සැප්තැම්බර් මස සිය 40 වැනි සංවත්සරය සැමරීය. ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) විසින් ජාතික ගුවන් සේවය වෙත ''විශිෂ්ටතම අලෙවිකරණ නව හඳුන්වාදීම'' සම්මානය පිරිනමන ලද්දේය. ශ්‍රීලංකන් සමාගම විසින් අඛණ්ඩව තෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් ලබා ගන්නා ලදී.

2019 වර්ෂයේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 'Two Cities, One Spirit' ප්‍රචාරණ ව්‍යාපෘතිය වෙනුවෙන් PATA ස්වර්ණ සම්මානය දිනා ගන්නා ලද අතර, 2019 බර්ලින් ITB ගෝල්ඩ් සිටි ගේට් සම්මාන උලෙළේදී සම්මාන ත්‍රිත්වයක් දිනා ගන්නා ලදී.

සමාගම විසින් 2020 බර්ලින් ITB ගෝල්ඩ් සිටි ගේට් සම්මාන උලෙළේදී ප්‍රථම වරට කාණ්ඩ තුනකින් ("Airline International", "Music International" සහ "Campaign") තරු පහේ සම්මානයට පාත්‍ර විය.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් වර්ල්ඩ් ට්‍රැවල් අවෝර්ඩ්ස් ඒෂියා ඇන්ඩ් ඕෂනියා (ලෝක චාරිකා සම්මාන- ආසියාව හා ඕෂනියාව) හිදී අග්‍රගණ්‍ය 'ලොව විශිෂ්ටතම ගුවන් සේවය' සහ 'ඉන්දියන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

## 2020/21

පශ්චාත් කෝවිඩ් සමයේදී ගුවන් ගමන්වලදී මගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම හේතුවෙන් APEX Health Safety විසින් ප්ලැටිනම් ප්‍රමිති තත්වය පිරිනමන ලදී.

"Future Travel Experience (FTE) Virtual Expo" සම්මාන උලෙළේදී ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) විසින් 2021 වසර සඳහා "ප්‍රධාන නිල ගුවන් සේවය සඳහා තරු හතරක ශ්‍රේණිගත කිරීම" පිරිනමන ලදී.

ගෝලීය වසංගත තත්වය තුළ ශ්‍රී ලාංකේය අපනයනකරුවන්ට සහය දැක්වීම සඳහා සහ අඩුවන මගී සංචාර හමුවේ විකල්ප ආදායම් මාර්ග සොයා ගැනීමේ අරමුණින් ප්‍රථම වරට භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානා, ගමනාගමන කාලසටහනට ඇතුළත් කරන ලදී.

වසංගතය තත්වය හමුවේ දේශසීමා වසා දැමීම හේතුවෙන් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් ආපසු ගෙන්වා ගැනීම සඳහා විශේෂ මගී ගුවන් ගමන් ක්‍රියාත්මක කළ අතර, අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය සඳහා විශේෂ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

## 2021/22

පශ්චාත් කොවිඩ් සමයේ ගුවන් සංචාරයේදී මගී ආරක්ෂාව සහ යහපැවැත්ම වෙනුවෙන් Simplyflying විසින් අනුග්‍රහය දක්වන ලද දියමන්ති සම්මානය - ඇපෙක්ස් සෞඛ්‍ය සහ ආරක්ෂාව, සහ "සේවා ස්ථානයේ සෞඛ්‍ය කළමනාකරණයේ විශිෂ්ටතමයා" ආසියාතික නායකත්ව සම්මානය 2021 වර්ෂයේදී ලබා ගන්නා ලදී.

දකුණු ආසියාතික කලාපයේ පැවැත්ම තහවුරු කළ හෙයින් 2021 ලෝක සංචාරක සම්මාන උළෙලේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඉන්දියන් සාගරය ආශ්‍රිත ලොව ප්‍රමුඛතම ගුවන් සේවය සහ ඉන්දියන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය ලෙස කීර්තියක් හිමි කර ගන්නා ලදී. එමෙන්ම 'සේ බොන්ජු ටු පැරිස් (Say Bonjour to Paris) ප්‍රචාරණ ව්‍යාපාරය සඳහා අලෙවිකරණ වාහකයා - PATA රන් සම්මානය 2021 වර්ෂයේදී දිනා ගන්නා ලදී.



## 2022/23

2023 වසරේදී සිංගප්පූරුවේ පැවති APEX Asia EXPO හිදී මධ්‍යම/දකුණු ආසියාවේ හොඳම ආහාර සහ පාන සහ හොඳම ආසන පහසුව සඳහා APEX මගී තේරීම් සම්මානය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත පිරිනමන ලදී.

2022 වසරේ ශෙයික් මොහම්මඩ් බින් රශීඩ් අල් මක්ටුම් (SMBR) ගෝලීය ගුවන් සේවා සම්මාන උලෙළේ හොඳම ගුවන් සේවා තිරසාර වැඩසටහන සඳහා සම්මානය දිනා ගන්නා ලදී.

2022 වසරේ පැසිෆික් ආසියා සංචාරක සංගමයේ (PATA) රන් සම්මාන උලෙළේ "අලෙවිකරණ වාහකයා" කාණ්ඩය යටතේ රන් සම්මානය හිමිකර ගන්නා ලදී.

2022 වසරේ දකුණු ආසියානු සංචාරක සම්මාන උලෙළේ (SATA) සංචාරක තේරීම අනුව වසරේ ගුවන් සේවය ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පිළිගැනීමට පාත්‍ර වන ලදී. 2022 ලෝක සංචාරක සම්මාන උලෙළේ ඉන්දියන් සාගරයට සඳහා ලොව ප්‍රමුඛතම ගුවන් සේවය ලෙස සම්මානයට පාත්‍ර විය.

## 2023/24

2023 පැසිෆික් ආසියා සංචාරක සංගමයේ (PATA) 28 වැනි රන් සම්මාන උලෙළේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 'අලෙවි-වාහක' කාණ්ඩයේ රන් සම්මානයක් දිනා ගන්නා ලදී.

සමාගම 2023 වසරේ දකුණු ආසියානු සංචාරක සම්මාන උලෙළේදී (SATA) ප්‍රමුඛ ජාත්‍යන්තර ගුවන් සේවය - දකුණු ආසියාව ලෙස කිරුළ දරන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කාගෝ, 2023 ඉන්දියා කාර්ගෝ සම්මාන උලෙළේදී ('භාණ්ඩ ප්‍රවාහන කර්මාන්තයේ ඔස්කාර් ලෙස නම් කර ඇත) හොඳම ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන ගුවන් සේවය ලෙස නම් කරන ලදී.

2023 වසරේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ කාන්තා වෘත්තිකයන් සඳහා සම්මාන උලෙළේදී 'වසරේ තොරතුරු තාක්ෂණ කණ්ඩායම' සම්මානය දිනා ගැනීමේ ජයග්‍රහණය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තොරතුරු තාක්ෂණ අංශය විසින් අත්කර ගන්නා ලදී.

## 2024/25

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මධ්‍යම/දකුණු ආසියාව සඳහා ඇපෙක්ස් හොඳම විනෝදාස්වාද සම්මානය දිනා ගත් අතර 2024 සිංගප්පූරුවේ FTE APEX Asia Expo හි ඇපෙක්ස් නිල ගුවන් සේවා ශ්‍රේණිගත කිරීම්වල 'තරු හතරේ ප්‍රධාන ගුවන් සමාගම' ලෙස එහි ස්ථානය දරන ලදී.

2024 දකුණු ආසියානු සංචාරක සම්මාන උලෙළේ (SATA) සංචාරක තේරීම යන කාණ්ඩය යටතේ දකුණු ආසියාවේ ප්‍රමුඛතම ජාත්‍යන්තර ගුවන් සේවය ලෙස සමාගම පිළිගැනීමට පාත්‍ර වන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2024 පැසිෆික් ආසියානු සංචාරක සංගමයේ (PATA) රන් සම්මාන උළෙලේදී " අලෙවිකරණ-වාහකයා" කාණ්ඩය යටතේ රන් සම්මානයක් දිනා ගන්නා ලදී.

2024 ශ්‍රී ලංකා කාර්ය උපාය සහ ගුවන් සහ නැව් භාණ්ඩ ප්‍රවාහකයන්ගේ සංගමය (SLFFA) විසින් සංවිධානය කරන ලද ජාතික සැපයුම් සම්මාන උළෙලේදී ගුවන් සේවා කාණ්ඩයේ රිදී සම්මානය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් දිනා ගන්නා ලද්දේය.

2024 ඩුබායි හි පැවති අරාබි ගුවන් භාණ්ඩ ප්‍රවාහන සම්මාන උලෙළේදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 'නැගී එන භාණ්ඩ ප්‍රවාහන ගුවන් සේවය' සම්මානය පිදුම් ලැබුවේය.

2024 තමිල්නාඩු ප්‍රාන්ත සංචාරක සම්මාන උළෙලේදී තමිල්නාඩුව සඳහා හොඳම ගුවන් සේවා හවුල්කරු ලෙස සමාගම ගෞරවයට පාත්‍ර විය.

# සාංගමික තොරතුරු

**සමාගමේ නම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

**සමාගමේ ලියාපදිංචි අංකය**
පී බී 67

**නෛතිකභාවය**
සීමාසහිත පොදු සමාගමකි

**අධ්‍යක්ෂ මණ්ඩලය**
සරත් ගනේගොඩ මහතා (සභාපති)
ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත
Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා
රොහාන් ගුණතිලක මහතා
විපුල ගුණතිලක මහතා
ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ
දුමිත් ප්‍රනාන්දු මහතා
සෙනරත් ඩී. ලියනගේ මහතා

**විගණන කමිටුව**
විපුල ගුණතිලක මහතා (සභාපති)
ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත
Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා
රොහාන් ගුණතිලක මහතා
දුමිත් ප්‍රනාන්දු මහතා
සෙනරත් ඩී. ලියනගේ මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**
රොහාන් ගුණතිලක මහතා (සභාපති)
Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා
ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ
ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත

**අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව**
ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත - සභාපති
විපුල ගුණතිලක මහතා
දුමිත් ප්‍රනාන්දු මහතා
සෙනරත් ඩී. ලියනගේ මහතා

**සම්බන්ධිත පාර්ශ්ව සමාලෝචන කමිටුව**
ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත - සභාපති
විපුල ගුණතිලක මහතා
දුමිත් ප්‍රනාන්දු මහතා

**මණ්ඩල ආචාරධර්ම කමිටුව**
ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ
ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත
දුමිත් ප්‍රනාන්දු මහතා

**සමාගම් ලේකම්/ සමූහයේ සාංගමික ලේකම් සේවා ප්‍රධානී**
ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය (ACG, MBA (AUS) )

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
මහජන බැංකුව
ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව
සිටි බැංකුව
සම්පත් බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
කොමර්ෂල් බැංකුව
කාගිල්ස් බැංකුව
පෑන් ඒෂියා බැංකුව

**විගණක**
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

**ලියාපදිංචි කාර්යාලය**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම
ගුවන් සේවා මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
කටුනායක
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය**
www.srilankan.com

optima Designing Your Year!
Designed & Produced by Optima Designs (Pvt) Ltd.
A full service design and print company. www.optimadesigns.lk

# මහා සභා රැස්වීම් නිවේදනය

පහත දැක්වෙන අරමුණු පාදක කර ගනිමින්, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන්ගේ හතළිස් හත්වන වාර්ෂික මහා සභා රැස්වීම 2025 සැප්තැම්බර් 12 වෙනි සිකුරාදා ප.ව. 3.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) ' මිහිලක මැදුර' පරිශ්‍රයේ පැවැත්වෙන බව මෙයින් දන්වා සිටියි.

1. 2025 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම.
2. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 210 (2)(අ) වගන්තිය ප්‍රකාරව වයස අවු. 71 සම්පූර්ණ කර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ධූරයෙන් ඉවත්වූ රොහාන් ගුණතිලක මහතා නැවත අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වීම සඳහා පහත සඳහන් සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම.
   "වයස අවු. 71 සම්පූර්ණ කර නැවත සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වන රොහාන් ගුණතිලක මහතා 2007 අංක 07 දරණ සමාගම් පනතේ 211 (1) වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි එම සමාගම් පනතේ 210 වන වගන්තියේ සඳහන් අවු. 70 ක වයස් සීමාව රොහාන් ගුණතිලක මහතාට අදාල නොවන බව මෙයින් තීරණය කරනු ලැබේ."
3. 2007 අංක 07 දරන සමාගම් පනතේ 210 (2)(අ) වගන්තිය ප්‍රකාරව අවු. 70 සම්පූර්ණ කර සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ධූරයෙන් ඉවත්වන Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා නැවත අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වීම සඳහා පහත සඳහන් සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම.
   "වයස අවු. 70 සම්පූර්ණ කර නැවත සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වන Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 (1) වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි එම සමාගම් පනතේ 210 වන වගන්තියේ සඳහන් අවු. 70 ක වයස් සීමාව Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතාට අදාළ නොවන බව මෙයින් තීරණය කරනු ලැබේ."

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

**ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
*සමූහයේ ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2025 අගෝස්තු 20
කටුනායක

**සටහන්:**

1. 2024/25 සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි වාර්ෂික වාර්තාව පහත පහත පරිදි ලබා ගත හැකිය.

(i) ආයතනික වෙබ් අඩවිය - https://www.srilankan.com/en_uk/corporate/annual-reports
(ii) කොටස් හිමියන්ගේ ප්‍රජා අඩවිය - https://shareholders.srilankan.com
(iii) පහත QR කේතය ස්කෑන් කිරීමෙන් සාමාජිකයින්ට ඔවුන්ගේ ජංගම දුරකථන හරහාද වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ වෙත ප්‍රවේශ විය හැකිය.

2. 2024 පෙබරවාරි 28 දිනැති 01/2024 පොදු ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව, මෙම වාර්තාව ලබා ගත හැක්කේ PDF ස්වරූපයෙන් පමණකි.
3. සාමාජිකයෙකුට ඔහු/ඇය වෙනුවට සහභාගි වීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට පෙරකලාසියක් පත් කිරීමට හිමිකම් ඇත. පෙරකලාසියක් සමාගමේ සාමාජිකයෙකු විය යුතු නැත. පෙරකලාසි පෝරමයක් මෙම දැන්වීම සමඟ ඇත.
4. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පෝරමය රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර, 2025 සැප්තැම්බර් 10 වන දින ප.ව. 3.00 ට පෙර සමාගමට ඉදිරිපත් කළ යුතුය.
   - විද්‍යුත් තැපෑලෙන් නම්: comsec@srilankan.com
   - ගෙනැවිත් භාරදීම හෝ රෙජිස්ට්‍රාර් තැපැල් මගින් නම් : සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක.
5. සංස්ථාවක් නියෝජනය කරන තැනැත්තෙකු සංස්ථාවේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමට බලය පවරන යෝජනාවේ සහතික කළ පිටපතක් රැගෙන ආ යුතුය. නියෝජිතයෙකු සාමාජිකයෙකු විය යුතු නැත.
6. වාර්ෂික මහා සභා රැස්වීමේදී තමන් නියෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු තම නියෝජිතයා ලෙස පත් කිරීමට කැමති කොටස් හිමියන්ට පෙරකලාසි පෝරමය පුරවා එසේ කළ හැකිය.
7. වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ දැන්වීම් න්‍යාය පත්‍රයේ ලැයිස්තුගත කර ඇති අයිතම පිළිබඳව කොටස් හිමියන්ට තම ප්‍රශ්න/අදහස් comsec@srilankan.com වෙත විද්‍යුත් තැපෑලෙන් හෝ සමාගමේ ලියාපදිංචි කාර්යාලය වන සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක යන ලිපිනයට රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් දින 3කට පෙර ගෙනැවිත් භාරදීම හෝ රෙජිස්ට්‍රාර් තැපැල් මගින් එවිය හැකිය.

ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද කිසියම් සන්නිවේදනයක්, මාර්ගෝපදේශනයක්, විධානයක් හෝ නියෝගයක් හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීමට අදාළව යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගමට අවශ්‍ය නම්, එම ක්‍රියාමාර්ගය පිළිබඳ නිවේදනය සමාගමේ වෙබ් අඩවිය - www.srilankan.com/AGM, කොටස් හිමියන්ගේ ප්‍රජා වෙබ් අඩවිය https://shareholders.srilankan.com සහ ජාතික පුවත්පත් හි ප්‍රකාශනයක් ආකාරයෙන් ලබාදිය යුතු වන්නේය.

* මෙම ලේඛණය ඉංග්‍රීසි අනුවාදය සමඟ යම් නොගැලපීමක් හෝ ගැටළු ඇතිවුවහොත්, ඉංග්‍රීසි අනුවාදය බල පැවැත්වේ.

# සටහන්

සටහන් තවදුරටත්.

# පෙරකලාසි පත්‍රය

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි කොටස් හිමියෙකු/කොටස් හිමියන් වන,.......................................................................හි

.......................................................................................................................................................................

වන *මම/අපි ........................................................................................................................................... හි

.......................................................................................................................................................................

හෝ *ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු;

| | |
|---|---|
| සරත් ගනේගොඩ මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| රොහාන් ගුණතිලක මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| දුමිත් ප්‍රනාන්දු මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| විපුල ගුණතිලක මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| ජනාධිපති නීතිඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |
| සෙනරත් ඩී. ලියනගේ මහතා | හෝ ඔහු අපොහොසත් වන්නේ නම්, |

*මගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන්, 2025 සැප්තැම්බර් 12 වන සිකුරාදා ප.ව. 3.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) ' මිහිලක මැදුර' පරිශ්‍රයේ පැවැත්වීමට නියමිත සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි හතළිස් හත්වන වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ එහි කිසියම් කල්තැබීමකදී *මම/අපි වෙනුවෙන් ඡන්දය ලබා දීමට සහ *මම/අපි නියෝජනයට මෙහිලා පත්කරනු ලබයි.

| | පක්ෂව | විපක්ෂව |
|---|---|---|
| 1. 2025 මාර්තු 31න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම. | | |
| 2. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 210 (2)(අ) වගන්තිය ප්‍රකාරව වයස අවු. 71 සම්පූර්ණ කර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ධුරයෙන් ඉවත්වූ රොහාන් ගුණතිලක මහතා නැවත අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වීම සඳහා පහත සඳහන් සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම.<br>"වයස අවු. 71 සම්පූර්ණ කර නැවත සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වන රොහාන් ගුණතිලක මහතා 2007 අංක 07 දරණ සමාගම් පනතේ 211 (1) වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි එම සමාගම් පනතේ 210 වන වගන්තියේ සඳහන් අවු. 70 ක වයස් සීමාව රොහාන් ගුණතිලක මහතාට අදාල නොවන බව මෙයින් තීරණය කරනු ලැබේ." | | |
| 3. 2007 අංක 07 දරන සමාගම් පනතේ 210 (2)(අ) වගන්තිය ප්‍රකාරව අවු. 70 සම්පූර්ණ කර සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ධුරයෙන් ඉවත්වන Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා නැවත අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වීම සඳහා පහත සඳහන් සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම.<br>"වයස අවු. 70 සම්පූර්ණ කර නැවත සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වන Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතා 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 (1) වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි එම සමාගම් පනතේ 210 වන වගන්තියේ සඳහන් අවු. 70 ක වයස් සීමාව Flt./Lt. (විශ්‍රාමික) සුගත් රාජපක්ෂ මහතාට අදාළ නොවන බව මෙයින් තීරණය කරනු ලැබේ." | | |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

දෙදහස් විසිපහේ ..................................................... මස ..................................... දින මෙය අත්සන් කරන ලදී.

.......................................................... අත්සන/අත්සන්

**සටහන:**
(අ) *අනවශ්‍ය වචනය කපා හරින්න.
වචන කිසිවක් ඉවත් කර නොමැති නම් හෝ පෙරකලාසිකරු ඡන්දය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ (පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීමේදී උපදෙස් ඇතුළත් කර ඇති ආකාරය සම්බන්ධව) පෙරකලාසිකරු හට සැකයක් පවතී නම්, පෙරකලාසිකරු යෝග්‍ය යැයි සිතන පරිදි ඡන්දය භාවිත කරනු ඇත.

* මෙම ලේඛණය ඉංග්‍රීසි අනුවාදය සමඟ යම් නොගැලපීමක් හෝ ගැටළු ඇතිවුවහොත්, ඉංග්‍රීසි අනුවාදය බල පැවැත්වේ.

# පෙරකලාසි පත්‍රය තවදුරටත්.

**පෙරකලාසි පෝරමය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

1. වලංගුභාවය සඳහා, සම්පූර්ණ කළ පෙරකලාසි පෝරමය වාර්ෂික මහා සභා රැස්වීම සඳහා නියම කර ඇති වේලාවට පැය 48කට පෙරඃ
   1.1 සමාගම් ලේකම් කාර්යාලය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක යන ලිපිනය වෙත තැපෑල මඟින් හෝ ගෙනැවිත් භාරදීම හෝ
   1.2. පෙරකලාසි පත්‍රය ස්කෑන් කර comsec@srilankan.com විද්‍යුත් තැපෑල හරහා ලැබීමට සැලැස්විය යුතුය.
2. පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයෙකු විය යුතු නැත.
3. පෙරකලාසි පෝරමය සම්පූර්ණ කිරීමේදී, සියලු විස්තර පැහැදිලිව කියවිය හැකි ලෙස සම්පූර්ණ කිරීමට සැලකිලිමත් වන්න.
4. ඔබේ පෙරකලාසියේ එක් එක් යෝජනාවට ඡන්දය දීමට කෙසේ දැක්විය යුතුදැයි '✓' අකුරින් සලකුණු කරන්න. කිසිදු ඇඟවීමක් නැතිනම්, පෙරකලාසිවරයාගේ/පෙරකලාසිවරියගේ අභිමතයට අනුව ඔහු/ඇය සුදුසු යැයි සිතන පරිදි ඡන්දය දෙනු ඇත.
5. සමාගමක්/සංස්ථාවක් නියෝජනය කරන පෙරකලාසිය එහි පොදු මුද්‍රාව යටතේ සිදු කළ යුතු අතර, සංගමයේ ලිපි මඟින් නියම කර ඇති ආකාරයට මුද්‍රා තැබීම සහ සහතික කිරීම කළ යුතුය.
6. නීතිඥවරයා විසින් අත්සන් කරන ලද පෙරකලාසියක් සම්බන්ධයෙන්, එම නීතිඥවරයාට අදාළ බලපත්‍රය ලියාපදිංචි කිරීම සඳහා "ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්," ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක හි ලියාපදිංචි කාර්යාලයට භාර දීම කළ යුතුය.



SriLankan Airlines
oneworld
www.srilankan.com
ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.